73 වන කාණ්ඩය
6 වන කලාපය

බදාදා
1967 අගෝස්තු 9

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

### නිල වාර්තාව

33447

#### අන්තර්ගත ප්‍රධාන කරුණු

ආණ්ඩුවේ ගණන් පරීක්ෂක කාරක සභාවේ වාර්තාව [තී. 1041]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 1042]

විසර්ජන පනත් කෙටුම්පත, 1967-68 [පස් වන වෙන් කළ දිනය] [තී. 1059] :

දෙවන වර කියවීම—විවාදය ඉදිරියට ගෙන යන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 73
இல. 6

புதன்கிழமை
9 ஒகஸ்ட் 1967

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

அரசாங்கக் கணக்குக் குழு அறிக்கை [ப. 1041]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப. 1042]

ஒதுக்கீடு மசோதா, 1967-68 [ஒதுக்கப்பட்ட ஐந்தாம் நாள்] [ப. 1059] :
இரண்டாம் மதிப்பு—விவாதம் ஒத்திவைக்கப்பட்டது

---

Volume 73
No. 6

Wednesday,
9th August 1967

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

PUBLIC ACCOUNTS COMMITTEE REPORT [col. 1041]

ORAL ANSWERS TO QUESTIONS [col. 1042]

APPROPRIATION BILL, 1967-68 [Fifth Allotted Day] [col. 1059] :
Second Reading—Debate adjourned

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය
## பிரதிநிதிகள் சபை
## House of Representatives

1967 අගෝස්තු 9 වන බදාදා

புதன்கிழமை, 9 ஓகஸ்ட் 1967

*Wednesday, 9th August 1967*

---

පූ. භා. 10ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [එස්. සී. ෂර්ලි කොරයා මයා.] මූලාසනාරූඪ විය.

சபை, மு.ப. 10 மணிக்குக் கூடியது. கௌரவ உப சபாநாயகர் அவர்கள் [திரு. எஸ். சீ. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at 10 A.M.,* MR. DEPUTY SPEAKER [MR. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## ආණ්ඩුවේ ගණන් පරීක්ෂක කාරක සභාවේ වාර්තාව
### அரசாங்கக் கணக்குக் குழு அறிக்கை
### PUBLIC ACCOUNTS COMMITTEE REPORT

බර්නාඩ් සොයිසා මයා. (දකුණු කොළඹ මන්ත්‍රී සහ ආණ්ඩුවේ ගණන් පරීක්ෂක කාරක සභාවේ සභාපති)

*(திரு. பேர்னட் சொய்ஸா—கொழும்புத் தெற்கு—அரசாங்கக் கணக்குக் குழுத் தலைவர்)*

(Mr. Bernard Soysa—Colombo South, and Chairman, Public Accounts Committee)

I present the First Report of the Public Accounts Committee on the Accounts of the Government of Ceylon for the Financial Year 1965-66 and the Report of the Auditor-General thereon together with the Proceedings of the Committee and the Minutes of Evidence.

නියෝජ්‍ය කථානායකතුමා

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

I wish to say that we should congratulate the Chairman of the Public Accounts Committee on this achievement. This is the first time the House has received the Report on the previous year's Accounts during the consideration of the Budget.

ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති)

*(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க—உள்நாட்டு விவகார அமைச்சர்)*

(The Hon. Dr. W. Dahanayake—Minister of Home Affairs)

It is a world record!

ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)*

(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

I move,

"That the First Report from the Public Accounts Committee on the Accounts of the Government of Ceylon for the Financial Year 1965-66 and the Report of the Auditor-General thereon together with the Proceedings of the Committee and the Minutes of Evidence be printed."

I wish to join in the congratulations that you have offered and conclude by saying that all good things emanate from Colombo South.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.

அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

*Ordered that the Report be printed.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
### வினாக்களுக்கு வாய்மூல விடைகள்
### ORAL ANSWERS TO QUESTIONS

නියෝජ්‍ය කථානායකතුමා

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

Question No. 1. The hon. Member is not here.

Question No. 2

2——එච් 6041—793 (67/8)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ජේ. ආර්. ජයවර්ධන (කෘෂිකර්ම හා ආහාර ඇමති වෙනුවට)

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—விவசாய, உணவு அமைச்சர் சார்பாக)

(The Hon. J. R. Jayewardene—on behalf of the Hon. Minister of Agriculture and Food)

One month's time is required to answer this Question

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

3. උඩ පුස්සැල්ලාව බ්ලයර්ලෝමන්ඩ් වත්තේ කම්කරු එච්. විල්බට් පීරිස් මයා.

திரு. எச். வில்பட் பீரிஸ், தொழிலாளி, பிலயர்லோமண்ட் தோட்டம், உடபுசல்லாவ

MR. H. WILBERT PIERIS, LABOURER, BLAIRLOMOND ESTATE, UDA-PUSSELLAWA

ටී. බී. එම්. හේරත් මයා. (වලපනේ)

(திரு. ரி. பி. எம். ஹேரத்—வலப்பனை)

(Mr. T. B. M. Herath—Walapane)

කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) උඩ පුස්සැල්ලාව බ්ලයර්ලෝමන්ඩ් වත්තේ කම්කරු එච්. විල්බට් පීරිස් මහතා 1965 දෙසැම්බර් 4 වන දින සේවයේ යෙදී සිටියදී හදිසි අනතුරකට භාජන වූ බව එතුමා දන්නවාද? (ආ) මෙම අනතුර නිසා ඔහුට සිදුවූ තුවාල කවරේද? (ඉ) මේ සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයාට දන්වූ බව එතුමා දන්නවාද? (ඊ) කම්කරු කොමසාරිස් විසින් මේ ගැන මෙතෙක් කුමක් කර තිබේද? (උ) මොහුට ඉක්මනින් වන්දියක් ලබා දීමට එතුමා ක්‍රියා කරනවාද? (ඌ) නොඑසේ නම්, ඒ මන්ද?

தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா: (அ) உடபுசல்லாவ பிலயர்லோமண்ட் தோட்டத்தொழிலாளியாகிய திரு. எச். வில்பட் பீரிஸ் 1965 டிசம்பர் 4 ஆம் தேதி கடமையாற்றும் போது திடீர் விபத்துக்குள்ளாகியதை அவர் அறிவாரா? (ஆ) இந்த விபத்தினால் அவருக்கு என்ன காயங்கள் ஏற்பட்டன? (இ) இந்த விஷயம் தொழில் ஆணையாளருக்கு அறிவிக்கப்பட்டதென்பதை அவர் அறிவாரா? (ஈ) தொழில் ஆணையாளர் இவ் விடயம் சம்பந்தமாக இதுவரை என்ன செய்துள்ளார்? (உ) இவருக்கு விரைவில் நட்டஈடு பெற்றுக்கொடுப்பதற்கு அவர் நடவடிக்கை எடுப்பாரா? (ஊ) அன்றேல் ஏன்?

asked the Minister of Labour, Employment and Housing: (*a*) Is he aware that Mr. H. Wilbert Pieris, a labourer employed at Blairlomond Estate, Uda-Pussellawa, met with an accident on 4th December 1965 while on duty? (*b*) What were the injuries sustained by him as a result? (*c*) Is he aware that this was brought to the notice of the Commissioner of Labour? (*d*) What action has been taken so far by the Commissioner of Labour in this regard? (*e*) Will he take action to obtain compensation for him early? (*f*) If not, why?

එස්. ද එස්. ජයසිංහ මයා. (කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. S. de S. Jayasingha—Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing)

(අ) නැත. (ආ) (අ) යන්නෙහි පිළිතුර අනුව මෙය පැන නොනගී. (ඉ) නැත. මෙම කරුණ සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් වෙත කරුණු සැළකොට නැත. (ඊ) (ඉ) යන්නෙහි පිළිතුර අනුව මෙය පැන නොනගී. (උ) මෙම කරුණ සමාජ සේවා අමාත්‍යාංශයේ කම්කරු වන්දි කොමසාරිස් වරයාගේ කාර්යය විෂයයන් යටතට අයත් වේ. (ඌ) පැන නොනගී.

ටී. බී. එම්. හේරත් මයා.

(திரு. ரி. பி. எம். ஹேரத்)

(Mr. T. B. M. Herath)

මේ කාරණය සම්බන්ධව නුවරඑළිය කම්කරු කාර්යාලය දැනටමත් විභාගයක් පවත්වා තිබෙන නිසා පාර්ලිමේන්තු ලේකම්තුමාගේ පිළිතුර වැරදි සහගත බව මා ප්‍රකාශ කරන අතර, නැවත වරක් ඒ ගැන සොයා බලනවාදැයි මා අහන්නට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*
(Mr. S. de S. Jayasingha)

නැවත වරක් සොයා බලන්නට පුළුවන්. එහෙත් පිළිතුරු දුන්නේ ඒ පිළිබඳ ලිපි ගොනුවලට අදාළවයි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

එහෙම නම් කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එතුමාට සපයා තිබෙන්නේ වැරදි පිළිතුරක්. මේ කාරණය සම්බන්ධයෙන් දැනටමත් විශේෂ විභාගයක් පවත්වා තිබෙන බව මා වගකීමක් ඇතිව ප්‍රකාශ කරන නිසා නැවත වරක් මේ කාරණය ගැන සොයා බලනවාදැයි මා අහන්නට කැමතියි.

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*
(Mr. S. de S. Jayasingha)

එවැනි විභාගයක් පවත්වා තිබෙනවාදැයි පරීක්ෂා කර බලනවා. එහෙත් පිළිතුරු දුන්නේ ඒ පිළිබඳ ලිපිගොනු අනුවයි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

පිළිතුර වැරදියි.

## නුවරඑළිය දිස්ත්‍රික්කයේ පේෂකර්ම ප්‍රදර්ශකයන්

நுவரெலிய மாவட்ட நெசவுத் தொழில் விளக்கமளிப்போர்

**TEXTILE DEMONSTRATORS, NUWARA ELIYA DISTRICT**

4. **ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1966 වර්ෂයේ අවසානයේදී හෝ 1967 වර්ෂය ආරම්භයේදී පේෂකර්මාන්ත ප්‍රදර්ශක තනතුරු සඳහා නුවරඑළිය දිස්ත්‍රික්කයට කී දෙනෙක් පත් කරනු ලැබුවෝද? (ආ) නුවරඑළිය දිස්ත්‍රික්කයට අන් පෙදෙස්වලින් කීදෙනෙක් පත් කරනු ලැබුවෝද? (ඉ) පත් කරන ලද සියලු දෙනාගේම වෘත්තීය හා අධ්‍යාපන සුදුසුකම් එතුමා වෙන වෙනම සඳහන් කරනවාද? (ඊ) පත්වීම මෙතෙක් නොලැබූ වතුමුල්ල, එගොඩකන්ද, ඩබ්ලිව්. එම්. ඥානවතී හා ඩබ්ලිව්. සෝමාවතී යන මහත්මාවන්ගේ වෘත්තීය හා අධ්‍යාපන සුදුසුකම් එතුමා වෙන වෙනම සඳහන් කරනවාද? (උ) එම දෙදෙනාට අයුක්තියක් සිදුවී තිබේද? (ඌ) එසේ නම් ඔවුන්ට පත්වීම් දීමට එතුමා ක්‍රියා කරනවාද? (එ) නොඑසේ නම්, ඒ මන්ද?

*உள்நாட்டு விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) 1966 ஆம் ஆண்டின் முடிவில் அல்லது 1967 ஆம் ஆண்டின் தொடக்கத்தில் நெசவுத் தொழில் செயல் விளக்கமளிப்போர் பதவிக்கு நுவரெலிய மாவட்டத்தில் எத்தனை பேர் நியமிக்கப்பெற்றனர்? (ஆ) நுவரெலிய மாவட்டத்திற்கு பிறபகுதிகளிலிருந்து எத்தனைபேர் நியமிக்கப்பெற்றனர்? (இ) நியமிக்கப்பெற்ற எல்லோரினதும் தொழில், கல்வித்தகைமைகளை அவர் வெவ்வேறாகக் குறிப்பிடுவாரா? (ஈ) இதுவரை நியமனங் கிடைக்கப்பெறாத வத்துமுல்ல எகொடகந்த திருமதி டப்ளியு. எம். குணவதி, திருமதி டப்ளியு. சோமவதி ஆகியோரின் தொழில், கல்வித் தகைமைகளை அவர் வெவ்வேறாகக் குறிப்பிடுவாரா? (உ) அவ்விருவருக்கும் அநீதி விளைவிக்கப்பட்டுள்ளதா? (ஊ) அவ்வாறாயின் அவர்களுக்கு நியமனங்கொடுக்க அவர் நடவடிக்கை எடுப்பாரா? (எ) இன்றேல், ஏன்?*

asked the Minister of Home Affairs: (*a*) How many textile demonstrators were appointed to the Nuwara Eliya District at end of 1966 or at the beginning of 1967? (*b*) How many from areas outside Nuwara Eliya District were appointed to the Nuwara Eliya District? (*c*) Will he state the technical and educational qualifications of all the appointees? (*d*) Will he state separately the technical and educational qualifications of Mrs. W. M. Gnanawathie and Mrs. W. Somawathie of Wathumulla, Egodakanda, who have not yet been appointed? (*e*) Have these two persons been subjected to any injustice? (*f*) If so, will he take action to give them appointments? (*g*) If not, why?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)
(අ) 25 දෙනෙකි. (ආ) කිසිවකු නැත.
(ඉ) නම් 25 ක් තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
ඒ නම් 25 ම කියවන්න ද?

එය සභාගත කරන්නට පුළුවන්.*

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

(ඊ) 1. ඩබ්. ඇම්. ඥානවතී මිය. ... අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත පිළිබඳ 9 අවුරුදු අටවැනි ප්‍රමාණය පළපුරුද්ද

2. ඩබ්. සෝමාවතී මහත්මිය ... අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්තය පිළිබඳ 7 අවුරුදු අටවැනි ප්‍රමාණය පළපුරුද්ද

(උ) නැත. (ඌ) සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ ඩබ්ලිව්. සෝමාවතී මහත්මියට සුදුසුකම් නොතිබුණි. (එ) ඉහත "ඊ" අනුව පැන නොනගී.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
අතුරු ප්‍රශ්නයක් අහන්නට තිබෙනවා. පත් කරන ලද 25 දෙනා අතර මේ අපේක්ෂිකාවන් දෙදෙනාට වඩා අඩු සුදුසුකම් තිබෙන අයත් ඉන්නා බව ඔබතුමා පිළිගන්නවාද?

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)
මේ තිබෙන ලැයිස්තුව අනුව නම් එවැනි තත්ත්වයක් නැහැ. පත් කළ අය සියලු දෙනාටම වෘත්තීය සුදුසුකම් සහ අධ්‍යාපන සුදුසුකම් යන දෙකම තිබෙනවා. ඉහත සඳහන් කළ දෙදෙනාට වෘත්තීය සුදුසුකම් නැහැ. තමුන්නාන්සේ තවත් පැහැදිලිව කරුණු ඉදිරිපත් කරනවා නම් මේ දෙදෙනා ගැන තවදුරටත් කරුණු සොයා බලන්නට මම නියම කරන්නම්.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
නුවරඑළිය දිස්ත්‍රික්කයේ පේසකර්ම ගුරුවර ගුරුවරියන් පත් කිරීම පිළිබඳව සම්පූර්ණ පරීක්ෂණයක් පැවැත්වූවොත්, ඔවුන් පත් කිරීමේදී නොයෙකුත් අයථා ක්‍රියාවන් සිදු වී ඇති බව එතුමාට දැන ගන්නට ලැබේවි. එම නිසා සියලුම අදාළ ලිපිගොනු ගෙන්වාගෙන ඒ පිළිබඳව සම්පූර්ණ පරීක්ෂණයක් කරනවාදැයි මා අහන්නට කැමතියි.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)
ඔව්. තමුන්නාන්සේ චෝදනා ඉදිරිපත් කරනවා නම් මා ඉතා සන්තෝෂයෙන් ඒවා ගැන සම්පූර්ණ පරීක්ෂණ පවත්වන බව කියන්නට සතුටුයි.

**එච්. ජී. ඒ. කාරියවසම් මයා.** (බෙන්තර-ඇල්පිටිය)
*(திரு. எச். ஜீ. ஏ. காரியவாசம்—பெந்தர-எல்பிட்டிய)*
(Mr. H. G. A. Kariyawasam—Bentara-Elpitiya)
අමුගොඩ අළුතෙන් විවෘත කරන ලද පේෂකර්ම මධ්‍යස්ථානයට පත් කළ ගුරුවරියට කිසිසේත්ම දැනීමක් නැති බව ගරු ඇමතිතුමා දන්නවා? දැන් මාස අටක් ගතවී තිබෙනවා. ඒ පේෂකර්ම

* විස්තර සඳහා 1049 තීරුව බලන්න.

* சபாபீடத்தில் வைக்கப்பட்ட நிரல் பத்தி 1049 இல் தரப்பட்டிருக்கிறது.

* List tabled is at col. 1049.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මධ්‍යස්ථානයේ ළමයින් ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාටත් පෙත්සම් එවා තිබෙනවා. මේක සම්පූර්ණයෙන්ම දේශපාලන පත්වීමක් මිස පේෂකර්මාන්තය ගැන දැනීමක් තිබෙනවාද නැද්ද කියා සොයා බලා කළ පත්වීමක් නොවෙයි. මේ පත්වීම ගැන සම්පූර්ණ පරීක්ෂණයක් කරනවාද කියා මා දැනගන්නට සතුටුයි. යම් විධියකින් නිලධාරීන් අල්ලස් ගෙන හෝ වෙනත් අයථා මාර්ගවලින් මෙවැනි පත්වීම් කර තිබෙනවා නම් ඒ නිලධාරීන්ට දඬුවම් පැමිණවීමට ගරු ඇමතිතුමා ක්‍රියා කරනවාද ?

**ගරු ආචාර්ය දහනායක**

*(கௌரவ கலாநிதி தகநாயக்க)*

(The Hon. Dr. Dahanayake)

ඔව්. මා එහෙම ක්‍රියා කරනවා. ගරු මන්ත්‍රීතුමා කී කාරණය ගැන පරීක්ෂණයක් කරනවා. වලපනේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කාරණය වුණත් මට කලින් දන්වා තිබුණේ නැහැ. එම නිසයි මට නියම පිළිතුරක් දෙන්නට නොලැබුණේ. නිලධාරීන් යම් යම් වැරදි කර තිබෙනවාය කියා පෙන්නුම් කළහොත් මා ඒවා ගැන පරීක්ෂා කර බලනවා.

* සභා මේසය මත තබන ලද ලැයිස්තුව මෙසේ යි :

*சபாபீடத்தில் வைக்கப்பட்ட நிரல் வருமாறு :*

*The list tabled is as follows :*

| නම | | වෘත්තීය සුදුසුකම් | | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 1. සී. ආ. සුමනාවතී මෙනවිය | ... | පේෂ කර්ම 3 අවුරුදු අවසාන සහතිකය | | අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය) |
| 2. ද. ගෙ. පළිහුමැණිකේ මෙනවිය | ... | එම | ... | එම |
| 3. ර. ත. ශීලවතී මෙනවිය | ... | එම | ... | අට වැනි ප්‍රමාණය |
| 4. දෑ. ගෙ. පුංචිමහත්මයෝ මෙනවිය | ... | එම | ... | හත්වැනි ප්‍රමාණය |
| 5. දෙ. ගෙ. ජයසිංහ මහතා | ... | අ. පො. ස. පත්‍ර විභාගයේ රෙදි විවීම විෂයය සමර්ථවීම | | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය |
| 6. හෙ. වි. කල්‍යාණවතී මෙනවිය | ... | එම | ... | එම |
| 7. දෙ. ගෙ. විජේසිංහ මහතා | ... | එම | ... | එම |
| 8. හේ. සුචරිතරත්න මෙනවිය | ... | එම | ... | එම |
| 9. බ. මු. ලී. කුමාරිහාමි මෙනවිය | ... | එම | ... | අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය) |
| 10. රා. ච. මු. ශීලවතී මහත්මිය | ... | එම | ... | එම |
| 11. ඊ. ර. මු. ලීලාවතී මෙනවිය | ... | එම | ... | එම |
| 12. අ. මු. ක. කො. මැ. අත්තනායක මෙනවිය | | එම | ... | එම |
| 13. වැ. ගෙ. හින්මැණිකේ මෙනවිය | ... | එම | ... | එම |
| 14. හේ. මු. ශීලවතී මෙනවිය | ... | එම | ... | අටවැනි ප්‍රමාණය |
| 15. අ. හේ. කුසුමාවතී මෙනවිය | ... | අත්යන්ත්‍ර පේෂකර්මාන්ත පිළිබඳ 10 අවුරුද්දකට නො අඩු පළපුරුද්ද | | අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය) |
| 16. වි. මු. බන්දුමැණිකේ මිය. | ... | එම | ... | අටවැනි ප්‍රමාණය |
| 17. ස. හෙ. කමලාවතී මිය. | ... | එම | ... | එම |
| 18. මා. මු. අබේමැණිකේ මෙනවිය | ... | එම | ... | එම |
| 19. රා. ක. චන්ද්‍රලතා මෙනවිය | ... | එම | ... | එම |
| 20. ම. මු. ය. මුදන්නායක මෙනවිය | ... | එම | ... | හත්වැනි ප්‍රමාණය |
| 21. දි. මු. විමලාවතී මිය. | ... | එම | ... | එම |
| 22. ලි. කුසුමාවතී මිය. | ... | එම | ... | එම |
| 23. වි. ගෙ. කුඩා මැණිකේ මිය. | ... | එම | ... | හයවැනි ප්‍රමාණය |
| 24. ලු. ගෙ. දී. මේරිනෝනා මෙනවිය | ... | එම | ... | පස්වැනි ප්‍රමාණය |
| 25. අ. මු. කරුණාවතී මැණිකේ මෙනවිය | ... | එම | ... | එම |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

වාචික පිළිතුරු

| பெயர் | | தொழில் நுட்பத் தராதரம் | கல்வித் தராதரம் |
|---|---|---|---|
| 1. செல்வி எஸ். ஏ. சுமனவதி | .. | மூன்று வருட இறுதிப் .. பரீட்சை—நெசவு | பொதுக்கல்வித் தராதரம் (சாதாரணம்) |
| 2. செல்வி டி. ஜி. பாலிகாமெனிக்க | .. | ,, .. | ,, |
| 3. செல்வி ஆர். ரி. லீலாவதி | .. | ,, .. | 8ம் வகுப்பு |
| 4. செல்வி டி. ஜி. புஞ்சிமகத்தயா | .. | ,, .. | 7ம் வகுப்பு |
| 5. திரு. டி. ஜி. ஜயசிங்க | .. | பொதுக்கல்வித் தராதரம் நெசவு ஒரு பாடம் | எஸ். எஸ். சி. |
| 6. செல்வி எச். வி. கல்யாணவதி | .. | ,, .. | ,, |
| 7. திரு. டி. ஜி. விஜயசிங்க | .. | ,, .. | ,, |
| 8. செல்வி எச். சுசாரித்தரெத்ன | .. | ,, .. | ,, |
| 9. செல்வி பி. எல். எம். குமாரகாமி | .. | ,, .. | பொதுக்கல்வித் தராதரம் (சாதாரணம்) |
| 10. திருமதி ஆர். டபிள்யூ. எம். சீலவதி | .. | ,, .. | ,, |
| 11. செல்வி ஐ. ஆர். எம். லீலாவதி | .. | ,, .. | ,, |
| 12. செல்வி எம். கே. கே. எம். அல்லநாயக்க | | ,, .. | ,, |
| 13. செல்வி டபிள்யூ. ஜீ. கின்மெனிக்க | .. | ,, .. | ,, |
| 14. செல்வி எச். எம். சீலவதி | .. | ,, .. | 8ம் வகுப்பு |
| 15. செல்வி ஏ. எச். குசுமாவதி | .. | 10 வருட நெசவுத் தொழில் அநுபவம் | பொதுக்கல்வித் தராதரம் (சாதாரணம்) |
| 16. திருமதி எம். பந்துமெனிக்க | .. | ,, .. | 8ம் வகுப்பு |
| 17. திருமதி எஸ். ஜி. கமலாவதி | .. | ,, .. | ,, |
| 18. செல்வி எம். எம். அபேமெனிக்க | .. | ,, .. | ,, |
| 19. செல்வி ஆர். கே. சந்திரலதா | .. | ,, .. | ,, |
| 20. செல்வி எம். எம். வை. முதன்நாயக்க | .. | ,, .. | 7ம் வகுப்பு |
| 21. திருமதி டி. எம். விமலாவதி | .. | ,, .. | ,, |
| 22. திருமதி எல். குசுமாவதி | .. | ,, .. | ,, |
| 23. திருமதி குடாமெனிக்க | .. | ,, .. | 6ம் வகுப்பு |
| 24. செல்வி எல். ஜி. டி. மேரிநோனா | .. | ,, .. | 5ம் வகுப்பு |
| 25. செல்வி ஏ. எம். கருணவதிமெனிக்க | .. | ,, .. | ,, |

| *Name* | | *Technical Qualifications* | *Educational Qualification* |
|---|---|---|---|
| 1. Miss S. A. Sumanawathie | .. | 3rd year final examination weaving | G. C. E. (Ord. Level) |
| 2. Miss D. G. Palingumenike | .. | do. .. | do. |
| 3. Miss R. T. Seelawathie | .. | do. .. | 8th Std. |
| 4. Miss D. G. Punchimahathaya | .. | do. .. | 7th Std. |
| 5. Mr. D. G. Jayasingha | .. | G. C. E. pass; Weaving as | S. S. C. subject |
| 6. Miss H. V. Kalyanawathie | .. | do. .. | do. |
| 7. Mr. D. G. Wijesingha | .. | do. .. | do. |
| 8. Miss. H. Sucharitharatna | .. | do. .. | do. |
| 9. Miss B. M. L. Kumarihamy | .. | do. .. | G. C. E. (Ord. Level) |
| 10. Mrs. R. W. M. Seelawathie | .. | do. .. | do. |
| 11. Miss I. R. M. Leelawathie | .. | do. .. | do. |
| 12. Miss A. M. K. K. M. Attanayake | .. | do. .. | do. |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| | | | |
|---|---|---|---|
| 13. | Miss. W. G. Heenmenike .. | G. C. E. Pass weaving as a subject | G. C. E. (Ord. Level) |
| 14. | Miss. H. M. Seelawathie .. | do. .. | do. |
| 15. | Miss. A. H. Kusumawathie .. | 10 years practical experience in Handloom Textile Weaving | G. C. E. (Ord. Level) |
| 16. | Mrs. W. M. Bandumenika .. | do. .. | 8th Std. |
| 17. | Mrs. S. G. Kamalawathie .. | do. .. | do. |
| 18. | Miss M. M. Abeyanike .. | do. .. | do. |
| 19. | Miss R. K. Chandralatha .. | do. .. | do. |
| 20. | Miss M. M. Y. Mudanayaka .. | do. .. | 7th Std. |
| 21. | Mrs. D. M. Wimalawathie .. | do. .. | do. |
| 22. | Mrs. L. Kusumawathie .. | do. .. | do. |
| 23. | Mrs. W. G. Kudamenika .. | do. .. | 6th Std. |
| 24. | Miss. L. G. D. Marynona .. | do. .. | 5th Std. |
| 25. | Miss A. M. Karunawathie Menike | do. .. | do. |

## අත්කඳුරේ දිවිතුර අයි. පී. හැන්ඩි මයා.

*திரு. ஐ. பீ. ஹென்டி, என்கந்துற, திவித்துற*

MR. I. P. HANDY, ETHKANDURA, DIVITURA

5. **කාරියවසම් මයා.**
*(திரு. காரியவாசம்)*
(Mr. Kariyawasam)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) හදිසි අනතුරකින් ලත් තුවාල සහිතව, ඇත්කඳුරේ දිවිතුර අයි. පී. හැන්ඩි මහතා ඇල්පිටිය ආරෝග්‍යශාලාවට ඇතුළුව සිටියදී 29.6.67 දින රාත්‍රි 2ට පමණ සාහසිකයෙකු විසින් ඇසිඩ් ගැසීමෙන් දැනට අන්ධයෙකුව සිටින බව එතුමා දන්නවාද? (ආ) රජයේ ආරෝග්‍යශාලාවේ ආරක්ෂාව යටතේ සිටින අවස්ථාවක සිදුවුන මේ අපරාධයට සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වගකිව යුතු බව එතුමා දන්නවාද? (ඉ) ඒ ගැන කෙතෙක් දුරට ක්‍රියාකර තිබේද? (ඊ) භාර්යාව හා දරු සතර දෙනෙක් සිටින අසරණ තත්ත්වයක සිටින මේ අයට මෙතෙක් කිසිම වන්දි මුදලක් ගෙවා නැති බව එතුමා දන්නවාද? (උ) එසේ නම්, වන්දි මුදලක් ගෙවීමට කටයුතු කරනවාද?

*சுகாதார அமைச்சரைக் கேட்ட வினு: (அ) என்கந்துற, திவித்துற என்னுமிடத்தைச் சேர்ந்த திரு. ஐ. பீ. ஹென்டி என்பவர் ஒரு விபத்தில் காயமடைந்ததினுல், எல்பிட்டிய ஆஸ்பத்திரியில் அனுமதிக்கப்பட்டிருந்த பொழுது 29.6.67 அன்று இரவு 2 மணியளவில் அவர் மீது ஒரு அக்கிரமக்காரன் அமிலத்தை வீசினுன் என்பதையும் அதனுல் அவர் இப்பொழுது குருடாகிவிட்டார் என்பதையும் அறிவாரா? (ஆ) ஆஸ்பத்திரி அதிகாரிகளின் பாதுகாப்பின் கீழிருந்த காலத்தில் நடைபெற்ற இச்செயலுக்கு சுகாதாரத் திணைக்கள உத்தியோகத்தரைப் பொறுப்பாளிகளாக்க வேண்டும் என்பதை அறிவாரா? (இ) இது சம்பந்தமாக இதுவரை என்ன நடவடிக்கை எடுக்கப்பட்டிருக்கிறது? (ஈ) ஒரு மனைவியும் நாலு பிள்ளைகளுமுள்ள இந்த உதவியில்லா மனிதருக்கு ஒருவித நஷ்ட ஈடும் கொடுக்கப்படவில்லையென்பதை அவர் அறிவாரா? (உ) அப்படியாயின், நஷ்ட ஈடு கொடுப்பதற்கு அவர் வேண்டிய நடவடிக்கைகளை எடுப்பாரா?*

asked the Minister of Health: (*a*) Is he aware that while Mr. I. P. Handy of Ethkandura, Divitura, who had sustained injuries in an accident, was warded in the Elpitiya Hospital, acid was thrown on him by a dastardly individual on 29.6.67 at about 2 o'clock in the night and that consequently he is now a blind man? (*b*) Is he aware that the Health Department should be held responsible for this crime which was committed when he was under the protection of the hospital authorities? (c) What action has been taken so far in this regard? (*d*) Is he aware that no compensation whatsoever has been paid to this helpless person who has a wife and four children? (*e*) If so, will he take action to pay compensation?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන (සෞඛ්‍ය ඇමති)**

*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன—சுகாதார அமைச்சர்)*

(The Hon. M. D. H. Jayawardena—Minister of Health)

මෙම නඩුව විභාග කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය හමුවෙහි තබා ඇති බැවින්, මෙම කාරණය නඩු විභාගයකට භාජන වෙමින් පවතී.

## බුරුම තේක්ක ආනයනකරුවන්

பர்மாத் தேக்கு இறக்குமதி

BURMA TEAK IMPORTERS

1. **බී. වයි. තුඩාවේ මයා.** (මාතර—ප්‍රින්ස් ගුණසේකර මයා.—හබරාදූව—වෙනුවට)

*(திரு. பி. வை. துடாவ—மாத்தறை—திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபருதுவ—சார்பாக)*

(Mr. B. Y. Tudawe—Matara—on behalf of Mr. Prins Gunasekera—Habaraduwa)

රාජ්‍ය කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1965, 1966 හා 1967 වර්ෂවලදී බුරුම තේක්ක ආනයන කිරීම සඳහා බල පත්‍ර නිකුත් කරන ලද ආනයනකරුවන්ගේ ලැයිස්තුවක් ඉදිරිපත් කරනවාද? (ආ) නො එසේ නම්, ඒ මන්ද?

*இராஜாங்க அமைச்சரைக் கேட்ட வினா: (அ) 1965, 1966, 1967 ஆகிய வருடங்களில் பர்மாத் தேக்கு இறக்குமதி செய்வதற்கு அனுமதி அளிக்கப்பட்ட இறக்குமதியாளர்களைக்கொண்ட ஒரு பட்டியலை அவர் சமர்ப்பிப்பாரா? (ஆ) இல்லையெனில் ஏன்?*

asked the Minister of State: (*a*) Will he submit a list of importers who were issued licences to import Burma teak in 1965, 1966 and 1967? (*b*) If not, why?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*

(The Hon. J. R. Jayawardene)

(*a*) No. (*b*) No import licences are issued for the import exclusively of Burma teak.

Licences for the import of timber are issued under Quota Item 2—Wood and Lumber in the round or roughly squared, including scantlings posts and logs; and under Quota Item 42—Lumber, sawn, planed, grooved, tongued, etc., including ceiling and flooring boards.

I table a list of the importers who have been issued licences during the years 1965, 1966 and 1967 for the import of timber under Quota Items 2 and 42.

සභා මේසය මත තබන ලද ලැයිස්තුව මෙසේයි:

*சபாபீடத்தில் வைக்கப்பட்ட நிரல் வருமாறு:*

*The list tabled is as follows:*

LIST OF IMPORTERS UNDER Q. I. 2—WOOD & LUMBER IN THE ROUND OR ROUGHLY SQUARED INCLUDING SCANTALINGS, POSTS AND LOGS

1. A. M. Duraipillai & Sons,
27, Canal Row,
Colombo 1.
2. Ibrahim Jafferjee,
148, Armour Street,
Colombo 12.
3. Jafferjee Brothers,
161, Prince Street,
Colombo 11.
4. Mascons Ltd.,
175, Armour Street,
Colombo 12.
5. Perera & Sons, K. A., Ltd.,
136, Sri Sumanatissa Mawatha,
Colombo 12.
6. Chiman Lal Desai & Co.,
P. O. Box 374,
Mascons Buildings, Main Street,
Colombo. (1965 and 1966 no allocations.)
7. St. Anthony's Hardware Stores,
516, Skinner's Road South,
Colombo 10.
8. Suleman Arab,
21, Armour Street,
Colombo 12.
9. Silva, K. D. & A. D.,
180, Deans Road,
Colombo 10.
10. Aponso, G. M. S., & Co.,
16, Armour Street,
Colombo 12.
11. Burma Teak Agency,
Ambihai Mahal,
Araly East, Vaddukoddai.
12. Burma Teak Trading Co.,
62, Bloemendhal Road,
Colombo 13.
13. Carson Cumberbatch & Co. Ltd.,
P. O. Box 24,
Colombo.
14. Charles & Sons,
105, De Soysa Road,
Moratumulla, Moratuwa.
15. Fernando, P. S. & P. J. S., Ltd.,
"Saranath",
Idama, Moratuwa.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

16. Fernando, W. M. J.,
Moratumulla,
Moratuwa.

17. Walker Sons & Co., Ltd.,
P. O. Box 166,
Colombo.

## *New Comers*

18. Manel Furnishing House,
408, Moratumulla,
Moratuwa (*1966 and 1967 no allocations.*)

19. Burma Teak and General Traders,
9, Milagiriya Avenue,
Colombo 4. (*1966 and 1967 no allocations.*)

18 and 19—Not regular importers. Special issues made only during 1965.

LIST OF IMPORTERS UNDER Q. I. 42—LUMBER, SAWN, PLANED, GROOVED, TONGUED, ETC., INCLUDING CEILING AND FLOORING BOARDS

1. K. N. Abdul Cader Rawther & Co., Ltd.,
312, Skinners Road South, Colombo 10.
2. City Timber Hall,
45, Armour Street, Colombo 12.
3. Co-operative Wholesale Establishment,
21, Vauxhall Street, Colombo 2.
4. Ibrahim Jafferjee,
148, Armour Street, Colombo 12.
5. Jafferjee Bros.,
161, Prince Street, Colombo 11.
6. K. M. Kaliappah Pillai & Co., Ltd.,
263, Sea Street, Colombo 11.
7. Mascons Ltd.,
175, Armour Street, Colombo 12.
8. D. K. Mody & Co., Ltd.,
250, Skinners Road North, Colombo 12.
9. K. A. Perera & Sons, Ltd.,
136, Armour Street, Colombo 12.
10. Samuel Sons & Co., Ltd.,
P. O. Box 46, Colombo.
11. Suleman Arab,
21, Armour Street, Colombo 12.
12. St. Anthony's Hardware Stores,
516, Skinners Road South, Colombo 10.
13. Shaw Wallace & Hedges Ltd.,
P. O. Box 84, Colombo.
14. Ceylon Manufacturers & Merchants, Ltd.,
P. O. Box 1304, Colombo.
15. Chimanlal Desai & Co., Ltd.,
P. O. Box 374, Colombo. (*1966 and 1967 allocation not released.*)

වාචික පිළිතුරු

16. Oriental Hardware Stores,
322, Old Moor Street,
Colombo 12.
17. A. C. Paul,
326, Skinners Road South,
Colombo 10.
18. Walker Sons & Co., Ltd.,
P. O. Box 166, Colombo.

## කොළඹ රැකීරක්ෂා කාර්යාලයේ ලියාපදිංචි වයි. ගුණපාල මයා.

கொழும்பு தொழில்காண் நிலையத்தில் பதிவு செய்யப்பட்டிருக்கும் திரு. வை. குணபால

MR. Y. GUNAPALA, REGISTRANT, EMPLOYMENT EXCHANGE, COLOMBO

6. කේ. වයි. එම්. විජේරත්න බණ්ඩා මයා. (සොරනාතොට—රත්නසිරි වික්‍රමනායක මයා.—හොරණ—වෙනුවට)

(*திரு. கே. வை. எம். விஜேரத்ன பண்டா—சொரணத்தோட்டை—திரு. ரத்னசிரி விக்கிரமநாயக்க—ஹொரண—சார்பாக*)

(Mr. K. Y. M. Wijeratne Banda—Soranatota—on behalf of Mr. Ratnasiri Wickramanayake—Horana)

කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කොළඹ රැකීරක්ෂා කාර්යාලයේ අංක 42/කො/64/36007 යටතේ වයි. ගුණපාල නමැති කෙනෙකු ලියාපදිංචි වී සිටින බව එතුමා දන්නවාද? (ආ) දැනට සීල් 20කට වැඩි ගණනක් ඔහුගේ කාඩ්පතේ ඇති බව එතුමා දන්නවා? (ඉ) යම්කිසි රැකියාවකට ඊළඟ කැඳවීමේදී ඔහු ඇරීමට එතුමා කටයුතු කරනවාද?

*தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா: (அ) 42/கொ/64/36007 என்ற இலக்கத்துடன் வை. குணபால என்ற பெயருடைய ஒரு நபர் கொழும்பு தொழில்காண் நிலையத்தில் பதிவு செய்யப்பட்டிருக்கிறார் என்பதை அவர் அறிவாரா? (ஆ) அவரது அட்டையில் இப்பொழுது 20க்குமதிகமான புதிப்பித்தல் அடையாளங்கள் இருக்கின்றன என்பதை அவர் அறிவாரா? (இ) அடுத்த முறை தொழில்காண் நிலையத்தில் அழைப்பு நேரும்போது, இவரை அனுப்புவதற்கான நடவடிக்கைகளை அவர் எடுப்பாரா?*

asked the Minister of Labour, Employment and Housing: (*a*) Is he aware that an individual by the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේරත්න බන්ඩා මයා.]

name of Y. Gunapala has been registered in the Employment Exchange, Colombo, under No. 42/කො/64/36007 ? (*b*) Is he aware that there are at present over 20 renewal seals on his card ? (*c*) Will he take action to have this person sent up when the next call on the employment exchange occurs ?

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*
(Mr. S. de S. Jayasingha)

(අ) ඔව්. (ආ) ඔව්. (ඉ) ඔව්; සේවය ලබාගැනීමට බලාපොරොත්තුවන සේවයා ඉල්ලුම් කරනු ලබන අවශ්‍යතාවයන්ට අනුකූලවන්නේ නම්.

## විසර්ජන පනත් කෙටුම්පත 1967-68

*ஒதுக்கீட்டு மசோதா, 1967-68*

APPROPRIATION BILL, 1967-68

**කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය** [ජූලි 25].

"**පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය**"—[ගරු වන්නිනායක].

**ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.**

ஜூலை 25 ஆம் தேதிய வினா மீதான ஒத்திவைக்கப்பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

"மசோதா இப்பொழுது இரண்டாம் முறை மதிப்பிடப்படுமாக."—[கௌரவ வன்னிநாயக்க].

வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Order read for resuming adjourned Debate on Question*—[*25th July*].

"That the Bill be now read a Second time"—[*The Hon. Wanninayake*].

*Question again proposed.*

පූ. භා. 10.10

**ජෝර්ජ් රාජපක්ෂ මයා.** (මුල්කිරිගල)
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ—முக்கிரிகல)*
(Mr. George Rajapaksa—Mulkirigala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමාගේ තුන්වන අයවැය ලේඛනය පිළිබඳ විවාදයේදී මටත් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. මීට කලින් ගරු මුදල් ඇමතිතුමා අයවැය ලේඛන දෙකක් ඉදිරිපත් කර තිබෙනවා. මේ අය වැය ලේඛන තුනෙන්ම අපට එක්තරා පැහැදිලි ප්‍රතිපත්තියක් පෙනෙනවා. මේ අයවැය ලේඛන තුනේම එක්තරා පොදු ප්‍රතිපත්තියක් ගැබ් වී තිබෙනවා. ඒ ප්‍රතිපත්තිය නම් ආණ්ඩුව මේ රටේ ධනේශ්වර පන්තියට වාසි ලබාදීමට, සහනයන් සලසා දීමට නිතරම කල්පනා කිරීමයි. මේ අය වැය ලේඛනයෙනුත් එය පැහැදිලිවම ඔප්පු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජීවන වියදමත්, ශීඝ්‍රයෙන් ඉහළ යන බඩු මිළත් හය මාසයෙන් පහළ බස්වනවාය කියා එක්සත් ජාතික පක්ෂය පසුගිය මැතිවරණ කාලයේදී ජනතාවට නොයෙකුත් පොරොන්දු දුන්නා. තමන් විසින් කර ගෙන යන ලද අදක්ෂ පාලනය නිසා අවුරුදු දෙකහමාරකට පසු අද ඒ උදවියට තමන්ගේ මුදල් ඇමතිවරයා ලවා—මුදල් ඇමතිවරයාගේ මුවින්ම—කරවන ලද කථාවෙන් පිළිගන්නට සිදු වී තිබෙන්නේ දැන් මේ රටේ පවතින ජීවන වියදම එදා පැවැති තත්ත්වයට වඩා ඉහළ ගොස් තිබෙන බවයි; බඩු මිළ ඉතාම ශීඝ්‍රාකාරයෙන් ඉහළ යමින් පවතින බවයි. ඒ තත්ත්වය තමන්ම පිළිගෙන ලොවටම ඇසෙන සේ ගරු මුදල් ඇමතිතුමාගේ කටින්ම ප්‍රකාශ කරවන්නට ඒ උදවියට දැන් සිදු වී තිබෙනවා. අන්න ඒ නිසා තමයි අද මේ ආණ්ඩුව රජයේ සේවකයන්ගේ —එක්තරා ප්‍රමාණයක වැටුප් ලබන රජයේ සේවකයන්ගේ—ඇස්වලට වැලි ගැසීම සඳහා ඉතාමත් සුළු දීමනාවක් ගෙවන්නට අදහස් කරන්නේ. මොකක්ද මේ දෙන්නට බලාපොරොත්තු වන දීමනාව? මාසයකට රුපියල් සියයක් හෝ ඊට අඩු ප්‍රමාණයක් මූලික වැටුප් ලෙස ලබන රජයේ සේවකයන්ගේ මාසික වේතනයට විශේෂ දීමනාවක් වශයෙන් රුපියල් විස්සකුත්, මාසයකට රුපියල් තුන්සියයක් හෝ ඊට අඩු ප්‍රමාණයක් මූලික වැටුප් ලෙස ලබන රජයේ සේවකයන්ගේ මාසික වේතනයට විශේෂ දීමනාවක් වශයෙන් රුපියල් දහයකුත්, විශ්‍රාම වැටුප් ලබන්නන් සඳහා දවසකට ශත පහළොවකුත් වැඩි කරන්නටයි බලාපොරොත්තු වන්නේ. මොන කාරණයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පදනම් කරගෙනද මේ මුදල් ප්‍රමාණය ඒ උදවියට ගෙවන්නට යන්නෙ? ඔවුන්ගේම තර්කයට අනුව එය ගෙවන්නට අදහස් කර තිබෙන්නේ ජීවන වියදම ඉහළ යන නිසයි; බඩු මිළ ශීඝ්‍රාකාරයෙන් ඉහළ යන නිසයි.

රජයේ සේවකයන් තරමක් දුරටවත් සනසන්නට වුවමනා නිසයි මේ ආණ්ඩුව විශේෂ දීමනාවක් ගෙවන්නට කල්පනා කර තිබෙන්නේ. වැඩි වශයෙන්ම ගොවි ජනතාව වාසය කරන මැතිවරණ කොට්ඨාශයක් නියෝජනය කරන මහජන මන්ත්‍රීවරයකු වශයෙන් මා අද කරන පැමිණිල්ල එතුමා විසින් ඉදිරිපත් කරන ලද මේ අය වැය ලේඛනයෙන් මේ රටේ ගොවි ජනතාවට කිසිම සහනයක් සලස්වා නොතිබීම ගැනයි. රජයේ සේවකයන් සඳහා දෙන්නට බලාපොරොත්තු වන දීමනාවත් ඇත්ත වශයෙන්ම ඉතාමත් මදියි. මේ තැත් කර තිබෙන්නේ වංචාවකින් ඔවුන් රවටීමටයි. රජයේ සේවකයන්ගේ පඩි වැඩි කිරීම ගැන අප විරුද්ධ වන්නේ නැහැ. අප කියන්නේ දෙන ලද ඒ ප්‍රමාණය මදි බවයි. ආණ්ඩුවේ තමුන්නාන්සේලා රජයේ සේවකයා ගැන මඳක්වත් විමසිල්ලෙන් කටයුතු කරන බවක් දක්වා තිබෙන්නේ වී නමුත් මේ රටේ ගොවිජනතාව කෙරෙහි මේ අයවැය ලේඛනයෙන් කිසිම සැලකිල්ලක් දක්වා නැති බවයි පෙනෙන්නේ. ගොවි ජනතාව සන්තෝෂයට පත් වන කිසිම දෙයක් මේ අයවැය ලේඛනයෙන් කර නැති බවයි අප ඉදිරිපත් කරන පැමිණිල්ල.

ගොවිජනතාව මේ රටේ ඉතා වැදගත් පිරිසක් බව අමුතුවෙන් පැහැදිලි කර දිය යුතු දෙයක් නොවෙයි. ඒ අයටත් තිබෙනවා ජීවන වියදම පිළිබඳ ප්‍රශ්නය. ඔවුන් මේ සමාජයෙන් ඈත් වූ වෙනත් කොටසක් නොවෙයි. මේ රටේ ජීවත් වන ගොවියාත් අඳින්නට පළඳින්නට ඕනෑ. ඒ අයටත් කන්නට බොන්නට, අඳින්නට පළඳින්නට ඕනෑ. ඒ අයටත් ඉන්න හිටින්න තැනක් ඕනෑ. ඔවුන් පාවිච්චියට ගන්න හැම දෙයකම පාහේ මිළ දැන් වෙනදාට වඩා බෙහෙවින් ඉහළ ගොස් තිබෙනවා. ඒ අනුව ගොවීන්ගේ ආර්ථික තත්ත්වය උසස් වෙලා නැහැ. අදත් ඔවුන් ජීවත් විය යුත්තේ එදා පැවති ආර්ථික තත්ත්වයේ සිටිමිනුයි. ඔවුන් වෙනුවෙන් යම් සහනයක් මේ අයවැය ලේඛනයෙන් ඇති නොකර තිබීම ගැනයි අප මේ ආණ්ඩුවට විරුද්ධව මේ අවස්ථාවේ චෝදනා ඉදිරිපත් කරන්නේ. ඒ ආණ්ඩුව පෙරළා දමා මේ ආණ්ඩුව බලයට පත් වූ දා සිට මේ රටේ ගොවි ජනතාවට ක්‍රම ක්‍රමයෙන්, පියවරින්, පියවර, පහර පිට පහර ගසා තිබෙනවා. ගොවි ජනතාවත් බත් කනවා. මේ රටේ ඉන්න ගොවියාත් මේ රටේ ඉන්න සෙසු කොටස්වලට අයිති උදවිය වාගේම බත් කනවා. ඔවුන්ගේ හාල් සේරුව ආණ්ඩුවේ තමුන්නාන්සේලා උදුරා ගත්තා. එදා හාල් සේරුව ශත විසිපහ බැගින් හාල් සේරු දෙකක් දුන් කාලයේ පවා ගොවි ජනතාව එයින් මඳක් දුරට තමයි සැහීමකට පත් වී ජීවත් වුණේ. දැන් එයිනුත් සේරුවක් උදුරාගෙන තිබෙනවා. එදා තිබුණු ජීවන වියදම අනුවයි ගොවියාට වී බුසලකට රුපියල් දොළහ බැගින් ගෙව්වේ. අද ජීවන වියදම ඉහළ ගොස් තිබෙනවා. ගොවියාගේ ජීවන වියදමත් ඉහළ ගොස් තිබෙනවා. ඒ කොයි හැටි වෙතත් සහතික මිළ ක්‍රමය යටතේ අදත් ගොවියාට ගෙවන්නේ දොළහක් පමණයි. වී බුසලකට සහතික මිළ ක්‍රමය යටතේ ගෙවනු ලබන මිළ වැඩි කරන්නට මේ ආණ්ඩුව තවමත් කල්පනා කර තිබෙන බවක් අපට පෙනෙන්නට නැහැ. එදා ශත 25කට ගත් හාල් සේරුවට අද ආණ්ඩුවේ ගණන් අනුව ගොවියා ශත 85ක් ගෙවන්නට ඕනෑ. ගරු අගමැතිතුමාත්, ගරු මුදල් ඇමතිතුමාත් නොයෙක් අවස්ථාවල කියා තිබෙනවා අද වෙළෙඳ පොළේ හාල් සේරුව ශත 85 බැගින් ගන්නට පුළුවන් කමක් ඇති බවක්. බෙලිඅත්තේ ගරු මන්ත්‍රීතුමා හෙවත් රාජ්‍ය ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාත් කියනවා දැන් හාල් සේරුවක් ශත 85කට ගන්නට පුළුවන් බවක්. ඒ ගණනට හාල් ගන්නට තිබෙන්නේ කොහේදැයි කියන්නට මට පුළුවන්කමක් නැහැ .ඒ හාල් මුට්ටයෙන්ම මටත් හාල් ගන්නට පුළුවන් නම් හොඳයි.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
ජාතික වෙළෙඳ පොළේ තියෙන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)

ජාතික වෙළෙඳ පොළේ ශත අසූපහ බැගින් හාල් සේරුවක් ගන්නට තිබෙන වාද? ජාතික වෙළෙඳ පොළෙන් හාල් සේරුවක් ශත 85 බැගින් ගන්නට මා නියෝජනය කරන කොට්ඨාශයේ ජනතාවට පුළුවන් කමක් නැහැ. ඒ අයට ඒ හාල ගන්නට මෙහාට එන්නට වුවමනාවක් නැහැ. ඒ නිසා සහතික මිළ වැඩිකර නැති බවයි මා කියන්නේ. හාල් සේරුව කපා තිබෙනවා. ජීවන වියදම වැඩි වී තිබෙන බව ආණ්ඩුවත් පිළිගන්නවා. එහෙත් මේ අය වැය ලේඛනයෙන් ගොවියාට කළ සහනය කුමක්ද? ඒ ප්‍රශ්නයට ආණ්ඩු පක්ෂයේ තමුන්නාන්සේලා අපට පිළිතුරු දෙන්න. එදා මෙන්ම අදත් ගොවියා දිය බද්දත්, අක්කර බද්දත්, රක්ෂණ බද්දත් ගෙවන්නට ඕනෑ. ඒවා අදත් එදා මෙන්ම තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මේ ආණ්ඩුව අදත් ඒ අයට කිසිම සහනයක් ලබා දී නැහැ. මේ අයවැය ලේඛනයෙන් දී තිබෙන සහනය මොකක්ද? එදා අපේ පළාත්වල ආණ්ඩුවේ ඉඩම් බද්දට ගත් අයට ගෙවන්නට සිදු වී තිබුණේ අක්කරයකට ශත පණහයි, රුපියලයි, නැත්නම් රුපියලකුත් ශත පණහයි. එහෙත් මේ රජය බලයට පත් වුණාට පසු ඒ ගම් මායිම් තුළ පවත්නා තක්සේරු අනුව සියයට 4ක බද්දක් අය කිරීම නිසා සමහර තැන්වල බිම් බදු වශයෙන් රුපියල් 10, 15, 18 ගෙවන්නට සිදු වී තිබෙනවා. මගේ කොට්ඨාශයේ රම්මලේ කන්ද උස් බිම් ව්‍යාපාරයේ, මීට කලින් රුපියල් 1.50 ගෙවූ තැනැත්තාට දැන් රුපියල් 35ක් ගෙවන්නට සිදු වී තිබෙනවා. මේ විධියට තමුන්නාන්සේලා ගොවි ජනතාවගෙ කර පිට බදු බර පටවා ඔවුන් පීඩනයෙන් පිඩන යට පත් කළ බවටයි, අප ප්‍රධාන වශයෙන් තමුන්නාන්සේලාට චෝදනා කරන්නේ. එහෙත් වේදිකා මත නම්, අතුරු මැතිවරණ වලදී නම් තමුන්නාන්සේලා ගොවියාව රජ කරවන්නටයි, කථා කරන්නේ. තමුන්නාන්සේලා ගොවියාව රජ කරවන්නේ ගොවියාගේ බදු බර වැඩි කරලා; ගොවියාගේ හාල් සේරුව උදුරාගෙන.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රජය මේ අයවැය ලේඛනයේ ඉතාමත්ම ආඩම්බරයෙන් කියනවා, ගොවියාට ණය පහසුව සලස්වා දෙනවාය කියා. අක්කරයකට දෙන ණය ප්‍රමාණය රුපියල් 175 සිට 220 දක්වා වැඩි කර තිබෙනවාය කියනවා. මහා බැංකුව මාර්ගයෙන්ලු ණය දෙන්නේ. මෙහි ප්‍රතිඵලය වන්නේ කුමක්ද? අපේ රජය යටතේත් ගොවියාට ණය පහසුකම් සලස්වා තිබුණා. එදා ගොවියාගෙන් අය කෙළේ සියයට 6ක පොළියක් පමණයි. එහෙත් මේ රජය අද ගිනි පොලී අය කරනවා; හෙට්ටින් ගන්න පොලී අය කරනවා. රාජ්‍ය ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා කියනවා, එසේ පොළී අය කිරීම සාධාරණය කියා. එතුමාට නම් එසේ පොළී අය කර පුරුදු ඇති. ගොවියාගේ ගෙළ මිරිකා සියයට 12ක පොළියක් අරගෙනයි, මේ රජය ගොවියාව රජ කරවනවාය කියන්නේ මේ රජය ගොවියාගෙන් ඔය විධියට අසාධාරණ පොළී අය කළොත් ගොවියා හිඟමනට පත් වන බවට කිසිම සැකයක් නැහැ. ගොවියාව රජ කරවන්නට යනවාය කියා බොරු කරන්නේ නැතිව ගොවීන්ට දෙන ණය සඳහා කලින් අය කළ ආකාරයට සියයට 6ක් පොළියක් අය කරන ලෙස ගොවි ජනතාවගේ නාමයෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රජය ආහාර වගාව ගැන කොයි තරම් කථා කළත් ඔය විධියට ගොවියාගේ සහයෝගය ලබා නොගෙන එය කරන්නට පුළුවන් කමක් නැති බව මා මතක් කරන්නට සතුටුයි. ආහාර අතින් මේ රට ස්වයම් පෝෂිත වෙනවා නම් අපත් බොහොම කැමතියි. තමුන්නාන්සේලාගේ ආහාර වගා කිරීමේ ව්‍යාපාරයට සහයෝගය දෙන්නට අපත් නිතරම සූදානම්. එහෙත් මේ රටේ ආහාර වගා කිරීමට පුරුද්දක් තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ ගොවීටන්ට පමණක්ද කියා මා අහන්නට සතුටුයි. තමුන්නාන්සේලා ආහාර වගා කරන්නට හැම තැනම බට ගොවි හමුදා ඇති කරනවා. මේක ජාතික ප්‍රශ්නයක් නම් මේ ප්‍රශ්නය විසඳීමට මුළු ජාතියේම සහයෝගය වුවමනා නම් සියළුම ගොවීන් මේ ව්‍යාපාරයට සහභාගි කරවා ගන්නෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැත්තෙ ඇයි? තමුන්නාන්සේලාගේ බට ගොවි හමුදාවලට බඳවා ගන්නා අය තෝරන විට ඔවුන්ගේ දේශපාලන පසු බිම ගැන සොයා බලන්නේ ඇයි? එක්සත් ජාතික පක්‍ෂයේ අනුගාමිකයන්ට පමණක් ද කැත්ත, උදැල්ල පාවිච්චි කරන්නට හුරු පුරුද්ද තිබෙන්නේ? ඒ නිසා තමයි, අපේ සිත්වල භයක් තියෙන්නේ. ආහාර වගා කිරීමේ මුවාවෙන් තමුන්නාන්සේලා පැසිස්ට්වාදී උණ්ඩ හමුදාවක් හදනවා, මර්දන නීති මගින් මේ රටේ ජනතාව පාගා මරා දමන්නට. එසේ නැත්නම් මන්ද, මගේ කොට්ඨාශයේ ගොවි හමුදාවට බඳවා ගන්නා අය තෝරන විට එක්සත් ජාතික පක්‍ෂයේ පරාජිත අපේක්ෂකයාගේ ලැයිස්තුවට ඇතුළත් වුණු අය පමණක් තෝරා ගත්තේ? කරුණාකර එයට උත්තර දෙන්න. මගේ කොට්ඨාශයේ පමණක් නොව අනෙක් පළාත්වලත් එය සිදු වෙනවා. ආහාර අතින් මේ රට ස්වයම්පෝෂිත කිරීමට තමුන්නාන්සේලා බලාපොරොත්තු වන්නේ එක්සත් ජාතික පක්‍ෂයේ අනුගාමිකයන්ගේ සහයෝගය පමණක් අර ගෙනද? එසේ නම් කවදාවත් මේ රට ස්වයම්පෝෂිත වන්නේ නැති බව හිතේ තබා ගන්න. කැත විධියට දේශපාලන පසු බිම ගැන බැලීම දන්වත් පැත්තකින් තබා මේ ප්‍රශ්නය ජාතික ප්‍රශ්නයක් හැටියට සලකා විසඳන්නට ලැස්ති වන ලෙස මා ඉල්ලා සිටිනවා.

මේ රටේ ධනේශ්වර පන්තියට නම්, ධනපති කොම්පැනි කාරයන්ට නම්, මුසාජීලාට නම් තමුන්නාන්සේලා සෑම පහසුකමක්ම සලස්වා දී තිබෙනවා. තේ වගාව ගැන බලන්න. තේ වගා කරන්නට තොන්ඩමන් මහත්මයාටත් තමුන්නාන්සේලා අක්කරයකට රුපියල් 3,000ක් දෙනවා. නුවරඑළියේ මන්ත්‍රී ඩොනල්ඩ් රණවීර මහත්මයාටත් තමුන්නාන්සේලා අක්කරයකට රුපියල් 3,000ක් දෙනවා. ධනපති ස්ටර්ලිං කොම්පැනිවලටත් මේ ආධාරය ලැබෙනවා. තේ වතු අයිතිකාරයන්ට සලකන්නේ ඒ විධියටයි. මේ අතර රබර් වතු අයිතිකාරයන්ට රබර් නැවත වගා කිරීම සඳහා අක්කරයකට රුපියල් 1,500 බැගින් දෙනවා. පොල් වතු අයිතිකාරයන්ටත් ආධාර දෙනවා. කාටද ආධාර නොදෙන්නේ? ධනපතියන් නොවන පැඟිරි කර්මාන්තකාරයන්ටයි; ධනපතියන් නොවන ගොවියන්ටයි. ධනපතියාට තේ අක්කරයක් වැවීම සඳහා රුපියල් 3,000 ක් දෙනවා. එහෙත් අසරණ ගොවියාට පෝර ගැනීම සඳහා සුළු මුදලක් දෙන්නේත් සියයට 12 ක පොළියකටයි. මෙම හත් හවුල් රජයේ ධනේශ්වර පංති ස්වරූපය එයින් පැහැදිලි වෙනවා. ගොවියන් රජ කරවන්නට යයි කියමින් තේ වගා කිරීම සඳහා, රබර් වගා කිරීම සඳහා ධනපතියන්ට සල්ලි දෙනවා, ආධාර දෙනවා. ගොවියන්ට ආධාර දෙන්නේ නැහැ. වී වගාව සඳහා ගොවියන්ට ආධාර දෙන්නේ නැහැ.

හැමදාම විදේශ විනිමය ප්‍රශ්නය ඉදිරිපත් කරනවා. මේ රටේ ආහාර වගාව දියුණු කරන්නේ විදේශ විනිමය ඉතුරු කර ගන්ටලු. මේ ආණ්ඩුව කියන පරිදි පසුගිය මහ කන්නයේදී වී ඇස්වැන්න විශාල ලෙස වැඩිවුණා නම් ඒ ප්‍රමාණය අනුව විදේශ විනිමය ඉතුරු වන්නට ඕනෑ නේද? එහෙම නම් ඇයි විනිමය පාවිච්චි කොට අපේ ගොවියන්ට ට්‍රැක්ටර්ස්, වීඩර්ස්, ඩස්ටර්ස්, ස්ප්‍රේයර්ස් සහ පෝර ලබා නොදෙන්නේ? ඇයි මේ රටේ ගොවියන්ට ඒවා නිකම් දෙන්නට බැරි? තේ වගා කිරීම සඳහා ධනපතියන්ට අක්කරයකට රුපියල් 3,000 බැගින් දෙන්නට පුළුවන් නම් අපේ ගොවියන්ට උවමනා කරන උපකරණ සහ පෝර නොමිලේ ලබා දෙන්නට බැරි ඇයි? වෙන ආධාරයක් දෙන්නට බැරිනම් උපකරණ ටිකත් පෝර ටිකත් දෙන්නට ඕනෑ නේද? මෙයින් පෙනී යන්නේ ඉඩම් හිමි ධනේශ්වර කොම්පැනිකාරයන්ට විශේෂ සැලකිල්ලක් දක්වන බවයි. ගරු ඉඩම් ඇමතිතුමා නම් මේ අවස්ථාවේදී මෙහි නැහැ.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.** (මීගමුව)
(*திரு. என். டென்சில் பெர்னாண்டோ—நீர்கொழும்பு*)
(Mr. N. Denzil Fernando—Negombo)

ජීප් ගත්තෙ නැද්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)

ඔව්, ගත්තා. ඒවා පාවිච්චි කරමින් වඩා හොඳට අල බතල සිටුවනවා. තමුන්නාන්සේලා සිටුවන්නේ කටින් විතරයි. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The hon. Member for Negombo is speaking next. He might refrain from interruption.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව තිබෙද්දී කුඹුරු පනත ඇති කෙළේ අධිපතියන්ගේ, ගම්භාරයන්ගේ, ලොකු ඉඩම් හිමියන්ගේ ග්‍රහණයෙන් අහිංසක ගොවි ජනතාව මුදා ගැනීමටයි. එහෙත් අද සිදු වී තිබෙන්නේ කුමක්ද? අද අද ගොවියා එදාටත් වඩා අසරණ වෙලා. පරම්පරා ගණනක් තිස්සේ තමන් වැඩ කරගෙන ආ කුඹුරුවලින් අද ඔවුන් පන්නා දමා තිබෙනවා. අද ඔවුන් නිදැල්ලේ අතරමං වී සිටිනවා. මේ ආණ්ඩුවට කීප වතාවක්ම මතක් කරන ලද නමුත් කුඹුරු පනත යටතේ පිහිටු වන ලද සමීක්ෂණ මණ්ඩල හිර වී තිබෙන අභියාචනා ගැන ක්‍රියා කොට ඒ අසරණ අද ගොවියන්ට නැවත වරක් තමන් වැඩ කරගෙන ආ කුඹුරු වැඩ කරගෙන යෑමට ඉකුත් අවුරුදු දෙක හමාර තිස්සේම සැලසුවේ නැ. දැනට අභියාචනා 20,000 ක් ඒ සමීක්ෂණ මණ්ඩල ඉදිරියේ තිබෙනවා. ඒ අද ගොවීන් අසාධාරණ ලෙස පන්නා ඇති බව සහකාර ගොවිජන සේවා කොමසාරිස්වරුන් විසින් කියනු ලැබ ඇති අවස්ථා බොහෝයි. එහෙත් ඒ තීරණයට විරුද්ධව අභියාචනා කර තිබෙනවා. එසේ වුවද සමීක්ෂණ මණ්ඩල ක්‍රියා විරහිතයි. සමීක්ෂණ මණ්ඩලවල වැඩ කටයුතු ඉක්මන් නොකිරීමෙන් අසරණ ගොවීන් අතරමං කර තිබෙනවා. මේ ආණ්ඩුව ආහාර වගා කරන්නේ මෙහෙමයි. මේ ආණ්ඩුව මේ රටේ ගොවි ජනතාවගේ සහයෝගය ලබා නොගෙන ආහාර වගා කිරීමේ ව්‍යාපාරය සාර්ථක කර ගන්නට බැහැ. එසේ හෙයින් ගොවි ජනතාව ඉදිරිපිට තිබෙන මෙම ප්‍රශ්නය නිරාකරණය කරන්න. අද ගොවියාට නීත්‍යානුකූල අයිතිවාසිකම් දෙන්න. ඒ අයිතිවාසිකම් ලබා දීම, ලොකුම යුතුකමයි. මෙම ආණ්ඩුව ඒ යුතුකම ඉටු නොකිරීම ගැනයි, අපේ ප්‍රධාන චෝදනාව ඉදිරිපත් වන්නේ. ගොවි ජනතාවගේ සහයෝගය නොලබා මේ රටේ ආහාර වගාව සාර්ථක කර ගන්නේ කොහොමද? මුසාජීලා ලවා මේ රටට වුවමනා කරන ආහාර වගා කරනවා යයි කීවාට අපට ඒකට මුලා වන්නට බැහැ.

කුඹුරේ සිටින ගොවියා මඩ සෝදා ගත් කල රජකම් කරන්නටද සුදුසු බව මේ ආණ්ඩුවේ උදවිය වේදිකාවලදී කියනවා. රොබට් නොක්ස් මේ ගැන සඳහන් කර තිබෙන බව වේදිකාවලදී කියනවා. එහෙත් ක්‍රියාවේදී ගොවීන් අමතක කරනවා. ක්‍රියාවෙන් සලකන්නේ ධනපතියන්ටයි; ඉඩම් දෙන්නේ ට්‍රැක්ටර් දෙන්නේ ධනපතියන්ටයි; මුසාජී වැනි කෙම්පැනිවලටයි. ගොවියාට හුළං. කරුණාකර ගොවියාට වුවමනා කරන උපකරණ ටික ලබා දෙන්න. නම්බුනාමවලින් වැඩක් නැහැ. නම්බුනාම ඕනෑ නැහැ. ඒ වෙනුවට උපකරණ දෙන්න; ට්‍රැක්ටර්ස් දෙන්න; වීඩර්ස් දෙන්න; ඩස්ටර්ස් දෙන්න; ස්ප්‍රේයර්ස් දෙන්න; පෝර දෙන්න. ධනපති තේ වතුකාරයන්ට දෙන්නට පුළුවන් නම් කුඹුරු ගොවිතැන් කරන ගොවීන්ට දෙන්නට බැරි ඇයි? ගොවීන්ට ජීප් ඕනෑ නැහැ. අන්න ඒ නිසයි මා **මෙහෙම කියන්නේ.**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් කරුණක් කියන්නම්. ඒ, ඉඩම් බෙදාදීම සම්බන්ධවයි. උඩවලවේ මිටියාවතට අයිති හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉඩම් බෙදාදීමේදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිටින ඉඩම් නැති ගොවීන්ට ප්‍රමුඛස්ථානය දිය යුතුයි කියා මා මේ ගරු සභාවේදී ගරු ඉඩම් ඇමතිතුමාගෙන් ඉල්ලීම් පිට ඉල්ලීම් කර තිබෙනවා. ඔක්කොම ඉඩම් අපි ඉල්ලන්නේ නැහැ. අප ඉල්ලා සිටින්නේ ඒ ප්‍රදේශයේ ඉඩම් නැති අයට සියයට 50 ක් වත් දිය යුතුයි කියලයි. එය සාධාරණ ඉල්ලීමක්. එහෙත් ඉඩම් ඇමතිතුමා කරන්නේ මොකක්ද? ඊයේ පෙරේද කච්චිකරුවන් තෝරන්නට ඉඩම් කච්චේරියක් පැවැත්වුවා. හම්බන්තොට දිස්ත්‍රික්කයට වෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කර තිබෙන්නේ ඉඩම් කට්ටි 700 යි. එය සාධාරණද කියා මේ ආණ්ඩුවේ ඉඩම් ඇමතිතුමාගෙන් හා මේ ආණ්ඩුවෙන් මා ප්‍රශ්න කරනවා. [බාධාකිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The hon. Member for Dambulla has a seat on the front bench. He takes a seat behind and interrupts.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හම්බන්තොට දිස්ත්‍රික්කයට වෙන් කර තිබෙන්නේ ඉඩම් කට්ටි 700 යි. තමන්ගේ ඇමතිතුමා ගත් ඒ තීරණයට රාජ්‍ය ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා හා හම්බන්තොට ගරු මන්ත්‍රීතුමා (සී. එජ්. ඩබ්ලිව්. එදිරිසූරිය මයා.) කැමතිද කියා මා අහන්න කැමතියි. මාතර දිස්ත්‍රික්කයට ඉඩම් කට්ටි 1,500 යි. මෙවර ඉඩම් කට්ටි ලබාගැනීම සඳහා ඉල්ලුම් පත්‍ර 38,000 ක් පමණ හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් ලැබී තිබෙනවා. එමෙන්ම මෙවර කට්ටිකරුවන් තෝරන්නට අමුතු ක්‍රමයක් පටන් ගෙන තිබෙනවා. ඉඩම් බෙදා දීමේදී අනුගමනය කිරීම සඳහා උපදෙස් මාලාවක් සියළුම කච්චේරිවලට චක්‍රලේඛනයක් වශයෙන් නිකුත් කර තිබෙනවා. මා හෝඩියේ සිටිය දී අපට ඉංගිරිසියෙන් ඉගැන්නුව Three Blind Mice කියා කථාවක්. තමුන්නාන්සේත් එය දන්නවා ඇති. ඇමතිතුමයි, පාර්ලිමේන්තු ලේකම්තුමයි, ස්ථිර ලේකම්තුමයි කියන තුන්දෙනා තමයි ඒ Three Blind Mice කියන තුන්දෙනා. ඒ අය—running after the farmer's wife—ගොවියාගේ අඹුව පස්සේ එළවීමට පටන් ගෙන තිබෙනවා. ඒ චක්‍රලේඛනය අනුව නොයෙකුත් ප්‍රශ්න අසා තිබෙනවා. වෙනදා ඉඩම් කච්චේරි පවත්වන විට ඉදිරිපත් වන්නේ ගොවියා පමණයි. තමන්ට ඉඩම් නැත, දරුවන් මෙපමණ සිටිනවා, යනාදී වශයෙන් තමන්ගේ සුදුසුකම් කියන්නේ ගොවියායි. මේ චක්‍ර ලේඛනයේ හැටියට වෙනමම පෝරමය තිබෙනවා; එහි නොයෙක් නොයෙක් කොටස් තිබෙනවා. පළමුවැනි කොටස ගෙවිලියගේ නම, ගම, වයස, උස, මහත, දිග, පළල, බර Weight of the farmer's wife ඉඩම් ඇමතිතුමා ගොවියාගේ පවුලේ බර සොයන්නේ මොකටද? මා එය අහන්නට ඕනෑ. මේ නිලධාරීන්ට පුළුවන්ද ඉඩම් කච්චේරිවලට තරාදි අරගෙන යන්න, ගෙවිලියගේ බර කිරන්න. ඒවා මොකටද?

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

කුඹුරේ එරුණොත් කියල.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)

මෙන්න මේ අන්දමට මෙවැනි චක්‍රලේඛන නිකුත් කර මෙවැනි උපදෙස් දී තිබෙන නිසා ඉඩම් ඉල්ලන්න තනියම කච්චේරියට යන්නට ගොවියාට පුළුවන් කමක් නැහැ; ගෙවිලියත් එක්කරගෙන යන්නට ඕනෑ. [බාධාකිරීම්] ඒ නිසා ඒ සම්බන්ධව මගේ විරුද්ධත්වය මේ ගරු සභාවේදී ප්‍රකාශ කරන්නට ඕනෑ. ගරු ඉඩම් ඇමතිතුමා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවි ජනතාවගෙන් පළිගෙන තිබෙනවා. මුල්කිරිගල මන්ත්‍රීතුමා කරන්නෙත් පෙඩරල් පක්ෂයේ ඉල්ලීමක් යයි එතුමා කියා තිබෙනවා. මුල්කිරිගල මන්ත්‍රීතුමා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉඩම් නැති ගොවීන් වෙනුවෙන් ඉඩම් ඉල්ලා සිටින විට කැකනදුරේ එක්තරා ස්ථානයක රැස්වීමකදී ඉඩම් ඇමතිතුමා කියා තිබෙනවා ඔහු ඒ කරන්නේ පෙඩරල් පක්ෂයේ ඉල්ලීමක්ය කියලා. එයින් තවත් දෙයක් ඔප්පු වුණා. පෙඩරල් පක්ෂය විසින් උතුරු නැගෙනහිර පළාත්වල ඉඩම් දෙමළ ජනතාවට පමණක් දෙන්නය කියා ඉල්ලා සිටින බවත් එයින් ඔප්පු වෙනවා. අපි අහන්නේ එය ඇත්තද නැත්තද කියායි. උතුරේ සහ නැගෙනහිරේ ඉඩම් දෙමළ උදවියට පමණක් දෙන්න තමුන්නාන්සේලා පොරොන්දු වී සිටිනවාදැයි අපි මෙපමණ කලක් චෝදනා කළේ නිකරුණේද? මට පිළිතුරු දෙන්නට ගොස් ඒ බළලා මල්ලෙන් එළියට පැන්නා. ඉඩම් ඇමතිතුමා කතා කරන විට අප ඊටත් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

ගරු මුදල් ඇමතිතුමා මෙම අයවැය ලේඛනය සකස් කර තිබෙන්නේ විදේශ විනිමය ආරක්ෂා කර ගැනීමේ පරමාර්ථය ඇතුව බව කියනවා. ස්වදේශ කටයුතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් රාජපක්ෂ මයා.]

භාර ගරු ඇමතිතුමා හැමතැනම ගොස් කියනන්නේ "මේ රටට වුවමනා කරන රෙදි පිළි මේ රටෙහිම නිපදවනවා" යනුවෙනුයි. එතුමා කුරුඳුවත්තේ අම්මණ්ඩිලා මනිපුරි, කාංචිපුරම්, කටාවොයිල් එහෙම අඳින නිසා ඒ උදවියට කස පහර දෙනවායැයි තර්ජනය කර තිබෙනවා. මේ රටට වුවමනා රෙදි ප්‍රමාණය මේ රටේ තරුණ තරුණියන් ලවා සකස් කරවනවා නම් විරුද්ධ පාර්ශ්වය ඊට බොහොම කැමැත්තෙන් සහාය දෙන බව කියන්නට කැමතියි. මීරිගම ගරු මන්ත්‍රීතුමිය (ඔබේසේකර මිය.) කතා කරන විට ඒ ගැන විස්තර වශයෙන් කියනවා ඇති. විදේශ විනිමය ආරක්ෂා කර ගැනීමට වුවමනා නම් තමුන්නාන්සේලාගේ මුළු ඇමති මණ්ඩලයම රටට ආදර්ශමත් පරිදි කටයුතු කළයුතුව තිබෙනවා. නිරපරාදේ විදේශ විනිමය නාස්ති කරන්න එපා.

ගරු අධිකරණ ඇමතිතුමා 1965 දී ගරු අගමැතිතුමා වෙනුවෙන් පොදු රාජ්‍ය මණ්ඩලීය අගමැතිවරුන්ගේ සම්මේලනයකට සහභාගි වීම පිණිස එංගලන්තයට ගියා. නෛකශ්‍රීන් විරාජමාන දෙවන එලිසබෙත් මහා රාජිනීන් වහන්සේ වෙසෙන බකිංහැම් මාලිගයේ පියගැට පෙළ නැගගෙන ගොස් එතුමිය ඉදිරිපිට දණ්ඩ නමස්කාර කිරීමේ අවස්ථාව ඒ ගමනේදී ගරු අධිකරණ ඇමතිතුමාට ලැබුණා. ලංඩන් නුවර ලංකා මහකොමසාරිස්වරයා හමුවී ලංකාවේ විදේශ විනිමයෙන් පවුම් 375ක් ලබා ගත්තා. ඒ පවුම් 375 ලබාගෙන අධිකරණ ඇමතිතුමා පළමුවෙන්ම කළේ කුමක්ද? මහරජින බැහැ දැකීම පිණිස අළුත් සූට් එකක්—කළු කෝට් එකයි, කළු කලිසමයි—මසා ගැනීමයි. ලංකාවේ මුදලින් රුපියල් 1,760 ක් වටිනා එම සූට් එක ඇඳ ගෙනයි, ගරු අධිකරණ ඇමතිතුමා රජින බැහැ දැකීමට ගියේ.

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ள)*
(Mr. T. B. Tennekoon—Dambulla)
මහජන මුදල්ද?

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)
මහජන මුදල් තමා. ඒ මොන විධියේ සූට් එකක්ද? හල් මිල්ල සූට් එකක්ද? බුරුත සූට් එකක්ද? සූට් එකකට රුපියල් 1,760ක් වියදම් කළේ මොකටද? අපේ කර්මාන්ත ඇමතිතුමා කියනවා, "ඩී. අයි. සපත්තු හොඳයි, ඒවා පිටරටවලට පවා පටවනවා" යනුවෙන්. නමුත් අධිකරණ ඇමතිතුමාට ලංකාවේ ඩී. අයි. සපත්තු හොඳ නැහැ. එංගලන්තයේ බොන් ස්ට්‍රීට් එකෙන් සපත්තු දෙකකුත් මහා ගත්තා. රජයේ නිලධාරීන්ට winter clothing allowance යනුවෙන් සීත කාලයට ඇඳුම් කට්ටල සපයා ගැනීම සඳහා රුපියල් 400ක දීමනාවක් ලැබෙනවා. අධිකරණ ඇමතිතුමා ගියේ ජූනි මාසයේදියි. In summer, Mr. Deputy Speaker. ජූනි මාසයේ එංගලන්තයට ගිහින් ලංකාවේ විදේශ විනිමයෙන් සීතලට අඳින්න රුපියල් 1,760 කට ඇඳුම් කට්ටලයක් මසාගෙනයි, මහරජින බැහැ දකිනන්ට ගියේ. මේ පිළිබඳව භාණ්ඩාගාරයෙන් ප්‍රශ්නයක් මතු කළා. අධිකරණ ඇමතිතුමා අවුරුදු එකහමාරක් ලියුම් ගනුදෙනු කර තිබෙනවා, මේ පිළිබඳව. දාතම ඇතුව ඒ ලියුම් පත්‍රවල පළවුණා. "කළුකෝට් මහපු හැටි මෙන්න" යනුවෙන් මා ළඟ තිබෙන පත්‍රයේ ඒ ගැන සඳහන් වී තිබෙනවා.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்ணண்டோ)*
(Mr. Denzil Fernando)
ඇත්තද?

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)
හරි ඇත්ත. මා අභියෝග කරනවා, බොරුවක් නම් ඔප්පු කරන ලෙස. වග කීමක් ඇතුවයි මා කතාකරන්නේ. [බාධා කිරීමක්] තමුන්නාන්සේ උසාවියට අඳින කළු කෝට් එක රුපියල් 1,760 ක් වටින්නේ නැහැ. ඒවා සුළු දේවල්. මේ ගැන කතා කරන්න එපා.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்ணண்டோ)*
(Mr. Denzil Fernando)
තමුන්නාන්සේත් අඳිනවා.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)
අපි අඳින්නෙ ලංකාවෙ ඒව. අප කවදාවත් ලංකාවේ මුදල් මේ විධියට නාස්ති කළේ නැහැ. [බාධාකිරීම්] මේව හොඳට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අහගන්න. අන්තිමේදී මොකද වුණේ? අධිකරණ ඇමතිතුමාත් විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයත් එංගලන්තයේ ලංකා මහා කොමසාරිස්තුමාත් අතර අවුරුදු එකහමාරක් තිස්සේ ලියුම් ගනු දෙනු වුණා. අවුරුදු එකහමාරකට පසුව අධිකරණ ඇමතිතුමා ඒ රුපියල් 1,760න් එතුමාට අයිති රුපියල් 400 ක් අරගෙන ඉතිරි රුපියල් 1,300 කුත් ගණනක් ආපසු ලංකාවේ භාණ්ඩාගාරයට රුපියල්වලින් ගෙවා තිබෙනවා. අද කළුකඩේ පවුමක වටිනාකම රුපියල් 31 යි නැත්නම් 32 යි. එහෙත් අධිකරණ ඇමතිතුමාගේ මේ ගනුදෙනුවේදී එතුමා ගණින් බේරා තිබෙන්නේ පවුමක් රු. 13.13 බැගිනුයි. ඒත් අවුරුදු එකහමාරකට පසුවයි. මේ රජයේ ඇමතිවරුන් ක්‍රියා කරන්නේ මේ විධියට නම් මහජනයාගේ සහයෝගයක් මේ රජය බලාපොරොත්තු වන්නේ කොහොමද? හැකි නම් මේ කාරණය බොරුවක්යයි ඔප්පු කරන ලෙස මා රජයට අභියෝග කරනවා. අධිකරණ ඇමතිතුමා රු. 1,760 ක සූට් එකක් මැසුවේ නැතැයි කියන්න, පුළුවන් නම්.

ඒ වාගේම මා මතක් කරන්නට කැමතියි, ගියවර අයවැය ලේඛනය ඉදිරිපත් කළ අවස්ථාවේදී—එම සිද්ධිය ප්‍රවෘත්ති පත්‍රවල පවා පළ වුණා—එම කථාව රාජ්‍ය භාෂාවෙන් නොකිරීම නිසා විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් 21 දෙනකු නැඟිට ගිය බව. මේ වතාවේ වුණේ, ඊට වඩා වෙනස් සිද්ධියක්. මෙවර අයවැය ලේඛනය ඉදිරිපත් කළ අවස්ථාවේදී ගරු මුදල් ඇමතිතුමා පිටුපස හැරී ආණ්ඩු පක්ෂයේ පසුපස ආසන දිහා බැලුවා නම් එතුමාට දකින්නට තිබුණා, ඒ අවස්ථාවේ තිබුණේ හිස් ආණ්ඩු පක්ෂයක් නැත්නම් හිස් ආසන බව. මුදල් ඇමතිතුමාගේ අයවැය ලේඛනවලින් හෙම්බත් වී සිටින නිසා දැන් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ට පමණක් නොව ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට පවා එතුමාගේ අයවැය ලේඛන එපා වී තිබෙන බව හොඳ හැටි පැහැදිළියි. මුදල් ඇමතිතුමා සාර්ථක අයවැය ලේඛනයක් ඉදිරිපත් නොකළ බව ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් පවා පිළිගන්නා බවට, එය හොඳ නිදර්ශනයක්.

ජීවන වියදම හා බඩු මිළ සම්බන්ධයෙනුත් මේ ගරු සභාවේ බොහෝ තර්ක විතර්ක ඇති වුණා. "අපේ කොට්ඨාශවල නම් ඕනෑ තරම් හාල් තිබෙනවා, ඕනෑ තරම් ලූනු තිබෙනවා, ඕනෑ තරම් නෙස්ප්‍රේ තිබෙනවා" යනුවෙන් සමහර ගරු මන්ත්‍රීවරුන් කියනවා අපට අහන්නට ලැබුණා. ඒ ඒ ද්‍රව්‍ය සුලබව තිබෙන බව ඒ ගරු මන්ත්‍රීවරුන් සඳහන් කළා. එහෙත් ඒ ගැන ඒ තරම් කථා කරන්නට දෙයක් නැහැ. ඉස්සර සිංහල රජ කාලයේ, රටේ ඇති නොයෙකුත් අඩුපාඩුකම් ගැන සොයා බැලීමට වෙස් වළාගෙන යන සිරිතක් සිංහල රජවරුන් අතර තිබුනා.

අපේ අගමැතිතුමා දැන් ආහාර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයට, රට සංවර්ධනය කිරීමේ ව්‍යාපාරයට බැස තිබෙනවා. එහෙත් එතුමා රටේ සංචාරය කරන්නේ වෙස් වළාගෙන නොවෙයි. ගුවන් විදුලියෙන් ප්‍රකාශ කර, දිසාපතිවරුන්ට දැනුම් දී ලොකු ප්‍රසිද්ධියක් කරලයි අගමැතිතුමා රටේ සංචාරය කරන්නෙ. එමනිසා රටේ සංවර්ධනය ගැනවත් රටේ කෘෂිකර්ම දියුණුව ගැනවත් වෙනත් කටයුතු ගැනවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දූෂණ ක්‍රියා ගැනවත් අගමැතිතුමාට නියම අවබෝධයක් ලබාගන්නට බැහැ. අගමැතිතුමා පළමුවෙන් ලොකු ප්‍රසිද්ධියක් කර මේ සංචාරවල යෙදෙන නිසා මේවායේ කෙරෙන හොර මැරකම් දූෂණ වසා ගන්නට පුද්ගලයිනට අවස්ථාව ලැබෙනවා ; අගමැතිතුමාට සුදු හුණු පෙන්වන්නට අවස්ථාව ලැබෙනවා. අන්න ඒ ආකාරයටයි ආහාර නිෂ්පාදන ව්‍යාපාරය ගෙන යන්නෙ. එමනිසා මේ කටයුතු පිළිබඳව නියම අවබෝධයක් ලබා ගන්නට නම් පැරණි සිංහල රජවරුන් මෙන් ප්‍රසිද්ධියක් නොකර වෙස් වළා ගෙන රටේ සංචාරය කළයුතු බව මා ප්‍රකාශ කරනවා. එසේ වෙස් වළාගෙන රටේ සංචාරය කළොත් මීට වඩා ප්‍රතිඵල දකින්නට ලැබේවි. වෙළඳ ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා එක් අවස්ථාවක රත්නපුරයට ගියා වගෙ වෙස්වළා ගෙන රටේ ඇවිදින මෙන් මා මුදල් ඇමතිතුමාටත් ආරාධනා කරනවා. වෙස් වළා ගෙන රටේ ඇවිද්දොත් බඩු මිළ පිළිබඳ නියම තත්ත්වය ගරු මුදල් ඇමතිතුමාට දැනගන්නට ලැබෙනවා ඇති. හැබැයි, සම්පූර්ණ ඇඳුම ඇඳ ගෙන නොවෙයි ; ඉරුණු කලිසමක් නැත්නම් රෙද්දක් ඇඳගෙන මල්ලකුත් අරගෙන රටේ ඇවිදින්න. එහෙම ඇවිද්දොත් බඩු මිළ කොයි තරම් ඉහළ ගොස් තිබෙනවාද කියා තමුන්නාන්සේට වැටහෙනවා ඇති. බඩු මිළ අප කියන තරම් ඉහළ ගොස් නැත කියා මේ ගරු සභාවේ ගෝරනාඩු කරන මන්ත්‍රීවරුන්ටත් වෙස් වළා ගෙන රටේ ඇවිදින මෙන් මා ආරාධනා කරනවා. බඩු මිළ ප්‍රශ්නය පිළිබඳව මා ඊට වඩා යමක් කියන්නෙ නැහැ. මා කියන අත් දැකීම ලබා ගත්තොත්—වෙස් වළා ගෙන රටේ ඇවිද්දෙත්—ගරු මුදල් ඇමතිතුමා මේ ගරු සභාවට ආපසු එන්නෙ "නොදකින් මේ මුදල් ඇමතිකම, මේ ආණ්ඩුව" කියා ගෙනයි. අප එය හොඳාකාරවම දන්නවා. එතුමා සිනහ වන්නේ වී නමුත් මා කියන දේ භාර ගන්නවා නම් මා සන්තෝෂ වෙනවා. පැරණි දේශපාලනඥයකු වන, මහජනතාව ගැන දන්නා කෙනෙකු වන ගරු මුදල් ඇමතිතුමාගෙන් මා කියන අත්දැකීම ලබා ගන්නටය කියා මා ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංවර්ධන අයවැය ලේඛන, රට ස්වයංපෝෂිත කරන චේතනාවෙන් අයවැය ලේඛන ඉදිරිපත් කළ පළමුවන අවස්ථාව මේක නොවෙයි. ඒ කාලයේ අප ගැලරියේ සිටත් මෙවැනි අයවැය ලේඛන ඉදිරිපත් කළ හැටි දැක තිබෙනවා. 1947 වර්ෂයේදී එවකට පැවති එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවේ මුදල් අමාත්‍යවරයාවූ දැනට රාජ්‍ය අමාත්‍ය ධුරය දරණ දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (ගරු ජේ. ආර්. ජයවර්ධන) පළමුවන වරට ඉදිරිපත් කළේත් ස්වයංපෝෂණය පරමාර්ථය කොටගත් අයවැය ලේඛනයක් තමයි. ඒ අවස්ථාවේදී හය අවුරුදු සැලැස්මක් ඉදිරිපත් කළා. හය අවුරුදු සැලැස්ම අනුව හය අවුරුද්දක් තුළ දී මේ රට ස්වයංපෝෂිත කරන්නට පුළුවන් වෙනවාය කියා එදා එතුමා ප්‍රකාශ කළා. නමුත් අවසානයේදී කුමක්ද සිදුවුණේ ? කාරණා කීපයක් නම් සිදුවූ බව ඇත්තයි. අප එය නැත කියා කියන්නෙ නැහැ. රජරට කැලෑ එළිවුණා. ගොවි ජනපද කීපයක් ඇති වුණා. එවැනි හොඳ වැඩ එකක් දෙකක් සිදුවූ බව ඇත්තයි. එහෙත් අවසානයේදී කුමක්ද සිදුවුණේ ? 1947 පටන් ගත් හය අවුරුදු සැලැස්මට අදාළ කාලසීමාව කෙළවර වන්නේ 1953 වර්ෂයේදීයි. හරියටම 1953 අගෝස්තු මාසයේදී තමයි හය අවුරුදු සැලැස්ම කෙළවර වන්නට තිබුණේ. ඒ අවස්ථාවේදී කුමක්ද සිදුවුණේ ? හාල් මිළ වැඩි කරන්නට සිදුවුණා. හෙට අනිද්දා—1967 අගෝස්තු 12 වැනිදා—ලංකා ඉතිහාසයේ වැදගත් අනුස්මරණ දිනයක්. හාල් සේරුවක මිළ ශත 75 දක්වා වැඩි කිරීම නිසා ඇතිවූ ජනතා සටන එදින මේ රටේ ජනතාව අස්මරණය කරනවා ඇති. හය අවුරුදු සැලැස්ම කෙළවර වන්නට තිබුණු වර්ෂයේදී එවකට තිබුණු ආණ්ඩුවට හාල් මිළ වැඩි කරන්නට සිදුවුණා. "ස්වයංපෝෂිත අයවැය ලේඛනයට" මුහුණපාන්නට වූ ඉරණම ඒකයි. දැන් අවුරුදු 20ක් ගතවී තිබෙනවා. නැවත වරක් අප හමුවේ "ස්වයංපෝෂිත අයවැය ලේඛනයක්" තබා තිබෙනවා. එය කොතැනින් කෙළවර වේවිද කියා අපට කියන්නට බැහැ. එදා ඉදිරිපත් කළ "ස්වයංපෝෂිත අයවැය ලේඛනයට" නම් අත්වූ ඉරණම මා දැන් පෙන්නුම් කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයසුන්දර මයා.]

ඊළඟට, තමුන්නාන්සේලාගේ සංවර්ධනය ව්‍යාපාරයට මොකක්ද වුණේ? කොන්ත්‍රාත්කරුවන් විශාල කැලෑවල හොඳ හොඳ දැව ටික කපා ගත්තා. ඒවායේ පල ප්‍රයෝජන ලබා ගත්තේ කවුද කියා තමුන්නාන්සේලා දන්නවා. එපමණක් නොවෙයි, ආණ්ඩුව විදේශීය හා ස්වදේශීය ධනපතියන්ගෙන් මුදල් පොළියට, ණයට අර ගත්තා.

1947 දී පටන් ගත් සාවුරුදු සංවර්ධන සැලැස්ම සඳහා ගත් මුදල් වෙනුවෙන් පොළිය වශයෙන් කොපමණ මුදල් සම්භාරයක් දේශීය සහ විදේශීය ධනපතියන් අතට ගියාදැයි කියන්නට පුළුවන්ද? කොන්ත්‍රාත් ක්‍රමය, ජාවාරම් ක්‍රමය, නොනිසි අන්දමට මුදල් ලබාගැනීම ආදී ක්‍රම රාශියක් යටතේ කොයි තරම් දූෂණ සිදුවන්නට ඇද්ද? මේ රටේ සංවර්ධනය, බලාපොරොත්තු වූ ආකාරයට ඇති කරන්නට නොහැකි වීමට ඔය විධියේ නොයෙක් කරුණු හේතු භූත වුණා. ඒ නිසා ඔය ඒ ඒ අවස්ථාවල වරින්වර අපට අහන්නට ලැබෙන ස්වයංපෝෂිත, සංවර්ධන වැනි වචන අර්ථශූන්‍ය ඒවා බවට පත් වී තිබෙනවා. ඔය වචන පාවිච්චි කර මොන මොන දේවල් ඉදිරිපත් කළත් අන්තිමේදී ඒවා පෙරළෙන්නේ මොන අතටදැයි හිතාගන්නට මිස දැන ගන්නට නම් ලැබෙන්නේ නැහැ. නොයෙක් විධියේ සැලැස්මවල් සකස් කර ඉදිරිපත් කරන නමුත් ඒ එක සැලැස්මකින්වත් ක්‍රම සම්පාදක ව්‍යාපාරයකින්වත් සුළු සුළු කෘෂිකාර්මික වැඩ පිළිවෙළවල් මිස පුළුල් වශයෙන් සංවර්ධන ව්‍යාපාරයක් දකින්නට අපට පුළුවන් වී නැහැ.

ක්‍රම සම්පාදනය සම්බන්ධයෙන් කටයුතු කෙරෙන අංශ කීයක් තිබෙනවාද? ප්ලෑනිං අංශය කියා එකක් මේ ආණ්ඩුව ඇති කර තිබෙනවා. ඉස්සර තිබුණේ "ප්ලෑනිං ඩිපාට්මන්ට්" එකක් පමණයි. දැන් කීයක් තිබෙනවාද? ක්‍රම සම්පාදක අමාත්‍යාංශයක් තිබෙනවා. ක්‍රම සම්පාදක දෙපාර්තමේන්තුවක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඇමතිවරුන්ගේ උප කමිටුවකුත් තිබෙනවා. එයිනුත් දැන් කෙරෙනවාය කියන්නේ සංවර්ධනය සඳහා වැඩ පිළිවෙළ ඇති කිරීමයි. ක්‍රම සම්පාදනය සම්බන්ධයෙන් ඇති කරන ලද "ප්ලෑනිං සෙක්‍රටේරියට්" හෙවත් සැලැස්ම ලේකම් මණ්ඩලයක් පවා තිබෙනවා. දැන් හැම තැනම ක්‍රම සම්පාදන අංශවලින් පිරිලා. ඒ කොයි හැටි වෙතත් තවමත් ඒ ක්‍රම එකක්වත් සාර්ථක වෙලා නම් නැහැ. ඒවායිනුත් ලැබුණු ප්‍රතිඵලයක් නැහැ. නිකම් හිස් තත්ත්වයක් පමණයි තිබෙන්නේ. එහෙන් මෙහෙන් කැරකී කැරකී ගිහිල්ලා ආපසු මේ උදවිය ගමන් කරන්නේ පටන් ගත් තැනටමයි. යල් පැනපු පරණ වැඩටයි කොහේ ගියත් ආපසු බසින්නේ. ආපසු ගමන් කරන විලාශයයි පෙනෙන්නේ. තමුන්නාන්සෙ කථාවක් අහලා ඇති—අපත් ඒ කථාව අහලා තියෙනවා—"ගවයා පොල් ගහක බැන්දාම ලණුව දිග තියෙන තෙක් ගිහිල්ලා ආයෙමත් පොල්ගහ මුලටමයි එන්නේ," යනුවෙන්. පොල් ගහේ බැඳපු ගවයා පුළුවන් තරම්, ලණුව දිග තියෙන කල්, ගිහින් ගිහින් ගහ මුලටම ආපහු කැරකිලා එනවා. කොයි තරම් උත්සාහ කළත්, රට සංවර්ධනය කරන්නටය කියා කොයි තරම් ක්‍රම සම්පාදනය කළත්, අර පරණ පුරුදු කෘෂිකාර්මික සැලැස්මටමයි එන්නේ. ඊට වඩා එහාට යන්නට මේ උදවියට පුළුවන්කමක් ඇති වී නැහැ. ඒ නිසා මේ ඉදිරිපත් කර තිබෙන්නෙත් අසාර්ථක අයවැය ලේඛනයකැයි කියන්නට සිදුවීම ගැන මා කනගාටු වෙනවා.

අප ඉදිරියේ තිබෙන මේ දුර්වල අයවැය ලේඛනය එසේ සකස් කරනු ලැබීම ගැන පෞද්ගලිකව ගරු මුදල් ඇමතිතුමාටද දොස් නඟන්නට මා අදහස් කරන්නේ නැහැ. මේ රට සංවර්ධනය කිරීමේත්, ආහාරයෙන් ස්වයංපෝෂිත කිරීමේත් කාර්යය භාරව සිටින්නේ ඇත්ත වශයෙන්ම එවැනි තත්ත්වයක් මේ රටට ඇති වනු දකින්නට කැමැත්තක් ඇතිව සිටින්නන් නොවන නිසයි මෙවැනි කණගාටුදායක තත්ත්වයක් ඇති වන්නේ. පසුපස අසුන්වල සිටින ගරු මන්ත්‍රීතුමන්ලා කොයි තරම් වේගයෙන් කෑගැසුවත් එයින් වැඩක් වන්නේ නැහැ. සංවර්ධන සැලැස්මට පිටුපසින් සිටින්නේ සංවර්ධනය නොවන තැනට වගබලාගන්නට වුවමනා උදවියයි. ඒ නිසයි ඔය සංවර්ධන සැලැස්මවල් සාර්ථක නොවන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආණ්ඩු පක්ෂයේ ඇතැම් ගරු ඇමතිවරුන්ද ඇතුළු බොහෝ දෙනා නිතර නිතර කඩාකප්පල්කාරීන් ගැන කථා කරනවා. කාටද කඩාකප්පල්කාරීන් කියන්නේ? කඩාකප්පල් කරනවාය කියනවා. මොකක්ද, කඩාකප්පල් කරනවාය කියන වැඩේ? කවුරුද මේ රටේ ඒ වැඩේ කරන්නෝ? ඒක කියන්නට දන්නේ නැහැ. පසුගිය දවස්වල වැඩ වර්ජන ඇති වුණේ නැහැ. ඇති වුණා නම් ඇති වුණේ සුළු සුළු වැඩ වර්ජන හතරක් පහක් පමණයි. ඒවා වැඩි දවසක් අල්ලා හිටියේ නැහැ. ඒවා ඉක්මනින්ම නිරාකරණය කරන්නට පුළුවන් වුණා. විරුද්ධ පාර්ශ්වය කඩාකප්පල් කරනවාලු. ආණ්ඩුව කරගෙන යන වැඩවලට විරුද්ධ පාර්ශ්වය ඊර්ෂ්‍යා කරනවාලු. ඒ කොයි හැටි වෙතත් මේ කඩාකප්පල් වැඩ කරන්නේ අසුවල් විධියකටදැයි කියා නැහැ. ගරු මුදල් ඇමතිතුමාවත් ඒ ගැන සඳහන් කර නැහැ. ඒ නිසා මේ වැදගත් අවස්ථාවේ ආණ්ඩු පක්ෂයට—විශේෂයෙන්ම ගරු මුදල් ඇමතිතුමාට—මා ආරාධනයක් කරන්නට කැමතියි. කරුණා කර මේ කඩාකප්පල්කාරයෝ කවුරුදැයි මේ ගරු සභාවට හඳුන්වා දෙන්න. මට දැනෙන තේරෙන හැටියට නම් කඩාකප්පල්කාරීන් යයි කියන්නට පුළුවන් වන්නේ රජයෙන් ලැබෙන ඇතැම් වරප්‍රසාද ප්‍රයෝජනයට ගෙන, අක්කර හාර පන්සියය ලබාගෙන කෘෂිකාර්මික සංවර්ධනයට අත දෙනවාය කියමින් ඇත්ත වශයෙන්ම තම තමන්ගේ ජාවාරම් කරන පුද්ගලයන් ගැන සඳහන් කරනවිටයි. ආණ්ඩු පක්ෂයට ආධාර කරන බවක් හඟවා ආණ්ඩුවේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නට උපකාරී වන බවක් පෙන්වා ඊට පටහැනි ලෙස ක්‍රියා කරන උදවිය කඩාකප්පල්කාරීන් ලෙස හැඳින්විය යුතුයි. පෞද්ගලික ව්‍යාපාර තහවුරු කරගෙන ආණ්ඩුවෙන් දෙන ආධාරවලින් ප්‍රයෝජන ගන්නා උදවියට කඩාකප්පල්කාරීන්යයි කියන්නට ඕනෑ.

ඊළඟ කඩාකප්පල්කාරයින් කවුද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද කැලෑවල ගස් කැපීම විශාල ජාවාරමක් වී තිබෙන බව තමුන්නාන්සේත් දන්නවා ඇති. කෘෂිකර්ම කටයුතු සඳහා වෙන් කර ඇති විශාල ඉඩම්වල ලී කපාගෙන ජාවාරම් කරනවා. ඒ ඉඩම්වල තිබුණු ලීවලට සිදු වූ දේ ආණ්ඩුවට ප්‍රකාශ කරන්නේ නැහැ. මේවා කරන්නේ විරුද්ධ පක්ෂයේ අයද, විරුද්ධ පක්ෂයේ අනුගාමිකයින්ද, ආණ්ඩු පක්ෂයේ අයද, ආණ්ඩු පක්ෂයේ අනුගාමිකයින් ද කියන එක ආණ්ඩු පක්ෂයේ අයගේ සිත්වල සටහන් වී ඇති. කෘෂිකාර්මික රථ නැත්නම් "මිනිමෝක්" රථ ගෙන්වීම සම්බන්ධව පසුගිය දිනක ගරු කෘෂිකර්ම ඇමතිතුමා විසින් සඳහන් කරන්නට යෙදුණා. මේ රටේ සිටින ධනපති කොටස් කෘෂිකර්මය දියුණු කරන්නට යයි කියා අවසර පත්‍ර ලබාගෙන වාහන ගෙන්වා ගෙන ඒවා ප්‍රයෝජනයට ගන්නේ කැලෑබද කෘෂිකාර්මික දියුණුව සඳහා ද, එසේ නැත්නම් නගරබදව ඔවුන්ගේ සුඛෝපභෝගී ජීවිත ගෙනයෑම සඳහා ද කියන එක කෘෂිකර්ම ඇමතිතුමා විසින් පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා. එමෙන්ම ට්‍රැක්ටර් අයිතිකරුවන් කවුද, ට්‍රැක්ටර් ජාවාරම්කාරයින් කවුද කියන එකත් අපි දන්නවා. අද දුප්පත් ගොවියකුට කුඹුරක වැඩ කරගැනීමට ට්‍රැක්ටරයක් ගන්නට විශාල කුලියක් ගෙවන්නට සිදු වෙනවා. ට්‍රැක්ටර්වලින් ගසාකන්නේ මේ ආණ්ඩු පක්ෂයේ අනුගාමිකයින් නොවේද කියා මා ඔබතුමාගෙන් අහනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම ව්‍යාපාරය සඳහා යොදාගෙන තිබෙන්නේ කාවද? දේශපාලන සම්බන්ධකම් උඩ තමන්ගේ ගැත්තන් ගැනීමේ ව්‍යාපාරය නිසා කෘෂිකාර්මික කටයුතු අද අනතුරට පත් වී තිබෙනවා. පසුගිය දවස්වල අපේ අගමැතිතුමාම අනුරාධපුරයට ගොස් ප්‍රකාශ කළා, උතුරු මැද පළාතේ දිසාපතිවරයා බොහොම දක්ෂ කෙනෙක්ය, ඔහු මේ රජයේ කෘෂිකාර්මික වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනයෑමට ක්‍රියා කරන කෙනෙක්ය කියා. එහෙත් එසේ පවසා මාස ගණනක් යන්නට පෙර එම දිසාපතිවරයාට සෞඛ්‍ය හේතූන් උඩ විශ්‍රාම ගන්නට සිදු වුණා. ඒ දිසාපතිවරයා වන මහින්ද සිල්වා මහතාට තිබුණු අසනීපය කුමක් ද කියා මා දන්නේ නැහැ. අවංක යයි අගමැතිතුමා විසින්ම ප්‍රකාශ කරනු ලබන අය ඔය විධියට විශ්‍රාම යන්නේ ඇයි? එහි යම්කිසි රහසක් තිබෙනවා. අවංකව මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයසුන්දර මයා.]

රට සංවර්ධනය කිරීමට මේ රට ස්වයංපෝෂිත කිරීමට ක්‍රියා කරන පුද්ගලයින්ට ඇති වන කරදර හා ඔවුන්ගේ ඉරණම කුමක්ද කියා අපි කවුරුත් දන්නවා. ඒ නිසා ඒ ගැන වැඩිදුර විස්තර ප්‍රකාශ කිරීමට වුවමනාවක් නැහැ.

එමෙන්ම මා රාජාසන කථා විවාදයේදී සඳහන් කළ කරුණක් ගැන තමුන්නාන්සේට මතක ඇති. අධ්‍යාපන ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා සඳහන් කළා, අපේ තේ ටික විකුණා ගන්නට ක්‍රමයක් නැත කියා. මැද පළාතේ තේ නැත්නම් "මිඩ් ග්‍රෝන් ටී" විකුණාගන්නට ක්‍රමයක් නැත, ඒ නිසා අප ලොකු ආර්ථික ප්‍රපාතයකට වැටෙන්නට යනවා කියා එතුමා කිව්වා. එසේ නම් රුසියන් තානාපතිතුමා පැමිණ කළ යෝජනාව බාරනොගත්තේ ඇයි? ගරු ඉඩම් ඇමතිතුමා මේ අවස්ථාවේදී මෙහි නොමැතිවීම ගැන මට කණගාටුයි. නොමිලයේ දෙන ට්‍රැක්ටර් බාර නොගත්තේ ඇයි? විකුණා ගන්නට බැරිව තිබෙන තේ රුසියන් වෙළඳ තානාපතිතුමා ඉල්ලූ විට ඒවා නොදුන්නේ ඇයි? ඒ ප්‍රශ්න තමුන්නාන්සේගේ මාර්ගයෙන් විශේෂයෙන්ම කෘෂිකර්ම ඇමතිතුමාගෙනුත්, ඉඩම් ඇමතිතුමාගෙනුත් අගමැතිතුමා ගෙනුත් මා අහනවා. අපට නොමිලයේ වර ප්‍රසාද ඇතිව ට්‍රැක්ටර් දෙන්නට සූදානම් වන විට ඒවා නොගත්තේ ඇයි කියා මා අහනවා. රාජාසන කථා විවාදයේදී නම් මේවාට පිළිතුරු ලැබුණේ නැහැ. මේවා මේ රටේ ජනතාව දැනගත යුතු වැදගත් ප්‍රශ්න. ඒවා හංගලා කටයුතු කරන්නට පුළුවන් ප්‍රශ්න නොවේයි. ඒ නිසා මේ අය වැය ලේඛන විවාදයේදීවත් ඒවාට පැහැදිලි පිළිතුරු අපට ලැබෙයි කියා මා බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය ලේඛනය සම්බන්ධයෙන් මීට කලින් මුදල් ඇමතිවරුන් වශයෙන් සිටි දෙපොළක් ම කථා කළා. ඒ දෙපොල නම් අපේ ගරු සෞඛ්‍ය ඇමතිතුමා හා ගරු රාජ්‍ය ඇමතිතුමායි. ඒ අයගේ කථාවල් එක්තරා ස්වරූපයක් අනුවයි කෙරුණේ. ඒ කථාවල් ඒ අයගේ අමාත්‍යාංශවලට පමණක් සීමා වී තිබුණා. අයවැය ලේඛනය පිළිබඳ කාරක සභා අවස්ථාවේදී තම තමන්ගේ අමාත්‍යාංශ ගැන කථා කරන්නට අවස්ථාව ඒ අයට ලැබෙනවා. එසේ තිබියදීත් රාජ්‍ය ඇමතිතුමාත් සෞඛ්‍ය ඇමතිතුමාත් ඒ අයගෙ කථාවලදී මේ අය වැය ලේඛනය ආරක්ෂා කරන්නට කථා නොකර තම තමන්ගේ අමාත්‍යාංශ ආරක්ෂා කර ගැනීම සඳහා පමණක් කථා කළා. තම තමන්ගේ අමාත්‍යාංශ ලබා ඇති දේවලුත්, ලබන්නට යන දේවලුත්, ඉල්ලා නොලැබුණු දේවලුත් ගැන තමයි ඒ අය කථා කළේ. ගරු සෞඛ්‍ය ඇමතිතුමා සඳහන් කළේ සෞඛ්‍ය අමාත්‍යාංශයට මෙ තරම් මුදලක් අවශ්‍යයි, එහෙත් එය ලැබී නැත කියන එකයි. ගරු රාජ්‍ය ඇමතිතුමා බොහොම ප්‍රවේශමෙන් තමන්ගේ අමාත්‍යාංශය ගැන පමණක් සඳහන් කළා. රාජ්‍ය ඇමතිතුමාගෙනුත් සෞඛ්‍ය ඇමතිතුමාගෙනුත් අප ඊට වැඩි දෙයක් බලාපොරොත්තු වුණා. කලින් හිටි මුදල් ඇමතිවරුන් හැටියට තමන්ගේ සහෝදර මුදල් ඇමතිතුමා ආරක්ෂා කර ගැනීමට ඒ අය දීර්ඝ වශයෙන් කථා කරනවා ඇත කියා අප බලාපොරොත්තු වුණා. එහෙත් ඒ අය කථා කළේ තමතමන්ගේ අමාත්‍යාංශ ගැන පමණයි. රාජ්‍ය ඇමතිතුමා විශේෂයෙන්ම කථා කළේ "ටුවරිසම්" නැත්නම් දේශ සංචාරකයින් ලංකාවට අද්දා ගැනීම ගැනයි.

ඒ ගරු ඇමතිවරුන් දෙදෙනාම හිටපු මුදල් ඇමතිවරුන් නිසා, මේ අය වැය ලේඛනයෙන් රටට කිසිම සෙතක් සැලසෙන්නේ නැති බව එතුමන්ලා දන්නවා. තමන්ගේ අමාත්‍යාංශ දෙක ගැන පමණක් බොහොම පරෙස්සමෙන් කථා කරන්නට එතුමන්ලා අදහස් කළේ ඒ නිසයි. ඒ එක්කම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුදුමාකාර යෝජනාවකුත් අපට අහන්නට ලැබුණා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

මන්ත්‍රීතුමා තව කොපමණ වේලා කථා කරන්නට අදහස් කරනවාද?

**විජයසුන්දර මයා.**
*(திரு. விஜயசுந்தர)*
(Mr. Wijesundara)

තව පැය බාගයක් පමණ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

නියම කර තිබෙන්නේ පැය බාගයයි. දැනටම තමුන්නාන්සේ මිනිත්තු 28 ක් කථා කර තිබෙනවා.

**විජයසුන්දර මයා.**
*(திரு. விஜயசுந்தர)*
(Mr. Wijesundara)

දිවා භෝජනයෙන් පසු මට තව ටික වේලාවක් දෙන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The Sitting is suspended till 2 p.m.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 2 ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு பி.ப. 2 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.

*Sitting accordingly suspended till 2 P.M., and then resumed.*

**විජයසුන්දර මයා.**
*(திரு. விஜயசுந்தர)*
(Mr. Wijesundara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිවා භෝජනය සඳහා විසිර යාමට පෙර මා විස්තර කරමින් සිටියේ මීරිගම ගරු මන්ත්‍රීතුමී (ජේ. පී. ඔබේසේකර මයා.) පෙන්වා දුන් පරිදි අයවැය ලේඛනය සම්බන්ධ රාජ්‍ය ඇමතිතුමාගේ අනාගත බලාපොරොත්තුව පිළිබඳවයි. අයවැය ලේඛනයේ තිබෙන හිගය පියවා ගැනීම සඳහා ඉදිරි වර්ෂයේදී විදේශ සංචාරකයන්ගෙන් මේ රටට විශාල ආදායමක් බලාපොරොත්තු වන බව එතුමාගෙන් ප්‍රකාශ වුණා. කොයි තරම් බලාපොරොත්තු තබා ගත්තත් ඒ ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. එහෙත් ඒ බලාපොරොත්තු කොයි තරම් දුරට සාර්ථක වෙනවාද යන්නයි, ප්‍රශ්නය.

අද හෝටල් සංස්ථාවක් පිහිටුවා තිබෙනවා. මීරිගම ගරු මන්ත්‍රීතුමී සඳහන් කළ පිළිවෙළට හික්කඩුවේ තානායම වැනි ලංකාවේ තානායම් කීපයක් දැන් පෞද්ගලික අංශයට භාර දී තිබෙනවා. මෙම තානායම් භාර දීමෙන් කිසිම ආදායම් වැඩි වීමක් සිදු වී තිබෙන බවක් අපට නම් පෙනෙන්නට නැහැ. දේශ සංචාරකයන් සියළු දෙනාම කෝටිපතියන් නොවෙයි. ලංකාවට එන විදේශ සංචාරකයන්ගෙන් විශාල සංඛ්‍යාවක් ඒ ඒ රටවල මධ්‍යම පන්තියට අයිති පුද්ගලයන්. ඉතාමත්ම කලාතුරකින් තමයි, ලක්ෂපතියකු හෝ කෝටිපතියකු සංචාරය සඳහා එන්නේ. එන අයගෙන් වැඩි දෙනෙක් ගුරුවරුන්, ප්‍රවෘත්ති පත්‍ර කලාවේදීන් වැනි අයයි.

හික්කඩුවේ තානායම පෞද්ගලික අංශයට භාර දීමෙන් පසු අද සිදු වී තිබෙන්නෙ කුමක්ද? අද අම්බලන්ගොඩ තානායමේ කිසිම ඉඩක් නැති වී තිබෙන බව තමුන්නාන්සේ ඒ පැත්තෙ ගියොත් දකින්නට ලැබෙයි. අද විදේශ සංචාරකයන් හික්කඩුවට යන්නෙ නැහැ. හික්කඩුවේ තානායමේ ගාස්තු බොහොම ඉහළ නිසා විදේශ සංචාරකයන් පවා අද අම්බලන්ගොඩ නගර සභාවට අයිති තානායමේ කාලය ගත කරනවා. ඉතාමත් කලාතුරකින් තමයි, විදේශ සංචාරකයෙක් හික්කඩුවේ තානායමට යන්නේ. ලක්ෂපති තත්ත්වයේ විදේශ සංචාරකයන්ට මිස සාමාන්‍ය තත්ත්වයේ විදේශ සංචාරකයන්ට හික්කඩුවේ තානායමේ නවතින්නට පුළුවන්කමක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේ හික්කඩුව පැත්තේ ගියොත් දකින්නට ලැබෙයි, අද හික්කඩුවේ මුහුදු වෙරළේ තිබෙන ගෙවල පවා විදේශ සංචාරකයන් විශාල වශයෙන් ලැගුම්ගෙන සිටින බව. එක ගෙදරක හතර පස් දෙනා බැගින් ගෙවල් දහයක, දොළහක විදේශ සංචාරකයන් පදිංචිව සිටිනවා. පෞද්ගලික අංශයට හික්කඩුවේ තානායම භාර දීමෙන් ප්‍රයෝජනයක් ලැබී නැති බව එයින් පෙනෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය ඇමතිතුමාගේ බලාපොරොත්තුව සඵල කර ගන්නට පුළුවන් නම් අප සතුටු වෙනවා. ඇමෙරිකාවේ පැතිරී තිබෙන නීග්‍රෝවරුන්ගේ කැරැල්ල දියුණු තියුණු වෙලා ඒ රටේ කෝටිපතීන්ට ඒ රට අත හැර යන්නට සිදු වී ඔවුන් මේ රටට පියාඹා විත් සංචාරකයන් හැටියට මේ රටේ සිටියොත් අපට විශාල ආදායමක් ඒ මගින් ලබා ගන්නට පුළුවන් වෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයසුන්දර මයා.]

හොංකොංවල තිබෙන කලබල තත්ත්වය උග්‍ර වී ඒ රටේ කෝටිපතීන් විදේශ සංචාරකයන් වශයෙන් නිවාඩුවක් ගත කරන්නට මෙහි පැමිණියොත් අපට විශාල ආදායමක් බලාපොරොත්තු වන්නට පුළුවන්. එසේ නැතිව සාමාන්‍යයෙන් සංචාරකයන් වශයෙන් පැමිණෙන මධ්‍යම පන්තියේ විදේශිකයන් මගින් නම් සංචාරක දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වන විශාල ආදායම ලබා ගන්නට පුළුවන්කමක් නැහැ. හික්කඩුව තානායම වැනි ස්ථානවල පවත්වාගෙන යන වැඩ පිළිවෙළ නිසා එවැනි ස්ථාන කරා ස්වදේශිකයන් වුවද යන්නේ ඉතා කලාතුරකිනුයි. විදේශ ශංචාරකයින් අතුරින්ද සියයට එක් අයකුට වඩා එවැනි ස්ථානයක ගත කරන්නට යනවායැයි සිතන්නට අමාරුයි. [බාධා කිරීමක්] අපේ නාවලපිටියේ ගරු මන්ත්‍රීතුමා (චන්ද්‍රා කරුණාරත්න මයා.) අළුත වෙච්ච සිද්ධියක් මතක් කරනවා. මෙම සභාවේ ඒ ගැන සාකච්ඡා කරන්නට වුවමනාවක් නැතැයි මා සිතනවා. අපේ රාජ්‍ය කටයුතු පිළිබඳ ඇමතිතුමා ප්‍රකාශ කර තිබෙනවා, ථෙරවාදී බෞද්ධයන් පවා විදේශ සංචාරකයන් හැටියට ලංකාවට එන්නට පුළුවන්කම තිබෙනවාය කියා. ඒකත් අළුත් ආදායම් මාර්ගයක් වශයෙනුයි, සඳහන් කර තිබෙන්නේ. ථෙරවාදී බෞද්ධාගම අතින් ලංකාව මධ්‍යස්ථානයක් වන බව එතුමාත් අපත් දන්නා දෙයක්. ථෙරවාදී දර්ශනය පිළිබඳව රාජ්‍ය ඇමතිතුමා තරමක් දුරට දන්නා කෙනෙකැයි මා හිතනවා. ථෙරවාදී බෞද්ධයන් ලංකාවට ඒම නිසා විදේශ සංචාරකයන් හැටියට ඔවුන්ගෙන් ආදායමක් ලැබේයැයි සිතීම සිහිනයක් පමණයි. ථෙරවාදී බෞද්ධ දර්ශනය අනුගමනය කරන්නන් මධ්‍යම ප්‍රතිපදාව පිළිපදින උදවිය බව කිව හැකියි. අත්ථකිලමථානුයෝගය අනුගමනය කරන වෛතුල්‍යවාදීන් සිටිනවා. කාමසුඛල්ලිකානුයෝගය අනුගමනය කරන්නේ මහායාන වාදීනුයි. ඒ දෙකොට්ඨාශය අතරේ සිටින කොට්ඨාශයක් තමයි, මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරන ථෙරවාදී බෞද්ධයන්. අතමිට දිගහැර වියදම් කිරීමේ බලාපොරොත්තුවෙන් එවැනි කෙනෙක් පැමිණේ යැයි සිතන්නට අමාරුයි. එම නිසා ථෙරවාදී බෞද්ධයන්ගෙන් දේශ සංචාරකයින් වශයෙන් ඒතරම් විශාල ආදායමක් ලබා ගන්නට පුළුවන්කමක් ඇතිවේයැයි මා සිතන්නේ නැහැ.

මේ අනුව අපට පෙනී යනවා, සිහින ලෝකයක ඉඳගෙන මේ රජය ආදායම් බලාපොරොත්තු වන බව. මෙවැනි සිහින ලෝකයක ඉඳගෙන ආදායම් බලාපොරොත්තුවීමෙන් ජනතාවට අවශ්‍ය දේ නිසියාකාර සපයාදෙන්නට හැකි වේයැයි අප සිතන්නේ නැහැ. අයවැය ඇස්තමේන්තුවල එක්තරා ශීර්ෂයක සඳහන් කර තිබෙනවා. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධිපති පදවිය පිළිබඳව. රුපියල් 18,000 ක් වාර්ෂික වැටුප වශයෙන් එහි ඇස්තමේන්තු කර තිබෙනවා. මෙම වැය ඇස්තමේන්තුව පිළිබඳව ටිකක් කල්පනාව යොමු කළ යුතුව තිබෙනවා. මෙය ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්තිවලින් පිටස්තරව සකස් කරන ලද ශීර්ෂයක් වශයෙනුයි, අපට සලකාගත හැකි වන්නේ. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව අප කොතෙක් දුරට කතා කළත් මුළු ආසියාකරයේම තවමත් නමට හෝ පාර්ලිමේන්තුවක් ඉතිරි වී තිබෙන්නේ ජපන් රටේත් ලංකාවේත් පමණකැයි සඳහන් කරන්නට පුළුවනි. ඉන්දියාවේත් පාර්ලිමේන්තුවක් තිබෙනවා. එහෙත් නමට හෝ පාර්ලිමේන්තු ක්‍රමයක් අනුගමනය කරන්නේ ජපන් රටේ සහ ලංකාවේ පමණයි. එමනිසා මේ කියන ලද වැය ශීර්ෂයෙහි පෙනෙන විධියේ ඇස්තමේන්තුවක් අනුමත කරගෙන ප්‍රජතන්ත්‍රවාදී ප්‍රතිපත්තිවලින් පිට පනින්න ගියහොත් නමට හෝ අප රටේ තිබෙන පාර්ලිමේන්තු ක්‍රමයත් අහෝසි වන්නට ඉඩ තිබෙනවා. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධිපති තනතුර ලංකා රාජ්‍ය පාලන සේවාවෙන් හෝ සිවිල් සේවාවෙන් හෝ තෝරා ගනු ලබන කෙනෙකුගෙන් නොව දේශපාලන වශයෙන් තෝරාගනු ලබන කෙනෙකුගෙන් පුරවන්නට යන බවක් පෙනෙන්නට තිබෙනවා. ප්‍රථම වතාවට දේශපාලන පැත්තෙන් සලකා ස්ථිර ලේකම්වරයකු පත් කර සිටින බව අප දන්නවා. එම ස්ථිර ලේකම්වරයා බඳවා ගත්තේ කුමන අමාත්‍යාංශයටදැයි තමුන්නාන්සේලා දන්නවා. ලංකා රාජ්‍ය පාලන සේවාවෙන් නොවෙයි, ඔහු පැමිණ සිටින්නේ. එහෙත් ඔහු පෙනී සිටින අමාත්‍යාංශය භාර ඇමතිවරයාගේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සඳහා ඔහුගේ පත්වීම ප්‍රශ්නයක් නොවේ යැයි සලකා එය අමතක කර දැමුවත් අඩි යෙන් අඩිය එම පිළිවෙළ ඉදිරියට යන බවයි, පෙනෙන්නට තිබෙන්නේ. ඒවා ගේම අගමැතිතුමාගේ ප්‍රවෘත්ති ලේකම් —Press Secretary—වශයෙන්ද දේශපාලන පක්ෂයක කෙනෙක්—පරා ජිත අපෙක්ෂකයෙක්—පත් කරගෙන සිටින බව පෙනෙනවා. ඊටම සම්බන්ධ වන ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධිපති පදවියත් දේශපාලන නිලයක් හැටියට සලකා ක්‍රියා කළොත් මේ රටේ ප්‍රජාතන්ත්‍ර වාදය කොතෙක් දුරට ආරක්ෂා වේවිද කියා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන වාැයි කියන මෙම රජයෙන් මා අහනවා. "සෙන්සර්" හෙවත් ප්‍රවෘත්ති පාලකයා —ප්‍රවෘත්ති කපා දමන්නා—වශයෙන් දේශපාලන අංශයක කෙනකු පත් කර තිබෙනවා නම්, අගමැති කාර්යාලයයේ ප්‍රවෘත්ති ලේකම් වශයෙනුත් දේශපාලන පක්ෂයකට සම්බන්ධ කෙනකු පත් කර ගෙන තිබෙනවා නම්, ප්‍රවෘත්ති අධිපති තැන වශයෙනුත් දේශපාලන පක්ෂයක කෙනකු පත් කරන්නට යනවා නම් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය කොයි තරමකට ඉතුරු වේද යන්න හිතා ගැනීම අද අපට ටිකක් අමාරු කාරණයක් වී තිබෙනවා.

ප්‍රාග්ධන කටයුතු හා පුනරාවර්තන විය දම් සඳහා විශාල මුදල් ප්‍රමාණයක්---රුපි යල් එක් කෝටි පණස් ලක්ෂයක්— වෙන් කර තිබෙන අතර එයින් අතිරේක තනතුරු 5,400 ක් ඇති කරන්නට බලා පොරොත්තු වන බව සඳහන් වී තිබෙ නවා. ලොකු බලාපොරොත්තුවක් ඇතුව මේ වැය ශීර්ෂය ඉදිරිපත් කර තිබුනත් එකී තනතුරුවලට දේශපාලන බල පෑම් උඩ යම් යම් පුද්ගලයින් පත් කරතොත් ඒ බලාපොරොත්තුව සම්පූර්ණයෙන්ම විනාශ වී යනවා. නොයෙක් විධියේ දේශ පාලන පත්වීම් කරගෙන යන මෙවැනි අවස්ථාවක මේ රජය ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන බව ප්‍රකාශ කිරීම ප්‍රෝඩා වක් වී තිබෙන නිසා අප මීට විරුද්ධ වන බවයි අපට මේ ආණ්ඩුවට කියන්නට තිබෙන්නේ.

ගොවි හමුදා ඇති කිරීම සඳහාත් වැය ශීර්ෂයක් ඉදිරිපත් වී තිබෙනවා. දැනට මේ රටේ මධ්‍යස්ථාන කීපයක ගොවි තරුණ යින්ගේ කඳවුරු ඇති කර තිබෙන බව අප දන්නවා. එහෙත් ඒවායෙහි සිටින තරුණ යින් කටයුතු කරන්නේ ඉතාමත් අමාරු වෙනුයි. කෘෂිකර්මය දියුණු කොට මේ රට ආහාර අතින් ස්වයංපෝෂිත කිරීමේ නියම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙතොත් ඒ සඳහා තමන්ගේ සහයෝගය අවංකව දෙන්නට මේ තරුණයින් ලෑස්තිව සිටි නවා ඇති. එහෙත් අද ඒ ගොවි කඳවුරු වල සිදු වී තිබෙන්නේ එය නොවෙයි. ඒවා යෙහි අද පවතින නිළධාරි ක්‍රමයේ වරද නිසාත්, දේශපාලන බල පෑම් උඩ ඒවාට රිංගා ගත් සමහර නිළධාරීන් එම තරුණ යින්ට ආදර්ශයක් ගන්නට පුළුවන් අන්ද මින් නොහැසිරීම නිසාත් ගොවි කඳවුරුවල කටයුතු බොහෝදුරට අඩපණ වී තිබෙනවා. මෙහි නිළධාරීන් ඔවුන්ට ලැබී තිබෙන තත්ත්වයෙන් ප්‍රයෝජන ගන්නවා මිස ගොවි තරුණයින්ගේ අඩුපාඩුකම් කිසිවක් ගැන සොයා බලන්නේ නැහැ. මෙම තරුණයින්ගේ අවශ්‍යතාවත් හරියාකාර සපුරාලන්නේ නැති නිසාත්, ඔවුන්ට ලැබිය යුතු යම් යම් දීමනා හරියාකාරව ඔවුන් අතට පත් වන්නේ නැති නිසාත් විශාල ලෙස කලකිරීම් ඇති වී මෙම තරුණයින් අද එම කඳවුරු අත්හැර යන් නට පටන් ගෙන තිබෙනවා. ඊට ප්‍රධාන හේතුව මා කලින් කී අන්දමට නිළධාරීන් ගේ නුසුදුසු ක්‍රියා කලාපය බව මා තමුන් නාන්සේට පෙන්වා දෙන්නට කැමතියි. මෙම ගොවි කඳවුරු බොහොමයකම තරුණයින් අද ඔවුන් අතට පත්වන පොරව, කැත්ත, උදැල්ල වැනි ආයුධ විකු ණාගෙන ආපසු ගම්බලා යන්නට පටන් ගෙන තිබෙනවා. මේ නිසා ආණ්ඩුව ගොවි කඳවුරු සඳහා කොපමණ මුදල් වියදම් කරන්නට ඉදිරිපත් වුණත් ඒවා කඩාකප් පල් වන තත්ත්වයක් ඇති වී තිබෙනවා. කිරිඉබ්බන් ඔය නමැති ස්ථානයෙහි තිබෙන ගොවි කඳවුර පමණක් තරමක් සතුටුදායක අන්දමින් කටයුතු කරගෙන යන බව මා කියන්නේ සන්තෝෂයෙනුයි. එය භාරව සිටින නිළධාරි මහත්මයා ආදර් ශමත් කෙනෙකු නිසා එහි ඒ තත්ත්වය ඇති වී තිබෙනවා. ගොවි කඳවුරු සඳහා වැය කරන මුදල් ගොවි තරුණයින්ගේ සුභසිද්ධිය සඳහා යෙදවීමට දැනට වඩා පරෙස්සම් වන ලෙස මා රජයට මතක් කර නවා. එසේ කළොත් එම ගොවි කඳවුරු වලින් හොඳ සේවයක් ලබා ගන්නට පුළු වන් වෙනවා ඇති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රටේ සංවර්ධනය සඳහා අවශ්‍ය වන්නේ කෘෂිකර්මය දියුණු කිරීම පමණක්ම නොවෙයි. රට ස්වයංපෝෂිත කිරීම සඳහා දියුණු කළයුතු නොයෙක් අංශ අතර වාහන ගමනාගමනය සඳහා පාරවල් ඉතා වැදගත් තැනක් ගන්නවා. අලුත් පාරවල් ඇති කිරීමත්, තිබෙන පාරවල් වැඩි දියුණු කිරීමත් අවශ්‍යයි. රජයේ වැඩ දෙපාර්තමේන්තුව භාර අමාත්‍යාංශය යටතේ විශාල මුදලක් වෙන් කර තිබෙනවා. එහෙත් ඉතාමත් අවශ්‍ය දේවල් පිළිබඳ කිසිම වැඩ පිළිවෙළක් ඊට ඇතුළත් වී නැහැ. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ විශෙෂයෙන් සලකා බැලිය යුතු කාරණයක් මේ අවස්ථාවේදී මතක් කළ යුතුව තිබෙනවා. පසුගිය ආණ්ඩුව කාලයේදී ආරම්භ කරනලදුව දැන් විවෘත වී තිබෙන පාලම් දෙකක් ගැනයි මා මතක් කරන්නේ. මෙම පාලම් දෙකෙන් පසුගිය ආණ්ඩුව ඇති කරගත් බලාපොරොත්තු ඉෂ්ට වන අන්දමට රජයේ වැඩ අමාත්‍යාංශය ක්‍රියා කර නැති බව මේ අවස්ථාවේදී මතක් කරන්නට සිදු වී තිබෙනවා. හංවැල්ලේ පාලමත්, කිරිඇල්ලේ ඉඩන් ගොඩ පාලමත් තැනීමේ ප්‍රධාන පරමාර්ථය වුණේ මහනුවර සිට—කන්ද උඩරට සිට—ඉතා ඉක්මණින් දකුණු පළාතට ළඟාවීමට මාර්ගයක් සකස් කිරීමයි. ඒ පාලම් දෙක තැනීමෙන් බලාපොරොත්තු වන උඩරට ප්‍රදේශය හා දකුණු පළාත සම්බන්ධ කිරීමේ කාර්යය ඉතාම සුළු ප්‍රතිපාදනවලින් ලෙහෙසියෙන් කරන්ට පුළුවන්කම ලැබෙනවා, ඇහැලියගොඩ-නැදුරන-ඇරැපොළ-ඉඩන්ගොඩ මාර්ගයත්, අයගම-කුකුලේගම මාර්ගයත් සම්බන්ධ කිරීමෙන්. එවිට මහනුවර සිට ගාල්ල, මාතර බලා යන උදවියට කොළඹ ඔස්සේ නොගොස් මේ මාර්ගය ඔස්සේ ඉක්මණින් ඒ නගරවලට ළඟා වෙන්ට පුළුවන්කම ලැබෙනවා. එමෙන්ම අනාගතයේදී හෝ මේ රටේ ස්වයංපෝෂිත තත්ත්වයක් ඇති කිරීමේ බලාපොරොත්තුවෙන් කරගෙන යන මේ සටනේදී ඒ විධියේ මාර්ගයක් සකස්වීමත් සංවර්ධන උදෙසා අවශ්‍ය කටයුත්තක් වශයෙන් රජය කල්පනා කරනවා ඇතැයි මා විශ්වාස කරනවා.



ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රත්නපුර, දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන් වන අපි —විරුද්ධ පාර්ශ්වයේ වේවා; ආණ්ඩු පක්ෂයේ වේවා—රත්නපුර දිස්ත්‍රික්කය උඩරට ගැමි කොමිසන් සභා ප්‍රදේශයට ඇතුළත් කරන ලෙස අවුරුදු ගණනාවක් තිස්සේ උද්ඝෝෂණය කළා. අද ඊයේ පමණක් නොව හැම අයවැය විවාදයකදීම වගේ රත්නපුර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන් මේ ඉල්ලීම කරනවා. එහෙත් තවම මේ ඉල්ලීම ඉටු වෙලා නැහැ. එක් අවස්ථාවකදී අපේ ස්වදේශ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා ප්‍රකාශ කළා, ඒ විධියේ බලාපොරොත්තුවක් රජය තුළ තිබෙන බව. මේ නිසා අද රත්නපුර දිස්ත්‍රික්කයේ පැන නැගී තිබෙන තත්ත්වය මොකක්ද? යම් යම් යෝජනා ක්‍රම නොයෙක් දෙපාර්තමේන්තුවලට අපි ඉදිරිපත් කළාම බොහෝ දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිතරම වගේ අප සමග කියන දෙයක් තමයි රත්නපුර දිස්ත්‍රික්කයත් උඩරට ගැමි කොමිෂන් සභා ප්‍රදේශයට ඇතුළත් කරනවාය, එවිට ඒ යෝජනා ක්‍රම උඩරට ගැමි කොමිසන් සභාවේ ප්‍රතිපාදනවලට ඇතුළත් කරන්ට පුළුවන්ය, කියන එක. අන්තිමේදී සිදු වෙන්නෙ ඒ දෙපාර්තමේන්තුව ඒ වැඩ භාර ගන්නෙත් නැහැ; උඩරට ගැමි කොමිසන් සභාව ඒ වැඩ භාර ගන්නෙත් නැහැ. එම නිසා රත්නපුර දිස්ත්‍රික්කයත් උඩරට ප්‍රදේශයක් බැවින් මේ ප්‍රදේශයත් උඩරට ගැමි කොමිසන් සභා සීමාවට ඇතුළත් කිරීමේ කාර්යයට තමුන්නාන්සේ මාර්ගයෙන් මා ආණ්ඩුවේ අවධානය යොමු කරවනවා.

රත්නපුර දිස්ත්‍රික්කයේ දැන් විශාල ඉඩම් හිඟයක් ඇති වීගෙන යන බව අපි දන්නවා. එහෙත් රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධාන කෘෂිකර්ම මධ්‍යස්ථානය වන වලවේ ව්‍යාපාරයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඩම් නැති උදවියට පදිංචි වන්ට සෑහෙන තරම් බිම් ප්‍රමාණයක් තවම ලැබී නැති බව අපට පෙනී යනවා. එම නිසා වලවේ ව්‍යාපාරයේ ඉඩම් බෙදා දීමේදී රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඩම් නැති උදවියට ඉක්මණින් ඉඩම් බෙදා දීමට මේ රජය ක්‍රියා කරනවා ඇති කියා මා විශ්වාස කරනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඩම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැති උදවියට තව ටික කලකින් පදිංචි වන්ට ඉඩම් අඟලක් නැති වී යන තත්ත්වයක් තමයි, දැනට පවතින්නේ.

මේ විවාදයේදී කථා කළ රත්නපුරයේ ගරු මන්ත්‍රීතුමා (ආටිගල මයා.) මැණික් සංයුක්ත මණ්ඩලයක් ඇති කිරීමෙන් දුප්පත් මැණික් නිෂ්පාදකයින්ට විශාල සේවයක් වන බව ප්‍රකාශ කිරීම ගැන මා ආඩම්බර වෙනවා. මැණික් සංයුක්ත මණ්ඩලයක් වහාම පිහිටුවන ලෙස එතුමා ඉල්ලා සිටියා. එතුමාගේ ඒ ප්‍රකාශය ගැන මා එතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ මැණික් කර්මාන්තය සම්බන්ධයෙන් විශාල ඉතිහාසයක් තිබෙනවා. 1964 අවුරුද්දේ මැණික් සංයුක්ත මණ්ඩලයක් පිහිටුවන්නට එවකට සිටි මුදල් ඇමතිතුමා වන යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) යෝජනාවක් ඉදිරිපත් කළා. එහෙත් 1964 දෙසැම්බර් මාසයේදී ඒ සභාග ආණ්ඩුව බිඳ වැටීම නිසා ඒ යෝජනාව යටපත් වුණා. 1939 අවුරුද්දෙ රාජමන්ත්‍රණ සභා යුගයෙදී තමයි, ප්‍රථම වරට එවකට රුවන්වැල්ලේ මන්ත්‍රීවරයා වශයෙන් පත්ව සිටි යටියන්තොට වර්තමාන මන්ත්‍රීතුමාගේ ප්‍රධානත්වයෙන් මැණික් කර්මාන්තය පිළිබඳව සොයා බලන්නට පරීක්ෂණ කමිටුවක් පත් කරන්ට යෙදුණේ. ඒ කමිටුවෙන් වාර්තාවක් ඉදිරිපත් වුණා. එහෙත් ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. එහෙත් මේ මැණික් කර්මාන්තයෙන් අද රජයට විශාල ආදායම් මාර්ගයක් පෑදී තිබෙන බව අපට පෙනී යනවා. නමුත් එයින් ප්‍රයෝජන ගැනීම ආණ්ඩුවට භාර කාරණයක්. අද මැණික් කර්මාන්තයෙන් ලාභ ලබන්නේ ජාවාරම්කාරයින් මිසක් මැණික් පතල්වලට බැස, වැඩ කරන, දහඩිය වගුරුවන දුප්පත් ජනතාව නොවෙයි. එම නිසා මැණික් කර්මාන්තය පිළිබඳව නියම විධියේ සංයුක්ත මණ්ඩලයක් ඇති කළහොත් දුප්පත් මැණික් ගරන්නන්ටත් විශාල සහනයක් අත් වෙනවා. ඒ පිළිබඳව සුළු වශයෙන් හෝ කල්පනා කළහොත් මැණික් කර්මාන්තයෙහි යෙදී සිටින දුප්පත් ජනතාවටත් රටටත් විශාල ආදායමක් ලබා ගන්නට මාර්ගය පෑදෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පේෂ කර්ම මධ්‍යස්ථාන මාර්ගයෙන් විසිපන්දහසකට රක්ෂා සපයන්නට ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා යෝජනාවලියක් ඉදිරිපත් කර තිබෙනවා. එහෙත් අපට පෙනෙන්නේ විසිපන්දහසකට රක්ෂා සපයනවා වෙනුවට අද පවතින නූල් හිඟය නිසා තිබෙන පේෂකර්ම මධ්‍යස්ථාන ටිකත් වැසෙන විධියට කටයුතු සිදු වන බවයි. ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා නිතරම කොළඹ හතේ කුරුඳුවත්තේ කාන්තාවන්ට තර්ජනය කරනවා. එතුමා අවිවාහකයකු වන්නේ වී නමුත් පේෂ කර්මාන්තය දියුණු කරන්නට නොහැකිව තිබෙන්නේ මේ කුරුඳුවත්තේ කාන්තාවන් නිසාය කියා එතුමා ප්‍රකාශ කරනවා. ධනවත් කාන්තාවන් මද්‍රාසිය, බොම්බාය, ආදී නගරවලට නිතර නිතර ගිහින් සාරි ගෙනෙනවා. මේ ගමන් සීමා කිරීම පිළිබඳව මුදල් ඇමතිතුමාත්, ප්‍රවාහණ ඇමතිතුමාත්, ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාත් අතර පසුගිය දවස්වල විශාල මතභේදයක් පැවතුණු බව මා දන්නවා. එය කවුරුත් දන්න කාරණයක්. යම් අමාත්‍යවරයකු තුළ දුප්පතාට සේවයක් කරන්නට අදහසක් තිබුණත්, තවත් අමාත්‍යාංශයක අමාත්‍යවරයකු ධනවත් උදවියගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්නට උත්සාහ කරනවා නම්, වැඩක් වෙන්නේ නැහැ. ඒ කාරණය පිළිබඳව මේ ආණ්ඩුවට පැහැදිලි ප්‍රතිපත්තියක් නොමැති බව අපට පෙනෙනවා. අද මේ ආණ්ඩුව කණ්ඩායමක් වශයෙන් ක්‍රියා කිරීමට නුපුළුවන් තත්ත්වයකට වැටී තිබෙනවා. එම නිසා යම් අමාත්‍යවරයකු තුළ ජනතාවට ප්‍රයෝජනවත් වැඩක් කිරීමේ අදහසක් තිබුණත් එය සාර්ථක කර ගන්නට නොහැකි තත්ත්වයක් ඇතිවී තිබෙනවා. මේ කාරණා ගැන කල්පනාවෙන් කටයුතු නොකළොත් තමුන්නාන්සේලාගේ ආයුෂ, නොයෙක් අය දැනටමත් ප්‍රකාශ කර තිබෙනවාටත් වඩා කොට වන බවට කිසිම සැකයක් නැහැ. මේ විධියේ අදූරදර්ශී ක්‍රියාවන් පිට පිට කරන්නට ගියොත් තමුන්නාන්සේලාගේ ආයුෂ කාලය ඉතාම කොට වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයසුන්දර මයා.]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකා ගමනාගමන මණ්ඩලය ගැන පසුගිය අය වැය ලේඛනයේ සඳහන් කර තිබුණා. බස් 3,300 ක් තිබෙනවාය, ඒ ගණන තවත් 756 කින් වැඩි කරනවාය, කියා ඒ අවස්ථාවේදී ප්‍රකාශ කළා. එහෙත් අද තත්ත්වය කුමක්ද? සංඛ්‍යා ලේඛන දෙස බලන විට ඒ බස්වලින් හතරෙන් පංගුවක්ම අද අබලන් වී ගරාජ්වල දමා තිබෙනවා. ජනසතු සේවා ඇමතිතුමාම ඒ කාරණය පිළිගන්නවා. මෙවැනි තත්ත්වයක් ඇති වුණේ කුමන කරුණු නිසාද? දේශපාලන බලපෑම් උඩ ලංකා ගමනාගමන මණ්ඩලයට නිලධාරීන් කොටසක් පත් කර සිටින බව අප දන්නවා. මා පුද්ගලයින්ගේ නම් සඳහන් කරන්නේ නැහැ. අද ලංකා ගමනාගමන මණ්ඩලයේ ඇස් නොපෙනෙන නිලධාරීනුත් සිටිනවා. එවැනි අය නැත කියා යම් කෙනෙකු අභියෝග කරනවා නම් මා අසවලාය කියා නම සඳහන් කර ඔහු වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියට පමුණුවා ඒ කාරණය ඔප්පු කරන්නට ලෑස්තියි. ඒ වාගේම එක ඇසක් නොපෙනෙන රියැදුරු මහත්වරුන් බඳවාගෙන තිබෙනවා. ඒ වාගේම නියම උස නැති, නියම අධ්‍යාපන සුදුසුකම් නැති, සේවකයින් බඳවා ගෙන තිබෙනවා. ඒ නාම ලැයිස්තු අප ළඟ තිබෙනවා. එහෙත් මා පුද්ගලයිනට මඩ ගසන්නට ලෑස්ති නැහැ. මේවා සියල්ලම දේශපාලන බලපෑම් උඩ සිදු වූ දේවල් බව අප දන්නවා. අද නිතර නිතර බස් රථ පෙරළෙනවා නම්, බස් සේවය අබලන් වී තිබෙනවා නම්, මේවාට අඩකින් වරදකරුවන් වන්නේ දේශපාලන බලපෑම් කර එවැනි පුද්ගලයින් ලංකා ගමනාගමන මණ්ඩලයට යැවූ උදවියයි. ජීවිත කීයක් අද අනතුරේ වැටී තිබෙනවාද? සතියකට බස් රථ කීයක් පෙරළෙනවාද? සතියකට ජීවිත කීයක් අනතුරට පත් වෙනවාද? ආණ්ඩුව මේවා ගැන සොයා බලන්නට ඕනෑ. දේශපාලන බලපෑම් උඩ ක්‍රියා කිරීම නිසා අද ජනතාවගේ ජීවිත පවා අවදානම් තත්ත්වයකට වැටී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අයවැය ලේඛනය පුස්සක් බව මා ප්‍රකාශ කරනවා. රටක යම්කිසි ආණ්ඩුවක් පවත්වාගෙන යනවා නම් අඩු වශයෙන් ජනතාවට එදිනෙදා ඉෂ්ට විය යුතු යුතුකම් ටික වත් ඉෂ්ට කරන්නට ඒ ආණ්ඩුව බැඳී සිටිනවා.

ආණ්ඩු පක්ෂයේ "ජිංජර් ගෲප්" නමින් හඳුන්වනු ලබන කණ්ඩායමේ උදවියට විශේෂයෙන් මතක් කරන්නට කැමතියි, එතුමන්ලාගේ වැඩ පිළිවෙළ වඩාත් ක්‍රියාත්මක අන්දමට කරගෙන යා යුතු බව. තව තවත් රට ඉදිරියට ගමන් කර වීමට මිස, රට ආපසු ගමන් කරවීමට කිසිවකුට ඉඩක් නොලැබෙන පරිදි කටයුතු කරන්නැයි මා එතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. අපේ රට ඉස්සරහට ගෙන යාමට අනුබල දෙන්නැයි මා තදින්ම ඉල්ලා සිටිනවා. එසේ නොකළොත් රට තව තවත් අමාරුවේ වැටෙන්නට පුළුවනි. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයකු නිසාම නොව මේ අයවැය ලේඛනයෙන් රට බලාපොරොත්තු වූ කිසිවක් නොකෙරෙන බව ඉතා පැහැදිලි ලෙස පෙනෙන නිසාම මේ අයවැය ලේඛනයට අප විරුද්ධ බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 2.26

**චන්ද්‍ර කරුණාරත්න මයා.** (නාවලපිටිය)

*(திரு. சந்திரா கருணாரத்ன—நாவலப்பிட்டி)*

(Mr. Chandra Karunaratne—Nawalapitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි වැදගත් විවාදයකට මාත් සහභාගි වීම මගේ යුතුකමක් හැටියට මා කල්පනා කරනවා. කිරිඇල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවේ අවසාන භාගයේදී එතුමා කළ ප්‍රකාශයක් ගැන යමක් මගේ කථාව ආරම්භ කිරීමට පෙර පළමුවෙන්ම කියන්නට ඕනෑ. එතුමාගේ කථාවේදී එම ගරු මන්ත්‍රීතුමා "ජිංජර් ගෲප්" එකක් ගැන කථා කළා. එවැනි වචන පාවිච්චි කරන අවස්ථාවේ එතුමා නිතරම මා දෙස බලාගෙනයි සිටියේ. මොන ගෲප් එකක් ගැන කථා කළත් මේ පැත්තේ ඔය කියන විධියේ පක්ෂ දෙකක් ඇත්තේ නැහැ. ඒ බව ඒ ගරු මන්ත්‍රීතුමාට පැහැදිලිවම කියන්නට මා කැමතියි. අපට ඇත්තේ එකම එක පක්ෂයයි. අපට ඇත්තේ එකම එක කණ්ඩායමයි. එක්සත් ජාතික පක්ෂයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපට ඇත්තේ එකම එක නායකයායි. ඒ අන් කිසිවකු නොව අපේ අග්‍රාමාත්‍යවර ගරු ඩඩ්ලි සේනානායක මැතිතුමා බවත් පැහැදිලිවම ප්‍රකාශ කරන්නට ඕනෑ.

මගේ කථාව පටන් ගන්නට පෙර දෙවැනි කාරණය හැටියට කෝට්ටේ ගරු මන්ත්‍රීතුමාගේ (ස්ටෙන්ලි තිලකරත්න මයා.) කථාවේදී සඳහන් කරන්නට යෙදුණු දෙයක් ගැනත් පිළිතුරු දෙන්නට මා බලාපොරොත්තු වෙනවා. කථාව කරගෙන යද්දී කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා තොන්ඩමන් මහත්මයාගේ ඡන්ද බල යෙන් උඩරට මන්ත්‍රීවරුන් කීප දෙනකු මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් වශයෙන් තේරී ඇවිත් සිටින බවක් සඳහන් කළා. ඒ කථාව කළ ගරු මන්ත්‍රීතුමාට ඡන්දදායක ලයිස්තු පරීක්ෂා කර බලන්නැයි මා කිය නවා. නාවලපිටිය මැතිවරණ කොට්ඨාශයට අදාළ ඡන්දදායක ලැයිස්තුවේ තොන්ඩමන් මහත්මයාගේ ඡන්ද කොපමණ තිබෙනවා දැයි ඒ අනුව සොයා දැන ගන්නා ලෙසත් මා එතුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටි නවා. ඒ අතරම කෝට්ටේ මැතිවරණ කොට්ඨාශය නියෝජනය කරන ඒ ගරු මන්ත්‍රීතුමාගෙන් අහන්නට කැමතියි, කෝට්ටේ පළාතේත් මැතිවරණවලදී මන්ත්‍රීන් තෝරා පත් කර ගන්නේ ඒ අන්දමටද කියා.

තවත් කාරණයක් කෝට්ටේ ගරු මන්ත්‍රී තුමාගෙන් අහන්නට තිබෙනවා. 1956 දී මේ රටේ රාජ්‍ය භාෂාව සිංහල භාෂාව විය යුතුය යන උද්ඝෝෂණය රට පුරා ගෙන යමින් අප සටන් පාඨ කියාගෙන ගිය කාලයේ මේ රටේ සෑම මැතිවරණ කොට් ඨාශයක් පාසාම වාගේ ගොස් එතුමා කියා සිටියේ මොකක්ද? එතුමා ඒ වකවානු වේදී සිංහලයටත් දෙමළයටත් මේ රටේ රාජ්‍ය භාෂා වශයෙන් සම තත්ත්වය දිය යුතුය යනුවෙන් කියා සිටි බව මේ අවසථා වේදී එතුමාට මතක් කර දෙන්නට කැම තියි.

පොලීසියට ආධුනිකයන් බඳවා ගැනීමට විශාල මුදල් ප්‍රමාණයක් මේ අයවැය ලේඛනයෙන් වැය කරන්නට බලා පොරොත්තු වන බව පෙනෙනවා. ඒ ගැන මුලින්ම වචන ස්වල්පයක් කථා කරන් නට මා අදහස් කරනවා. පසුගිය ආණ්ඩුව පැවති කාලයේදී යුද හමුදාවටත් [illegible] හමුදාවටත් විශාල මුදල් [illegible]

කළා. එහෙත් රටේ සාමය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් විශාල වැඩ කොටසක් භාරව සිටින පොලීසිය සම්බන්ධයෙන් යම් වැදගත් වැඩ කොටසක් කරන්නටයි අපේ ආණ්ඩුව බලාපොරොත්තු වන්නේ. ඒ ගැන මා විශේෂයෙන්ම සන්තෝෂ වෙනවා.

පොලීසියට ආධුනිකයන් තෝරා ගැනී මේදී ගම්බද ප්‍රදේශවලින් පැමිණෙන අය දුම්කරුවන් මුහුණ පාන කරදරකාරී තත්ත්වය ගැන සඳහන් කළ යුතුයි. ගම් වලින් එන අය තෝරා ගැනීමට පෙර බොහොම දරුණු ලෙස පරීක්ෂණ පවත්වන බව තමුන්නාන්සේට මතක් කරන්නට ඕනෑ. යම් කෙනකු පොලීසියට ඇතුළු වීම සඳහා ඉල්ලුම් කළාම ඒ පුද්ගලයා ගැන බොහෝ දුර කරුණු විපරම් කර බලනවා. තාත්තා හෝ බාප්පා හෝ මාමා කෙනකු හෝ රා බොනවාදැයි සොයා බලනවා. ඒ අය රා බීම පොලීසියට එන්නට බලා පොරොත්තු වන අයදුම්කරුට ඒ අවසථාව, ඉඩකඩ, නොලැබී යාමට හේතුවක් වෙන වාය කියනවා. අපට බොහෝ විට මෙවැනි අවසථාවල් ගැන අහන්නට ලැබෙනවා. ගරු මන්ත්‍රීතුමන්ලා මේ ගැන හොඳාකාර දන්නවා. මේ වාගේ හේතුවක් උඩ, වෙනත් සුදුසුකම් සියල්ලක්ම තිබෙන ගම් බද කෙනකුට පොලීසියේ සේවය කිරීමේ අවස්ථාව නැතිව යාම ගැන මගේ බලවත් විරෝධය මේ අවසථාවේ මා ප්‍රකාශ කර නවා.

දැනට මේ තත්ත්වය මේ ආකාරයට පව තිනත් 1952, 1954, 1955, 1956 අවුරුදුවල පොලීසියට ආධුනිකයන් තෝරා ගන්නා විට ඔය විධියේ බාධාවලට මුහුණ පෑ අය පවා බඳවාගෙන තිබෙනවා. යම් යම් පවුල් වලින් ආ උදවිය කිසිම බාධාවකට මුහුණ පාන්නේ නැතිව පොලීසියට ඇතුළත් කර ගෙන තිබෙන අවස්ථාවල් ගැන අපට අසන්නට ලැබෙනවා. නාවලපිටියේ පොලී සියේ ඉන්ස්පෙක්ටර්වරයෙකු සිටියා. ඒ මහත්මයාගේ තාත්තා නෝර්වුඩ් වත්තේ විශාල මංකොල්ලයකට අසු වූ නමුත් එයින් ඒ මහත්මයාට කිසිම කරදරයක් නොවූ බව මතක් කරන්නට කැමතියි. එය කොහොම වෙතත් සිංහල බෞද්ධයකු පොලීසියට ආධුනිකයකු වශයෙන් ඇතුළු වීම සඳහා ඉල්ලුම් පත්‍රයක් යැව්වොත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[චන්ද්‍ර කරුණාරත්න මයා.]

ඔහුට නොයෙක් විධියේ බලපෑම්වලට මුහුණ පාන්නට සිදු වන බව මතක් කරන්නට සිදු වී තිබෙනවා. එහෙත් දැනට පත් වී සිටින පොලිස්පතිතුමා ඉතාමත් දක්ෂ අන්දමින්, සාධාරණ ලෙස වැඩ කටයුතු කරගෙන යන බව අපට දැනගන්නට ලැබී තිබෙනවා. ලුනාවේ රෙස්ට් හවුස් එකට පොලීසියෙන් පැන්න අවස්ථාවේ එහි කෙරුණු දූෂණ වගයක් ගැන අද පත්‍රයක පළ වී තිබෙනවා. ඒ වගේම එතුමා හෙ.ර බුකිකාරයන් මැඩීමටත් උනන්දුවෙන් කටයුතු කරනවා. මේ ආදි වශයෙන් වර්තමාන පොලිස්පතිතුමා මෙවැනි අයුතු වැඩ, දූෂණ කටයුතු මැඩීමට ඉදිරියට ඇවිත් කටයුතු කරන බව කියන්නට කැමතියි.

කිරිඇල්ලේ ගරු මන්ත්‍රීතුමා (පී. බී. විජේසුන්දර මයා.) කීවා, සමහර අය නොයෙකුත් ගරු මන්ත්‍රීවරුන්ට නින්දා කරනවාය කියා. මෙහිදී මා එක් දෙයක් විශේෂයෙන් සඳහන් කරන්නට කැමතියි. අධිරාජ්‍යවාදී ධනපති කොම්පැණිකාරයන්ගෙන් අපේ පළාත්වලට විශාල උවදුරු ඇති වී තිබෙනවා. කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. ඉලංගරත්න මයා.) ඇමතිවරයකුව සිටි කාලයේ ඒ ධනපති කොම්පැණිකාරයන්ට ගැසූ පහර දැනුත් ඔවුන්ට ගැසිය යුතු බව, මා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු වුවත් විශේෂයෙන් මතක් කරන්නට කැමතියි. එසේ ඔවුන්ට පහර නොගැසුවොත් ආර්ථික අතින් මේ රටට නිදහසක් ලබා ගන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. අපේ පළාත්වල—ඉන්නවා—කොත්මලේ කෝට්ඨාශයේ හිටියත් නාවලපිටියටත් බලපෑම් කරනවා—ලොකු සුදු කොම්පැණිකාරයන්. ඒ අධිරාජ්‍යවාදී කොම්පැණිකාරයන් පොලීසියත් තමන්ගේ පැත්තට නම්මාගෙන, අහිංසක වතු කම්කරුවන් තලා පෙළා ඉතා දරුණු අන්දමට වැඩ කරගෙන යනවා. ඒ වත්තේ උප සුපිරින්ටැන්ඩන්ට්වරයා රජයේ උසස් නිලධාරීන්ගේ නෑදෑයන්ගේ මාර්ගයෙන්, වත්තේ ඉන්නා ටී. ආර්. පී. කාරයන් අල්ලාගෙන යාම නවත්වාගෙන තිබෙන බව මා මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරන්නට කැමතියි. ඔහුගේ අදක්ෂ පාලනය නිසා ලක්ෂ 2½ ක තොගයක් කොම්පැණියට නැති වී තිබෙනවා. එහෙත් සිංහල හෝ ලාංකික හෝ කෙනකුගෙන් මෙවැනි වරදක් සිදු වුණා නම් කොළඹ ඉන්නා කොම්පැණිකාරයන් ඒ නැනැත්තා පැය 24 න් දොට්ට දමනවා.

මේ රජය බලයට පත් වූ අවස්ථාවේදී බෝරාකාරයන්ටත්, සින්දිකරුවන්ටත් විරුද්ධව අප ලොකු සටනක් ගෙන ගියා. එහෙත් අද මේ බෝරාකාරයනුත්, සින්දිකරුවනුත් ඉතා දරුණු අන්දමට "බ්ලැක් මාර්කට්" ව්‍යාපාරයේ යෙදෙන බව ඉතා කණගාටුවෙන් ප්‍රකාශ කරන්නට සිදු වී තිබෙනවා. පසුගිය රජය කාලයේදී මෙන්ම මේ කාලයේදීත් ඔවුන් බලපත්‍ර නැත් නම් "කෝටා" අරගෙන "බ්ලැක් මාර්කට්" ජාවාරම බරටම ගෙන යනවා. ඔවුන් "බ්ලැක් මාර්කට්" ගහනවා පමණක් නොවෙයි, දැන් ආසනවලට තරඟ කර මේ රටේ පාලන බලයත් අල්ලා ගන්නට ලැහැස්ති වන බව මා තමුන්නාන්සේට මේ අවස්ථාවේදී කණගාටුවෙන් මතක් කරන්නට කැමතියි.

විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමකු කලින් සඳහන් කළා, නොයෙකුත් පුද්ගලයන්ට අයුතු විධියට ජීප් රථ දී තිබෙනවාය කියා. මීගමු අතුරු මැතිවරණයට ඉදිරිපත් වූ බෝරාකාරයකු 5 ශ්‍රී ජීප් රථ තුනක්ම පාවිච්චි කළ බව මා පෙන්වා දෙන්නට කැමතියි.

**එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.** (මිනුවන්ගොඩ)
*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட)*
(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda)

සතාර් මහත්මියද ?

**චන්ද්‍ර කරුණාරත්න මයා.**
*(திரு. சந்திரா கருணாரத்ன)*
(Mr. Chandra Karunaratne)

සතාර් මහත්මියද, කවුද කියා මා දන්නේ නැහැ.

මේ රටේ රැකී රක්ෂා ප්‍රශ්නය හරි හැටි විසඳන්නේ නැතැයි විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් චෝදනා කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ රටේ රැකිරක්ෂා ප්‍රශ්නය විසඳී නැතැ යි මාත් කලින් කල්පනා කළා. එහෙත් ගරු ඇමතිවරුන්ගේ කොට්ඨාශ වලටත්, දැනට නොයෙකුත් සංයුක්ත මණ්ඩලවල අධ්‍යක්ෂවරුන් වශයෙන් සේවය කරන පරාජිත අපේක්ෂකයන් ගේ කොට්ඨාශවලටත් තොග ගණනේ රක්ෂා සැපයෙන බව, සොයා බලන විට මට පෙනී ගියා. ඇමතිවරුන් මෙන්ම මේ ගරු සභාවේ සිටින සෑම මන්ත්‍රීවරයකුම පාගේ මහ මැතිවරණයකට මුහුණ දී පැමිණ සිටින බව මා රජයට මතක් කරන්නට සතුටුයි. ඒ නිසා, රැකී රක්ෂා දිය යුත්තේ ලංකාවේ අස්සක් මුල්ලක් නැර පැතිර ඉන්නා මුළු මහත් ජනතාව ටම සාධාරණය ඉටු වන ආකාරයට බව මා මෙහිදී විශේෂයෙන් සඳහන් කරන් නට කැමතියි.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)
බොහොම හරි.

**කේ. වයි. එම්. විජේරත්න බණ්ඩා මයා.**
(සොරනාතොට)
*(திரு. கே. வை. எம். விஜேரத்ன பண்டா —சொரணத்தோட்டை)*
(Mr. K. Y. M. Wijeratne Banda—Soranatota)
ඔහොම කීවාට ආණ්ඩුව පිළිගන්නේ නැහැ. මේ පැත්තට ඇවිත් කියන්න.

**චන්ද්‍ර කරුණාරත්න මයා.**
*(திரு. சந்திரா கருணாரத்ன)*
(Mr. Chandra Karunaratne)
අප ආණ්ඩු පක්ෂයේ හිටියත් මහජන යාගේ දැනගැනීම සඳහා මේවා කියන් නේ, අපේ හෘදය සාක්ෂ්‍යයට අනුවයි.

**හේමචන්ද්‍ර සිරිසේන මයා.** (අකුරණ පළමුවන මන්ත්‍රී)
*(திரு. ஹேமச்சந்திர சிறிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)*
(Mr. Hemachandra Sirisena—First Akurana)
විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් කිය නවාට වඩා වැදගත්, ආණ්ඩු පක්ෂයේම මන්ත්‍රීවරුන් මේවා සඳහන් කිරීම.

**චන්ද්‍ර කරුණාරත්න මයා.**
*(திரு. சந்திரா கருணாரத்ன)*
(Mr. Chandra Karunaratne)
ඊළඟට සංස්කෘතික දෙපාර්තමේන්තුව ගැනත් වචන ස්වල්පයක් කියන්නට කැමතියි. ළඟකදී, නාවලපිටියේ උඩ බුලත්ගම ශාසනාරක්ෂක බල මණ්ඩලය මඟින් ඒ පළාතේ ස්වාමීන් වහන්සේ ලාගේ රැස්වීමක් කැඳවා තිබුණා. ඒ රැස් වීමේදී සඳහන් වුණු යම්කිසි දෙයක් මේ විධියට පත්‍රයේ පළ වී තිබෙනවා. එහි ශීර්ෂය මෙසේ සඳහන් වෙනවා :

"Cultural Department a White Elephant"

එහි තවදුරටත් මෙසේ සඳහන් වී තිබෙනවා :

"Although the department aided capitalist temples and other large religious organizations in the cities and main towns which also received thousands and thousands of rupees as aid from various other organizations it did not help the small temples in the rural areas which were the backbone of the nation."

මේ සම්බන්ධව වචන සවල්පයක් ප්‍රකාශ කරන්නට සතුටුයි. නාවලපිටියේ කිසිම රජමහා විහාරයක් නැහැ; කිසිම නින්ද ගමක් නැහැ. අපට තිබෙන්නේ බෝ ගහක් අසල හෝ කොළනියක හෝ සාදා ගත් සාමාන්‍ය පන්සලක් පමණයි. මා මන්ත්‍රීවරයකු වශයෙන් පත් වුණු දා සිට කීප වරක්ම සංස්කෘතික දෙපාර්තමේන්තු වට ගොස් මගේ ආසනයේ සිටින ස්වාමීන් වහන්සේලා ගැන කියා සිටියා. එහෙත් මේ වන තුරු කිසිම විධියකින් ශතයකවත් ආධාරයක් ඒ පන්සල්වලට ලැබී නැති බව කණගාටුවෙන් වුණත් මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ. ඒ පළාතේ බෞද්ධයකු වශයෙන් මා ඒ ගැන මගේ බලවත් විරෝධය ප්‍රකාශ කරනවා. මුදල් වෙන් කරන විට රාමඤ්ඤ නිකායට එක විධිය කටත්, සියම් නිකායට වෙන විධිය කටත්, අමරපුර නිකායට ඊටත් වඩා වෙනස් විධියකටත් මුදල් වෙන් නොකර නිකාය තුනටම එක විධියට මුදල් වෙන් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බ්ලැක් මාර්කට් ව්‍යාපාරය ගැන ඊ ළඟට සඳහන් කරන්නට ඕනෑ. නාවලපිටිය නගරයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[චන්ද්‍ර කරුණාරත්න මයා.]

විශාල වශයෙන් බ්ලැක් මාර්කට් ව්‍යාපාර යෙහි යෙදී සිටින්නන් ඉන්නවා. මම දිසාපතිතුමාටත් මේ ගැන කරුණු ඉදිරිපත් කළා. මිල පාලක නිලධාරීන් ඒ පළාත්වලට බොරුවට ඇවිත් පගා අරගෙන ඒ බ්ලැක් මාර්කට් කාරයන්ට අච්චු නොකෙරෙන විධියට කටයුතු කර යන බව මේ අවස්ථාවේ දී විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ. තවත් එක් කරුණක් මතක් කරන්නට තිබෙනවා. නෙස්ලේ වැනි, කිරි ආහාර ද්‍රව්‍ය ගෙන්වන විශාල කොම්පැනි ඒ ඒ පළාත්වල ජාවාරම් කාරයන් අල්ලාගෙන විශාල කූට ජාවාරම් ගෙන යනවා. ඒ ජාවාරම් කාරයන් ඒ ඒ පළාත්වල කිරි ආහාර ද්‍රව්‍ය එකතු කර චොක්ලට් කොම්පැනිවලට විකුණන බව දැන ගන්නට ලැබී තිබෙනවා. මේ ගැන මා ඒ කොම්පැනියට කිව්වා ; ගරු ඇමතිතුමාට කිව්වා ; දිසාපතිතුමාට කිව්වා. එහෙත් ඒ අයට දඬුවම් කිරීමට අද වන තෙක් කිසිම දෙයක් කර නොතිබීම ගැන මා කණගාටු වෙනවා.

අපේ පළාතේ තිබෙන පාඨශාලා ගැනත් වචනයක් කියන්නට ඕනෑ. පසුගිය වර්ෂයේ නාවලපිටියේ පාසල් ගොඩනැගිලි සඳහා සුළු මුදලක් පමණයි, වෙන් කර තිබුණේ. ඒ මුදල් වෙන් කරන ලද එක ගොඩනැගිල්ලක පමණක් වැඩ යන්තම් පටන්ගෙන තිබෙනවා. අනික් ඒවායේ ටෙන්ඩර්වත් කැඳවා නැහැ. ඒ නිසා ඒ ගොඩනැගිලි ඉක්මණින් තැනවීමට කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටට—විශේෂයෙන් නාවලපිටිය වැනි පළාත්වලට—ඉතා තදින් බලපාන ප්‍රශ්නයක් තමයි, තේ මිල පහත වැටීම පිළිබඳ ප්‍රශ්නය. මගේ හිත මිත්‍ර දෙනියායේ මන්ත්‍රීතුමාත් (සී. එන්. කන්නන්ගර මයා.) ඒ ප්‍රශ්නය පිළිබඳව මේ ගරු සභා වේදී නොයෙක් ප්‍රකාශ කර තිබෙනවා. පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීමේදීත් මේ ගැන කරුණු ඉදිරිපත් කර තිබෙනවා. එහෙත් අද වන තෙක් අපේ පළාත්වල සුළු තේවතු හිමියන්ට හරියාකාර සහනාධාරයක් ලැබෙන වැඩ පිළිවෙළක් ඇති වී නැහැ. සුළු සුළු ආධාර ඒ අයට ලැබෙන පිළිවෙළට ආණ්ඩුවෙන් ලොකු වතුවලට ආධාරදී තිබෙනවා. ඒ ලොකු වතු කාරයන්ට දෙන ආධාරවලින් කිසිම කොටසක් සුළු තේ වතු හිමියන්ට නොලැබෙන බව මා කියන්නට ඕනෑ. තේ මිළ පහත වැටීම නිසා දුකට පත් වී සිටින, තේ කර්මාන්ත යේ යෙදී සිටින ඒ විශාල පිරිසට සහනයක් සැලසීම සඳහා යම් කිසි විශේෂ වැඩ පිළිවෙළක් ඇති කරන ලෙස ගරු මුදල් ඇමතිතුමන්ගෙනුත්, ඒ ගැන වග කිවයුතු අනික් ඇමතිවරුන්ගෙනුත් ඉල්ලමින් මගේ වචන සවල්පය අවසාන කරනවා.

අ. භා. 2.40

**සෝමවීර චන්ද්‍රසිරි මයා.** (කැස්බෑව)
*(திரு. சோமவீர சந்திரசிரி—கெஸ்பேவ)*
(Mr. Somaweera Chandrasiri—Kesbewa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නාවලපිටියේ ගරු මන්ත්‍රීතුමාගෙන් පසුව මට කථා කරන්නට ලැබීම ගැන මා විශේෂයෙන් සන්තෝෂ වෙනවා. තමන්ගේ ආණ්ඩුව කරන විපරීත වැඩ ගැන හොඳ අවබෝධයක් ඒ ගරු මන්ත්‍රීතුමාට ලැබී තිබෙන බව එතුමාගේ කථාවෙන් අපට ඔප්පු වුණා. කට බොරු කිව්වත් දිව බොරු කියන්නේ නැතැයි අපේ සිංහල මිනිසුන් අතර කටකතාවක් තිබෙනවා. ඒ අනුව හිතන විට නාවලපිටියේ ගරු මන්ත්‍රීතුමාට (චන්ද්‍රා කරුණාරත්න මයා.) සත්‍යය ප්‍රකාශ කිරීමට පුළුවන්කම ලැබීම ගැන අප සතුටු වෙනවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට නාවලපිටියේ ගරු මන්ත්‍රීතුමාට ඇමතිවරුන්ගෙන් ලැබෙන සැලකිල්ල, මෙම ආණ්ඩුවෙන් ලැබෙන සැලකිල්ල ඔහොම නම්, විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ට කෙසේ සලකත්දැයි එතුමටා හිතා ගන්නට පුළුවනි. නාවලපිටිය පළාතේ පාඨශාලාවලට ගොස් තිබෙන කලදසාව එහෙම නම්, සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් ඒ ප්‍රදේශයේ පන්සල්වලට දී තිබෙන ආධාර එහෙම නම්, නාවලපිටිය ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු නියෝජනය කරන කොට්ඨාශයක් ව තිබියදීත් ඇති වී තිබෙන තත්ත්වය එහෙම නම්, විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් නියෝජනය කරන කොට්ඨාශවලට මෙම ආණ්ඩුව මොන තරම් නොසැලකිලිමත් විධියට ක්‍රියා කරනවා ඇද්ද ?

පසුගිය ආණ්ඩුවේ සිටි එක්තරා ඇමතිවරයකු කරණකොටගෙන නාවලපිටිය පළාතේ වතුවල අධිපති බලය යන්තම්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

නැති කර ගන්නට පුළුවන් වුණු බව එතුමාගේ කථාවේදී සඳහන් වුණා. මේ රටේ ධනපති අධිපති බලයට යම්කිසි පහරක් ගසා පොදු ජනතාවට යහපතක් කර ගන්නට පුළුවන් වුණේ පසුගිය ආණ්ඩුව පැවැති වකවානුවේදී බව විරුද්ධ පාර්ශවයේ සිටින අපට මෙන්ම මෙම ආණ්ඩුව තුළ සිටින මන්ත්‍රීවරුන්ටද අද පෙනී යෑම ගැන, ඒ විධියට හිතන්නට පුළුවන් වීම ගැන අප සතුටු වෙනවා.

තවද, සින්දි බෝරා ආදී කොට ඇති වෙළෙඳ ව්‍යාපාර ගැනද ඒ ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී සඳහන් වුණා. සින්දි බෝරාකාරයන් පමණක් නොව මේ රටේ සිටින කළුකඩකාරයන්ද එකතු වී ගෙන යන "බ්ලැක් මාකට්" ව්‍යාපාර ගැන නාවල පිටියේ ගරු මන්ත්‍රීතුමා වැනි ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට තේරුම් ගොස් තිබෙනවා නම් වැඩි කලක් යන්නට මත්තෙන් ඒ උදවිය ඒ පැත්ත අතහැර මේ පැත්තට අවුත් වාඩි වෙතැයි අප කල්පනා කරනවා. මන්ත්‍රීවරුන්ට පමණක් නොව මේ රටේ පොදු මහජනතාවට ඇස් ඇරීගෙන එන අවස්ථාවකයි, අද අප ජීවත් වන්නේ. තමන්ට මේ සිදු වී ඇති විපත, කරදරය, කාංකරච්චලය කුමක්දැයි අද මේ රටේ සෑම තැනකම ආන්දෝලනයක් පවතිනවා. මේ රටේ ඇති ප්‍රශ්න විසඳීමට මෙම ආණ්ඩුවට නම් මොන විධියකටවත් පුළුවන්කමක් නැති වීම ඊට හේතුවයි.

රටේ ප්‍රශ්න විසඳීම ගැන කල්පනා කර ඉදිරිපත් කරන ලද මෙම අයවැය ලේඛනය එක්තරා ව්‍යාපාරික අයවැය ලේඛනයක් හැටියට සඳහන් කරන්නට පුළුවනි. ඇත්තෙන්ම මෙය සංවර්ධන අයවැය ලේඛනයක් හැටියට ඉදිරිපත් කොට ඇතත්, මා නම් කියන්නේ මෙය සංවර්ධන අයවැය ලේඛනයක් නොව "හං වර්ධන" අයවැය ලේඛනයක් බවයි. සිංහල භාෂාවේ වචන තේරුම් කළ හැකි පිළිවෙළ අනුව මේ "හං වර්ධනය" යන්න දෙවිධියකට තේරුම් කළ හැකියි. "හං වර්ධනයට" අර්ථ දෙකක් දෙන්නට පුළුවනි. මොට වීම, එතැනම තිබීම, පණ නැති වීම එහෙම නැත්නම් අඩපණ වීම, හං වීම යනුවෙන් අප දක්වනවා. ඒ එක තේරුමක්. එතකොට ඒ අනුව මේ ආණ්ඩුව පණ නැති ආණ්ඩුවක්. මන්ත්‍රීවරුන්ටත් පණ නැහැ; ඇමතිවරුන්ටත් පණ නැහැ; අගමැතිතුමාටත් පණ නැහැ. ඔක්කොම අඩපණයි. ඔක්කොම හං වෙලා.

අනෙක් අර්ථය මොකක්ද? "හං සාප්පුව" යනුවෙන් අපේ ගම්බද ප්‍රදේශවල එක්තරා කථාවක් තිබෙනවා. [බාධා කිරීමක්] ඔව්, අද "ඔබ්සර්වර්" පත්‍රයෙහි එක්තරා ප්‍රවෘත්තියක් පළ වී තිබෙනවා. ඊයේ ලුනාවේ තානායම් පොළේදී පවුල් 16 ක් පොලිස් අත් අඩංගුවට ගෙන ඇති අතර පොලිස් අත් අඩංගුවට ගන්න විට මේ අය නිරුවත්ව සිටියාලු. නිරුවත් තරුණ තරුණියන් එහි සිටි සැටි පත්‍රයෙහි දක්වා තිබෙනවා. ලුනාවේ තානායම් පොළේ ඇති වූ මේ සිද්ධිය ගැන අද "ඔබ්සර්වර්" පත්‍රයෙහි මුල් පිටුවේම සඳහන් වෙනවා. නිරුවත් පාඨශාලා ශිෂ්‍යාවන් පවා එහි සිටියාලු. මේ අනුව දැනටම එක තානායම් පොලක් "හං සාප්පුවක්" බවට පත් වෙලා. ගණිකා වෘත්තිය පවත්වාගෙන යන තැනට "හං සාප්පුව" යනුවෙන් අපේ සමහර ගම්බද උදවිය පාවිච්චි කරනවා. දැනටම එක හං සාප්පුවක් පටන්ගෙන තිබෙන බව "ඔබ්සවර්" පත්‍රයෙන් පෙනී යනවා. මේ ආණ්ඩුවට මුදල් හම්බ කිරීම සඳහා ඇති ලොකුම ක්‍රියා මාර්ගය හං සාප්පු ඇති කිරීමයි. "හිල්ටන්" නමින් හෝ වෙන මොන නම් වලින් හෝ හං සාප්පු පටන් ගෙන මුදල් හම්බ කරන්නටයි, මේ ආණ්ඩුව අදහස් කරන්නේ. මේ "හං සාප්පු ව්‍යාපාරය" නිසාත් මේ වර ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනය "හං වර්ධන අයවැය ලේඛනයක්" හැටියට හඳුන්වන්නට පුළුවනි. පණ නැතිකම නිසාත් හං සාප්පු ඇති කරන නිසාත් මේ අයවැය ලේඛනයට ඒ නම උචිතයි. ඒ වචන ඔස්සේ හිතන කොට මේ ආණ්ඩුවේ හැම දෙයක්ම පණ නැති බව එක පැත්තකින් පේනවා.

මේ ආණ්ඩුව කෘෂිකර්ම ව්‍යාපාරය සඳහා මහන්සි ගන්නවා. එහෙත් එය මහජනයා බොරුවෙන් මුළා කොට රැවටිලි ලෙන් රවටා මහජනයාගේ ඇස්වලට වැලි ගසා කරගෙන යන ව්‍යාපාරයක් හැටියට හඳුන්වා දෙන්නට සිදු වී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෝමවීර චන්ද්‍රසිරි මයා.]

කෘෂිකර්ම ව්‍යාපාරය ඔස්සේ පමණක් නොව සියලු අතින්ම මේ රැවටිල්ල කරන බව අප දන්නවා. එහෙත් කෘෂිකර්ම ව්‍යාපාරය අතින් කරන රැවටිල්ල දියුණු එකක් හැටියට පෙනෙනවා. අද මේ ආණ්ඩුවේ කෘෂිකර්ම ඇමතිවරුන් දෙපොලක් සිටිනවා. එක් අයෙක් ගරු අගමැතිතුමායි. අනික් තැනැත්තා පොල්ගහවෙල මන්ත්‍රීතුමා . (ගරු එම්. ඩී බණ්ඩා) යි. මේ දෙදෙනාගෙන් කොයි තැනැත්තා මේ කටයුත්ත හරියට කරන්නට සූදානම් ද කියා මා දන්නේ නැහැ. හැබැයි පාසැල් ශිෂ්‍යයන් යයි කියමින් ගොයම් පැළ සිටුවීමට ශිෂ්‍යාවන්ම ගෙන්වා ගන්නවා. පාඨශාලා ශිෂ්‍යයින් ඒ කටයුත්තට බැසීම ගැන අප සතුටු වෙනවා. එහෙත් කෙසේ හෝ තමන්ගේ පාඨශාලාවලින් ගැහැණු ළමිස්සියන්ම එක්කර ගෙන යන්නය කියා ගුරුවරුන්ට අණ කරනවා. එසේ එක්කරගෙන ඇවිත් කුඹුරුවල පැළ සිටුවීමට සූදානම් වෙනවා. කොළඹ දිස්ත්‍රික්කයේ ධනපති පාඨශාලාවල සිටින ළමයින් කෙසේ හෝ කුඹුරකට බැස්සවීම ගැන අපි සන්තෝෂ වෙනවා. එහෙත් මේ ළමයින්ගේ කාලයෙන් වැඩි හරියක් ඒ සඳහා යොදවා ඔවුන්ගේ අධ්‍යාපනය මොට්ට කිරීමට නැත්නම් හංකිරීමටයි මේ රජය මේ සූදානම් වන්නේ. ළමයින්ගේ අධ්‍යාපනය හංකිරීමේ ඒ ව්‍යාපාරය මගින් ගුරුවන්ට දඬ ගහනවා ; දඬුවම් කරනවා.

කෘෂිකර්ම ව්‍යාපාරය සාර්ථක කිරීමටය කියා සෑහෙන වැඩ පිළිවෙළක් මේ රජය අරගෙන නැහැ. මේ රජය කෘෂිකර්මය දියුණු කිරීමට මොනම වැඩ පිළිවෙළක්වත් ගන්නේ නැතිව පිටරටත් හාල් යවනවා යයි කියනවා. ඒවා විකාර කතා. මේ රටේ සිටින මිනිසුන්ට කන්නටවත් හාල් ටික සොයා ගන්නට බැරිව තිබෙන අවස්ථාවක අස්වැන්න වැඩිකර ගැනීමට අදහස් කරන්නේ උකුණන් ලවා ගල් අද්දවන්නා සේ පාසැල් ශිෂ්‍යයින් ලවා ගොයම් පැළ ටිකක් සිටුවීමෙනුයි. කෘෂිකර්මය දියුණු කිරීම සඳහා අද කිසියම් ව්‍යාපාරයක් ඇති කර තිබෙනවාද ? පොල්වගාවට පොල් මණ්ඩලයක් තිබෙනවා ; රබර් වගාවට රබර් මණ්ඩලයක් තිබෙනවා ; තේ වගාවට තේ මණ්ඩලයක් තිබෙනවා. එහෙත් අපේ වී වගාවට මොනම මණ්ඩලයක්වත් නැහැ. වී වගාව දියුණු කිරීම සඳහා විශාල ව්‍යාපාරයක් ගෙනයනවාය කියා අගමැතිතුමා කරන ප්‍රකාශයත් මුදල් ඇමතිතුමා කරන ප්‍රකාශයත් යන දෙකම සම්පූර්ණ විලම්බිත ප්‍රකාශයන් හැටියට මේ අවස්ථාවේදී ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. ඒ නිසා කෘෂිකර්මයට මේ රටේ කිසිම තැනක් නැති බව එයින්ම පෙනෙනවා. කිසිම වැවක් ප්‍රතිසංස්කරණය කිරීමට සූදානම් වුණාය කියා මා හිතන්නේ නැහැ. අපේ රටේ කෘෂිකර්මය කොතරම් දියුණු තත්ත්වයකින් තිබුණාද කියා අප විසින් කල්පනා කර බැලිය යුතුයි. මේ ලංකාවේ අද නටබුන් තත්ත්වයට පත් වී තිබෙන වැව් දෙස බලන විට සිංහල රාජධානිය කොතරම් හොඳට මේ රටේ ගොවිතැන දියුණු කර ගෙන සිටියාද කියා අපට හිතා ගන්නට පුළුවන්. එහෙත් ඒ කිසිවක් ගැන සලකන්නේ නැතිව කෘෂිකර්මය දියුණු කිරීමට විශාල ව්‍යාපාරයක් ගෙනයනවාය කියා මහජනතාව රැවටීමට මේ රජය සූදානම් වෙනවා.

මේ රටේ මහා ජාතියට වගකීමේ අයිතිවාසිකම ඇති කර ගන්නා තුරු කෘෂිකර්මය තබා මොනම ව්‍යාපාරයක්වත් සාර්ථක කර ගන්නට ලැබෙන්නේ නැහැ. අද සුළු ජාතීන්ට ඕනෑවට වඩා ඉඩකඩ සලස්වා දී මහා ජාතිය නැති හංග වන තැනට කටයුතු සලස්වා මේ රට සංවර්ධනය කිරීමට මේ ආණ්ඩුව සූදානම් වෙනවා නම් එය ඉතාම මෝඩ කල්පනාවක් හැටියට සලකාගන්නට ඕනෑ. සිංහල රජදරුවන් සිංහල රට සාරවත් බවට පත් කළේත් සිංහල රටේ කෘෂිකර්මය දියුණු කළේත් සිංහල ජාතියට මුල් තැන දී සිංහල ජාතියේ අයිතිවාසිකම් රැක ·ගැනීමට අවස්ථාව සලසා දීමෙන් පසුවයි. එහෙත් මේ ආණ්ඩුව සිංහල ජාතියේ අයිතිවාසිකම් රැකීමට සූදානම් නැහැ. ෆේඩරල් පක්ෂය ඉල්ලන ඕනෑම ඉල්ලීමක් දෙන්නට මේ ආණ්ඩුව ලැහැස්තියි. රටසභා දෙන්නට ලැහැස්තියි ; දෙමළ රාජ්‍යයක් දෙන්නට ලැහැස්තියි ; වෙනත් නොයෙක් දේවල් දෙන්නට ලැහැස්තියි. ඒ අන්දමට සුළු ජාතීන්ට ඉඩ දීමෙන් ආණ්ඩුවක් වැනසෙනවා මිස ආණ්ඩුවක් පවතින්නේ නැති බව අපට ඉතිහාසය විසින් පෙන්වා දී තිබෙනවා. ක්‍රිෂ්තු වර්ෂ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

187 දී රජ පැමිණි සූරතිස්ස රජු මරා දැමුවේ සේන සහ ගුප්තික කියන ද්‍රවිඩ අස්සලයන් දෙදෙනායි. ඒ ද්‍රවිඩයින් දෙදෙනාට සිංහල ආණ්ඩුවේ යම්කිසි සුළු තැනක් ලැබුණු පමණින් ඔවුන් පසුබට නොවී සූරතිස්ස රජු මරා දමා රජ වුණා. මේ දෙමළ ආන්දෝලනය ඇති වුණේ 187 දී ඇති වූ අන්න ඒ සිද්ධියේ සිටයි. ඒ පැමිණි උපද්‍රවය අද ඉතා වැඩි දියුණු ලෙස පවත්වා ගෙන යමින් ද්‍රවිඩයන්ටත් ඉන්දියානුවන්ටත් වැඩිපුර අයිතිවාසිකම් දී කෘෂිකර්මයත් වෙනත් දේවලුත් දියුණු කර මේ රටේ මහජනතාවට සෙතක් සුවයක් සලසාදීමට මේ රජය සූදානම්වීම ගැන අප කණගාටු වෙන්නේ නැහැ. මෙම වැඩ පිළිවෙළ තවදුරටත් මේ ආකාර යෙන්ම පවත්වා ගෙන ගොස් ඉක්මණින්ම ආයුස පිරිහී මේ ආණ්ඩුව සම්පූර්ණයෙන්ම විනාශ වී යනවාට අප තුළ කිසිම සැකයක් ඇත්තේ නැහැ. එම නිසා අප මේ ගැන කනගාටු වන්නේ නැහැ. ගරු මුදල් ඇමතිතුමාගේ මේවර අයවැය ලේඛනය කිසිම එලියක් නොමැති මළගේක ශෝක ප්‍රකාශයක් හැටියටයි, අපට පෙනෙන්නේ. එම අයවැය ලේඛනය මගින් ඉදිරිපත් කරන ලද සංවේගාත්මක පණිවුඩය නැතිනම් ශෝකාලාපය ගරු මුදල් ඇමතිතුමා විසින් ප්‍රකාශ කරන්නට යෙදුණේ කණකොක් හඩක් ඇසෙන්නා සේයි. ජාතිය පිළිබඳව වූ සංවේගදායක පණිවුඩයක් වශයෙනුයි, අප මෙය සලකන්නේ. එම නිසා මේ ගැන සිතන විට අපට උසුලා සිටින්නට පුළුවන්කමක් නැහැ. මේ රටේ සිංහලයන්ගේ අයිතිවාසිකම් මරා දමා, සිංහලයන්ට දිය යුතු තැන නැති කර දමා පවත්වා ගෙන යන මෙම ක්‍රියා මාර්ගය ගැන කිසි සේත් අපට සතුටු වන්නට බැහැ.

මෙම අයවැය ලේඛනයට පමණක් නොවෙයි, අවුරුදු විසි ගණනක් තිස්සේ පවත්වන ලද අයවැය ලේඛන වලට අප ඇහුම්කන් දී තිබෙනවා. බණ්ඩාරනායක මැතිතුමාගේ ආණ්ඩුවෙන් සහ සිරිමා බණ්ඩාරනායක මැතිණියගේ ආණ්ඩුවෙන් පවත්වන ලද අයවැය ලේඛන කථා හැරෙන්නට අනිකුත් අයවැය ලේඛන කථාවලින් යන්තම් පිරිමහින තත්ත්වයක්වත් ඇති වූයේ නැති බව අප පිළිගන්නට ඕනෑ. කිසියම් හොඳ අයවැය ලේඛනයක් මෙතුමන්ගේ යෙදුණා නම් මේ අවුරුදු විසි ගණන ඇතුළත අපේ රට සශ්‍රීක බවට පත් වන්නට ඕනෑ. පසුගිය අවුරුදු විසි ගණන ඇතුළත ජාතියට සුව පිණිස ජාතියට හිත පිණිස, ජාතියේ සංවර්ධනය පිණිස කිසිම අයවැය ලේඛනයක් අප රටේ පහළ වූයේ නැති බව ප්‍රකාශ කරන්නට ඕනෑ. සියල් ලක්ම කෙරුණේ ජනතාව රවටා ඒ ඒ අයට බලයේ රැඳී සිටීමට පමණයි. එම නිසා බලයෙහි පමණක් රැඳී සිටීමට සූදානම් වන මෙවැනි ආණ්ඩුවකින් අපේ රටට විමුක්තියක්, අපේ ජාතියට විමුක්තියක් හෝ අපේ මනුෂ්‍ය ධර්මයන්ට විමුක්තියක් ලබා ගන්නට හැකි වන්නේ නැහැ.

අප රටේ තිබෙන ලොකුම අඩුපාඩුව නම් ආණ්ඩු ක්‍රමයේ වරදයි. මෙවැනි වැරදි සහගත ආණ්ඩු ක්‍රමයක් වෙනස් කිරීමට කිසිම ඇමතිවරයකුට හෝ ආණ්ඩු පක්ෂයේ කිසිම මන්ත්‍රීවරයකුට හෝ වුවමනාවක් නැති බව අපට පැහැදිලියි. අප තව මත් ජීවත් වන්නේ මීට අවුරුදු විස්සකට පමණ පෙර සෝල්බරි සාමි විසින් මෙහි ගෙන ආ එක්තරා ආණ්ඩු ක්‍රමයක ආස්වාදය ලබමිනුයි. සෝල්බරි ක්‍රමය විල්සන් ක්‍රමය, ජොන්සන් ක්‍රමය, හැරල්ඩ් ක්‍රමය යනාදී ක්‍රමවලින් තව දුරටත් ඉදිරිය බලා ගමන් කිරීමට අපට පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඒ ආණ්ඩු ක්‍රමවලින් තවදුරටත් කටයුතු කරගෙන යාමට අපට ශක්තිය ලබා ගත නොහැකි බව ඉදුරා සහතික ලෙස සිතා ගත යුතු තැනට අප දැන් පැමිණ සිටිනවා. මෙම අයවැය කථාව අර විධියේ ඉංග්‍රීසි ක්‍රමයට අනුව එක්තරා අන්දමක උත්සව ස්වරූපයකින් යුක්තව පැවැත් වූ අතර ඊළඟට මෙසේ වාද විවාදාදිය ද පවත්වනවා. එවැනි වැඩ පිළිවෙළකින් පුළුවන් වන්නේ නැහැ මේ රටේ විමුක්තිය පිණිස, නිදහස පිණිස හෝ දියුණුව පිණිස කටයුතු කිරීමට. අප දැන් සිතා ගතයුතුව තිබෙනවා, මේ රට කෘෂිකර්මය අතින් අඩාල බව. ඒවාගේම මේ රට අධ්‍යාපනය අතින් අඩාලයි; සංස්කෘතික අතින් අඩාලයි. මහජනතාවගේ කිසිම ප්‍රශ්නයක් විසඳීමට පුළුවන්කමක් නැති මේ කබල් ආණ්ඩු ක්‍රමය හැකිතරම් ඉක්මණින් විනාශ කර දැමීමට මහන්සි ගන්නවා නම් හොඳයි. මේ ආණ්ඩු ක්‍රමය සම්පූර්ණයෙන් විනාශ කර දමා නියම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෝමවීර චන්ද්‍රසිරි මයා.]

ආණ්ඩු ක්‍රමයක් ඇති කර ගත යුතු කාලය දැන් පැමිණ තිබෙනවා. එය මේ රටේ මහ ජාතියගේ අයිතිවාසිකම් ආරක්ෂ වන විධියේ ආණ්ඩු ක්‍රමයක් විය යුතුයි.

ගෙදරක කුස්සියේ සිටින අම්මණ්ඩිට වුවමනාවක් නැහැ, ගෙයි තිබෙන මකුළු දැල් කඩා දැමීමට. මේ රට සිංහල රට වශයෙන් පිළිගන්නවා නම්, මේ රටේ උසස්ම අයිතිවාසිකම් තිබිය යුතු එකම ජාතිය සිංහල ජාතිය බව සිතන්නට ඕනෑ. සිංහල ජාතියට වුවමනා කරන ආණ්ඩු ක්‍රමයක් මේ රටේ තිබිය යුතුයි. අද ජාතික ආණ්ඩුව යයි කියනු ලබන්නේ ද්‍රවිඩ පක්ෂ කීපයකුත් ද්‍රවිඩයන් කීප දෙනෙකුත් එකතු කර ගෙන පවත්වාගෙන යන හත් හවුල් කෑද හැලියකටයි. ජාතික ආණ්ඩුවක් මේ රටේ තිබෙනවා නම් එය සිංහලයන්ගේ ආණ්ඩුවක් වෙන්නට ඕනෑ. මේ රටේ මහ ජාතිය වන්නේ සිංහල ජාතිය නම් ඔවුන්ගේ ආණ්ඩුවක් ඇති කර ගැනීම කොහෙත්ම ප්‍රජාතන්ත්‍ර විරෝධි වන්නේ නැහැ. ප්‍රජාතන්ත්‍රවාද යයි කියන්නේ වැඩි මහජනතාවගේ සම්පූර්ණ අයිතිය රැක දීමයි. එම නිසා මේ රටේ සිංහල ජනතාවගේ අයිතිවාසිකම් සලස්වා දෙන, ඔවුන්ට තමන්ගේ රට දියුණු කර ගැනීම සඳහා ලබා දිය යුතු දේ ඇප කැප කර දෙන, ආර බාර කර දෙන, ආණ්ඩු ක්‍රමයක් සකස් කර නොදෙනවා නම් ඊට එහායින් පවත්වාගෙන යන ජාතික යයි කියන බොරු ආණ්ඩුවකින් කිසිම වැඩක් සිදු නොවන බව අප පිළිගත යුතුයි.

ෆෙඩරල් පක්ෂය රට සභා ඇති කිරීමට සූදානම් වෙනවා. මෙම අයවැය ලේඛනයෙන් පවා ඊට අවස්ථාව සලසා දී තිබෙන්නේ මන්ද කියා මා ප්‍රශ්න කරනවා. රට සභා ඇති කරලීමේ මුවාවෙන් මේ රටේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ වෙන් කර ගෙන ද්‍රවිඩ මුන්නෙත්‍ර කසාගම් නමැති පක්ෂයත් සමග එකතු වී වෙනම අධිරාජ්‍යයක් ගොඩනංවා ගැනීමට ද්‍රවිඩයන්ට වුවමනා කර තිබෙනවා. එසේ ද්‍රවිඩ අධිරාජ්‍යයක් ගොඩනැංවීම සඳහා අවස්ථාව ලැබෙන තුරු අන්නදොරේ එහෙන් බලා ගෙන සිටිනවා. අන්නදොරේ ජයග්‍රහනය කළ වේලාවේ අත්පුඩි තැලුවේ, [illegible]

රතිඤ්ඤ ආදිය පත්තු කළේ උතුරේ ජනකා යයි. මේ රට සභා ක්‍රමය හේතුකොටගෙන මේ රට දෙකට කඩා කරන්නට ෆෙඩරල් කාරයන් යොදන ප්‍රයත්නයට සම්පූර්ණ ධෛර්‍යයක් ලැබෙනවා. රට සභා පනත වැනි දූෂිත පනතක් මෙම පාර්ලිමේන්තුව ඉදිරියට ගෙන ඒමට සූදානම් කෙරෙන අන්දමේ අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීමෙන් මේ මුදල් ඇමතිවරයා වන්නියේ සිට කරන්නේ වන්නියේ ජනයාට පවා ඉතා විශාල කරදරයක්ය, හිරිහැරයක්ය, අපරාධයක්ය යන්න මෙහිලා සඳහන් කළයුතුයි. බොහෝ කාලයක සිටම මා දන්නා අඳුනන එතුමා මේ විධියේ ජාති ද්‍රෝහී ව්‍යාපාරයකට හවුල් වන පුද්ගලයෙකැයි මා නම් කවදාවත් හිතුවේ නැහැ. එතුමා සිංහල රට පිළිබඳව සිංහල ජාතිය පිළිබඳව විශාල හැඟීමක් ඇල්මක් ඇති කෙනෙකැයි යන බලවත් විශ්වාසයක් මා තුළ මෙතෙක් කල් තිබුණා. එහෙත් දැන් එතුමා ඇමතිකම කෙරෙහි තිබෙන කෑදරකම උඩ ක්‍රියා කර තිබෙන බව පේනවා. අපේ ජාතිය විනාශ වන තැනට කටයුතු කරගෙන යන ද්‍රවිඩ පිරිස් උතුරු නැගෙනහිර පළාත් දෙක වෙන් කරගෙන ඊළඟට ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂයේත් මේ රටට ගලා එන කල්ලතෝනි කාරයින්ගේත් ආධාරය ඇතිව එයිනුත් නොනැවතී මදුරාසි ප්‍රාන්තය ආදී කොට ඇති ප්‍රදේශවල ද්‍රවිඩයිනුත් සමග එකතු වී මේ පිරිස ද්‍රවිඩ අධිරාජ්‍යයක් ගොඩ නගා ගත්තොත් සිංහල ජනතාවට යන කලදසාව කුමක්ද? ඒ කලදසාව කුමක් වේද යන්න දැන ගැනීමට හොඳ මිම්මක් මේ අයවැය ලේඛනයෙන් අපට ලබා ගන්නට පුළුවනි. මේ අයවැය ලේඛනයෙන් සිදු වන අපරාධය විපත මැඩ පවත්වා ගන්නට නම්, තාවකාලිකව තමන්ට ලැබී තිබෙන මන්ත්‍රී පුටුවට වඩා අවුරුදු 2500 ක් නොව අවුරුදු දස දහස් ගණනක් තිස්සේ පැවත එන සිංහල ජාතිය උසස් බවත් එය මකා දැමීම හොඳ නැති බවත් ආණ්ඩු පක්ෂයේ සිටින සිංහල මන්ත්‍රීවරුන් හිතන්නට ඕනෑ. රාවණාගෙන් පටන් ගෙන අගස්තිගෙන් ආලෝලනය වී පුලස්ති ආදීන්ගෙන් ආලෝකමත් වුණු සිංහල ජාතිය නාති කර දමා තමන්ගේ තාවකාලික ඇමති පුටු මන්ත්‍රී පුටු ආරක්ෂා කර ගන්නට මේ රජයේ මැති ඇමතිවරුන් අදහස් කරතොත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊට වඩා හීන දීන නීච නින්දිත නිකෘෂ්ට චණ්ඩාල බලු වැඩක් තවත් නැති බව මා කියන්නට කැමතියි. මේ ඉදිරිපත් කර තිබෙන අයවැය ලේඛනය සංවර්ධන අය වැය ලේඛනයක් නොව "හං වර්ධන" අයවැය ලේඛනයක් යයි මා කියන්නේ ඒ නිසායි.

පිටරටවලින් මේ රටට ඇදී එන විනෝද කාමීන්ගේ කෙළි බිමක් බවට මේ රට පත් කරන්නට යන මේ රජයේ මෙවර අයවැය ලේඛනය තරම් ලජ්ජා නැති අය වැය ලේඛනයක් මා නම් කවදාවත් දැකලා නැහැ. මේ රජයෙන් මීට පෙර ඉදිරිපත් කළ අයවැය ලේඛනත් කිසිම වැඩක් නැති ඒවා තමයි. එහෙත් මේ තරම් ලජ්ජා නැති අයවැය ලේඛනයක් පසුගිය අවුරුදු 21 ඇතුළත ඉදිරිපත් වී නැහැ. හෝටල් හදා සංචාරක ව්‍යාපාර ඇති කොට ඒවාට පැමිණෙනන විනෝද කාමීන්ගේ කකුල් මිරිකන්නටත් ඔවුන් සමග සැතපෙන්නටත් ඔවුන් සමග නිදා ගන්නටත් සිංහල ගෙවල සිටින ගැහැනු ළමස්සියන් යොදවනවාට වඩා එම තරුණියන්ට ඔවුන්ගේ ගෙවල කුස්සිය පැත්තේ බෙල්ලේ වැලක් දාගෙන මැරෙන්නට සැලැස්වීම හොඳයි. ඇමතිකම් මන්ත්‍රීකම් තාව කාලිකයි. වැඩිම වුණොත් ඒවා තිබෙන්නේ අවුරුදු 5 යි. ඒ කාලය තුළ රට ජාතිය විනාශ නොකර තමන්ගේ උතුම් ජාතිය විනාශවන අන් දමේ වැඩ පිළිවෙළවල් ඉදිරිපත් නොකර මේ ඇමති මණ්ඩලය කටයුතු කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

මට තව වචන දෙක තුනක් කථා කරන්නට ඕනෑකම තිබෙනවා. එහෙත් ඊට අවශ්‍ය ඔළුගෙඩි ටික මෙහි නැති නිසා ඒ ගැන මා කනගාටු වෙනවා. අපේ කර්මාන්ත ඇමතිවරයා දැන් මෙහි නැහැ. උන්නැහේට දැන් ජාතිය අමතක වී වෙනත් විධියක ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා. සිංහල ජාතිය පිළිබඳ ලොකු කැක්කුමක් ඇතිව ක්‍රියා කරන අධ්‍යාපන ඇමතිතුමාත් මෙතැන නැහැ. අධ්‍යාපන ඇමතිතුමාගේ සිංහල දැනීමත්, සිංහල භාෂාව පිළිබඳ එතුමා තුළ තිබෙන හැඟීමත් අප දන්නවා. ඒවා බොහොම උසස්. එහෙත් එතුමාට අද මොකක්වත් කර ගන්නට බැරිව ළතවෙනවා. එතුමාට දැන් නිතර අසනීප හැදෙනවා. අධ්‍යාපන ඇමතිතුමා ගරු අගමැතිතුමාගේ බොහොම සුවච කීකරු ගෝලයෙක්. අගමැතිතුමා කොළපතකට පහරා, "ඊරියගොල්ල මෙහෙ වරෙන්, මේක අනුභව කරපන්" කිවුවොත් එය ඉෂ්ට කිරීමට තරම් අධ්‍යාපන ඇමතිතුමා කීකරුයි. ආන්න, හොඳ ලස්සණ එක්කෙනෙක් සභාව තුළට එන බව පෙනෙනවා. ඒ තමයි හං සාප්පු ව්‍යාපාරයෙ නායකයා. පිටරටවලින් එන විනෝද කාමීන්ගේ කකුල් මිරිකීමට අපේ තරුණියන් යෙදවීම සඳහා හෝටල් ඇති කොට එයින් මේ රටට විශාල ආර්ථික ලාභයක් ලබා ගන්නට පුළුවන් යයි එතුමා කල්පනා කරතොත් ඒ තරම් මෝඩ කල්පනාවක් ලජ්ජා නැති අදහසක් තවත් තිබෙනවාදැයි මා අහනවා. පළමුවැනි ලෝක මහා යුද්ධය කාලයේදී "ජර්මන් ගෙවල්" නමින් හැඳින්වුණු තැන් තිබුණා. අපේ රාජ්‍ය ඇමතිතුමා ඇතුළු ඇමතිවරුන් සූදානම් වන්නේ නැවතත් මේ රටේ "ජර්මන් ගෙවල්" ඇති කරන්නටදැයි මා අහනවා. පිටරටවලින් මෙහි එන විනෝද කාමීන්ට අපේ ගැහැනු ළමයින් බිලි කර දී ඒ විනෝදකාමීන්ගේ කකුල් මිරිකන්නට අපේ තරුණියන් යොදවනවාට වඩා දියමන්තියක් ගිලලා මැරෙන එක හොඳ බව අපේ රාජ්‍ය ඇමතිතුමාට මා මතක් කරනවා. මෙහිදී අප වැඩිපුර කථා කරන්නට සූදානම් නැහැ. මගේ කාලය ඉක්ම යනව. නියෝජ්‍ය කථානායකතුමා වරින් වර මා දෙස බලනව. එම නිසා මේ විධියේ නිර්ලජ්ජී අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීමෙන් මේ ආණ්ඩුව තමන්ගේ ලජ්ජා නැතිකම හොඳ හැටි පැහැදිලි කර දුන්න. මේ ලජ්ජා නැති ආණ්ඩුවේ ආයු ප්‍රමාණය, ආයුෂ කාලය ඉතාම කෙටි බව අපට පෙනී යනව. ඒ කෙටි ආයුෂ කාලය අවසාන වීමෙන් මේ රට සුඛිත මුදිත කිරීමට තමුන්නාන්සේලාට ඉක්මණින් නිවන් සැප ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3

**ජේ. එල්. සිරිසේන මයා.** (බිංගිරිය)
*(திரு. ஜே. எல். சிறிசேன—பிங்கிரிய)*
(Mr. J. L. Sirisena—Bingiriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කැස්බෑවේ ගරු මන්ත්‍රීතුමාගේ (චන්ද්‍රසිරි මයා.) යාදින්නෙන් පසුව මට කථා කරන්නට ලැබීම ගැන මා කනගාටු වෙනව. ආසනය ආරක්ෂා වෙනව නම් අපි රටත් ජාතියත් විපතකට හෙළන්නට වුණත් ලැහැස්තිය කියා එතුමා භයක් ප්‍රකාශ කළා. මා එතුමාට කියන්නට කැමතියි, විරුද්ධ පාර්ශ්වයේ සිටින උදවිය කෙසේ වෙතත් ආණ්ඩු පක්ෂයේ සිටින අප කිසිවෙක් රටටත් ජාතියටත් යම්කිසි විපතක් සිදු වීගෙන එන අවස්ථාවකදී මේ ආසනය තුච්ඡුවක් තරමටවත් සලකන්නෙ නැති බව.

එතුමා සංස්කෘතිය ගැන කථා කළා. ඒ අතර කකුල් මිරිකීම, අත පය මිරිකීම ගැනත් සඳහන් කළා. මේ ගරු සභාවේ විතරක් නොවෙයි, මේ රටේ අස්සක් මුල්ලක් නෑර සොයා බැලුවත් ඒ පිළිබඳව හොඳ අභ්‍යාසයක් තිබෙන අය ගරු කැස්බෑවේ මන්ත්‍රීතුමා පමණයි. අමුතුම සංස්කෘතියක් මේ රටේ ඇති කරන්නට දඟලන්නේ කැස්බෑවේ ගරු මන්ත්‍රීතුමා බව අපි ප්‍රකාශ කරන්ට කැමතියි. ඒ වගේම එතුමාගේ සංස්කෘතියට අපි ඇඳෙන්නේ නැති බව දන්වන අතරම, ගරු ඊරියගොල්ල ඇමතිතුමා ඇති කරන්නට බලාපොරොත්තු වන සංස්කෘතියට අපි පුළුවන් තරම් සහයෝගය දෙන බවත් ප්‍රකාශ කරනව.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)

ලූනාවෙ සංස්කෘතිය.

**ආර්. පී. විජේසිරි මයා.** (කුණ්ඩසාලෙ)
*(திரு. ஆர். பீ. விஜேசிறி—குண்டசாலெ)*
(Mr. R. P. Wijesiri—Kundasale)

කවුද ඇප දුන්නෙ? [බාධා කිරීම]

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)

ඒ අයගෙ නම් දැනගන්න ඕනෑද? [බාධා කිරීමක්] මම කියවන්නම්.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please!

**ජේ. එල්. සිරිසේන මයා.**
*(திரு. ஜே. எல். சிறிசேன)*
(Mr. J. L. Sirisena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කරන්නට කම් වුවක් පත් කිරීමට මේ රජය උත්සාහ ගත් සෑම අවස්ථාවකදීම විරුද්ධ පාර්ශ්වය ඊට සහයෝගය නුදුන් බව මේ රටේ කවුරුත් දන්නව. කැස්බෑවේ ගරු මන්ත්‍රීතුමාගේ කථාව සම්බන්ධයෙන් මා ඊට වඩා යමක් කියන්ට යන්නෙ නැහැ.

මේ විවාදයේදී ජීවන වියදම් ප්‍රශ්නය ගැන සෑම ගරු මන්ත්‍රීවරයකුම වගේ සඳහන් කළා. අත්‍යවශ්‍ය බඩු බාහිරාදියේ මිළගය ගැනත් බොහෝ සේ සඳහන් වුණා. ඇත්ත වශයෙන්ම ජීවන වියදම ටිකක් ඉහළ නැඟ තිබෙන බව ඇත්තයි. ජීවන වියදම් අංකය සකස් කිරීමේ ක්‍රමය පවා වැරදි යයි කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) ප්‍රකාශ කළා. පසු ගිය අවුරුදු විසි ගණන තුළම මේ ජීවන වියදම් අංකය සකස් කර තිබෙන්නේ මේ විධියටයි. කිසිම රජයකින් මේ ක්‍රමය වෙනස් කරන්ට ප්‍රයත්නයක් දරා නැහැ. මේ ක්‍රමය සාධාරණ නැති බව මා පෞද්ගලිකව පිළිගන්නව. කොළඹ බල පවත්වන ජීවන වියදම හලාවතට, කුරුණෑගලට, ඒ අන්දමින් බල පවත්වන්නෙ නැහැ. රටේ අනික් ප්‍රදේශවල තත්ත්වයත් එහෙමමයි. එම නිසා ඒ ඒ දිස්ත්‍රික්ක අනුව, ඒ ඒ පළාත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනුව ජීවන වියදම් අංකය සකස් කරනව නම්, ඒ පළාත්වල ජීවන වියදම් අංකය මීට අඩුවෙන් සකස් වෙනවාට කිසිම අනුමානයක් නැහැ. කුරුණෑගල, හලාවත, වැනි එළවුළු ආදි නොයෙක් ද්‍රව්‍ය කොළඹට වඩා පහසු මිළට ලබා ගන්ට පුළුවන් පිට පළාත්වල ජීවන අංකය කොළඹ ජීවන අංකයට වඩා අඩුවෙනව, මා කලින් සඳහන් කළ අන්දමට ඒ ඒ පළාත් අනුව වෙන් වෙන් වශයෙන් ජීවන අංකය සකස් කරනවා නම්. ඒක ටිකක් අමාරු වැඩක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අත්‍යවශ්‍ය බඩු බාහිරාදියේ හිඟය මේ රටේ පවතින්නෙ අද ඊයේ සිට නොවෙයි. 1960 වර්‍ෂයේ සිටම මේ රටේ අත්‍යවශ්‍ය බඩු පාරිභෝගිකයාට අවශ්‍ය ප්‍රමාණය ලබා ගන්ට පුළුවන් කමක් තිබුණෙ නැහැ. ඊට හේතු කීපයක් තිබෙනව. පසුගිය රජය බලයේ සිටි කාලයේදීත්, වර්තමාන ආණ්ඩුව බල යට පත් වීමෙන් පසුවත්, විදේශ විනිමයේ හිඟකම නිසා අත්‍යවශ්‍ය බඩු බාහිරාදිය අවශ්‍ය ප්‍රමාණයට මේ රටට ගෙන්වන්ට අවස්ථාවක් නැතිව ගියා. බඩු තිබෙන්නේ, ටිකයි. ගැනුම්කරුවන් වැඩියි. පාරිභෝගිකයන්ට අවශ්‍ය ප්‍රමාණයට බඩු ලබා ගැනීමට ඇති දුෂ්කරතාවය නිසා මෙසේ බඩු මිළ ඉහළ යාම වළක්වන්නට බැහැ. 1956 සිට 1965 දක්වා රට පාලනය කළ රජයයන් ගෙන ගිය අදූරදර්ශී ක්‍රියා කලාපය නිසා මේ තත්ත්වය ඇති වූ බව හැම කෙනකුම අවිවාදයෙන් පිළිගන්නවා. මේ දුෂ්කර තත්ත්වයට මුහුණ පාන්නට මේ රටේ මුළු මහත් ජනතාවටම සිදු වී තිබෙන්නේ, ඒ නිසයි. අවුරුදු ගණනාවක් තුළ තමන් කළ නාස්තිය අමතක කර දමා, අවුරුද්දකින් දෙකකින් මේ රජය එය හොඳ තත්ත්වයකට ගෙන ඒවියැයි විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්—විශේෂයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්—බලාපොරොත්තු වෙනවා නම්, ඔවුන්ගේ ඒ බලාපොරොත්තුව අවුරුද්දක් දෙකක් තුළ සපුරාලීමට මේ රජයට කොහෙත්ම පුළුවන්කමක් නැති බව මා කණගාටුවෙන් ප්‍රකාශ කරනවා.

විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් විශේෂයෙන් සඳහන් කළ තවත් කාරණයක් තමයි, සමුපකාර ව්‍යාපාරය. එහෙත්, පසුගිය රජය ලංකාවේ සමුපකාර ව්‍යාපාරය සම්පූර්ණයෙන් නැති කර දැමූ බව ඔවුන් අමතක කර තිබෙනවා. අද ගම් බද විවිධ සේවා සමුපකාර සමිතියකට නියම පිළිවෙළට කටයුතු කරන්නට බැරි තත්ත්වයක් පැන නැඟී තිබෙනවා. සමුපකාර සමිති සමඟ තරඟ කිරීමට සමුපකාර තොග වෙළෙඳ ආයතන මඟින් සිල්ලර සාප්පු ඒ පළාත්වල විවෘත කිරීම, එසේ වීමට එකම හේතුවයි. විකිණීම සඳහා බඩු බාහිරාදිය ලබා ගැනීමේ අපහසුව නිසා මීට පෙර බඩු විකිණීමෙන් ඒ සමුපකාර කඩ සමිති ලබා ගත් ලාභය දැන් ලබා ගන්නට බැරි වී තිබෙන අතර, සමුපකාර සමිතිවලින් සියයට 75 කට වැඩි ගණනක් අද අඩපණ වී තිබෙනවා. සමුපකාර ව්‍යාපාරය, මේ රටේ සාමාන්‍ය මහ ජනයාගේ ජීවනාලිය හැටියට ගණන් ගනත් පුළුවන් ව්‍යාපාරයක්. ඒ ව්‍යාපාරය පවා පසුගිය රජයෙන් අඩපණ කර දැමූ නිසා අද එම ව්‍යාපාරයට ඔළුව උස්සන්නට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. මෙන්න මේකයි, නියම තත්ත්වය.

පසුගිය අවුරුද්දේ පොල්, තේ, රබර් නිෂ්පාදනය අඩු වීම පිළිබඳවත් විරුද්ධ පාර්ශවයේ ගරු මන්ත්‍රීවරුන් මේ රජයට දොස් කීවා. 1963, 1964 යන වර්ෂ දෙකේ වර්ෂාපතනයට වඩා අඩුවෙනුයි, 1965, 1966 යන වර්ෂ දෙකේ වර්ෂාපතනය ලැබුණේ. 1967 දක්වා ඒ වර්ෂාපතනයේ අඩුව පැවතුණා. වර්ෂාපතනයේ හිඟකම නිසා සමහර පළාත්වල යල් කන්නයේ ගොවිතැන් පවා මැරී ගියා. එවැනි අවස්ථාවක,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිරිසේන මයා.]
කෘෂිකාර්මික ද්‍රව්‍ය නිෂ්පාදනය අඩු වීම පිළිබඳවත් මේ රජය වගකිව යුතුයැයි පැවසීම ගැන අප කනගාටු වෙනවා.

විශේෂයෙන් මේ අවුරුද්දෙ පොල් නිෂ්පාදනය ගිය අවුරුද්දේ පොල් නිෂ්පාදනයට වඩා සියයට 40 කින් අඩුයි. ගිය අවුරුද්දේ පොල් නිෂ්පාදනය ඊට කලින් අවුරුද්දට—1965 ට—වඩා අඩුයි. මෙයට මූලික හේතුව වර්ෂාපතනයේ අඩු කමයි. කෘෂිකාර්මික නිෂ්පාදකයන්ට රජය ආධාර කරන්නේ නැතැයි වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) රජයට දොස් පවරන අතර, රජය තේ ව්‍යාපාරිකයන්ට පමණක් ආධාර කරනවා යැයි කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) රජයට දෝෂාරෝපණය කරනවා. විශේෂයෙන් පොල් වතු හිමියන්ට සියයට 33 1/3 ක සහනදායක මිළ ක්‍රමයට රජය මඟින් පෝර සපයනවා. රබර් හා තේ වගාවනට මෙන් නොවුණත්, ශත 25 බැගින් පොල් පැළ—මවු ගස් වලින් තෝරු පොල් පැළ—දීමෙන්, පොල් වගාවටත් යම් ප්‍රමාණයකට රජය ආධාර කර තිබෙන බව කියන්නට කැමතියි. ඒ සඳහා රුපියල් 9,00,000 ක් වැය කර තිබෙනවා. ගිය අවුරුද්ද තුළ මේ පොල් පැළ දීමට පමණක් මේ රුපියල් 9,00,000 වැය කර තිබෙනවා.

විරුද්ධ පාර්ශවයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් නිතරම අහන්නට ලැබෙන තවත් වැදගත් කාරණයක් තිබෙනවා. "ඊනියා කෘෂිකර්ම සංවර්ධන සැලැස්ම, ඊනියා ගොවිතැන" ආදි වශයෙන් ඔවුන් නිතරම කියනවා. ගොවිතැන දියුණු වීමත් විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ට ලොකු හිස රදයක් වී තිබෙනවා. ගොවිතැන දියුණු වුණොත්, මේ රජය නැවතත් බලයට පත්වන්නට එයම හේතුවක් වන බවට විරුද්ධ පාර්ශවයේ ගරු මන්ත්‍රීවරුන් තුළ බියක්, සැකයක් ඇති වී තිබෙනවා. අප මොන දේශපාලන මත දරුවත්, අද මේ රටේ පවතින ආර්ථික තත්ත්වය සලකා බලා, අප කවුරුනුත් එකා මෙන් එක්ව ක්‍රියා කොට, මේ රට ආහාරයෙන් වත් ස්වයම්පෝෂිත කර ඒ සඳහා මෙරටින් විදේශවලට ඇදී යන ධනස් කන්ධය මෙහිම නතර කර ගත යුතුව තිබෙනවා. එවැනි අවස්ථාවක අපට සහයෝගය දෙනවා වෙනුවට මේ අය සෑම අවස්ථාවකදීම ගොවියා පවා අධෛර්ය මත් වන විධියට කථා කරනවා. ඒකයි අපට තිබෙන කණගාටුව. කැස්බෑවේ ගරු මන්ත්‍රීතුමා සිංහලයින් ගැනත් සිංහල රට ගැනත් කථා කරද්දී එතුමාගේ සහෝදර මන්ත්‍රීවරු සිංහලයාගේ ජාතික උරුමය වූ ගොවිතැන ගැන බොහොම සුළුවෙනුයි සලකන්නෙ. එය කණගාටුවට කාරණයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සහතික මිළට, එනම් බුසලක් රුපියල් 12 ගණනෙ, වී බුසල් 58,22,500 මිළ දී ගැනීම සඳහා මේ අයවැය ලේඛනයෙන් මුදල් වෙන් කර තිබෙනවා. ඒ මිළට වී ගන්නට නොහැකිය කියා එක් ගරු මන්ත්‍රීවරයකු සඳහන් කළා. ඇත්ත. හලාවත, බිංගිරිය ආදී ප්‍රදේශවල, මා වී වැඩ කරන ප්‍රදේශ වල වී බුසලක් රුපියල් 12 ගණනෙ ගන්නට බැහැ. එම නිසා සහතික මිළට ආණ්ඩුවට ඒ ප්‍රදේශවලින් වැඩියෙන් වී ලැබෙන්නෙ නැහැ. විශේෂයෙන්ම, සම්බා වැනි මා වී බුසලක් රුපියල් 18 ගණනෙ නැත්නම් 20 ගණනෙ විකුණන්නට ගොවියාට අද අවස්ථාවක් ලැබී තිබෙන බව එයින්ම ඔප්පු වෙනවා. වැඩි මිළක් ගන්නට අවස්ථාව ලැබීම නිසා අද ගොවියා වැඩි උනන්දුවකින්, වැඩි ඕනෑකමකින්, වැඩි සතුටකින් ගොවිතැනෙහි යෙදී සිටිනවා. එම නිසා මේ රජය ගොවියාට තැනක් ලබා දුන්නාය කියා අප ආඩම්බර වෙන්නට ඕනෑ.

**එල්. සී. ද සිල්වා මයා. (බලපිටිය)**
*(திரு. எல். சீ. டி சில்வா—பலப்பிட்டிய)*
**(Mr. L. C. de Silva—Balapitiya)**
සම්බ කවදත් ඒ ගණනට විකුණුවා.

**ජේ. එල්. සිරිසේන මයා.**
*(திரு. ஜே. எல். சிறிசேன)*
**(Mr. J. L. Sirisena)**
නැහැ, කවදාවත් විකුණුවේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගොවිතැන සඳහා ණය සහන, පොහොර අඩු මිළට දීම ආදී වශයෙන් නොයෙකුත් ආධාර ක්‍රම මේ රජය මඟින් ආරම්භ කර තිබෙනවා. මීට කලින් ගොවි මහතුන්ට සමුපකාර සමිති මාර්ගයෙන් ණය ලබා ගැනීමේදී යම්කිසි ප්‍රමාදයක් සිදු වුණා. එහෙත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අප පිළියෙළ කර තිබෙන අළුත් වැඩ පිළිවෙළ අනුව ගොවි මහතුන්ට කෙළින්ම මහජන බැංකුවෙන් නැත්නම් ලංකා බැංකුවෙන් ණය ගැනීමේ පහසුව ලැබී තිබෙනවා.

වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) සත්‍යයෙන් තොර තවත් ප්‍රකාශයක් කළා. මේ රජය දුප්පත් මහජනතාවගේ මුදල් පැහැර ගෙන ධනපතියන්ට බෙදා දෙනවාය කියා එතුමා ප්‍රකාශ කළා. එය සත්‍යයෙන් තොර ප්‍රකාශයක් පමණක් නොවෙයි, මහජනතාව මුළා කරන ප්‍රකාශයක්. එතුමා ඒ ප්‍රකාශය කළේ ජීප් රථ ගැන කථා කරද්දීයි. ගොවිතැන සඳහා ජීප් රථයක් ගන්නට අවසර පත් ඉල්ලූ කොයි ගොවි මහත් මයාටද අවසර පත්‍රයක් නොලැබුණේ කියා මා ප්‍රශ්න කරන්නට සතුටුයි. අනික් අතට ගම්බද ප්‍රදේශවල ගොවි මහතුන්ගෙන් සියයට කී දෙනාටද ජීප් රථයක් ගන්නට වත්කමක් තිබෙන්නේ? අවශ්‍යකමක් තිබෙන්නෙ? කාගෙන්වත් කොල්ලකා ගත් මුදලකින් මේ ජීප් රථ ගෙන්වන්නේ නැහැ. විදේශ රටවලින් දෙන නොයෙක් ආධාර ක්‍රම යටතේ තමයි මේ ජීප් රථ ගෙන්වන්නෙ. මේ ජීප් රථ අක්කර දහස් ගණන් අරගෙන වවන සමාගම්වලට, ධනවත් උදවියට, දී තිබෙන බව ඇත්තයි. ඉතින් ඒක කොහොමද කොල්ලකෑමක් වුණේ? කාගෙන්ද කොල්ලකෑවෙ?

විදේශ රටවලින් ආධාර දෙන විට මෙන්න මේ මේ බඩු පමණක් ගන්නය කියා කොන්දේසි දමනවා නම් එය හොඳ ක්‍රියාවක්ය කියා මා පිළිගන්නේ නැහැ. එහෙත් හිඟන්නන්ට තෝරන්නට බැහැ. අවුරුදු නවයක් තිස්සේ පැවති අදක්ෂ පාලනය නිසා මේ රට හිඟන තත්ත්වයකට වැටී තිබෙනවා. අප අද ජීවත් වන්නේ යාචක යුගයකය කියා කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමාත් කියන්නට යෙදුණා අපත් ඒක පිළිගන්නව. අප ජීවත් වන්නේ යාචක යුගයක නම් යාචකයන්ට පුළුවන්ද තෝර තෝර ගන්න? යාචකයන්ට ඔය කොහේවත් තිබෙන, කවුරු වත් දෙන පිළිණු දේවල් ගන්නට සිදු වෙනවා මිස තෝර තෝර ගන්නට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. අන්න එවැනි තත්ත්වයකටයි අද අප මුහුණ පා සිටින්නෙ. එම නිසා විදේශීය රටවල් යම් ආධාරයක් දෙන විට එයින් ජීප් රථ පමණක් නැත්නම් ලොරි බැසි පමණක් ගන්නය කියා කී විට, නැහැ අපට ඒවා එපා, වෙන බඩු වුවමනාය, කියන්නට පුළුවන් තත්ත්වයක් නැහැ. අප හිඟන තත්ත්වයකටයි වැටී තිබෙන්නෙ. මේ රට මෙවැනි හිඟන තත්ත්වයකට පත් වීම ගැන 1956 සිට 1965 දක්වා මේ රට පාලනය කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වගකිවයුතුය කියා මා ප්‍රකාශ කරනවා.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඹුරු අක්කර 1,54,000 ක් තිබෙනවා. ඉහත කාලයේදී මෙයින් සැලකියයුතු ප්‍රමාණයක ගොවිතැන් කළේ අවුරුද්දකට එක කන්නයක් පමණයි. පසුගිය අවුරුද්දේ සිට කන්න දෙකම වැඩ කරනවා. මේ කුඹුරු ප්‍රමාණයෙන් ස්ථාන පහක අක්කර පහකින්, අක්කරයකට වී බුසල් දෙසියයකට වැඩි ප්‍රමාණයක් බැගින් අස්වැන්නක් පසුගිය මාස් කන්නයේ එනම් එක් එක් කන්නයකින් පමණක් ලබා ගන්නට පුළුවන් වූ බව ඇසීමෙන් තමුන්නාන්සේ පුදුමයට පත් වෙනවා ඇති. බිංගිරිය ප්‍රදේශයේ පෝරවැව ප්‍රදේශයේ එක් අක්කරයකින් වී බුසල් 175 කුත් තවත් තැනක අක්කරයකින් වී බුසල් 145 කුත් ලබා ගත්තා. තව තවත් තැන්වලින් සැලකියයුතු අස්වැන්නක් ලබා ගන්නට පසුගිය කාලයේදී හැකි වී තිබෙනවා. නවීන ක්‍රම අනුගමනය කිරීමෙනුත්, පෝර යෙදීමෙනුත්, හොඳාකාර බිම සකස් කිරීමෙනුත්, වැඩි වැඩියෙන් අස්වැන්න ලබා ගැනීමට දැන් ගොවීන් වෙහෙස මහන්සි වෙනවා. ඊට අත දීමක් වශයෙන් රජය දැන් ඒ උදවියට නොයෙක් විධියට ආධාර දීගෙන යනවා. ඒ කොයි හැටි වෙතත්, තවමත් අප කවුරුනුත් බලාපොරොත්තු වන උසස් තත්ත්වයේ ප්‍රතිඵල ලබන්නට මේ කර්තව්‍යයෙන් අපට පුළුවන් වී නැහැ. වී ගොවිතැනින් තවම සියේට සියයක්ම ප්‍රතිඵල ලබාගන්නට පුළුවන් වී නැහැ. ඊට හේතු ගණනාවක්ම තිබෙනවා. සමහර ප්‍රදේශවල ගොවිතැන් දියුණු කිරීමේ කටයුතු භාරව ක්‍රියා කරන නිලධාරීන් නියම විධියට උනන්දුවක් නොදක්වන නිසා විශේෂයෙන්ම අප බලාපොරොත්තු වන තරම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිරිසේන මයා.]

උසස් ප්‍රතිඵල ලබාගන්නට බැරි වී තිබෙන බව පිළිගන්නට අපට සිදු වී තිබෙන බව මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. ඇතැම් ප්‍රදේශවල තත්ත්වය මේ ආකාරයට පවතින නමුත් බොහෝ ප්‍රදේශවල රට, ජාතිය ගැන බොහොම ලොකු කැක්කුමක් ඇතිව සිය කටයුතු නොපිරිහෙළා කරගෙන යන නිලධාරීන් සිටින බව ප්‍රීතියෙන් මේ අවස්ථාවේදී සඳහන් කරන්නට කැමතියි. කොයි ආණ්ඩුවක් බලයට ආවත් මේ විධියේ නිලධාරීන් දෙකොටසක් සිටිනු දකින්නට ලැබීම පුදුමයට කිසිසේත් කාරණයක් නොවෙයි. අනුක්‍රමයෙන් වී ගොවිතැන කෙරෙහි රටවාසීන් මෙන්ම ආණ්ඩුවත් මහජන නියෝජිතයිනුත් දක්වන සැලකිල්ල ගැන කල්පනා කරන විට නුදුරු අනාගතයේදී මේ තත්ත්වය සම්පූර්ණයෙන්ම හොඳ අතට හැරී අපේ ගම් පළාත්වල සිටින ගොවි මහත්වරුන්—අපේ රටේ ජීව නාලිය හැටියට සලකන්නට පුළුවන් ගොවි මහත්වරුන්—තව තවත් උනන්දුවෙන් වැඩ කටයුතු කිරීම නිසා අපට ඉතා සාර්ථක ප්‍රතිඵල නෙලා ගන්නට පුළුවන් වන බවට මා තුළ නම් කිසිම සැකයක් නැහැ. අපේ ගොවි මහතුන් තමන්ගේ වැඩ කොටස බලවත් උනන්දුවකින් කරගෙන යාම නිසාම ලංකා සම සමාජ පක්ෂයටත්, ලංකා කොමියුනිස්ට් පක්ෂයටත්, ඒවායේ නායකයින්ටත් තමන්ගේ උගුරට ලේ රස දැනෙන තුරු කෑගහන්නට පුළුවන්කමක් ලැබී තිබෙන බවත් මෙහිදී කියන්නට කැමතියි. ඒ නිසා මේ රටේ සිටින සියලු දෙනාම අපේ ගොවි මහත්වරුන්ට ණයගැතියි. ඒ අයගේ වැඩවලින් නිසි ප්‍රතිඵල ලැබුණොත් ඉදිරි කාලයේදී මෙතෙක් කල් කළාක් මෙන් අපේ ආහාරය සඳහා පිටරටවල් දෙස බලාගෙන සිටින්නට අපට සිදු නොවේවි. අපේ ආහාරය වෙනුවෙන් අවුරුදු පතා පිටරටවලට ඇදී යන කෝටි සංඛ්‍යාත ධන සම්භාරය මේ රටේම නතර කර ගන්නටත් අපට හැකි වේවි. ලබන අවුරුද්ද තුළ බැරි වුණොත් ලබන අවුරුදු දෙක තුළ ඒ අතින් මේ රට සංවර්ධනය කර ගැනීම ඒ තරම් ලොකු කාර්යයක්ද නොවෙනවා ඇතැයි විශ්වාස කරන්නට අපට පුළුවනි. ඒ නිසා මෙම ආණ්ඩුව නොයෙක් ආකාරයට ආධාර කරමින් ගොවියාට තැන දීමට කරන උත්සාහය ගැන අපේ බලවත් ප්‍රීතිය ප්‍රකාශ කරන්නට ඕනෑ.

1947-56 යුගයේදීත්, 1956-65 යුගයේදීත් මේ රටේ යම් යම් කර්මාන්ත රාශියක් එවකට තිබුණු ආණ්ඩු මගින් ආරම්භ කරන්නට යෙදුණු බව කාටවත් රහසක් නොවෙයි. ආරම්භ කරන ලද ඒ කර්මාන්තවලින් සමහර ඒවා හොඳින් දියුණු වුණු අතර සමහර ඒවා අසාර්ථක වී අතරමග නැවතුණා. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පවත්නා ඕනෑම රටක තත්ත්වය එයයි. මුලින් තිබුණු ආණ්ඩුවක් මගින් ඇති කරන ලද යම් කාර්මික වැඩ පිළිවෙළකින් රටට සෙතක් වෙනවා නම් අලුතින් ඇති වන ආණ්ඩුව එය වැඩි දියුණු කරමින් දිගටම පවත්වාගෙන යනවා. ඒ අතර වැඩක් නොවන අන්දමට කරගෙන යන කර්මාන්ත ඉබේම වාගේ අවලංගු කාසියක් බවට පත්වී අහෝසි වී යනවා. 1947-56 දක්වා තිබුණු පාලන යුගය තුළ ඇති කරන ලද කර්මාන්ත සම්බන්ධයෙනුත් 1956-65 පාලන යුගය තුළ ඇති කරන ලද කර්මාන්ත සම්බන්ධයෙනුත් කියන්නට තිබෙන්නේ එයයි. ආරම්භ කරන ලද කර්මාන්තවලින් හොඳ ඒවා ඉතිරි වූ අතර නරක ඒවා නැති වී ගියා. එය එසේම විය යුතුව තිබුණා. ඒ නිසා ඒ ආණ්ඩුවලට අප කෘතඥ විය යුතුයි. මුලින් තුබුණු තත්ත්වය අමතක වී අද සහයෝගය දක්වමින් සිටිතත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව විසින් මේ රටේ ඇති කරන ලද්දේ සීනිබෝල කර්මාන්තය පමණකැයි එදා දෝෂදර්ශනයට භාජන කළේ යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) බව මතක් කරන්නට කැමතියි. පසුගිය කාලවලදී සිදු වූ දේවල් දැන් බොහොම දෙනකුට මතක නැහැ. ඒ ගැන කරන්නට දෙයක් නැහැ. එය කාගේත් ස්වභාවයයි. විශේෂයෙන්ම දේශපාලකයින්ය කියන මේ විලි ලජ්ජා නැති කොටසේ උදවියට කවදත් සිදු වන්නේ එහෙම තමයි. එදා කළ දේ අද අමතකයි. මටත් එහෙම වෙන්නට පුළුවනි. ඒකයි මේ රටේ තත්ත්වය. ඒක නොකියා බැහැ. මා කියන්නේ මා දන්න තරමින් ඇත්ත නිසා ඒ ගැන කරන්නට දෙයක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊයේ-පෙරේදා අපේ සෞඛ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා කී දෙයක් මට මතක් වෙනවා. කෝටි හැටක් වියදම් කර පසුගිය අවුරුදු පහ තුළ ඇති කළ සංයුක්ත මණ්ඩල 20ක් මගින් ඇති කළ කර්මාන්තවලින් ලැබී ඇති ලාභය වැය කළ මුදලින් සියේට දශම පහකැයි එතුමා ප්‍රකාශ කළා. එයින් හිතා ගන්නට පුළුවනි, ඒ ආණ්ඩුව ඇති කළ කර්මාන්තවල තත්ත්වය මොකක්ද යන වග. ගණන් එකතු කරන්නට පුළුවන් හැම දෙනාම මේ කාරණය තේරුම් ගන්නවා ඇති.

පොල් වගාව ගැනත් වචනයක් කියන්නට කැමතියි. පොල් වගාවට කිසිම ආණ්ඩුවකින් සෑහෙන ආධාරයක් ලැබී නැහැ.

දැනට අක්කර 20ට වඩා විශාල පොල් වතු හිමියන්ට ආධාර විශයෙන් පෝර වල මිළ සියයට 33 1/3 ක් අඩු කර දෙනවා. අක්කර 20 ට අඩු පොල් වතු හිමියන්ට සියයට 50 ක් මිළ අඩු කර පෝර සපයනවා. ඊට අමතරව ආධාර වශයෙන් අද කරන්නේ පොල් මණ්ඩලයෙන් පොල් පැළයක් ශත 25 ගණනේ සැපයීමයි. පොල් දෙවැනි වගාව සඳහා අක්කරයකට රුපියල් 400 ක බැගින් වූ ආධාර මුදලක් ගෙවිය යුතුය කියා 1965 ගේ අයවැය විවාදයේදී මා මේ ගරු සභාවට යෝජනාවක් ඉදිරිපත් කළා. රජය එය පිළිගත්තා. ඒ යෝජනාව ක්‍රියාත්මක කිරීමට යම් යම් නීති රීතිත් සකස් වේ ගෙන එද්දී සැලැස්ම පිළියෙල කරන ඇමති අංශයෙන් කියන්නට යෙදුණා, වැඩි වැඩියෙන් පෝර කිරීමට ආධාර දීමෙන්, දෙවැනි වගාවට ආධාර දෙනවාට වඩා ඉක්මනින් ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන්ය කියා. මා එය පිළිගන්නවා. එහෙත් පෝර සඳහාත්, පැළ සැපයීම සඳහාත් දැනට වියදම් කරන්නේ රුපියල් දස ලක්ෂ 12ක මුදලක් පමණයි. මගේ යෝජනාව වුණේ පොල් දෙවැනි වරට වගා කිරීම සඳහා අක්කරයකට රුපියල් 400 බැගින් අවුරුදු 5ක කාලයක් ඇතුළත ගෙවිය යුතුය කියායි. ඊට පසුව පත් කරන ලද කමිටුවක් ඒ මුදල රුපියල් 500 කළ යුතුය කියා නිර්දේශ කළා. රුපියල් 500ක මුදල ඉතාම සාධාරණයි. දැනට මෙන් පෝර සඳහා ආධාර දෙන අතරම දෙවැනි වගාව සඳහා අක්කරයකට රුපියල් 500 බැගින් ආධාර වශයෙන් දෙනවා නම් රුපියල් දස ලක්ෂ 21ක් වියදම් වෙනවා. ලංකාවේ පොල් අක්කර 11,50,000 ක් තියෙනවා. එයින් විශාල පොල් වතු තිබෙන්නේ අක්කර 4,10,000 ක ප්‍රමාණයක් පමණයි. ඉතිරි අක්කර 7,40,000 ම කුඩා පොල් වතු හිමියන්ට අයිති වතු. මේවා අයිති ලාංකිකයන්ටයි. තවත් පැහැදිලිව කියනවා නම් මේ වතු අයිති සිංහලයන්ටයි. ඒ නිසා පෝර සඳහා දැන් කෙරෙන පිළිවෙළට ආධාර දෙන අතරම දෙවැනි වගාව සඳහාත් අක්කරයකට රුපියල් 500 බැගින් අවුරුදු 5 ක් තුළ ගෙවීමේ ක්‍රමයත් ක්‍රියාත්මක කළ යුතු බව මා නැවතත් ප්‍රකාශ කරන්නට සතුටුයි.

මා කලින් සඳහන් කළ කමිටුවේ වාර්තාවේ සඳහන් වෙනවා, ලොකු පොල් වතු හිමියන්ටත් පෝර මිළ සියයට 33 1/3ක් නොව සියයට 50 ක්ම අඩු කර ආධාර දිය යුතුය කියා. මාත් ලොකු වතු හිමියකු ළඟ රක්ෂාවේ යෙදී සිටින කෙනෙක්. එහෙත් මා ඒ අදහසට විරුද්ධයි. ලොකු වතු හිමියන්ටත්, කුඩා වතු හිමියන්ටත් එකම විධියට ආධාර කිරීම යුතු නැහැ. ලොකු වතු හිමියන්ට සියයට 33 1/3 ක ආධාරයක් දෙන අතර කුඩා වතු හිමියන්ට සියයට 50ක ආධාරයක් දීමේ දැනට පවතින ක්‍රමය ඉදිරියටත් එසේම පවත්වාගෙන යා යුතු බව මා ප්‍රකාශ කරන්නට සතුටුයි. ඒ සමගම ලබන වර්ෂයේ පටන් පොල් දෙවැනි වගාව සඳහා අක්කරයකට රුපියල් 500 බැගින් ආධාර වශයෙන් දීමේ ක්‍රමයක් මේ රජය ක්‍රියාත්මක කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

පොල් වගාව ගැන කථා කරන මේ අවස්ථාවේදී තවත් වැදගත් කරුණක් මේ ගරු සභාවේදී මතක් කළ යුතුව තිබෙනවා. පොල් වගාව වැඩි වශයෙන් කෙරෙන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහ හලාවත දිස්ත්‍රික්කයේයි. එහෙත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහ හලාවත දිස්ත්‍රික්කයේ පොල්වතුවල පාලකවරුන් ස්වාමිවරුන්, ඒ වෘත්තිය සමිති සංගම් සමග හෝ කම්කරු දෙපාර්තමේන්තු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිරිසේන මයා.]

වත් සමග හෝ බැඳෙන ගිවිසුම් එකකට වත් යටත් වන්නෙ නැහැ. ඒ ගිවිසුම් එකක්වත් ඔවුන් වෙනුවෙන් ක්‍රියාත්මක වන්නේ නැහැ. මෙය ඉතා කණගාටුදායක තත්ත්වයක්. මේ රජය පටන් ගත් පසු කම්කරු ඇමතිතුමා පඩි පාලක සභා විශාල ගණනක් ඇති කළා; දෛනික වැටුප් ලබන කම්කරුවන්ට නොයෙකුත් පහසුකම් ඇති කළා; කම්කරුවන්ගේ යහපත සඳහා වෙනත් නොයෙකුත් අයුරින් කටයුතු කළා. සමහර විට මේ කාරණය ගැන ගරු ඇමතිතුමා දන්නෙ නැතුව ඇති. ලංකාවේ අනිකුත් සෑම වතුවලම සිටින පාලකයන්ට කම්කරු දෙපාර්තමේන්තුව සමග හෝ වෘත්තීය සමිති සමග හෝ බැඳෙන ගිවිසුම් ක්‍රියාත්මක වෙනවා. එහෙත් පොල් වතුවල ස්වාමිවරුන්—පාලකයන්—පොල් වතුවල වැඩ කරන මාස් පඩි කාරයන් සම්බන්ධයෙන් බැඳෙන ගිවිසුම් ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒවා ඒ අය පිළිගන්නේ නැහැ. මේ ව්‍යාකූල තත්ත්වය නැති කිරීමට ගරු ඇමතිතුමා ක්‍රියා කරනවා ඇතැයි මං බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව අසන් කරන්නට මත්තෙන් මගේ පෞද්ගලික අදහසක්ද ප්‍රකාශ කරන්නට කැමතියි. රුපියල් 99 කෝටි 50 ලක්ෂයක අඩුවක් තිබෙන බව ගරු මුදල් ඇමතිතුමාගේ කථාවෙන් හෙළි වුණා. අපේ රටේ දේශපාලන පක්ෂවල ඇති ගැටුම නිසා කරන්නට බැරි වැඩ හුඟක් තිබෙනවා. කුමන දේශපාලන පක්ෂය බලයට පත් වුණත් සිදු වී තිබෙන්නේ හාල් සලාක පහසුකම් සලසනවා වාගේම අධ්‍යාපන පහසුකම්, සෞඛ්‍ය පහසුකම් ආදියත් නොමිළයේම මහජනයාට සපයන්නටයි. එසේ හෙයින් මගේ පෞද්ගලික අදහස අනුව පහත සඳහන් කාරණා කියන්නට කැමතියි. මුදල් තිබෙන, ගෙවන්නට ශක්තියක් සහ කැමැත්තක් තිබෙන අයගෙන් අධ්‍යාපනය සඳහා මුදල් අය කළාට ඇති වරද මොකක්ද? සෑම දෙනාටම එක හා සමාන අධ්‍යාපනයක් දෙන අතර ගෙවන්නට ශක්තියක් කැමැත්තක් තිබෙන අයගෙන් අධ්‍යාපනය වෙනුවෙන් මුදල් අය කළාට වරදක් නැහැ. සෞඛ්‍ය පහසුකම් සම්බන්ධයෙන් වුණත් මට කියන්නට ඇත්තේ ඒකයි. ගම්බද ප්‍රදේශවල සිටින ඇපොතිකරි මහත්වරුන් මාස් පතා රුපියල් දහස් ගණන් උපයනවා. අලුතෙන් දොස්තරවරුන් සහ හෙදියන් පත් කිරීම සඳහා රුපියල් හැත්තෑ ලක්ෂයක මුදලක් අවශ්‍ය වන බව ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේ කථාවේදී ප්‍රකාශ වුණා. මුදල් ගෙවා බෙහෙත් ලබා ගනන්ට පුළුවන් අයගෙන් ගාස්තුවක් අය කිරීමේ වැඩ පිළිවෙළක් යෙදුවොත් කිසිම අපහසුවක් නැතිව මෙම රුපියල් හැත්තෑ ලක්ෂය සොයා ගන්නට පුළුවන් යයි මා කල්පනා කරනවා. ගෙවන්නට ශක්තියක් තිබෙන අය ගෙවුවාට ඇති වරද මොකක්ද? ගෙවන්නට පුළුවන් කැමති අයගෙන් මුදල් ලබාගෙන රිසිට් පත් දෙන ලෙස ඇපොතිකරි මහත්වරුන්ට නියම කළහොත් ඇත්තෙන්ම වුවමනා කර තිබෙන හැත්තෑ ලක්ෂයට වැඩි මුදලක් උපයා ගන්නට පුළුවන් වේවි. මුදල් දීමෙන් හොඳ බෙහෙත් ලබා ගන්නට පුළුවනැයි මිනිසුන් අතර හැඟීමක් තිබෙනවා. මිනිසුන්ගේ මානසික තත්ත්වය ඒකයි. ඒ නිසා ගෙවන්නට සතුටු, ගෙවන්නට මුදල් තිබෙන අයට රිසිට් පත් දී මුදල් ලබා ගන්නට පුළුවනි. කැමැති අයට ගෙවන්නට ඉඩ දෙන්නට පුළුවනි. ගෙව්වත් නොගෙව්වත් බෙහෙත්වල වෙනසක් ඇති කළ යුතු නැහැ.

බ්‍රිතාන්‍යයන් මේ රට පාලනය කළ කාලයේදී මහජනයා බෙහෙත් ගැනීම සඳහා දිස්පැන්සරිවලට පැමිණි විට ඔවුන්ගේ ආදායම කෙතෙක්දැයි ප්‍රකාශ කරන්නට ඔවුන්ට සිදු වුණා. යම්කිසි ප්‍රමාණයකින් එහා ආදායම ලැබුණු අයට ඔවුන් ලබා ගන්නා බෙහෙත් සඳහා මුදලක් ගෙවන්නටත් එදා සිදු වුණා. එදා කළ මේ වැඩේ අද කරන්නට බැරි ඇයි? දිළින්දා මුදල් නොගෙවිය යුතු අතර පොහොසතා මුදල් ගෙවිය යුතුයි. ඒ විධියට ක්‍රමයක් සකස් කරනවා නම් විශාල මුදලක් එකතු කර ගන්නට පුළුවන් වන අතර ඒ මුදල් මහජනයාගේ ප්‍රයෝජනය සඳහාම යොදවන්නට පුළුවනි. විරුද්ධ පැත්තේ සිටින උදවියත් ආණ්ඩු පැත්තේ සිටින උදවියත් යන මේ දෙගොල්ලන්ම එකතු වෙනවා නම් කිසිම අපහසුවක් නැතිව මේ රට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දියුණු කරන්නට පුළුවනි. ඉහත කී විධියේ වැඩවලට දෙපැත්තෙන්ම සහාය අවශ්‍යයි. දිළින්දාටත් කෝටි පතියාටත් යන දෙදෙනාටම නොමිලයේම ඒ පහසුකම් සලසන්නට ඕනෑ නැහැ. දිළින්දාට නොමිලයේම ඒ සේවා සපයන අතර කෝටිපතියාගෙන් මුදල් අය කළ යුතුයි. සියලු දෙනාටම නිකම් දෙන්නට ගියාම ජාතියක් හැටියට අපට දියුණු වන්නට බැහැ; ඉදිරියට යන්නට බැහැ.

තව එක කාරණයක් මතක් කරන්නට තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමා විසින් සලු සල නමින් ඒකාබද්ධ ස්කන්ධ සමාගමක් ආරම්භ කරනු ලැබ තිබෙනවා. සලු සල නමින් ස්කන්ධ සමාගමක් ආරම්භ කර ඇතිවා සේම අනෙකුත් ආනයන හා අපනයන බඩු සඳහාද තව තවත් ස්කන්ධ සමගාම් පණහක් හැටක් ඇති කරතොත් එයින් මේ රටට විශාල ප්‍රයෝජනයක් සැලසෙනවා ඇති. දැනට බඩු ආනයන කරන හා අපනයන කරන මේ රටේ උපන් ලාංකිකයන්, සිංහලයන් කී දෙනකු සිටිනවාද? ආනයන හා අපනයන වෙළෙඳාම සම්පූර්ණයෙනම් වාගේ තිබෙන්නේ ඉන්දියානුවන් අතේයි; සින්දි බෝරාකාරයන් අතේයි. එසේ හෙයින් මේ විධියේ ස්කන්ධ සමාගම් ඇති කොට අපනයන හා ආනයන වෙළෙඳාම ඒවාට පවරා දෙනවා ඇතැයිද, ඒ ඒ බඩු ඒ ඒ සමාගම්වලට පවරා දෙනවා ඇතැයිද, බලාපොරොත්තු වෙමින් හා එයින් ලැබෙන ආදායම් යොදා රට සංවර්ධනය කරනවා ඇතැයිද බලාපොරොත්තු වෙමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 3.30

**පී. බී. තෙන්නකෝන් මයා.**

*(திரு. ரீ. பி. தென்னகோன்)*

(Mr. T. B. Tennekoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ වන්නිනායක මුදල් ඇමතිතුමාගේ තුන්වන අයවැය ලේඛනය ගැන වචන කීපයක් ප්‍රකාශ කරන්නට මාත් කල්පනා කරනවා. ඊට පෙර කාරණයක් මතක් කරන්නට කැමතියි. අප අයවැය ලේඛන ගැන ඕනෑ තරම් කථා කර තිබෙනවා, දීඝ වශයෙන් හා ඕනෑකමින් යුක්තව කථා කර තිබෙනවා. එහෙත් අප ගත් මහන්සියේ තරමට අප දැක්වූ උනන්දුවේ තරමට ප්‍රතිඵල ලැබුණු බවක් නම් පෙනෙන්නට නැහැ. මේ අයවැය ලේඛන සම්බන්ධව අප කථා කිරීමත් බීරි අලින්ට වීණා ගයනවා වගෙයි. කොතරම් වීනා ගායනා කළත් බීරි අලින්ට ඇසෙන්නේ නැහැ. අලි සියලුදෙනාම දැන් බිහිරන් වී සිටිනවා. එසේ වුවත් සිරිතක් වශයෙන් මේ ගරු සභාවේදී අයවැය ලේඛනය සම්බන්ධව වචනයක් දෙකක් කියන්නට ඕනෑ. සාමාන්‍යයෙන් අවංකව කල්පනා කර ගෙන යනවා නම් අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීමය කියන එක සම්පූර්ණ බොරුවක්. මෙය අධිරාජ්‍යවාදී ක්‍රමයක් අනුව ලබාගත් ව්‍යාජ වැඩක් බව මේ අවස්ථාවේදී ස්ථිරවම ප්‍රකාශ කරන්න කමතියි. අයවැය ලේඛනයක් ඉදිරිපත් කළ විට අප පුළුවන් තරමින් ඒ සම්බන්ධව අපේ අදහස් ප්‍රකාශ කරනවා. මා මේ හිතට විරුද්ධව කිසිම දවසක කොයි අන්දමකින්වත්—අයවැය ලේඛනය ගැන පමණක් නොවෙයි, කුමක් ගැන වුවත්—මගේ දේශපාලන ජීවිතයේදී කරන්නේ නැති බව මා කියනවා. යම් හොඳක් තිබෙනවා නම් කිසිම බයක් නැතිව ඒ හොඳ ප්‍රකාශ කරනවා. නරකක් තිබෙනවා නම් කොයි පැත්තේ වුවත් ඒ නරක ගැන මගේ අදහස් මා ප්‍රකාශ කරනවා. දේශපාලන බිමේ අද කරන ප්‍රකාශ හෙට බොරු වෙනවා යයි බිංගිරියේ ගරු මන්ත්‍රීතුමා (ජේ. එල්. සිරිසේන මයා.) කිව්වත්, අවුරුදු 30ක් පමණ වූ මගේ දේශපාලන ජීවිතයේදී මා කළ ප්‍රකාශයක් ගැන නැවත එය එහෙම නොවෙයි කියා මා නම් කියලා නැහැ. අප දේශපාලන සටන ආරම්භ කළ දින සිටම ඒ සටන ඒ අන්දමින්ම දිගටම කර ගෙන යන්නට අපට පුළුවන් වී තිබෙනවා.

මේ රටේ ජාතිය සර්ව සම්පූර්ණ ජාතියක් වශයෙන් පැවත එන අතරතුරේ නොයෙක් ආපදා උඩ විදේශිකයින්ගේ බලපෑම් නිසා අපේ ජාතිය සම්පූර්ණයෙන්ම දිළිඳු හිඟන ජාතියක් බවට පත්වූ බව අප පිළිගන්නවා. අද වෛද්‍ය ආධාර, අධ්‍යාපන ආධාර ආදී නොයෙකුත් ආධාර මහ ජනතාවට දෙමින් කටයුතු කරන්නට අපට සිදු වී තිබෙන බව බිංගිරියේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා. එසේ වී තිබෙන්නේ අපේ ජාතිය ඒ තරම් ප්‍රපාතයකට වැටී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජී. බී. සෙන්නායක් මයා.]

සිටින නිසයි. එසේ වී තිබෙන්නේ මේ ජාතිය පාගාගෙන සිටින අධිරාජ්‍යවාදීන් ගේ බලය නිසයි. මේ රටේ සාමාන්‍ය ජනතාව ජීවත් වුණේ මනුෂ්‍යයින් හැටියට නොවෙයි. මිනිසුන් හැටියට එළියට එන්නට සාමාන්‍ය මහජනතාවට පුළුවන් වුණේත් අපේ ගම්වල අයට මනුෂ්‍යත්වය පිළිබඳ හැඟීමක් ඇති වුණේත් 1956 න් පසුවයි. ඒ පිළිබඳව හොඳ කථාවක් මම තමුන්නාන්සේට කියන්නම්. නියම නම් ගම් සහිතවම කියන්නම්.

මා දවසක් මාතලේ කච්චේරියට ගියා. ඒ කච්චේරියේ එවකට දිසාපති වශයෙන් සිටියේ කේ. බී. දිසානායක කියා මහත්මයෙක්. ඒ මහත්මයා සිටි කච්චේරි කාමරයට මා ගියේ පාර්ලිමේන්තු ලේකම් වරයෙක් වශයෙන්. ඒ අවස්ථාවේ සීගිරියට එහා තිබෙන අහිංසක මිනිසුන් සිටින ගමක කෙනෙක්—ඒ ගමේ සිටින්නේ අපේ බෙර ගහන කුලයේ සහෝදරයෝ—දිසාපතිතුමා ගේ කාමරයේ දොරකඩටම ආවා. දිසාපතිතුමා ඒ නැනැත්තාව හඳුනන නිසා ඔහුට කතා කොට "උප ඇමතිතුමාට කතා කළායින් පසු මා තමුසේට කතා කරන්නම්; එම නිසා ටිකක් ඉන්න" යනුවෙන් කියන්නට යෙදුණා. එය ඇසූ මා දිසාපතිතුමාට කතාකොට කිව්වා, ඒ මහත්මයාත් මා සමගම දඹුල්ලට යන්න සිටින කෙනෙක් නිසා මට කලින් ඔහුට කතා කළොත් ඉතා වැදගත් දෙයක් බව. මගේ ඉල්ලීම අනුව එම දිසාපතිතුමා ඒ මහත්මයාට කතාකොට කරුණු අසා ගත්තා. ඒ කරුණු අසා ගැනීමෙන් අනතුරුව තමයි, දිසාපතිතුමා ළඟට මා ගියේ. ඒ මහතා දිසාපතිතුමා හමුවීමෙන් පසු එළියට ගොස් නැවති සිටියා. දිසාපතිතුමාත් සමග කළ කතාවෙන් පසු එතුමාත් සමග වාහනයට නැගුණු මා අර මහත්මයාටද කතා කොට ඔහුගෙන් එක්තරා ප්‍රශ්නයක් ඇසුවා. මා එදා ඔහුගෙන් එම ප්‍රශ්නය ඇසූ පිළිවෙළ වමයි, මේ කියන්නේ. ඒ මහත්මයාගේ නම රන්බරණයි. "රන්බරණෝ, දිසාපතිගොල්ල මින් පෙර "තමුසේ" කියා කතා කරනු කාලයක් මතක තිබෙනවාද ?" කියන ප්‍රශ්නයයි, මා ඔහුගෙන් ඇසුවේ. ඒපාර රන්බණ්ඩා මහතා මට පිළිතුරු දෙමින්, "අනේ උත්තමයා, අපට ඒයා ඒ කාලේ උත්තමයලාටවත් ඔය දිසා හාමුදුරුගොල්ල වැනි උසස් උදවිය "තමුසේ" කියා කතා කරන්නේ නැහැ; මෙහෙම කතා කරනවා අපට අසන්නට ලැබුණේ අපේ දිවංගත ගරු බණ්ඩාරනායක අගමැතිතුමා පිහිටෙව්ව ආණ්ඩුවෙන් පසුවයි" යන ආකාරයට කිව්වා. ඔය කතාවට මුල් වූ දිසානායක නමැති දිසාපතිතුමාත් රන්බණ්ඩා මහත්මයාත් අද පවා අප අතර සිටිනවා. ඔන්න ඔහොමයි තත්ත්වය. අපේ රටේ වැටී තිබුණු ගම්වල උදවිය අතුරින් ඔළුව උස්සන්නට තරම් අයිතිවාසිකම් ලැබී තිබෙන්නේ අතලොස් සකට පමණක් බව අප අමතක කළයුතු නැහැ. ඒ අතලොස්ස කවුද? යුරෝපීය යන් අනුගමනය කරමින් ඔවුන්ට බැල මෙහෙවර කරමින් ඔවුන්ගේ සිරිත විරිත කරට ගනිමින් කටයුතු කළ පිරිසයි. යම් කිසි තත්ත්වයක මිනිසුන් හැටියට මේ රටේ වාසය කරන්නවත් ඉඩකඩ සැලසුනේ එම උදවියටයි. අපේ රටේ දේශපාලන සටන ඇති වුණේ එම තත්ත්වය මගහරවා ගැනීමේ අදහසිනුයි. අපේ එම දේශපාලන සටන ආරම්භ කළ විට අපට නොයෙකුත් කරදර හිරිහැර ඇති වුණා. යුරෝපාකාරයින් අනුව හැඩගැසුණු පිරිස ගෙන් අපට නොයෙකුත් අන්දමේ හිරිහැර සිදු වුණා. අපේ භාෂාවට ලැදිකම් දක්වනවාය කියන, අපේ ජාතියේය කියන, සිංහලය වෙනුවෙන් මැරෙන්න කතාකරන එවැනි උදවියගෙනුයි විශේෂ යෙන්ම අපට තදබල අන්දමින් පහර වැදුණේ. ඒ බව අප කවදාවත් අමතක කළයුතු නැහැ. ඔය ලොක්කන්ය කියන උදවියගෙන් ගන්නට තිබෙන්නේ ඔවුන් භාවිත කරන ඉංග්‍රීසි ටික පමණයි. ඔවුන් භාවිත කරන ඉංගිසි ටික අරගෙන පසෙකින් තැබුවොත් ඔවුන් ළඟ ඉතිරි වෙන්නට තරම් දෙයක් ඇත්තේ නැහැ. එම නිසා ඒ උදවියට අප වැන්නන් පෙනෙන්නට බැහැ. ඒ උදවිය අපට ඊෂ්‍යා කරන්නේ එම නිසයි. ඉංග්‍රීසි ටික ඉවත් කළ දාට ඒ උදවියගේ අර මහන්තත්ත්වයට පහර වදින බව ඒ උදවිය දන්නවා. අපේ ගරුතර මලලසේකර මහා විශාරද පඬිවරයාණෝ ඉංග්‍රීසිය නැතුවම බැරි බවක් ප්‍රකාශ කර තිබුණු වග ඊයේ පෙරේදා පත්‍රවල තිබුණා. ඉංග්‍රීසි තිබෙන්නට ඕනෑ කාටද ? ඒ උදවියට ඉංග්‍රීසි ඕනෑකම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙනවා. එහෙත් මේ රටේ ඔක්කෝටම ඉංග්‍රීසි වුවමනා නැහැ. ඉංග්‍රීසි ලෝක භාෂාවක්ලු. අපත් මේ ලෝකයේ බොහෝ රටවලට ගොස් තිබෙනවා. අප ඉංග්‍රීසියට විරුද්ධත් නැහැ. ඒ බව අප මේ ගරු සභා වෙදිත් කියා තිබෙනවා. එහෙත්, මේ රටේ සාමාන්‍ය මිනිසා හීන දීන තත්ත්වයකට දමා මේ රටේ පන්ති දෙකක් ඇති කොට මේ රටේ ස්වදේශිකත්වයක් තිබෙන සාමාන්‍ය මිනිසා පාගාගෙන ජීවත් වීමට ඉංග්‍රීසිකාර පන්තිය දරන උත්සාහයට විරුද්ධව අප ගෙන යන සටන අප ජීවත් වන තුරුම ගෙනයන බව මලලසේකර උන්නැහේලාට කොයිතරම් අමාරු වුණත් නොකියා බැහැ. ඒ උන්නැහෙලාට අමාරු වුණාට අපට කරන්නට දෙයක් නැහැ. ලෝකයේ හැම රටකම හැම ජාතියකටම ඔවුන්ගේ භාෂාවලින් කටයුතු කර ගන්නට පුළුවන්කම තිබියදී, කැස්බෑවේ ගරු මන්ත්‍රීතුමා (සෝමවීර චන්ද්‍රසිරි මයා.) කිවාක් මෙන් අවුරුදු දසදහස් ගණනක් තිස්සේ—කවදාදැයි කියන්න බැරි තරම් ඈත කාලයක සිට—මේ රටේ ජීවත්වන සිංහල ජනතාවට පමණක් ඔවුන්ගේ භාෂාවෙන් කටයුතු කර ගන්නට බැරි අන්දමේ බාධා ඇති වීම කනගාටුවට කාරණයක්.

භාෂාව ආරක්ෂා කරන්නට ඉදිරිපත් වන අය නම් හුඟදෙනෙකු සිටිනවා. භාෂාව නැති වන්නේත් ඔවුන්ගෙන්මයි. ඉස්සර මේ රටේ බුද්ධාගම ආරක්‍ෂා කරන්නටයයි කියමින් දෙමළ, ආන්ද්‍ර, කේරළ වැනි ජාතිකයින් මෙහි ඇවිත් මහණ වූ බව අපේ ඉතිහාසයෙහි සඳහන් වී තිබෙනවා. මාත් සංඝයා වහන්සේ කෙනෙකැයි කියා ගනිමින් සිවුරක් පොරවාගෙන භික්ෂූන් අත රට රිංගා ගත් විට ඇතුළතින් බුද්ධාගමේ විනාශයට පාර කපන්නට ලේසියි. බුද්ධාගම ආරක්ෂා කරන්නටයයි කියමින් එය විනාශ කිරීමේ අදහසින් මෙහි පැමිණ මහණ වූ අය මෙන් සිංහල භාෂාව ආරක්‍ෂා කරන්නට ඉදිරිපත් වන සිංහලයයි කියා ගන්නා පිරිසක් අද අප අතර සිටිනවා. භාෂාව ක්‍රම ක්‍රමයෙන් දියුණුව කරා යන වේගය නතර කිරීමට ඔවුන් දූන් තිරිංග පොල්ලක් කරකවා තිබෙනවා. මේ රටේ අද ඇති වී තිබෙන පන්ති දෙක—ඉංග්‍රීසි භාවිතා කරන පන්තියත් ඉංග්‍රීසි භාවිතා නොකරන පන්තියත්—අතර තිබෙන පරතරය නැති කරන තුරු මේ රටේ ගොවි කම්කරු පිරිසගේ හීනත තත්ත්වය නැති කර ඔවුන් සුඛිත මුදිත කරන්නට කොහෙත්ම පුළුවන්කමක් ඇත්තේ නැහැ.

අද මේ රටේ පාගන පිරිසකුත් පෑගෙන පිරිසකුත් සිටිනවා. මේ රජයේ ගොවිතැන් කටයුතු ගැන කථා කළ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් ගොවීන්ට ජීප් රථ දෙන බවක් හේම කිව්වා. කොහේද ගොවීන්ට ජීප් රථ දී තිබෙන්නේ ? උදැල්ල අල්ලන මිනිහාට ජීප් රථ ලැබෙන්නේ නැහැ. ඔය කියන ජීප් රථ ලැබෙන්නේ ගොවිතැන් කරන උදවියට නොව කරවන උදවියටයි. ගොවිතැන් කරන ගොවීන්ට එවැනි සහනයක් කිසිම තැනක ලැබී නැති බව මා ස්ථිර වශයෙන්ම ප්‍රකාශ කරනවා.

ඊයේ මෙම ගරු සභාවෙදි කථා කළ රාජ්‍ය කටයුතු පිළිබඳ ගරු උප ඇමතිතුමා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයක් දූත් නැති බවත් එය කවුදෝ ගිලගෙන ඉවර බවත් කිව්වා. නියම ප්‍රජාතන්ත්‍රවාදය අනුව අප වැනි ගොවි කම්කරු දුප්පත් මන්ත්‍රීවරුන් ක්‍රියා කරවීමේ නියම ශක්තියක් ඇති, සාමාන්‍ය ජනතාවගෙන් යුත් එකම පක්‍ෂය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බව මා ඉතා ප්‍රීතියෙන් මෙම ගරු සභාවේදී ප්‍රකාශ කරන්නට කැමැතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දුප්පත් මිනිහෙක්. මම මන්ත්‍රී කෙනකු වශයෙන් අවුරුදු 13 ක් හිටියත්, පාර්ලිමේන්තු ලේකම්වරයකු වශයෙන් අවුරුදු 7 ක් හිටියත්, නගර සභිකයකු වශයෙන් අවුරුදු 20 ක් හිටියත්, මගේ දරුවන් සමග හෙට කන්ට තරම් යමක් තිබෙනවාදැයි කියන්න බැරි තරම් දුප්පත් කෙනෙක් තමයි මම. කවුරු රටේ මොනවා කිව්වත් මම පිරිසිදුව දේශපාලන වැඩ කර තිබෙනවා කියා මට ප්‍රීති වන්ට පුළුවන්. එවැනි දුප්පත් අඩියක ඉන්න මා වැනි කෙනෙකුට ලේකම් ධුරයක් ලැබී තිබෙන්නෙ කොයි දේශපාලන පක්ෂයෙදැයි කල්පනා කර බැලුවොත්, ඒ දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා ආරම්භ කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බව ප්‍රීතියෙන් ප්‍රකාශ කරන්ට පුළුවන්. සාමාන්‍ය මිනිහෙකුට එවැනි තත්ත්වයක් වෙනත් කිසිම පක්‍ෂයකින් ලැබී නැති බව අපට පෙනී යනව. ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මැරුණා කියා රාජ්‍ය කටයුතු පිළිබඳ පාර්ලි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]

මේන්තු ලේකම්තුමා හෝ වෙන කිසිවෙකු හෝ කල්පනා කරන්ට වුවමනාවක් නැහැ. සාමාන්‍ය ජනයා භාරගෙන තිබෙන උසස් පක්ෂය නිසා තමයි අපි වගේ උදවිය අවංකව ඒ පක්ෂයට බැඳී සිටින්නෙ. මම ඇතුළු මේ සභාවේ සිටින ගොවි-කම්කරු පන්තියේ මන්ත්‍රීවරුන්ගෙන් වැඩි දෙනා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බැඳී සිටින්නේ අනික් පක්ෂවලට වඩා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, සිංහල කථා කරන රෙද්ද බැනියම අඳින සාමාන්‍ය ගමේ ගොඩේ මිනිහාට ඉතාම කිට්ටු පක්ෂය නිසයි.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මයා.** (ගල ගෙදර)
*(திரு. டபிள்யூ. எம். ஜீ. ரீ. பண்டா—கல கெதர)*
(Mr. W. M. G. T. Banda—Galagedera)
අපිත් ඒ පන්තියේ.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
එහෙම නම් මෙහාට එන එකයි, තියෙන්නෙ. ගලගෙදර මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මයා.) ඒ පන්තියේ තමයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උන්නැහේත් මන්ත්‍රී කෙනෙක් තමයි; උන්නැහේත් පිකිරි බණ්ඩා කෙනෙක් තමයි. මම පිකිරි බණ්ඩා කෙනෙක්. නම් එක විධියට තිබුණත් වෙනස්කම් තිබෙනව. "දද" කියල කිව්වම එක එක නැනදි අර්ථය වෙනස් වෙනව. "දද වැනෙනව" කිව්වම "කොඩි ලෙළ දෙනව" කියන අර්ථයයි. "දදයක් කසනව" කිව්වොත් ලැබෙන්නෙ වෙනත් අර්ථයක්. ඒ වගේම "දද කඩා ගෙන එන්න" කිව්වොත් අපි දදකිරිය ගහ කින් කොළ පිකක් කඩාගෙන එනව. ඒ වගේ එක වගේ නම් තිබුණාට, එක වගේ මිනිසුන් හිටියට, හැම දෙනාගෙම අදහස් උදහස් එක විධිය නොවෙයි. එක වගේ වචනවලින් සිංහල භාෂාවෙ හුඟක් දේවල් හඳුන්වනව. එම නිසා එක වගේම වුණාට එක සමාන යයි කල්පනා කරන්ට එපා. මිනිසුන්ගේ එකඟත්වයක් ඇති වෙන්නෙ අදහස් උඩයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය ලේඛනය ඉතාම හොඳයි. කැස්බෑවේ ගරු මන්ත්‍රීතුමා (චන්ද්‍රසිරි මයා.) ප්‍රකාශ කළා වගේ, අපේ දේශපාලන ජීවිතයේදී කිසිම දෙයක් නැති අයවැය ලේඛනයක් අපට දකින්න ලැබුණා නම්, ඒ 1967-68 අයවැය ලේඛනය බව මතක් කළ යුතුයි. මේ අයවැය ලේඛනය මා කියෙව්වා. අයවැය ලේඛනයේ සිංහල පිටපතේ වැඩියක්ම තිබෙන්නේ සිංහල නොවෙයි. ඉංග්‍රිසියටත් වඩා අමාරු සංස්කෘත, පාළි වචනවලින් තමයි, මේ අයවැය ලේඛනයේ සිංහල පිටපත සකස් කර තිබෙන්නේ. අයවැය ලේඛනය මුලින්ම පටන් ගෙන තිබෙන්නේ බොහොම නරක ගණයකිනුයි. එය පටන්ගෙන තිබෙන්නේ, වායු ගණයෙන්.

**ජේ. එල්. සිරිසේන මයා.**
*(திரு. ஜே. எல். சிறிசேன)*
(Mr. J. L. Sirisena)
පිටරට යන්න වෙනවා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
පිටරට ගිහින් බේරුණොත් ඇති. එය දුවන ගණයක්. ඒ අනුව ගරු මුදල් ඇමතිතුමාට දුවන්නට සිදු වෙයිද, ආණ්ඩුවටම දුවන්නට සිදු වෙයිද කාට දුවන්නට සිදු වෙයිද කියන්නට බැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්.**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
විරුද්ධ පාර්ශ්වයට දුවන්නට වෙයි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
විරුද්ධ පාර්ශ්වයට නොවෙයි. විරුද්ධ පාර්ශ්වය කවදත් දුවනවා. මේ ගණයෙන් තමයි වැත්තෑවේ හාමුදුරුවන් ගුත්තිල කාව්‍යය පටන්ගෙන තිබෙන්නේ. එය පටන් ගන්නේ මෙහෙමයි:

"සිය පින් සිරින් ස රු
දෙතිස් ලකුණෙන් විසිතු රු
කෙලෙසුන් කෙරෙන් දු රු
වදිම් මුනිඋතුමන් තිලෝගු රු"

"සිය පින්" යන්න වායු ගණයටයි, අයත් වන්නේ. මේ ලෝකයේ තිබෙන හැම බන්ධනයක්ම ගණ 8 කට ඇතුළත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙනවා. ඒ ගණ 8 ට ඇතුළත් වන්නේ නැති එක වචනයක්වත් නැහැ. [බාධා කිරීමක්] ගණ 9 ක් ඇත්තේ නැහැ. ගණ 9 ක් තිබෙන්නවත් බැහැ. ඒ ගණ මෙසේ කියැවෙනවා :

"මඃ ත්‍රි ගුරුඃ ත්‍රි ලඝුශච නකාරෝ
භාදි ගුරුඃ පුනරාධි ලඝූර්යඃ
ජෝ ගුරුඃ මධ්‍ය ගතොරල මධ්‍යඃ
සොන්ත ගුරුඃ කති සොන්ත ලඝූර්යඃ"

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඒ ගණ බල පාන්නේ සිංහලයට පමණක් ද ?

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

සංස්කෘත, පාළි භාෂාවලටත් අදාළයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඒ ගණ 8 හැම භාෂාවකටම අයිතිද ?

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

පාළි, සංස්කෘත, සිංහල භාෂාවලට ඒ ගණ 8 බලපානවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

"ඔම්" කියන වචනය ?

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

එය ගණයක් නොවෙයි. ගණයකට අකුරු තුනක් ඕනෑ. එක අකුරකින් දෙකකින් ගණයක් හැදෙන්නේ නැහැ. ඒ අතිනුත් මේ අය වැය ලේඛනය විෂ වී තිබෙනවා.

බිංගිරියේ ගරු මන්ත්‍රීතුමා (ජේ. එල්. සිරිසේන මයා.) කීවා, අපේ ආණ්ඩු කාලයේ සමුපකාර ව්‍යාපාරය නැති කර දැමුවාය කියා. සමුපකාර ව්‍යාපාරය විනාශ කර දැමීම ගැන කොහොම වුණත්, අවුරුදු 2½ ක් පමණ වූ මේ වර්තමාන ආණ්ඩු කාලයේ අළුතින් එක සමුපකාර සමිතියක් වත් විවෘත කර තිබෙනවාදැයි මා දැන ගන්නට කැමතියි. මේ ආණ්ඩුව සේරම සමුපකාර සමිති වසාගෙන යනවා. මේ අය "බෝඩ්" හදනවා. සමුපකාර සමිති ඒ "බෝඩ්වලට" දෙනවා. සමුපකාර ව්‍යාපාරය ඉතා වැදගත් ව්‍යාපාරයක්. එහෙත් සමහර අය, එය සිංහලයෙන් හරියට ශබ්ද කරන්නටවත් දන්නේ නැහැ. සමහර ගරු මන්ත්‍රීවරු—බිංගිරියේ ගරු මන්ත්‍රීතුමාත්—කීවා, "සමුපාකාරය" කියා. "සමුපාකාරය" නොවෙයි, හරි වචනය ; "සමුපකරය" යි. ඒ සමුපකාර ව්‍යාපාරය දුන් විනාශ වේගෙන එන බව පෙනෙනවා. අද සමුපකාර ප්‍රතිපත්තියක් ඇත්තේ නැහැ. මහජනයා අතේ පාලනය තිබුණු සමුපකාර ව්‍යාපාරය මේ ආණ්ඩුව විසින් "බෝඩ්වලට"—බෝඩ් ලෑලිවලට ද, මිනිසුන්ටද මා දන්නේ නැහැ—භාර දෙනවා. එයින් කිසිම ප්‍රයෝජනයක් අත් වන්නේ නැහැ. පුදුමය මේකයි. සමුපකාර සංගම් වල නිත්‍ය සේවයට පරීක්ෂකවරුන් දෙදෙනෙක් නේවාසිකව පදිංචි කරවා තිබෙනවා. එහෙත් අවසානයේදී ගණන් බැලුවාම ලක්ෂ ගණන් පාඩුයි. උඹල කොහොමද මේ ගණන් හිලව් පරීක්ෂා කළේ කියා අර නිත්‍ය සේවයට පත් කර සිටින පරීක්ෂකවරුන් දෙදෙනාගෙන් ප්‍රශ්න කරන්නේ නැහැ. ඒ පිළිබඳව පරීක්ෂකවරුන්ට වගකීමක් නැහැ. ඒකයි. තත්ත්වය. ඉස්සර මමත් සමුපකාරයට බොහොම ලැදිව වැඩ කළා. ඒ කාලයේ සුළු සමිති හතක් එක් පරීක්ෂකයකුට භාර දී තිබුණා. ඒ සමිති හතේ ගණන් හිලව් පිරිසිදුව ගෙන යාම පිළිබඳ වගකීම ඒ පරීක්ෂවරයාට පවරා තිබුණා. අද එහෙම නොවෙයි. ප්‍රධාන පරීක්ෂක, දෙවන පරීක්ෂක, තුන්වන පරීක්ෂක ආදී වශයෙන් කොතෙකුත් පරීක්ෂකවරුන් පත් කර සිටිනවා. එහෙත් මේ අයගෙන් ගන්නා ප්‍රයෝජනයක් නැහැ. හැම තැනම සමුපකාර සමිති සංගම්වලින් ලක්ෂ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]

ගණන් පාඩුවෙනවාය කියනවා. මා නම් මේ මෑත භාගයක සිට සමුපකාර සංගමයක වැඩ කර නැහැ.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මයා.**
*(திரு. டபிள்யூ. எம். ஜீ. ரீ. பண்டா)*
(Mr. W. M. G. T. Banda)
වලපනේ කොපමණ පාඩුද ?

**ටී බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ඒක ඒ පොත්පත් බලල කියන්නට ඕනෑ. වලපනේ කොපමණ පාඩුද, ගල ගෙදර කොපමණ ලාභද ආදී වශයෙන් සමුපකාර සංගම් එකින් එක ගැන කියන් නට මට පුළුවන්කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කවදා හෝ සමුපකාර ව්‍යාපාරය දියුණු කළ යුතුයි. සමුපකාර ප්‍රතිපත්තිවල හැටියට දෙපාර්තමේන්තුවක් නැතිව සමුපකාරිකයන් මාර්ගයෙන්ම ජනතාව මාර්ගයෙන්ම සමුපකාර සමිති සංගම් ගෙන යන්නට පුළුවන් වන අන්දමට සමුපකාර ව්‍යාපාරය දියුණු කරන්නට ඕනෑ. 1941 දී පමණ අප එකතුවී මහනුවර ආරම්භ කළ සමුපකාර සමිතියක් ගැන මට මතකයි. හාල් සේරුවක් ලැබෙන්නට තිබෙන විට අපට පෞද්ගලික වෙළෙන්දකුගෙන් හාල් සේරු භාගය බැගින් ලැබුණා. ඒ අවස්ථාවේදී අප, සාමාන්‍ය දුප්පත් මිනිසුන් එකතුවී රුපියල බැගින් එකතු කොට ඒ සමුපකාර සමිතිය පිහිටුවා ගත්තා. දැන් ඒ සමුපකාර සමිතිය රුපියල් ලක්ෂ ගණන් උපයා තිබෙනවා. එහෙත් දැන් මුලින් ඒ සමුපකාර සමිතිය ආරම්භ කළ දුප්පත් මිනිසුන් එළවා දමා "බෝඩ්" එකකට එය භාර කර තිබෙනවා. අද සමුපකාර ව්‍යාපාරය කිසිම පිළිවෙළක් නැතිවයි ගෙන යන්නෙ. අපේ ආණ්ඩුව තිබෙන කාලයේදී වුවත් සමුපකාර ව්‍යාපාරය දියුණු කිරීම පිළිබඳව ස්ථිර ශක්තිසම්පන්න වැඩ පිළිවෙළක් අනුගමනය කළාය කියා මා කියන්නේ නැහැ. අප එවැනි වැඩ පිළිවෙළක් අනුගමනය කළා නම් තත්ත්වය මේ තරම් නරක් වෙන්නේ නැහැ. එහෙත් අද මේ රටේ සමුපකාරය අන්තයටම පිරිහී තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please!

The Sitting is suspended for half an hour. On resumption the hon. Deputy Chairman of Committees will take the Chair.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින් අ. භා. 4.30 ට ශ්‍රීමත් රසීක් ෆරීඩ් (ඕ.බී.ඊ.) මැතිතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදි.**

*அதன்படி அமர்வு இடை நிறுத்தப்பட்டு, மீண்டும் பி. ப. 4.30 மணிக்கு ஆரம்பமாயிற்று. குழு உப அக்கிராசனர் [ஸ்ரீமான் ருசீக் பரீத், ஓ. பி. ஈ.] தலைமை தாங்கினார்.*

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [SIR RAZIK FAREED, *O.B.E.*], *in the Chair.*

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තේ පානය සඳහා රැස්වීම තාවකාලිකව නතර කරන අවස්ථාව වන විට මා කථා කර මින් සිටියේ සමුපකාරය ගැනයි. මා මේ අවස්ථාවේ ඒ ගැන දීර්ඝ වශයෙන් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. සමුපකාරය දියුණු කරන්නට නම් ඒ දෙපාර්තමේන්තුවට මීට වඩා උපදෙස් සහ අනුබල දීමේ වැඩ පිළිවෙළක් ඇති කළ යුතු බව පමණක් කොටින්ම කියන් නට කැමැතියි.

වගාවන් දියුණු කිරීමේ අලුත් ව්‍යාපාරය ගැන යමක් කියන්නට කැමතියි. වගා කිරීම සම්බන්ධයෙන් ඝෝෂාවල් ඇති වන්නට පටන් ගත්තේ අද—ඊයේ නොවන බව තමුන්නාන්සේ දන්නවා. 1931 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ඉන්නකොටත් වගාකිරීමේ ඝෝෂාව තමුන්නාන්සේට ඇහෙන්නට ඇති. ඒ තරම් පැරණි කාලයක සිට වගා කිරීමේ ඝෝෂාව ඇහෙන්නට පටන් ගත් බව තමුන්නාන්සේට මතක ඇතැයි මා කල්පනා කරනවා. අපේ ජීවිත කාලයේදී ඔය වගාකිරීමේ ඝෝෂාව නොයෙක් වාරවලදී අපට ඇහිලා තියෙනවා. මොන ආණ්ඩුවක් විසින් වුවත්, කවුරුන් විසින් වුවත් අපේ ලංකා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ද්වීපය සම්පූර්ණයෙන්ම ස්වයංපෝෂිත කිරීමේ ව්‍යාපාරයක් පටන් ගැනීම ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. අප කාටත් වුවමනා කර තිබෙන්නේ අපේ රට ස්වයංපෝෂිතව තිබෙනු දකින්නටයි.

අපේ සමහර මිනිසුන්ගේ ඇතැම් වැඩ ගැන කල්පනා කරන අපට බොහෝ විට පුදුම හිතෙනවා. සමහරකුගේ වැඩ හරියට අර වැද්දන් ගෙවල් හදන්නා වාගෙයි. වැද්දන්ගේ ගෙවල් හැදිල්ල ගැන තමුන්නාන්සේ දන්නවා ඇති. වැස්සක් එන කොට තමයි වැද්දන්ට ගේ මතක් වෙන්නේ. වැස්සෙන් තෙමෙන්නට පටන් ගන්නකොට ගෙවල් හැදීම ගැන ලොකු උනන්දුවක් ඇති වෙනවා. "යකෝ, මෙහෙම තෙමි තෙමි හැමදාම ඉන්නට බැහැ; අපටත් ගෙයක් දොරක් තියෙන්නට ඕනෑ; හෙට නම් කොහොම හරි අපට ගෙයක් හදා ගන්නටම ඕනෑ" කියලා එකෙක් ඒ වෙලාවට කියනවා. ඒ කතාවට අනෙක් වැද්දොත් එකඟයි. "උඹ හෙට උදේම කණු ටිකක් කපා ගෙන එන්ට ඕනෑ; උඹ බිම හදන්නට ඕනෑ; උඹ ගෙය හෙවිල්ලන්නට වුවමනා දේ සපයාගන්නට ඕනෑ" යනාදි වශයෙන් කතිකා කර ගන්නවා. ඔයින් මෙයින් වැස්සත් පායනවා. එතකොට ඔවුන්ගේ කථාව ඔවුන්ටම අමතක වෙනවා. පහුවදා ඔවුන් හැම එකාම වෙනදා වාගේම දඩයමේ යනවා. හැන්දෑවේගෙන එනකොට ආයෙමත් වහින්නට පටන් ගන්නකොටයි මේ වැද්දන්ට ගෙවල් මතක් වෙන්නෙ. "හෙට නම් කොහොම වත් ගෙයක් හදන්නටම ඕනෑ; මේ පාර නම් ඒ වැඩේ කල් දමන්නටම බැහැ" ආදි වශයෙන් තරයේම කියනවා. ඒ කිය මනත් වැස්ස නතර වෙනවාත් එක්කම ඉවර වෙනවා. ගෙවල් හැදිල්ලත් අමතක වෙනවා. වැස්සක් එනකොටයි ආයෙමත් මතක් වෙන්නේ. නැවතත් වෙනදා වාගේම දඩයමේ යනවා. වැස්සක් ආවාම කියනවා, "ඊයේත් බැරි වුණා ගෙයක් හදන්නට; මේ පාර නම් ගොයියෝ ඔහොම ඉඳලා බැහැ; හැමදාම තෙමෙන්නට බැහැ; හෙට නම් ගෙවල් තනන එක තනනවාමයි." ඔය කතාව කවදාවත් නතර වෙන්නෙත් නැහැ; ගෙවල් තැනීම කවදාවත් කෙරෙන්නෙත් නැහැ. වගා කිරීම පිළිබඳවත් අපේ ජීවිතයේ අපට වරින්වර අහන්නට ලැබී තිබෙන්නේ ඔය වගේ කතාමයි. වැඩ කිරීමත් අපට පෙනී ගියේ ඔය පිළිවෙළටමයි.

පුරාණ කාලයේ අපේ රටේ වගා කිරීම හොඳට සිදු වුණා. ඒවා විදේශීන්ගේ පැමිණීමෙන් පසු නැතිවී ගියා. 1919 දී ප්‍රසිද්ධ කරන ලද එක් කවියක් මට මතකයි.

"පොල් ගස් කපලා රබර් සිටෙව්වා
 දූ දරුවන්හට කිරි දෙන්වා
දෙල් කොස් කපලා තේකොළ වැව්වා
 ඇට බැද කොළ මැල්ලුම් කන්වා
වෙල් ගොඩ කරලා තණකොළ වැව්වා
 ඉන්නා ගේ දෙර වහගන්වා
සල්ලි සොයාලා පෙට්ටි පිරෙව්වා
 හාල් හුණ්ඩුවක් නැත කන්වා"

දැනටත් වඩා ඒ කාලයේදී ගොවිතැන සාර්ථක කිරීම ගැන බලාපොරොත්තු තිබුණා. අවුරුදු 40 කටත් උඩදී ප්‍රසිද්ධ කරන ලද කවියකිනුයි ඔය තත්ත්වය පෙන්වා දුන්නේ. සාගතයක් එන හැම අවස්ථාවකම වැවීම ගැන ලොකු කඩිමුඩියක් ඇති වෙනවා. අදත් වැවීම ගැන කඩිමුඩියක් තිබෙනවා. 1931 ඉඳලාම අපේ ගරු අගමැතිතුමාගේ පවුලේ උදවිය ගත වූ අවුරුදු තිස් පහක් තරම් වූ කාලය තුළ ලංකාවේ මුදල් ගොවිතැන සම්බන්ධයෙන් වියදම් කර තිබෙන බව අපි දන්නවා. ස්වයම්පෝෂිත වීමක් නම් අපට පෙනෙන්නට නැහැ. ගරු සභාපතිතුමනි, අස්වැන්න වැඩි වෙනවලු. එහෙත් යල් කන්නයේ වතුර නැතිකම නිසා—නියඟය නිසා—වියළි කලාපයේ අපේ ප්‍රදේශවල වී ඇටයක්වත් ලබා ගන්නට පුළුවන්කමක් ඇති වුණේ නැහැ. වියළි කලාපයට කොයි අන්දමකින් හෝ ජලය සැපයීමේ වැඩ පිළිවෙළක් ඇති කෙළේ නැත්නම් ඒ වියළි කලාපයේ ගොවීන්ට යල මහ දෙක වැඩ කර ගන්නට පුළුවන්කමක් ඇති වන්නේ නැහැ.

ගරු ඉඩම් ඇමතිතුමා 1956 දී—අපේ ආණ්ඩුවේ සිටින කාලයේදී—මහවැලි ගඟ උතුරට හැරවීමේ ව්‍යාපාරය පටන් ගත්තා. අවුරුදු 12 ක් තිස්සේත් ඒ සඳහා සැලැස්මවල් හදනවා. තවමත් සැලැස්ම හදා ඉවර කර ගන්නට බැරි වුණා. අපට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]

පුදුමයි, ගරු සභාපතිතුමනි, අප කොළඹ සිට මහනුවර දක්වා දුම්රියෙන් යන විට මහා කඳු මැද්දෙන් හැතැප්ම ගණන් දිග බිම් ගෙවල් තනා තිබෙන සැටි අපට පෙනෙනවා. යන්ත්‍ර සූත්‍ර දියුණු නැති කාලයේ ලංකාවේ ඒ තරම් අමාරු වැඩ කර තිබෙනවා. එහෙත් දැන් අවුරුදු 10ක් 12 ක් තුළ ඇළක් කපා ගන්නටවත් බැරි තත්ත්වයක් ඇති වෙලා තියෙනවා.

ගරු සභාපතිතුමනි, රට ස්වයම්පෝෂිත කිරීම හෝ රටේ තත්ත්වය දියුණු කිරීම හෝ 1930 හේ තත්ත්වයෙන් හෝ 1950 හේ තත්ත්වයෙන් හෝ කල්පනා කර කරන්නට පුළුවන්කමක් නැහැ. දැනට තිබෙන තත්ත්වය අනුව, අද රට ගමන් කරන පිළිවෙළ අනුව, අද ලෝකය ගමන් කරන පිළිවෙළ අනුව කල්පනා කර, අප ඒ අනුව හැඩගැසී රට දියුණු කරන්නට ඕනෑ. එසේ කිරීමෙන් පමණයි, අපේ රට නිදහස් රටක් වශයෙන් පවත්වාගෙන යන්නට පුළුවන් වන්නේ.

ගරු සභාපතිතුමනි, අපේ රටේ ගොවීන්ට කම්කරුවන් නැහැ. අද ගොවීන්ට තිබෙන සැලකිල්ල අනුව නම් මේ රට කවදාවත් දියුණු කරන්නට බැහැ. වැඩ කරන පිරිසත් කරවන පිරිසත් අතර තියෙන මේ පන්ති භේදය නැති කරන තුරු අපේ රට දියුණු කරන්නට බැහැ. ගොවීන්ට ජීප් රථ දුන්නලු. කව්ද ඒ ගොවීන් ? ඒ අය කවදාවත් උදැල්ලක් අල්ලා තිබෙනවද ? ඒ ජීප් රථ ලැබූ හුඟක් දෙනෙක් කුරුඳු වත්තේ ඉන්න ගොවීන්. ඒ අය ගොවිතැන් කරවන උදවිය ; ගොවිතැන් කරන උදවිය නොවෙයි. ගොවිතැන් කරවන උදවියට උදව් කර කවදාවත් මේ වැඩේ කරන්නට බැහැ. ගොවිතැන් කරන උදවිය ට ආධාර හා අනුබල දුන්නොත් පමණයි, ඒ අයට සැලකිල්ල දක්වුවොත් පමණයි, මේ රට දියුණු කරන්නට පුළුවන් වන්නේ. ඒ නිසා අපේ ගොවීන්ට යම් කිසි තත්ත්වයක් දෙන්නට ඕනෑ. සමහර විට එක ගොවියෙක්ව ඉස්සර කරගෙන යනවා, අපේ අගමැතිතුමා යන රැස්වීම් වලටත්. සමහරවිට ප්‍රචාරය පිණිස ගොවියකුව වේදිකාවට නංවා, පදක්කම් පළඳවා, මල් මාලා පළඳවා ලොකු මිනිහකු හැටියට සැලකිල්ලක් දක්වනවා, අගමැතිතුමා සහභාගි වන රැස්වීම්වලදීම. මල් මාලා පළඳවා පිළිගනු ලැබූ ඔය මනුෂ්‍යයා පසු දිනයෙහි මහ පාරේ ගමන් කරන විට, මෝටර් රථයෙන් ගමන් කරන අර ලොකු මිනිසා ඔහුට තුට්ටුවක් තරමටවත් සලකනවාද ? නැහැ. වේදිකාවේදී නම් නොයෙකුත් විධියට වර්ණනා කරමින් මල් මාලා පළඳවනවා. එපමණයි. ඊට පසුව මොකුත් නැහැ. නැවතත් අර දුප්පත් මිනිහා ඒ තත්ත්වයේම පසුවෙනවා. මේවා ව්‍යාජ වැඩ ; මේවා බොරු වැඩ. මේ විධියට බොරු කොට නම් කවදාකවත් මේ රට හදන්නට බැහැ. මවා පෑම්වලින් වැඩක් නැහැ, බොරුවෙන් වැඩක් නැහැ. යමක් නියම විධියට ක්‍රියාවෙන්ම පෙන්වන්නට අප පුරුදු වන්නට ඕනෑ. [බාධා කිරීමක්] සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයට සාමාජිකයන් පත් කරන විට ගොවියන් ගැනද කල්පනා කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පක්ෂ භේද ගැන අප කථා කළාට ඇත්තෙන්ම මේ රටේ පක්ෂ භේද නැහැ. මේ රටේ තිබෙන්නේ පංති භේදයි. හැමදාම මේ රටේ තිබෙන්නේ පංති භේදයි. පක්ෂ භේදය යන්න, පක්ෂ වාදය යන්න බොරුවක්. මේ රටේ තහවුරු වී තිබෙන්නේ පංති භේදයයි. පක්ෂ භේදය සාදාගෙන තිබෙන්නේ තමන්ගේ වාසිය සඳහායි ; තැන ලබා ගැනීම සඳහායි.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න (සමාජ සේවා ඇමති)**

*(கௌரவ என். எச். எ. எம். கருணாரத்ன —சமூக சேவை அமைச்சர்)*

(The Hon. N. H. A. M. Karunaratne—Minister of Social Services)

පක්ෂ භේදය හොඳ නැහැ. මා ඒකට විරුද්ධයි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**

*(திரு. ரீ. பி. தென்னகோன்)*

(Mr. T. B. Tennekoon)

අපි ගොවි කම්කරු පන්තියට අයත් උදවියයි. අප මන්ත්‍රීවරුන් වුණත් අපට මුදල් හදල් යහමින් නැති නිසා, අප ඉංගිරිසි භාවිත නොකරන නිසා අපට ඔය අනෙක් පංතියේ තැනක් ලැබෙන්නේ නැහැ. මේ රටෙන් මේ පංති භේදය නැති කිරීම සඳහා කිසියම් වැඩ පිළිවෙළක් ඇති කළ යුතුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
තමුන්නාන්සේ උප ඇමති කාලයේ මොනවා කළාද ?

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
උප ඇමති කාලෙත් කොයි කාලෙත් අප වෙනස් වුණේ නැහැ. අප මන්ත්‍රීවරුන් වුණත්, උප ඇමතිවරුන් වුණත්, රජවරුන් වුණත්, අප වෙනස් වන්නේ නැහැ. අප අඳින ඇඳුම වෙනස් කරන්නේ නැහැ. අප කථා කරන භාෂාව වෙනස් කරන්නේ නැහැ. බුලත් විට අතහරින්නේ නැහැ. කොටින්ම අප වෙනස් වන්නේ නැහැ. [බාධා කිරීමක්] අප ධනපති කාර් වල ගමන් කරන බව බේරුවල ගරු මන්ත්‍රීතුමා (එම්. අබ්දුල් බකීර් මාකර් මයා.) කියනවා. ධනපති කාර්වල පමණක් නොව ලැබුණොත් ඔය කොයි ඒවායේ වුණත් යනවා. මොන මොන ධනපති ඒවායේ යන්නට ලැබුණත් අප ඒ ගැන නම් පසු බට වන්නේ නැහැ. ධනය නැතුවාට අපේ හැටි එහෙම තමා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගොවියාගේ තත්ත්වය උසස් කරලීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි. මා එක කථාවක් කියන්නට කැමතියි. මා ඊයේ පෙරේද කැකිරාව කොට්ඨාශයෙහි කුඹුක්වැව නමැති ගමට ගියා. ගොවියන් මොලේ නැත්තන් යයි මහේශාක්‍ය උදවිය, මහත් තත්ත්වයෙන් පිම්බුණු උදවිය කල්පනා කරන නිසා ගොවියාට කම්කරුවාට මොලේ තිබෙනවාදැයි පෙන්වීම සඳහායි, මා මේ කථාව කියන්නේ. මිහින්තලේ ගරු මන්ත්‍රීතුමා (පී. එම්. කේ. තෙන්නකෝන් මයා.) කුඹුක්වැව ගම හොඳින් දන්නවා. එතුමා එදා එහි නොපැමිණීම ගැන එහි මිනිසුන් බොහෝ කනගාටු වුණා. එදා එහි පැවැත්වුණු සාකච්ඡාවේදී තමන් ප්‍රශ්නයක් අසන්නට කැමති බව එක් ගොවි මහතෙකු ප්‍රකාශ කළා. "තමුසේ ඔය ප්‍රශ්නය මගෙන් අහන්නේ උත්තරය දැනගෙන මගේ දැනීම මනින්නද, එහෙම නැත් නම් තමුසේගේ දැනගැනීම පිණිසද" කියා මා ඇසුවා. එවිට ඒ ගොවි මහත් මයා කිව්වා, "ඒ කෝකට වුණත් ප්‍රශ්නය අහන්නට ඔනෑ" කියල.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ඔය කථා කරන්නෙ අයවැය ලේඛනය ගැනද ?

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
ඒ අයට දැන් අන්දකයිප්පු කැවිලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ ගොවි මහතා මගෙන් ඇසූ ප්‍රශ්නය මෙන්න මේකයි : මහාසම්මතයේ සිට අද වන තුරු රජකම් කළ රජවරුන්ගෙන් රටටත් ජාතියටත් සමාජයටත් ප්‍රයෝජනයක් ඇතිව සිටි රජ්ජුරුවන්ගේ නම කුමක්ද යන්නයි ඒ ප්‍රශ්නය.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
ගරු රාජ්‍ය ඇමතිතුමා ඉතිහාසය ගැනත් දන්නවා ; රටේ පිළිගැනීමකුත් තිබෙනවා ; හොඳ ඥනයකුත් තිබෙනවා ; එමෙන්ම එතුමා හොඳ උගතෙක්. ඒ නිසා මේ ප්‍රශ්නයට පිළිතුර මොකක්ද කියා මා ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් අහනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ප්‍රශ්නය මොකක්ද ? මට තේරුණේ නැහැ.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
මහාසම්මත රජ කාලයේ සිට අද වන තුරු රජකම් කර තිබෙන රජවරුන් අතුරින් රටටත් ජාතියටත් සමාජයටත් ඉතාම උසස් ප්‍රයෝජනයක් ඇතිව සිටි රජ්ජුරුවන්ගෙ නම මොකක්ද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
අශෝක.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
ඒ පිළිතුරත් හරි. එහෙත් නියම පිළිතුර ඒක නොවෙයි. මාත් කල්පනා කළේ ඒ විධියටයි. එහෙත් ගරු රාජ්‍ය ඇමතිතුමාගේ උත්තරයත් වැරදියි; මගේ උත්තරයත් වැරදියි.

ඒ කෝක වුණත් මා අර ගොවි මහතාට කිව්ව, "ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න අපට බැහැ" කියල. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහා සම්මතයේ සිට අද වනතුරු රජ කළ රජවරුන්ගෙන් රටටත් ජාතියටත් සමාජයටත් විශාල ප්‍රයෝජනය සිදු වූ රජ්ජුරුවෝ නම් "ගොවි රජා" කියලයි ඒ ගොවි මහත් මයා පිළිතුරු දුන්නේ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
මාත් ඒ ගැන කල්පනා කළා. එහෙත් මා ඒ පිළිතුර නොදුන්නේ ගොවි රජාට ඔටුන්නක් නැති නිසයි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
ඇත්ත වශයෙන්ම මටත් මේ උත්තරය දෙන්නට බැරි වුණා. පුද්ගලයාගේ හැටියෙනුත් ඇසූ ආකාරයෙනුත් මට හිතුණා රහස් උත්තරයක් ඇති කියලා. ඒ නිසා කොයි විධියේ පිළිතුරක් බලාපොරොත්තු වෙනවාද කියා නොදත් නිසා මටත් එයට පිළිතුරු දෙන්නට බැරි වුණා. කැකිරාවේ ගරු මන්ත්‍රීතුමාත් (එස්. බී. ලේනව මයා.) මෙය හොඳින් දන්නවා.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy-Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා කරන්නේ බොහොම ලක්ෂණ කථාවක්. එහෙත් එක් අයකුට වෙලාව නියම කර තිබෙන්නේ විනාඩි 30 යි. දැන් වැඩිපුරත් විනාඩි 20 ක් අර ගෙන තිබෙනවා. ඒ නිසා තව මිනිත්තු 5 කින් කථාව ඉවර කරන්න බලන්න.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
අපේ ආරෝග්‍ය ශාලාවල තිබෙන්නේ පුදුම අන්දමේ තත්ත්වයක් බව කියන්නට සිදු වී තිබෙනවා. නිල නොලත් ආරෝග්‍යශාලා පරීක්ෂකවරුන් පත් කරන්නට යාමේදී අසුවල් අසුවල් ආරෝග්‍යශාලාවලට පත් කළ යුත්තේ කවුරුන්ද කියා අපෙන් අසා එවන සිරිතක් තිබෙනවා. අවුරුදු තුනක පමණ කාලයක් තිස්සේ අපි එම ලියුම්වලට උත්තර යවා තිබෙනවා. නමුත් අප නම්කර යවන ලද අයගෙන් කවරෙකුවත් පත් කර තිබෙන වාද කියන්නට දන්නේ නැහැ. මීට පස්සේ බොරුවට ඔයවිදියෙ දේවල් අපෙන් අහන්නට එපාය කියන එකයි, සෞඛ්‍ය කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම් තුමියට කියන්නේ. දැන් ආරෝග්‍ය ශාලාවල ලෙඩුන් අඩුයි. කෑම නැති නිසයි, එසේ වන්නේ. අපේ ආරෝග්‍යශාලාවල බත් වැනි ආහාර ඇත්තේ නැහැ. ආහාර නැතිකමින් කවුරුන්වත් මැරුණේ නැති බවක් මුදල් ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා ප්‍රකාශ කර තිබෙනවා. කෑම නැතුව සිටින බොහෝ දෙනා දුර්වලකම උඩ අසනීප වී ආරෝග්‍යශාලාවලට ඇතුළු වෙනවා. එහිදී සමහරුන් මිය යනවා. එවැනි අවස්ථාවලදී දොස්තරවරුන් සහතික දෙනවා, මෙයාට උණ තිබුණාය; මෙයාට පාචනය තිබුණාය; මෙයාට අසුවල් අසනීපය තිබුණාය" යනාදී පිළිවෙළට. එම නිසා අනිත් දේවලට ඕනෑ එකක් වෙලා ගියත් ආරෝග්‍යශාලාවල සිටින රෝගීන්ට ආහාර ටිකවත් හරියාකාර සපයා දීමේ වැඩ පිළිවෙළක් ඇති කරන ලෙස ඉතා ගෞරවයෙන් මා ඉල්ලා සිටිනවා. මව් කෙනෙක් වශයෙන් සිටින අපේ සෞඛ්‍ය කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමියට මේවා වැටහෙන්නට ඕනෑ. එම නිසා අපේ රෝගීන්ට දෙන ආහාර ටිකවත් කලින් දුන්නාක් මෙන් නිසියාකාරයෙන් ලබා දෙන්නය කියා ඉල්ලා සිටිමින් මගේ කතාව අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 4.53

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ මිත්‍ර දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ (ටී. බී. තෙන්නකෝන් මයා.) කතාවෙන් පසු කතා කිරීමට ඉඩ ප්‍රස්තාව සැලසීම ගැන මා බොහොම සන්තෝෂ වෙනවා. මා එසේ කියන්නේ යම් කාලයක අප එක හැලියේ කාපු මිනිසුන් වන නිසයි. කොතෙක් දේශපාලන වාද බේද අප අතර පැවතුනත් යම් යම් ප්‍රතිපත්තින් උඩ අපි එකඟ වන බව මා නොකිවාට තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. අද, මෙම අයවැය ලේඛනය පිළිබඳ විවාදයේදී මා කතා කිරීමට බලාපොරොත්තුවෙන් සිටියේ නැහැ. පසුගිය අයවැය ලේඛනය ඉදිරිපත් වූ අවස්ථාවේ ආණ්ඩු පක්ෂයෙන් පිළිතුරු දීමේ පළමුවන අවස්ථාව ලැබුණේ මටයි. මේ වර කතා කළ රාජ්‍ය ඇමතිතුමා පැහැදිළි වැදගත් කතාවක් කරන්නට යෙදුණාය කියා මා සිතනවා. අපට නිදහස ලැබුණායින් පසු පක්ෂ ක්‍රමය අනුව මේ රටේ පාර්ලිමේන්තු ක්‍රමයක් පිහිටුවූ දා පටන්, දේශපාලන බේද අනුව නානාවිධ ආණ්ඩු පිහිටුවන්නට පටන්ගත් දා පටන්, අවුරුද්දක් පාසාම අයවැය ලේඛන ඉදිරිපත් කරන ලද බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. 1958 පටන් මේ දක්වාම පවත්වන ලද සෑම අයවැය ලේඛනයකටම ඇහුම්කන් දීමට මට භාග්‍යය ලැබුණා. අයවැය ලේඛනයක් සකස් කිරීම ලෙහෙසි වැඩක් නොවෙයි. අපි කවුරුත් පාහේ අයවැය ලේඛනය මගින් නොයෙකුත් අන්දමේ පොරොන්දු දෙනවා. ගිය වතාවේ අප දුන් පොරොන්දුවලින් ඇතැම් දේ අපට ඉටු කරන්නට බැරි වී තිබෙන්නට පුළුවනි. අප එය පිළිගන්නවා. 1956 වර්ෂයේ පටන් 1965 වර්ෂය දක්වා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ රට ආණ්ඩු කළා. ඒ අවස්ථාවලදී ඉදිරිපත් කරන ලද අයවැය ලේඛන බැලුවොත් නොයෙක් විධියේ පොරොන්දු ඒවායිනුත් ජනතාවට දී තිබෙන බව තමුන්නාන්සේලාට පෙනී යනවා ඇති. ඒ පොරොන්දු සියල්ලම කී හැටියටම ඉෂ්ට වුණාදැයි මා මේ අවස්ථාවේදී විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් අහනවා. අප විසින් ඉෂ්ට කරන්නට බලාපොරොත්තු වන දේවල්, නොයෙක් නොයෙක් සිදුවීම් නිසා බලාපොරොත්තු වූ පිළිවෙළට ඉෂ්ට කරන්නට බැරි වෙනවා. අප මේ වරත් කිසියම් වැඩ සැලැස්මක් ඉදිරිපත් කර තිබෙනවා. මේ අවුරුද්ද ඇතුළත එහි තිබෙන දේවල් හැකි තරමක් හැකි තාක් දුරට ඉෂ්ට කරන්නට අප බලාපොරොත්තු වෙනවා. අප හැම දෙයක්ම කරන්නේ කටින් පොතපතින් පත්‍රයෙන් ලියකියවිලිවලින් කැමරාවෙන් රේඩියෝවෙන් පමණක්යයි විරුද්ධ පක්ෂයේ බොහෝ ගරු මන්ත්‍රීවරුන් කිව්වා. අපගේ මේ ආණ්ඩුව බලයට පත් වූණේ 1965 දීයි. රට ජාතිය වෙනුවෙන් ඔය තරම් ගර්ජනා කරන, ගොවියා වෙනුවෙන් දුප්පතා වෙනුවෙන් ඔය තරම් මොර දෙන, ඔය තරම් ජාතිමමත්වයක් තිබෙන, ඔය තරම් මහා දේශප්‍රේමීන් හැටියට රටට පෙන්වන්නට හදන, මහජන ප්‍රශ්න විසඳන්නට ඔය තරම් උත්සාහයක් ප්‍රයත්නයක් දරන බවක් පෙන්නන, විරුද්ධ පක්ෂයේ අය 1965 දී පැරදුණේ ඇයිදැයි මා අහනවා. මාත් ඒ පැත්තේ සිටි බව දැන් තමුන්නාන්සේලා කියයි. ඒක ඇත්ත තමයි. තමුන්නාන්සේලා ඔය තරම් රටට සේවයක් කළා නම් සිංහලකම, සභ්‍යත්වය, සංස්කෘතිය රකින්නට වැඩ කළා නම් ඇයි දෙයි හාමුදුරුවනේ 1965 දී තමුන්නාන්සේලා ගහලගියේ.

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிரிசேன)*
(Mr. Hemachandra Sirisena)

තමුන්නාන්සේලා කරන හැටි බලන්න අප නිවැඩු ගත්තා.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

මහජනයා නිවාඩු දුන්නා. අප එක් අවස්ථාවකදී බොහොම මහන්සි වී මේ පැත්ත අටට බැස්සූ බව තමුන්නාන්සේලාට මතක ඇති. තමුන්නාන්සේලා ගොවි කම්කරු ජනතාවත් සාමාන්‍ය ජනතාවත් උසස් කරන්නට ඔවුන්ගේ ජීවිත වර්ණවත් කරන්නට ඔවුන්ගේ ජීවිත අලංකාර කරන්නට බලාපොරොත්තු වුණා නම්, ඒ බලාපොරොත්තුව උඩ කටයුතු කළා



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න]

නම්, අර තරම් තැනක් නැති වුණු පුද්ගල සින්ම 1965 දී පැරදුණේ ඇයි? තමුන්නාන්සේලා හැම තැනම ගැහුවේ බොරු. මහජනයා රැවටුවා. දිවංගත ගරු බණ්ඩාරනායක අගමැතිතුමා හොඳ වැඩ පිළිවෙළක් ආරම්භ කළ බව ඇත්ත. අද තමුන්නාන්සේලා ගහන්නේ ඒ පරණ "රෙකෝඩ්" එකමයි. අද ඔය පැත්තේ අය මේ ගරු සභාව තුළ සිටින්නේ බණ්ඩාරනායක මැතිතුමාගේ නමින් බව මා නිර්භයව ප්‍රකාශ කරනවා. එසේ නැතිව තමුන්නාන්සේලාගේ පුළුවන්කාරකමටත් ලොකුකමටවත් නොවෙයි. බණ්ඩාරනායක අගමැතිතුමා සම්පූර්ණ සමාජ විප්ලවයක් කළා. අද ඔය පැත්තේ සිටින බොහෝ දෙනකුට පාර්ලිමේන්තුවට එන්නට පුළුවන් වුණේ ඒ නිසයි. එහෙත් ඒ ප්‍රතිපත්ති තමුන්නාන්සේලා කොපමණ දුරට අනුගමනය කළාදැයි තමුන්නාන්සේලාගේ හෘදයට තට්ටු කරල අහන්න. අද තිබෙන්නෙ බණ්ඩාරනායක මැතිතුමාගෙ ප්‍රතිපත්තියද, නැත්නම් තුන්හවුල් ප්‍රතිපත්තියද? අද තිබෙන්නෙ බණ්ඩාරනායක ප්‍රතිපත්තිය නොවෙයි. අද ඒක අවුල් ජාලාවක්. ඒ නිසා තමයි තමුන්නාන්සේලාට ඔය අවසනාවන්ත තත්ත්වය අත් වුණේ. "බණ්ඩාරනායක මැතිතුමාගේ සමාධිය තියෙන තුරු අපි ඉන්නවා; අපි පැරදෙන්නෙ නැහැ" කියා බොහෝ ඇමතිවරු ඒ කාලයේ කිව්වා. අපි නම් කවදාවත් එහෙම කියන්නෙ නැහැ. අපි 1970 වන තුරු ආණ්ඩු කරනව. ඉන්පසුව අපේ වැඩ පිළිවෙළ අනුව අපේ සුදුසුකම අනුව නැවත පත් කිරීම මහජනතාවට භාර කරනවා. ඔවුන් යම් අන්දමකින් අප නැවත පත් කළොත් අපි ආණ්ඩු කරනව; පැරදුණොත් ගෙදර ඉන්නව. අපට ආණ්ඩුවක් පිහිටුවින්න බැරි වුණොත් විරුද්ධ පාර්ශ්වයේ අසුන් ගන්නව. තමුන්නාන්සේලා මේ පැත්තෙ අසුන් ගනියි.

**පී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

මේ පුටුවල?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

මන්ත්‍රීකම පැරදුණොත් ගෙදර ඉන්නව.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

ඒකත් වෙන්ට පුළුවන්.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නොයෙක් වැල්වටාරම් අනවශ්‍ය දේවල් මේ අයවැය විවාදයේදී මතු වුණු නිසා මටත් එවැනි දේවල් සම්බන්ධයෙන් පිළිතුරු දෙන්ට සිදු වුනා.

මට පෙර කථා කළ දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. තෙන්නකෝන් මයා.) පීඩිත පන්තිය ගැන කථා කළා. අද මේ රජයත් විරුද්ධ පාර්ශ්වයත් අතර තිබෙන්නෙ දේශපාලන පක්ෂ භේදයක් නොව පන්ති භේදයක් යයි එතුමා ප්‍රකාශ කළා. ඒ පන්ති භේදය නැති වුණේ සර්ව ජන ඡන්ද බලය ලැබීමත් සමගම 1947 දී අපට සම්පූර්ණ නිදහස ලැබීමෙන් බව මා මේ අවස්ථාවේදී මතක් කරන්ට සතුටුයි. දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ පියා පුද්ගලයන්ට කථා කළේ, "තෝ—බොල—අඩෝ—මෙහෙ වර" ආදී වශයෙන් බව තමුන්නාන්සේ දන්නව. අපි වගේ පුද්ගලයන්ට උන්වහන්සේගේ මාළිගාවට යන්ට පුළුවන්කමක් තිබුණේ නැහැ. එතුමා අශ්වයා පිට නැඟී යන විට සැම වාහනයක්ම නවත්වා ආචාර කරන්ට සිද්ධ වුණා. එහෙත් එතුමාගේ පුතා සම්පූර්ණයෙන් ඒ අදහස් වෙනස් කර ඊට හාත්පසින්ම විරුද්ධ සාමාන්‍ය මිනිහෙක් ලෙස හැඩ ගැසුණා. ලෝකයේ පෙරළීම එයයි. එතුමා තාත්ත වගේ කථා කළේ නැහැ. ඒ විධියට හැසුරුණේ නැහැ. එතුමා රජකමෙන් සම්පූර්ණයෙන්ම සාමාන්‍ය මිනිහෙකුගේ තත්ත්වයට බැස්සා. දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා අද කියනව, පන්ති භේදයක් තිබෙනවලු. සටන තිබෙන්නෙ පීඩිත පන්තියත්, ධනපති පන්තියත් අතරෙලු. මා එතුමාගෙන් අහනව, ආණ්ඩු පක්ෂයේ ඉන්නෙ ඉංග්‍රීසියට පමණක් නැන දෙන, සාමාන්‍ය මිනිහ සම්පූර්ණයෙන් පාගාගෙන ඉන්න, දුප්පතා වහල් බැම්මෙන් බැඳගෙන ඉන්න, දුප්පතාට නැඟිටින්නට ඉඩ නොදී ඉන්න, කම්කරුවාත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගොවියාත් වහලුන් වශයෙන් තබාගන්න තැත් කරන පිරිසක්ද කියා. තමුන්නාන්සේලාගේ පැත්තේ ධනපතීන් නැද්ද ? තමුන්නාන්සේලාගේ පැත්තේ ඉන්න, අක්කර දහස් ගණන් ඉඩකඩම් ඇති අය පෙළපාලිවල පෙරමුණේ යමින් කියන්නේ නැද්ද, " ධනපතියන් හංග වේවා " කියා. පන්සලක් හදන්නට ශත 5 ක් වත් නොදෙන, තමන්ගේ බංගලාවට හිඟන්නකුට ඇතුළු වන්නට ඉඩ නොදෙන, සාමාන්‍ය කෙනකුට තමන්ගේ ගෙදර තිබෙන ආසනයක වාඩි වන්නට නොදෙන පුද්ගලයන් අද රටට පෙන්වන්නට හදනව, " අපි තමා, පීඩිත පන්තියේ ගැළවුම්කාරයන් " කියා.

ඒ වාගේම විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් සිංහල ගැනත් කථා කළා. ඒ අය කියනවා, අප ඉංග්‍රීසියට තැන දෙනවාලු. අප සිංහලයට මේ රටේ තැනක් දෙන්නේ නැතැයි ඒ අය කියනවා. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් මා අහන්නට කැමතියි, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තිබුණු කාලයේ සිවිල් සේවයට සිංහල මාධ්‍යයෙන් කී දෙනකු බඳවා ගත්තාද කියා. දැන් සිවිල් සේවකයන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන්නේ සිංහලයෙන් බව තමුන්නාන්සේලා දන්නවාද ? විරුද්ධ පාර්ශවයේ ගරු නායකතුමියගේ දියණිය එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ ඉගෙන ගන්නේ සිංහලයෙන්ද ? එතුමියගේ දුව සිංහල සංස්කෘතිය ඉගෙන ගන්නවාදැයි මා අහන්නට කැමතියි. ඒ වාගේම අගලවත්තේ ගරු මන්ත්‍රීතුමාගේ (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) දියණිය අද උසාවියේ කථා කරන්නේ සිංහලයෙන්ද ? ඇය සිංහල සංස්කෘතියට ගරු කරනවාද ?

විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් හදන්නේ, සාමාන්‍ය මහජනයා මුළා කිරීමටයි ; රට රැවටීමටයි. කලිසම හා රෙද්ද, බැනියම ගැනත් නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමා (එම්. තෙන්නකෝන් මයා.) කථා කළා. ඒ ගරු මන්ත්‍රීතුමා කලිසම ඇඳගෙන ඉන්නවා මා දැක තිබෙනවා. ඒ අය ටුවීඩ් කලිසම්, කෝට් අඳින්නේ නැද්ද ? සමහර විට මේ ගරු සභාවේ රැස්වීම්වලට පමණක් රෙද්ද, බැනියම ඇඳගෙන එනවා වෙන්නට ඇති. සවස් වන විට, රෑ වන විට, කලිසමට බහින හුඟ දෙනකු මා දැක තිබෙනවා. මේ අයවැය විවාදයේදී විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් මතු කළේ එවැනි ප්‍රශ්නයි. ඔය රීතියා දේශ ප්‍රේමීන් තමන්ගේ දරුවන් එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලවලට යවා ඉංග්‍රීසි සාහිත්‍ය ආදි විෂයයන් උගන්වන අතර, අපේ අහිංසක ගම්බද මිනිසුන්ගේ දරුවන්ට ඒවා සම්පූර්ණයෙන්ම අහිමි කළ බව තමුන්නාන්සේ දන්නවා ඇති. එහෙම කළේ නැතැයි කියනවාද ?

පසුගිය ආණ්ඩුවලිනුත් වැඩ රාශියක් කෙරුණු බව මා පිළිගන්නවා. මාත් ඒ පක්ෂයේ ඉන්න කාලයේ එසේ වැඩ රාශියක් කළා. නොයෙක් කර්මාන්ත පටන් ගත්තා. ඒ කර්මාන්ත ඇති කිරීමට ආධාර වුණේ මොනවාද ? ඒ කර්මාන්ත ඇරඹුවේ කොහොමද කියා මා පෙන්වන්නම්. එදා—1956 දී—අප හැම එක් වී එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව වැට්ටු අවස්ථාවේ, විදේශ විනිමය වශයෙන් රුපියල් දස ලක්ෂ 1,194.4 ක් අපට තිබුණා. එසේ නැතැයි කියනවාද ? එදා තිබුණු එක්සත් ජාතික පක්ෂය පරදින විට ඒ තරම් විශාල මුදලක් විදේශ විනිමය වශයෙන් අපට ඉතිරි කොට තිබුණා. අප තමුන්නාන්සේලා, එදා ආණ්ඩුව භාර ගත්තා විට ඒ තරම් විශාල මුදලක් විදේශ විනිමය වශයෙන් ඉතිරිව තිබුණත්, තමුන්නාන්සේලා 1965 දී නැවත ආණ්ඩුව භාර දෙන විට එයින් ඉතිරිව තිබුණේ කීයද ? දශ ලක්ෂ 1,194.4 ක් තිබුණු බව මා දැන් සඳහන් කළා. ඒ ගණන 1965 වන විට දශ ලක්ෂ 407.6 ට බැස්සුවා. නැත කියා පිළිතුරු දෙන්න පුළුවන් නම්. කොහොමද ඒ මුදල වියදම් වුණේ ? කොහොමද ඒ කම්මාන්ත පටන් ගත්තෙ ? කොහොමද ඒ යන්ත්‍ර සූත්‍ර ගෙන්නුවෙ ? ඒවා සියල්ලක්ම කළේ අර ඉතිරි කර තිබුණු මුදල්වලිනුයි. තමුන්නාන්සේලා එක කර්මාන්තයක්වත් නිසි පිළිවෙළකට ක්‍රමවත් වැඩ පිළිවෙළක් අනුව ආරම්භ නොකළ බව මා පෙන්වා දෙන්නම්. මුදල් තිබුණා. අර කර්මාන්තය ඕනෑය, මේ කර්මාන්තය ඕනෑය කිව්වාම පටන් ගත්තා. හිතුවක්කාර අන්දමට. හිතෙන හිතෙන අන්දමට කර්මාන්ත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න]
පටන් ගත්තා. මා එය ඔප්පු කරනවා. තමුන්නාන්සේලාගේම ආණ්ඩුවේ අවසාන වරට මුදල් අමාත්‍ය ධූරය ඉසිලූ යටියන් තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) ඔය කර්මාන්ත ගැන මොනවද කියන්නෙ ?

**ආර්. ජේ. ජී. ද මැල් මයා.** (දෙවිනුවර)
*(திரு. ஆர். ஜே. ஜீ. டி மெல்—தெவிநுவர)*
(Mr. R. J. G. de Mel—Devinuwara)
සීනි බෝල කාල කාල ඇති වෙලා නැද්ද ?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
මට සීනි බෝල කන්න ඒ තරම් ආශාවක් නැහැ. මම ඊට වඩා හොඳ බෝල කන මිනිහෙක්.

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)
කාල වමාරන්නත් වෙයි.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
ඒ වමාරන ජාතියෙ බඩු නොවෙයි අපි.

"In the past, when foreign exchange was more readily available and when there were no restrictions on imports from abroad, private sector industrial projects were liberally approved and granted generous quotas for the import of machinery and raw materials. While this may have been to some extent unavoidable in the first stages of industrialization, it nevertheless resulted in a haphazard and lopsided pattern of industrial development."—[OFFICIAL REPORT, 30th July 1964; Vol. 56, c. 1646.]

තමුන්නාන්සේලාගේම අයවැය ලේඛනයක් ඉදිරිපත් කරමින් පච්චම් දෙකක් උසුලන යටියන්තොට ගරු මන්ත්‍රීතුමා මොනවද කියන්නෙ ? හිතුණු විධියට මේ කර්මාන්ත ආරම්භ කළාය, ඒවායින් බොහොමයකගෙන් පාඩු ලැබෙනවාය, කිසිම වැඩ සැලැස්මක් නැතිව ඒ අය මේ රටේ කර්මාන්ත පමණක් ඇති කරන්නට කටයුතු කළාය කියනවා. ඒ අවස්ථාවේදී ඕනෑ තරම් මුදල් තිබුණා. ඒ මුදල් ඒ විදේශ විනිමය, තමුන්නාන්සේලා හිතුවක්කාර අන්දමට බඩු ගෙන්වන්නට ඇතැම් පුද්ගලයිනට දුන්නා. වැඩි හරියක්ම දුන්නේ කාටද ? තමුන්නාන්සේලා දැන් සිංහලයින් ගැන, ලාංකිකයින් ගැන ලොකුවට කථා කරනවා. එහෙත් පසුගිය කාලයේදී ඒ විදේශ විනිමය වැඩි හරියක් තමුන්නාන්සේලා දුන්නේ ලාංකික නොවන පුද්ගලයනටයි. ජාතික කැක්කුමක්, ජාති මමත්වයක්, ජාති ඇල්මක් තිබෙනවාය කියන තමුන්නාන්සේලා ඒ විදේශ විනිමය වැඩි හරියක්ම දුන්නේ ලාංකික නොවන පුද්ගලයනටයි.

කර්මාන්ත පටන් ගැනීම ගැන යටියන්තොට ගරු මන්ත්‍රීතුමා සත්‍ය ප්‍රකාශයක් කළා. හොඳ අදහස් තිබෙන උගතකු හැටියටත්, දර්ශනවාදියකු හැටියටත් මා එතුමාට හුඟක් ගරු කරනවා. එතෙක් කල් කරගෙන ගිය වැඩ පිළිවෙළ වැරදි බව පෙන්නුම් කර දීම ගැන එතුමාට මා ස්තුති කරනවා. ඒ වැරදි සියල්ලක්ම හරිගස්සා රටට නියම විධියේ ප්‍රයෝජනයක් ලැබෙන තත්ත්වයට ගෙන ඒමට අපේ ආණ්ඩුව උත්සාහ කරන බව මා මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්නට කැමතියි.

කාලයක් තිස්සේ පාඩුවට වැඩ කර ගෙන ගිය ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයට, වැඩ කරන්නට පුළුවන් දක්ෂ පුද්ගලයන් පත් කර ගැනීම නිසා දැන් අපට සම්භාණ්ඩ පිටරටවලට පවා යවන්නටත්, ඒ මගින් ආදායමක් එකතු කර ගන්නටත් පුළුවන්කමක් ඇති වුණා. ඒ වාගේම ධීවර කර්මාන්තය ඇතුළු වෙනත් බොහෝ කර්මාන්තවල තිබුණු වැරදි හරිගස්සා නියම දියුණුවක් ලැබෙන ආකාරයට වැඩ පිළිවෙළක් ගෙන යාමටයි අප බලාපොරොත්තු වන්නේ.

නොයෙක් චෝදනාවන් එල්ල කළා. මොකක්ද අපේ රටට වෙන්නට යන්නේ කියා ඇහුවා. අපේ තේ ටික, අපේ රබර් ටික, අපේ පොල් ටික විකුණා ගන්නට බැරි නිසා අපේ රට දවසින් දවස අන්ත පරිහාණියටයි මේ ආණ්ඩුව ගෙන යන්නේ, කිව්වා. නොයෙක් මන්ත්‍රීවරුන් එසේ ප්‍රකාශ කළා. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා මුදල් ඇමතිවරයා විශයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිටි කාලයේදී ඉදිරිපත් කළ අයවැය ලේඛනය විස්තර කරමින් එතුමා කියා තිබෙන දේ කියවන්නට කැමතියි :

"The future prospects for both tea and rubber are not at all bright. In the case of tea, with the increasing production potential in the traditionally tea producing countries in Asia as well as in the newly producing countries in East Africa and South America, there would appear to be a definite prospect of over production. In Ceylon the production of tea in the past decade has been increasingly approximately at a little over 3 per cent. a year. In these circumstances, Ceylon's ability to maintain a position of competitiveness in the world market in future would depend upon her ability to produce good quality tea. Although the future prospects for tea are not at all reassuring, I am not satisfied that we are getting the prices for our quality tea that we should get. Is it an accident that the f.o.b. price of tea has steadily and consistently dropped since 1955? In that year, the average f.o.b. price of a pound of tea as I have already mentioned was Rs. 3.30. —[OFFICIAL REPORT, 30th July 1964; Vol. 56, c. 1601.]

විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සේලා තේ වතු හිමියන්ටත්, පොදු මහජනයාටත් පෙන්වන්නේ තේ, රබර් සහ පොල් වල මිළ පහළ බහින්නට පටන් ගත්තේ අපේ ආණ්ඩුව බලයට ආවායින් පස්සේ කියලයි. ඒ නිසයි, විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සේලා බලයේ ඉන්න කාලයේ දී තමුන්නාන්සේලාගේ මුදල් ඇමතිවරයා ඉදිරිපත් කළ අයවැය ලේඛනයෙන්ම කරුණු ඉදිරිපත් කරන්නට මා කල්පනා කළේ.

1956 දී තේ රාත්තලක මිළ කීයද? රුපියල් තුනයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බලයට ආවාට පස්සේ, 1957 තේ රාත්තලක සාමාන්‍ය මිළ කීයද රුපියල් 2.78යි 1958 දී රුපියල් 2.75 යි. 1959 දී රුපියල් 2.72යි. 1960 දී රුපියල් 2.67 යි. 1961 දී 2.62 යි. 1962 දී රුපියල් 2.54 යි. 1963 දී රුපියල් 2.50යි.

ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා. (හපුතලේ)
(திரு. டபிள்யு. பீ. ஜீ. ஆரியதாச—ஹப்புத்தளை)
(Mr. W. P. G. Ariyadasa—Haputale)

අද කීයද?

ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න
(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)
(The Hon. N. H. A. M. Karunaratne)

අද ඊටත් අඩුයි. තමුන්නාන්සේලාගේ කාලයේදී රුපියල් තුනේ සිට දෙකයි පණහට බැහැලා තියෙනවා. ඔය තරම් කෙරුම්කාර පුද්ගලයන් මේ බැහැගෙන ඒම වැළැක්වුවේ නැත්තෙ ඇයි? ඇයි නගගන්නෙ නැතිව බහින්නට ඉඩ දුන්නේ? තේවලට දීප්තිමත් අනාගතයක් තිබෙනවයයි හිතන්නට බැරිය කියා එදා අයවැය ලේඛනය ඉදිරිපත් කළ තමුන්නාන්සේලාගේ ඇමතිතුමාම කිව්වා. අවුරුදු 10 ක් ඇතුළතම තේ ගණන් බැස්සා. අප බලයට ඇවිත් තවම ගත වී තිබෙන්නේ අවුරුදු දෙකකුත් මාස ගණනක් පමණයි. අවුරුදු 10 ක් තිස්සේ තේ ගණන් බහින තෙක් තමුන්නාන්සේලා බුදියාගෙන හිටියද කියා මම අහනවා. අවුරුදු 10 ක්ම කුම්භ කර්ණයන් වගේ නිදාගෙන ඉඳලා අප ටිකක් දඟලන විට ඇස් ඇරලා අහනවා, තේ ගණන් බැහැලා තියෙන්නේ මොකද කියා. ඇයි මහජනයා මුළා කරන්නේ? කෝ කෙරුම්කාරයන් කෙරුවා? ඔය තර්ජනය කරන පුද්ගලයන්ට බලය තියෙද්දී නේද තේ ගණන් බැහැගෙන බැහැගෙන ගියේ? තමුන්නාන්සේලා ඔය තරම් දක්ෂ නම්, තමුන්නාන්සේලාට අපට වඩා පාලන ශක්තියක් තිබෙනවා නම්, අපට වඩා විදේශික සම්බන්ධකම් තමුන්නාන්සේලාට තිබුණා නම් මේ ගණන් බහින්නට නොදී බොහොම පහසුවෙන් නගගන්නට තිබුණා. ඇයි කෙරුවෙ නැත්තෙ පුළුවන් නම්?

රබර්, පොල් ගැනත් ඒ විධියටම සඳහන් කර තිබෙනවා. ඇයි තමුන්නාන්සේලා මේවායේ ගණන් නැග්ගුවේ නැත්තේ? ඒ කිසි දෙයක් නොකර, මුල මතක නැතිව මහේශාක්‍ය ලීලාවෙන් කටයුතු කර දැන් බොරුවට කෑගහනවා. කර්මාන්තත් අවුල් කළා. රට පුළුවන් තරම් අවුල් කළා. පුළුවන් නම් නැහැ කියන්න, බලන්න. විදේශ විනිමය නැති කළ හැටි පෙනෙනවා. එපමණක් නොවෙයි. මහජන ණය ප්‍රමාණයත් වැඩි කළා. ගණන් හිලව් ගැන දන්නෙවත් නැති, කලිසම ගැනයි, රෙද්ද ගැනයි, අමුඩය ගැනයි පමණක් දන්න, අයයි මේ කථා කරන්නෙ. 1956 දී තිබුණු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න]

මහජන ණය මුදල කොපමණද? දස ලක්ෂ 942.7 යි. 1965 දී අප බලයට එන විට මහජන ණය මුදල කොපමණද? දස ලක්ෂ 3614.2 යි. ඔය කෙරුම් කාරයන්ට නැහැ කියන්න පුළුවන්ද? ඕවට උත්තර දෙනවා, පුළුවන් නම්. දෙව්නුවර මන්ත්‍රීතුමා (ද මැල් මයා.) හොඳ සිවිල් සේවකයෙක්. පුළුවන් නම් උත්තර දෙන්න බලන්න.

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

ණය ගන්නෙ නැතුව කොහොමද සංවර්ධනය කරන්නෙ?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

ණය වෙලා සුදිය මොකටද ගරු මන්ත්‍රීතුමනි? තියෙන දේවල් උගස් කරලා රේස් යන්නට ඕනෑ නැහැ. සුදි කරනවා නම් හරියට සුදි කරන්න ඕනෑ. තමුන්නාන්සේලා අවුරුදු 10 ක් කරපු හැටි මා මේ කියන්නෙ. විදේශ විනිමය දස ලක්ෂ එක් දහස් හාරසිය ගණන හාරසිය ගණනකට බැස්සුවා. ණය ප්‍රමාණය තවත් වැඩි කළා. 1965 වන විට ණය ප්‍රමාණය දස ලක්ෂ 3614 දක්වා වැඩි කර තිබුණා. ඒ විදියේ ආණ්ඩුවකුයි අප භාර ගත්තේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

තමුන්නාන්සේලා විවෘත කෙළේ අප ආරම්භ කළ කම්මාන්තයි.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

තමුන්නාන්සේලාගේ කම්මාන්ත ගැන යටියන්තොට මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) කියා තිබෙනවා. හිතුවක්කාර අන්දමට ඇති කළ ඒ කම්මාන්ත නියම පිළිවෙළට සංවිධානය කරන්නට අප ඒවා දක්ෂ පුද්ගලයකුට භාර දී තිබෙනවා. දෙමව්පියන් උපයා තැබූ ධනය නාස්ති කරන්නට සමහර පුතුන් බොහොම දක්ෂයි. ඔවුන් රේස් යනවා. වෙනත් නොයෙකුත් වැඩ කරනවා. ඒ ධනය විනාශ කරනවා. දෙමව්පියන් උපයා තැබූ ධනය වියදම් කරමින් මහාරාජාවරුන් මෙන් ජීවත් වන්නට හදන අය අන්තිමේදී පාරේ හිඟා කන්නන් බවට පත් වන අවස්ථාත් තිබෙනවා. පසුගිය ආණ්ඩුව සම්බන්ධයෙන්ද ඒ උපමාව ගැළපෙනවා. ඒ අය ගෙන ගිය නාස්තිකාර වැඩ පිළිවෙළ නිසා මේ රට වැටී තිබෙන තත්ත්වයෙන් ගොඩ ගන්නටයි, අප ක්‍රියා කරන්නේ. මේ රට ආහාරයෙන් ස්වයංපෝෂිත කිරීම සඳහා පසුගිය රජය පවතිද්දී ගත් පියවරවල් මොනවාදැයි ගොවි රජුන් ගැන කතා කළ දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමාගෙන් (ටී. බී. තෙන්නකෝන් මයා.) මා ප්‍රශ්න කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කර්මාන්ත මාර්ගයෙන් අපේ රටේ නිෂ්පාදනය කරන භාණ්ඩ ප්‍රයෝජනයට ගැනීම සඳහා අපේ රටේ සිටින බහුතර ජනතාවට මුදල් තිබෙන්නට ඕනෑ නේද? අපේ රටේ කිසියම් කර්මාන්තයක් පටන්ගෙන එයින් නිෂ්පාදනය කරන දේ ලෝකයේ අනෙකුත් බලසම්පන්න රටවල් සමඟ තරඟයට ඉදිරිපත් කරන්නට පුළුවන් ශක්තියක් අපට තිබෙනවාද? කාලාන්තරයක් තිස්සේ කර්මාන්ත අතින් දියුණුවක් ලබා ගත් රටවල් සමග අපට තරඟ කරන්නට පුළුවන්ද? බැහැ. එහෙම නම් අපේ රටේ නිෂ්පාදනය කරන දේ වැඩි වශයෙන්ම අලෙවි කරන්නට සිදු වන්නේ අපේ රට තුළමයි. පසුගිය ආණ්ඩුව ඒ පැත්ත බැලුවේ නැහැ. ඒ අය බැලුවේ වෙන පැත්තක් පමණයි.

අද අපේ ප්‍රතිපත්තිය මොකක්ද? මම කියන්නම්. අපේ හාල් ටික ලබාගැනීම සඳහා නැව් එනතුරු අපට බලාගෙන ඉන්නට සිදු වී තිබෙනවා. අප හැම විටම මුහුද දෙස බලාගෙන ඉන්නට ඕනෑ. හාල් ටික පමණක් නොව, ලූනු ටික මිරිස් ටික සුදුරු කොත්තමල්ලි ටික පිටරටින් ගෙන්වන තුරු බලාගෙන ඉන්නට ඕනෑ. අපට හැමදාමත් මේක කරන්නට පුළුවන්ද? පසුගිය යුද්ධ කාලයේදී එක්කෙනකුට සතියකට හාල් සේරු භාගයක් ලැබුණා. එදා තිරිඟු පිටි නැතිව තිරිඟු ඇට ගෙන්වාගෙන කෑවා. එදා එක බඩු නැවක් මෙහි ළඟා වුණේ තවත් නැව් හයක ආරක්ෂාව ඇතිවයි. එදා ඒ බඩු ටික අපට ලැබුණේ මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රට යටත් විජිතයක්ව පැවතුණු නිසයි; බ්‍රිතාන්‍ය යුද්ධ භටයන් මෙහි සිටි නිසයි. එහෙත් අද එවැනි තත්ත්වයක් අති වුව හොත් අපට ආහාර ගෙනැවිත් දෙන්නේ කවුරුන්ද? ලංකාවට එක නැවක්වත් තිබෙනවාද? අද ලෝක යුද්ධයක් ඇති වුවහොත්, ඇමෙරිකාව, චීනය, රුසියාව යන රටවල් පැටළුණහොත් අපට සිදු වන්නේ මොකක්ද? එදාට අප කන්නේ මොනවාද?

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சி. டி சில்வா)*
(Mr. L. C. de Silva)
අමෙරිකන් භටයන් බඩු ගෙනත් දේවි.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
ඔව්, අපි ඇමෙරිකාවට කත් අදින මිනිස්සු! තමුන්නාන්සේලා කියන්නේ ඒක නේද? එහෙත් පසුගිය ආණ්ඩුව නොයෙකුත් අවස්ථාවලදී අමෙරිකාව ගැන කියා ඇති දේවල් මම පෙන්වන්නම්. එංගලන්තය ගැන කියා ඇති දේවල් පෙන්වන්නම්. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ගේ කථාවලින්ම මට ඒ ගැන පෙන්වා දෙන්නට පුළුවනි. එදා මුදල් ඇමතිවරයාව සිටි දොම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාර නායක මයා.) කීවේ මොකක්ද? ඒ කියා ඇති දේවල් දැනගෙනද විරුද්ධ පාර්ශ්ව යේ ගරු මන්ත්‍රීවරුන් අද කථා කරන් නේ? දැන් නම් අමෙරිකාවට බණිනවා. එහෙත් එදා ඇමෙරිකාවට ප්‍රශංසා කළා. මේක චපලකම නොවෙයි නම් වෙන මොකක්ද? මේක වමාරා කෑම නොවෙයි නම් වෙන මොකක්ද? වමාරා තිබෙන හැටි මම දෙව්නුවර ගරු මන්ත්‍රීතුමාට (ආර්. ජේ. ජී. ද මැල් මයා.) පෙන්වා දෙන්නම්. ඒ ගරු මන්ත්‍රීතුමා නම් ළඟදී පත්ව ආ නිසා තවම වැමැරුවේ නැහැ. එහෙත් අනෙක් අය නම් වැමැරුවා. එදා ඇමෙරිකාවට ප්‍රශංසා කළ අය අද බණිනවා. ලජ්ජා ඇති අය නම් මෙහෙම කරන්නේ නැහැ. එක වෙලාවක ප්‍රශංසා කරනවා. තව වෙලාවක බණිනවා. මේ වැඩේ කරන්නේ රෙදිත් ඇඳගෙනද? ඇමෙරිකන්කාරයන් අපට කන්නට ගෙනත් දෙතැයි බලපිටි යේ ගරු මන්ත්‍රීතුමා (එල්. සී. ද සිල්වා මයා.) දැන් කීවා එදා කීවේ මොකක්ද? මෙතන ප්‍රකාශ කළ හැම කරුණක් ගැනම කථා කිරීමට මා බලා පොරොත්තු වන්නේ නැහැ. එහෙත් එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මහතා මුදල් ඇමති වශයෙන් සිටි කාලයේ එතුමා කියා තිබෙන්නේ කොහොමද කියා අපි බලමු. Foreign Private Investment සම්බන්ධව කථාකරමින් කියා තිබෙන්නේ මොකක්ද? ඒ අය විදේශීන් කැඳවනවා, මේ රටට ඇවිත් වැඩ පටන් ගන්නය කියා. නොයෙක් කර්මාන්ත ව්‍යාපාර පටන් ගැනීමට ආධාර දී තිබෙනවා. දැන් මෙතන ට ඇවිත් කියනවා අපි අමෙරිකාවට මේ රට පාවා දෙනවාය කියලා. එහෙත් ඒ අය ආණ්ඩු කරන කාලයේදී අමෙරිකාවටත් බ්‍රිතාන්‍යයටත් ආරාධනා කර තිබෙනවා.

"During the year the terms of an Investment Guarantee Agreement to be entered into between the Government of Ceylon and the United States Government regarding U.S. investments in Ceylon which would offer a stimulus to U.S. private investment in this country were approved."—[OFFICIAL REPORT, 26th July 1962; Vol. 47, c. 1320.]

තේරුණාද? කවුද ඔය කියන්නේ? දෙම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) ඔය කියන් නේ. අමෙරිකාවෙන් මුදල් යොදවා මේ රටේ යම් යම් කර්මාන්ත ව්‍යාපාර ආරම්භ කිරීම සම්පූර්ණයෙන්ම අනුමත කර තිබෙනවා. ඉතින් දැන් කියන්නේ මොකක්ද? ගරු ඉලංගරත්න ඇමතිතුමා කියා තිබෙන එකක් අහගන්නට ඕනෑද? අමෙරිකාව, එංගලන්තය, බටහිර ජර්මනිය ආදී සෑම රටක් සමගම ගිවිසුම් ඇති කර ගෙන මේ රටේ කර්මාන්ත ව්‍යාපාර පටන් ගැනීම සම්බන්ධයෙන් තමුන්නාන්සේලා සම්පූර්ණ සම්මතියකට ඇවිත් ඒවාට අනුබල දී අද මෙතනට ඇවිත් අමෙරිකාව ට එංගලන්තයට කත් අදිනවා කියා කෑගහනවා. මොකක්ද ඔය කතාවේ තේරුම? මේවා බොරුද? ඇයි එක පැත්තකටම කථා කරන්නේ? ගරු ඉලංගරත්න මුදල් ඇමතිතුමා කළ කථා වේත් ඔය විධියටම ඒ රටවලට ස්තුති කර තිබෙනවා; ප්‍රශංසා කර තිබෙනවා. foreign private capital ගැන කථා කරගෙන යන ගමන් ලංකාවට පැමිණ වැඩ ආරම්භ කිරීම ගැන අමෙරිකාව එංගලන්තය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න]
ආදී රටවලට සම්පූර්ණයෙන්ම එතුමාගේ ස්තුතිය පිරිනමා තිබෙනවා. එමෙන්ම ඒ රටවලින් දුන් ආධාර පිළිබඳවත් ඒ රටවලට ස්තුති කර තිබෙනවා. ආචාර්ය එන්. එම්. පෙරේරාත් ඒ විධියටම ස්තුති කර තිබෙනවා. ගරු ඉලංගරත්න මුදල් ඇමතිතුමාත්, ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මුදල් ඇමතිතුමාත්, ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා මුදල් ඇමතිතුමාත් යන තුන්දෙනාම කැනඩාව, ඕස්ට්‍රේලියාව, අමෙරිකාව, බටහිර ජර්මනිය, ආදී රටවලට අපට උදව් කිරීම ගැන බොහොම ප්‍රශංසා කර තිබෙනවා. එමෙන්ම මේ රටට ඇවිත් මේ රට දියුණු කරන්නය, තව තව ආධාර දෙන්නය කියා ඉල්ලා තිබෙනවා. එදා එසේ කී අය අද මෙහෙම කථා කරන්නේ කොහොමද? තමුන්නාන්සේලා කථා කරන්නේ කටින්ද නැත්නම් වෙන තැනකින්ද? අධිරාජ්‍යවාදීන්ට විරුද්ධ නම් විරුද්ධයි කියා කෙලින්ම කියන්න. අධිරාජ්‍යවාදීන්ට විරුද්ධ නම් ඇයි ඒ අය පස්සෙ යන්නේ? මා සඳහන් කළ ඔය මුදල් ඇමතිවරුන් තුන්දෙනාම ඒ රටවලින් ආධාරත් අරගෙන තිබෙනවා; ඒ රටවලට ඒ ගැන ප්‍රශංසා කරලත් තිබෙනවා. අපි අමෙරිකාවට, එංගලන්තයට, කැනඩාවට, ඕස්ට්‍රේලියාවට යට වී සිටිනවාය කියා මහ ජන ගැලරියට පෙන්වන්නට දැන් තමුන්නාන්සේලා උත්සාහ කරනවා. අපි කොයි රටකටවත් යට වී නැහැ. අප සෑම රටක් සමගම වෙළඳ හුවමාරු ඇති කරගෙන අපක්ෂපාතව කටයුතු කිරීමට බලා පොරොත්තු වෙනවා. ඔය අදහස විරුද්ධ පාර්ශ්වයේ නොයෙකුත් කථික මහත්වරුන් විසින් ප්‍රකාශ කරන්නට යෙදුණා. හොඳයි මේ අන්දමට ප්‍රකාශ නො කළායැයි තමුන්නාන්සේලා කාටවත් දැන් කියන්නට පුළුවන්ද? අප ආණ්ඩු කළ අවුරුදු 10 කාල සීමාව තුළ අමෙරිකාව, එංගලන්තය, කැනඩාව, ඕස්ට්‍රේලියාව වැනි රටවල් පස්සේ ගියේ නැතෙයි කියන්නට කාටවත් පුළුවන්ද? ඇයි මෙහෙම බොරු කියන්නේ? ඇයි මෙහෙම බොරු කියා මහ ජනතාව රවටන්නේ? මෙතන ඇවිත් එක දෙයක් කතා කරනවා. මහජන වේදිකාවේ දී වෙන දෙයක් කතා කරනවා. කැණහිලුන් වාගේ ඒ ඒ රටවලට පුළුවන් තරම් ගසා උදව් ලබා ගනිමින් ක්‍රියාකොට අන්තිමේ පැරදිලා නිවටයන් මෙන් සිටින සමහර උදවිය අද කරන්නේ ඒ ආධාර ලබා ගත් උදවියටත් බණින එකයි.

අපි කවදාවත් රුසියාවට දොස් කියන්නේ නැහැ. රුසියාව බොහොම හොඳ රටක්. චීනයත් ඉතා හොඳ රටක්. අපි ඒ සෑම රටකටම ගරු කරනවා. අපේ වෙළඳ ප්‍රතිපත්තිත් අපේ විදේශ ප්‍රතිපත්තිත් ඒ රටවල් සමග හරියාකාර අනුගමනය කරනවා. අපේ කර්මාන්ත සඳහා අප බඩු ගෙන්වන්නේ අමෙරිකාවෙන් පමණක් නොවෙයි. එංගලන්තයෙන් පමණක් නොවෙයි. මුළු ලෝකයෙන්ම ටෙන්ඩර් කැඳවා පුළුවන්තරම් අඩු මිලට හොඳ බඩු ලබා ගන්නටයි, අප ක්‍රියා කරන්නේ. තමුන්නාන්සේ දන්නවා අප පෙරදිග ජර්මනියෙන්, රුසියාවෙන් සහ චීනයෙන් එහෙම බඩු ගෙන්වන බව. අප ඒ රටවල් සමග තිබෙන ගණුදෙනු අතහැර නැහැ. එසේ නම් මහ ජනයාට තමුන්නාන්සේලා බොරු කියන්නේ ඇයි? සම්පූර්ණයෙන්ම වෙනස් ස්වරූපයක් මවා පෙන්වන්නට තමුන්නාන්සේලා කල්පනා කරන්නේ චපලකම් හිතේ තියෙන නිසායි. ඕකට තමයි, hypocrisy හෙවත් චපලකම කියන්නේ. තමුන්නාන්සේලා මහජනතාව මුලා කිරීමේ අදහසින්, රැවටීමේ අදහසින් කතා කරනවා. දෙව්නුවර ගරු මන්ත්‍රීතුමා (ද මැල් මයා.) හොඳ සිවිල් සර්විස් කාරයෙක්. දොම්පෙ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා) එදා එහෙම කිව්වෙ නැතැයි කියන්න, පුළුවන් නම්. දැන් සිටින කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) ඒ කාලෙ එහෙම කියා උදව් ගත්තෙ නැතැයි කියන්න, පුළුවන් නම්. දැන් සිටින යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) ඒ කාලෙ මේ විධියට කිව්වෙ නැතෙයි කියා පුළුවන් නම් ඔප්පු කරන්න.

ද මැල් මයා.
*(திரு. டி மெல்)*
(Mr. de Mel)
මා ඊයෙ පෙරේද ආව කෙනෙක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

මෙහාට එන්න ඉස්සර තමුන්නාන්සේ මීට වඩා හොඳට මේවා ගැන දන්නවා. තමුන්නාන්සේ මේකට ඇතුළු වන්නට පෙර මීට වඩා මේවා ගැන සොයාපු කෙනෙක්. මම තමුන්නාන්සේට ගරු කරනවා.

ධනේශ්වරයන්ට, සල්ලි කාරයන්ට අපි ඉඩම් ආදිය බෙදා දෙන බවක් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් විසින් කියන්නට යෙදුණා. ඒක සම්පූර්ණ ඇත්ත. අප ගෙනියන්නේ බලු ප්‍රතිපත්ති බවයි, තමුන්නාන්සේලාගේ අදහස. අප කරන්නේ බලු වැඩ නම් තමුන්නාන්සේලාගේ අයවැය ලේඛනවල අර අන්දමේ බලු ප්‍රතිපත්ති අනුගමනය කළේ මන්ද කියා මා ප්‍රශ්න කරනවා. අද සිටින දොම්පෙ ගරු මන්ත්‍රීතුමාත් කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමාත් එදා තමතමන්ගේ කතාවලින් කීවේ මොනවාද ? පොදු ජනතාවට තමන් ලඟ තිබෙන මුදල් යොදවා මේ රටේ කර්මාන්ත බිහි කිරීමටත්, වැවිලි කටයුතු කරන්නටත් අනුබල දෙන්ට ඕනෑ බවයි කීවේ. ලොකුම සමසමාජ කාර විරොස්කිවාදී යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) එදා හිටපු මුදල් ඇමතිතුමායි. එතුමාත් මේවා අනුමත කරනවා. එහෙත් දැන් කියන්නේ වෙනස් අන්දමකටයි. මේ තර්කවල අදහස කුමක්ද? පුද්ගලික සල්ලි තිබෙන උදවියට කර්මාන්ත පටන් ගැනීමටත් ගොවිතැන් වැඩි දියුණු කිරීමටත් පුළුවන් තරම් ආධාර අනුබල දිය යුතුය කියන කතාවයි, අවුරුදු 10ක් තිස්සේ තමුන්නාන්සේලාට බලය පැවරී තිබුණු කාලයේ ප්‍රකාශ කළේ. අපත් ඒකම කරන්නට සූදානම් වන විට ඒක පල් වැඩක් යයි තමුන්නාන්සේලා කියනවා. වලිගෙ හපාගෙන දඟලමින් චපල කථා කියමින් මේ උදවිය නිකං බොරුවට කෑගහනවා. "ස්වේට් කවුන්සිල්" කාලයේ මා ඉස්කෝලේ යන කොලුවකුව සිටියදී අර මහජන ගැලරියෙහි සිට මෙහි කෙරෙන කථා අසාගෙන සිටියා. එදා සිට අද දක්වාම, මගේ මේ ජීවිත කාලයේදී, මේ උදවිය කියන තරම් චපල කථා අහලා නැහැ. කවින් එකකුත් තවත් තැනකින් තව එකකුත් කියන මේ වගේ පිරිසක් නම් මා කවදාවත් දැකලා නැහැ. කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමාත් (පී. බී. ඉලංගරත්න මයා.) යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය එන්. එම්. පෙරේරා) දොම්පෙ ගරු මන්ත්‍රීතුමාත් (ඒෆ්. ආර්. ඩී. බණ්ඩාරනායක මයා.) මුදල් ඇමතිවරුන් වශයෙන් සිටියදී එතුමන්ලා විසින් අනුමත කරන ලද දේම අප විසින් කරන්නට යන විට එතුමන්ලාම ඒ වැඩේ වැරදියි කියනවා. "උඹලා සල්ලි දෙන්නේ ධනපතියන්ට මයි ; දුප්පතාට කිසිම දෙයක් නැහැ ; ගොවිතැන් කරන්නට ඉඩම් දෙන්නෙත් කර්මාන්ත ආරම්භ කරන්නට සල්ලි දෙන්නෙත් ධනපතියන්ට පමණයි" ආදී වශයෙන් එතුමන්ලා කියනවා. නැතැයි කියා ඔප්පු කරන්න, මහ කෙරුම්කාරයින්ට පුළුවන්නම්. මේ විධියේ බොරු ගහලා මහජනයා රවටන්නේ ඇයි ? "නටපු නොයිලෙකුත් නෑ, බෙරේ පළුවකුත් නෑ" යන කියමනක් තිබෙනවා. අවුරුදු 10 ක් තිස්සේ තමුන්නාන්සේලා දුප්පතාට මොනවද කළේ ?

දුප්පත් ළමයින්ගේ අධ්‍යාපනය ගැන තමුන්නාන්සේලා කටයුතු කළ හැටි මා කියන්නම්. ලොකු අයගේ දරුවන් එංගලන්තයේ, අපේ කොල්ලන් කෙල්ලන් ගමේ පොල් අතු ඉස්කෝලේ. ලොකු අයගේ දරුවන් ඔක්ස්පර්ඩ් එකේ. අපේ ළමයින්ට ඉංග්‍රීසි ඇත්තේම නැහැ. බණ්ඩාරනායක මැතිණියගෙ දුව ඔක්ස්පර්ඩ් එකේ සිංහලද ඉගෙන ගන්නේ ? කොල්වින් ආර්. ද සිල්වා මහත්මයාගේ දුව—ඒ මහත්මයා නම් අහිංසක දුප්පතා—කොහේද ? ධනපති හංග වේවායි කියමින් එතුමා මහජනයා ඉදිරියට ගිහින් කෑ ගහනවා. එතුමාගේ දුව ඉගෙන ගත්තේ ඔක්ස්පර්ඩ් එකේ නැත්නම් කේම්බ්‍රිජ් එකේ. සිංහලද ඉගෙන ගත්තේ ? ඇයි මේ විධියට මහජනයා මුලා කරන්නේ ? අපේ ගම්බද පාසල්වල ඉගෙන ගන්නා දරුවන්ට, අපේ හාමුදුරුවරුන්ට සිංහලයෙන් ඉගෙන ගෙන බී.ඒ. ගන්නට පුළුවන් බව ඇත්ත. එහෙත් උපාධිය ගත්තායින් පසුව ඒ අයට ලැබෙන රක්ෂාව මොකක්ද ? මේවට උත්තර දෙන්න. මේ රටේ එස්. එස්. සී. සමත් වුණු අයටත්, උපාධි ලබා ගත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න]

අයටත්, විරුද්ධ පක්ෂය රට ආණ්ඩු කළ අවුරුදු 10 තිස්සේ දුන් රක්ෂා මොනවාද? රක්ෂා දෙන්නට තිබුණු වැඩ සැලැස්ම මොකක්ද? මොකක්වත් නැහැ. "අප සිංහලයෙන් උපාධි ලබා ගන්නට ඉඩ සලසා දුන්නා"යි කියමින් ගම්වලට ගොස් මේ උදවිය කෑගහනවා. එයින් ඇති වැඩේ මොකක්ද? අද යම්කිසි තැනෙක මුර වැඩක් සඳහා ඉල්ලුම් කළත් උපාධියක් තියෙනවාදැයි අහනවා. බස් කොන්දොස්තර වැඩකට ඉල්ලුම් කළත් උපාධියක් තියෙනවා දැයි අහනවා. එවැනි තත්ත්වයකට මේ රටේ රැකිරක්ෂා ප්‍රශ්නය ගෙන ඒම නිසා විශාල පිරිසක් අද රස්තියාදු වෙනවා. උපාධි ලබන හැමදෙනාටම රක්ෂා දෙන්නට පිළිවෙළක් පසුගිය ආණ්ඩුව සකස් කළාද? නැහැ. ඉගෙන ගෙන ඉස්කෝලවලින් පිටවන දරුවන් වෙනුවෙන් තමුන්නාන්සේලා මොනවද ඇති කළ ව්‍යාපාර? ගමේ ගොඩේ දුප්පතාගේ දරුවාට ඉන්ජිනේරුවෙක් වෙන්ට තමුන්නාන්සේලා මොකක්ද කෙරුවෙ? දොස්තර කෙනෙක් වෙන්ට මොනවද කෙරුවෙ? අද්වකාත් කෙනෙක් වෙන්ට මොනවද කෙරුවෙ? සෑම දෙයක්ම කෙරුවෙ ඉංග්‍රීසියෙන්. තව කයිවාරු ගහනව. සිංහල භාෂාව, ඉතිහාසය, භූමි ශාස්ත්‍රය විතරක් උගන්වල ගම්බද සාමාන්‍ය මිනිසුන්ගෙ දරුවන් රස්තියාදුකාරයින් කරල ඒගොල්ලන්ගෙ දරුවන් අද්වකාත්වරුන්, දොස්තරවරුන්, ඉන්ජිනේරුවන් කරන්ට ඔවුන්ට ඉංග්‍රීසි ඉගැන්නුව. පසුගිය අවුරුදු 10 ඇතුළත සිංහලෙන් පුහුණු කරපු එක ඉන්ජිනේරුවෙක් ඇති කෙරුව නම් ඔප්පු කරන්න; සිංහලෙන් පුහුණු කරපු එක දොස්තර කෙනෙක් පසුගිය අවුරුදු 10 ඇතුළත ඇති කෙරුව නම් කියන්න; පසුගිය අවුරුදු 10 ඇතුළත සිංහලෙන් පුහුණු කරපු එක ගෘහ නිර්මාණ ශිල්පියෙක් තමුන්නාන්සේලා ඇති කෙරුව නම් කියන්න; එක නඩුකාරයෙක් ඇති කෙරුව නම් කියන්න. එහෙම කියන්නෙ වේදිකාවෙදි විතරයි. මේවට උත්තර දෙන්ට බැහැ. අපි අහන්නෙ පුහු ප්‍රශ්න නොවෙයි. පුළුවන් නම් අපේ තර්ක බිඳිනව, අපි මේව කරවල තිබෙනව, අපි මේ මේ විධියේ අය ඇති කරල තිබෙනවා කියා. මේවට දෙන්න උත්තර නැහැ. සත්‍යය සත්‍ය අන්දමට බැලුවොත් ඉතා පැහැදිලිව දෘෂ්‍යමාන වෙනව, ව්‍යාජයෙන් බලය අල්ලන්ට දඟලන, බල ලෝභයෙන් ගැහෙන, පිරිසක් මේ රටේ සිටින බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පුද්ගලයන් අවුරුදු 10 ක් රට පාලනය කළ කාලයේදී කල්පනා කර බැලුවෙ නැහැ. වැඩි වන ජනගහනය අනුව මේ රටේ මිනිසුන්ට කන්ට හොයන්නෙ කොහොමද කියල. නැව් එනතුරු විරිත්තගෙන බලා සිටිය. නැව් ආවෙ නැත්නම් හුලං බොන්ටයි වෙන්නේ. පුළුවන් නම් මේවට "නැහැ" කියල උත්තර දෙන්න. අද හාල් ටික පිටරටින් ගෙනෙන්ට ඕනෑ. චීනය හාල් නැහැ කිව්වොත් ටොන් ලක්ෂ 2 කට වදිනව. තායිලන්තයෙන් එන ප්‍රමාණය එවන්නට බැහැ කිව්වොත් විරිත්තගෙන උඩ බලාගෙන ඉන්න ඕනෑ. පාකිස්ථානයේ හෝ ඉන්දියාවේ මිරිස් ටික මැරී ගියොත් අපට කන්ට මිරිස් නැහැ. ලෙබනනයෙන් හෝ බල්ගේරියාවෙන් හෝ බොම්බයි ලූනු ටික ආවෙ නැත්නම් විරිත්තගෙන ඉන්න ඕනෑ. අපේ සැලැස්ම මේකයි. බොහොම අමාරුයි, මොළේ නැති මිනිහෙකුට අවබෝධ කරවන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අදහන ප්‍රතිපත්තිය මේකයි; රටක් දියුණු වීමට නම් ඒ රට ආහාරයෙන් ස්වයං පෝෂිත වන්ට ඕනෑ. අපේ රටෙන් පිටරට ඇදී යන මුදල මේ රටේ නවත්වා ගන්න පුළුවන් වුණොත් මේ රටේ බලය කොයි පක්ෂයට ගියත් කමක් නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වේවා, කොමියුනිස්ට් පක්ෂයට වේවා, සමසමාජ පක්ෂයට වේවා කොයි පැත්තට බලය ලැබුණත් ඒක මහ ජන මතයයි. අපි සදාකාලිකව ආණ්ඩු කරන්නෙ නැහැ. අපි කවදාවත් කියන්නෙ නැහැ, අපි ඉර හඳ තිබෙන තුරු බලයේ ඉන්නව කියා. පසුගිය මැතිවරණ කාලයේ විරුද්ධ පාර්ශ්වයේ සමහර ඇමතිවරුන් ඒ විධියේ ප්‍රකාශ කළාට අපේ අගමැතිතුමාවත්, ඇමතිවරුවත්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුවත් එවැනි මෝඩ ප්‍රකාශ කිසි දිනෙක කරන්නෙ නැහැ. ඒ වගේම අපි සදාකාලිකව ජීවත් වෙන්නෙත් නැහැ. අපි බලයට එන්නෙ හෝ බලයෙන් පහ වන්නෙ හෝ මහජන මතය අනුවයි. අපේ අදහස අනුන්ගෙන් හිඟාකෑම නොවෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අප අන්ත ප්‍රපාතයට වැටී තිබෙන නිසා පිටරටින් ආධාරත් අරගෙන මේ රට ස්වයංපෝෂිත කරන්නයි. මේ රටට සහල් ගෙන ඒමට කෝටි ගණනක් මුදල් යනවා. එහෙත් මේ සහල් කොපමණ ප්‍රමාණයක් අපේ රටේ නිපදවන්න පුළුවන්ද? මෙහි තිබෙන වැව් පොකුණු ගැන බලන විට, පසේ සාරවත්කම ගැන බලන විට, තමුන්නාන්සේලාට පැහැදිලිවම පෙනී යනවා ඇති, මේ රටේ ජනතාවට ඇති තරම් සහල් මේ රටේම නිපදවන්නට පුළුවන් බව. එසේ වුණත් අවුරුදු 10 ක් තිස්සේ ඒ පුද්ගලයන් එවැනි අදහසක් ඇති කර ගත්තේ නැහැ. ඒ මක්නිසාද එයට ඉඩ දුන්නේ නැහැ. ඒ පුද්ගලයන් පුළුවන් තරම් උත්සාහ කෙළේ වැඩ වර්ජන ආදිය කරන්නයි. ඒ කිසිම දේකට ඉඩ නොදී රට බංකොලොත් කර සම්පූර්ණයෙන් මේ රට වෙනත් අතකට ගෙන යන්න උත්සාහ කළා.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy-Chairman of Committees)

ගරු ඇමතිතුමා තව බොහෝම වෙලාව ගන්නවාද? දැනටත් හුඟක් වෙලාව ගත වුණා.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

ඇමති කෙනෙක් හන්දා වැඩි වෙලාවක් දෙන්න ඕනෑ නේ.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy-Chairman of Committees)

ගරු ඇමතිතුමාට පැයක් දුන්නා.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

මා හිතනවා අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකු හෝ දෙන්නකු තමන්ගේ වෙලාවෙන් මට ටිකක් ඉඩ දේවි කියා.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy-Chairman of Committees)

එසේ නම් 6 වන තුරු කථා කරන්න. 6 ට නවත්වන්න.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

6 ට තව මිනිත්තු 10 යයි තිබෙන්නෙ. මම පුළුවන් තරම් උත්සාහ කරන්නම්. ඒ කාලය ඇතුළත බැරි වුණොත් තවත් මිනිත්තු 10 කට අවසර දුන මැනව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පෙන්වා දෙන්නට වෑයම් කෙළේ අපේ රජය කරන්නට යන ඒ වැඩ පිළිවෙළ කාටත් දැන් පැහැදිලි වී තිබෙන බවයි. අනුන් ගැන බලාපොරොත්තුවක් නැතිව, මේ රටේ නිදහස රැකීමට නම් ඒ නිදහස රැකගත යුත්තේ අපේ ආර්ථික පදනම උඩයි, නොහොත් ආර්ථික නිදහස උඩයි. අප කොපමණ කර්මාන්ත ඇති කළත්, සාමාන්‍ය ගොවියා ළඟ මුදල් නැති නම් ඒ කිසිම දෙයක් මේ රටේ අලෙවි කරගන්න බැහැ. කුඹුරු අක්කර ලක්ෂ ගණනක් අස්වැද්දීමට අපට පුළුවන්කමක් තිබෙනවා. එහෙත් පසු ගිය අවුරුදු 10 ක් පමණ කාලයක් තිස්සේ මේ උදවිය කයිවාරු ගැසුවා මිසක් මෙරට නිපදවන හාල් ප්‍රමාණයේ වැඩි වීමක් ඇති වුණාද? එන්න එන්නම පිටරටින් ගෙනෙන හාල් ප්‍රමාණය වැඩි වුණා මිසක් ඒ ප්‍රමාණය අඩු කිරීමට ගත් ප්‍රයත්නය මොකක්ද කියා උත්තර දෙන්න. හාල් සඳහා පිට රට ඇදෙන මුදල සම්පූර්ණයෙන්ම ඉතුරු කර ගන්න අපට පුළුවන්.

අපේ අත්තලා මුත්තලා අර්තාපල් කෑවෙ නැහැ. ඒත් අප ඒවාත් කෑමට පුරුදු වී තිබෙනවා. ඒ ආහාරයත් මේ රටේ වවන්න පුළුවන්. රටකජු වවන්න පුළුවන්. මඤ්ඤොක්කා ගසක්වත් වවන්න පටන්ගෙන තිබෙන්නේ දැන් නේද? ජාතික අභිමානයෙන් ධෛර්යයක් ලැබී නිදහස් රටක ජනතාවක් හැටියට වැඩ කර මේ රට ස්වයංපෝෂිත කිරීමට සූදානම් වී සිටින්නේ දැන් නේද? කවුද ඒ තත්ත්වය ඇති කෙළේ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එන්. එච්. ඒ. එම් කරුණාරත්න]

තමුන්නාන්සේලා ලොකුවට කියනවා, ගොවියා වැඩ කරනවාලු, වැව් බඳිනවාලු ඒත් තවමත් නැතිලු. ඉපදුණ හැටියෙ ඇවිද්ද මිනිහා කවුද ඔය පැත්තේ ? ඇවිද්ද කෙනෙක් ඉන්නවාය කියා ඔප්පු කළොත් මා ඉල්ලා අස් වෙනවා. මන්ත්‍රීකමත් එපා කියා ගෙදර යනවා. වවුලා හැපූ කජු පුහුලම වාගේ මේ රට කා දමා හප යක් වශයෙන් තිබුණ තත්ත්වයට පණ දෙන්නයි අප සූදානම් වන්නේ. ඒත් ඒක ටිකක් අමාරු වැඩක්. ටිකක් ඉවසා සිටින්න ඕනෑ.

අප ගොවි හමුදාවක් ඇති කළේ ගොවි කර්මාන්තය අතින් දහසක් තරුණයන්ට රක්ෂා දීමටයි. ගොවි කර්මාන්තය අගෞරව රක්ෂාවක් නොවෙයි. උඩ වලවේ ව්‍යාපාර ආදිය පමණක් නොව, සෑම තැනකම වාගේ ඉඩම් දී අස් වද්දවා මේ රටට අවශ්‍ය සහල් ටික සම්පූර්ණයෙන්ම මෙමෙහිම නිපදවා දෙන්නටයි අප බලාපොරොත්තු වන්නේ. අද හාල් සේරුවක් නිකම් දෙනවා. 1970 වන විට අප හාල් පොත්වලට පයින් ගසා වීසි කරනවා, හාල් පොත් නැතුව ඕනෑ තරම් හාල් දෙනවා. නමුත් තමුන්නාන්සෙලා ගත් පියවර මොකක්ද ? දොම්පෙ ගරු මන්ත්‍රීතුමා මුදල් ඇමතිවරයා වශයෙන් සිටි කාලයෙ හාල් මිල වැඩි කරන්න හැදුව, සීනි මිල වැඩි කළා. ඒ වාගේම පඩි කැපුවා. නමුත් විරුද්ධ පක්ෂයෙ මන්ත්‍රීවරුන්ට මේවා අමතක වී වේදිකාවලට නැගී කියන්නෙ මොනවද ? සූදුරු නැහැ, මිරිස් නැහැ, අල නැහැ, බොම්බයි ලූණු නැහැ, මොකුත් නැහැ, කියනවා. කාරණය ඇත්ත. චීනයෙන් හාල් දුන්නෙ නැති නම් අපට හුලං. යුද්ධයක් වුණොත් ඔය මොකක්වත් ලැබෙන්නෙ නැහැ. එම නිසා තමයි අප මේ ප්‍රයත්නය දරන්නෙ. එතුමන්ලා ආණ්ඩු කරන කාලයේ, ඔය තරම් කිරියෙන් පැණියෙන් උතුරා ගිය, ඔය තරම් මහේශාක්‍යකමින් ආණ්ඩු කළ, දුප්පතා නැගිටුවන්න උත්සාහ කළ, දුප්පතාට තැන දුන් සිංහල සංස්කෘතිය, සභ්‍යත්වය ආගම දියුණු කළ කාලයේ උදලු නැති නිසා —අපේ නිකවැරටියෙ මන්ත්‍රීතුමා කථා කරනවා මා අසාගෙන සිටියා—අමුඩ ලේන්සුව නැති නිසා විරුද්ධ පක්ෂයෙ ගරු නායකතුමිය ආසනයට ගිය අවස්ථාවෙ උදළු කර තබාගෙන අමුඩ පෙළපාලියක් ගිය බව තමුන්නාන්සේලා දන්නවා ඇති. මා හිතන්නෙ එතුමිය කීවා, ඒ ගරු මන්ත්‍රීතුමාගෙ අමුඩය ගළවනවාය කියා. ඔය තරම් රට දීප්තිමත් කළා නම්. ඔය කියන විධියට වර්ධනය කළා නම්, ඒ අන්දමට එතුමා පෙළපාලි ගියේ ඇයි? එදා උදල්ලක් රුපියල් 25 කටවත් ගන්න තිබුණෙ නැහැ. අද තත්ත්වය ඔය කියන තරම් උග්‍ර නම්, අද උදළු ලබාගන්න නැති නම්, අද අමුඩ ලේන්සු නැති නම් නිකවැරටියෙ ගරු මන්ත්‍රීතුමාගෙන් මා ඉල්ලා සිටිනවා, අමුඩෙ නැතුව පෙළපාලි යන්නටය කියා. ඇයි? තත්ත්වය ඒ තරම් භයානකයි. ගරු ඩඩ්ලි සේනානායක අගමැතිතුමා නිසා, මේ මේ දේවල් නැති නිසා, අමුඩෙත් නැතුව පෙළපාලි යන ලෙස මා ඉල්ලා සිටිනවා. තත්ත්වය උග්‍ර වෙන්න වෙන්න ක්‍රියාවත් උග්‍ර වෙනවා.

එදා ටයර් එකක් ලබාගන්න පරණ ටයරය කරේ දමාගෙන යන්න සිද්ධ වුණා. ටෝර්ච් බැටරි කෑල්ලක් ගන්න පරණ බැටරිය ගෙන යන්න සිද්ධ වුණා. රෙදි ලබාගන්න කොයි තරම් දුකක් විඳින්න සිදු වුණාද ? අපේ ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාත්, කර්මාන්ත ඇමතිතුමාත් රටට අවශ්‍ය දේවල් ඉක්මණින් නිපදවන්න බොහොම වෙහෙසෙනවා. අපේ රට දැන් රෙදිවලින් ස්වයංපෝෂිතයි ; ඕනෑ තරම් රෙදි තිබෙනවා.

හාල් පොත්වලට, මිරිස් ටික, ලූනු ටික, උම්බලකඩ ටික දෙනවා. ඔව්, ඒක අපි පිළිගන්නවා. එහෙම දෙන්නෙ ඇයි ? එහෙම දෙන්නෙ, ද්‍රව්‍ය ගෙන්වීමේ බලපත්‍ර ලබාගත් ලොකු වෙළඳුන්—මොන විධියෙන් බලපත්‍ර ලබාගත්තාද කියන්න මා දන්නෙ නැහැ, ඒ ගැන මා කාටවත් චෝදනා කරන්නෙ නැහැ—බඩු හංගන නිසා, අඩු වශයෙන් මිරිස් කරලක්වත් ගම්බද උදවියට ලැබෙන්න ඕන නිසා, මෙවැනි පියවරක් ගන්න සිදු වී තිබෙනවා. මේ ද්‍රව්‍ය අපේ රටේ නිපදවන විට, හාල් ඇති තරම් මේ රටේ නිපදවන විට, අනිකුත් ද්‍රව්‍ය නිපදවන විට, ඔය කියන ප්‍රශ්න සියල්ලක්ම විසඳෙයි. එදාට මහජනතාවට වැටහේවි, සුදු පාට කියන්නෙ සුදු පාටටද නැතුව කළු පාටටද කියන එක. කළු කියන්නේ මොන පාටටද, බොරු කියන්නේ කවුද, මහජනයා මුළා කරන්නේ කවුද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා අද මේ රටේ මහජනතාව හොඳින්ම දන්නවා. නියම අත්තිවාරමක් —පදනමක්—උඩ, මේ රට දියුණු කිරීමට වැඩ කළේ කවුද කියා 1970 වන විට ඔප්පු වේවි.

විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් හාල් සේරුවක් කැපීම ගැන බොහොම ලොකුවට කෑ ගහනවා. අද ඔවුන්ට තිබෙන ලොකුම තුරුම්පුව, හාල් සේරුවක් කැපීමයි. හැබැයි, ඒ අය කියන්නේ නැහැ, එක සේරුවක් නොමිළයේ දෙනවාය කියා. ඒකයි, ඔවුන්ගේ ඇති චපලකම. හාල් සේරුවක් කැපූ බව කියන වේදිකාවේදීම කියන්නට ඕනෑ, මේ ආණ්ඩුව එක හාල් සේරුවක් නොමිළයේ දෙනවාය කියාත්. ඒක නම් කියන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ඒක කවුරුනුත් දන්නවා.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
එහෙම නම්, හාල් සේරුවක් කැපූ බවත් කවුරුනුත් දන්නවා. ඇයි, සේරුවක් නිකම් දෙන බවත් කියන්නට බැරි?

අඩු පඩි ලබන අයගේ මාසික පඩිය මේ අයවැය ලේඛනය මගින් රුපියල් 20 කින් වැඩි කර තිබෙනවා. ඒකත් හොඳ නැද්ද? මාතර ගරු මන්ත්‍රීතුමාත් (තුඩාවෙ මයා.) බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමාත් (මංගල මුණසිංහ මයා.) කීවා, එයත් නිකම් බොරු වක්ලු. සුළු පඩි ලබන සේවකයන්ගේ පඩිය වැඩි කළේ නැද්ද? බළලා ඉටියෙන් වුණත්, මැටියෙන් වුණත් කමක් නැහැ, මීයන් අල්ලනවා නම්, එහෙම නම් මේ අය වැය ලේඛනය මගින් අඩු පඩි ලබන අයගේ මාසික වැටුප රුපියල් 20 කින් වැඩි කර නැහැ? ඒක බොරුවක්? තමුන්නාන්සේලා කියන්නේ, කපන්නද?

තමුන්නාන්සේලා රජයේ සේවකයන්ට මොනවද දුන්නේ? රු. 17.50 දුන්නේ, දිවංගත බණ්ඩාරනායක මැතිතුමායි. එතුමාගෙන් පස්සේ මොනවාද දුන්නේ? එතුමාගෙන් පස්සේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුවලින් මහජනයාට—රජයේ සේවකයාට—කිසිම සෙතක් කර නැහැ. තමුන්නාන්සේලා කරන්නේ, ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකුගේ—බණ්ඩාරනායක මැතිතුමාගේ—නම විකුණ විකුණා පරණ රෙකෝඩ් එකම ගසමින්, ගම්බද ජනතාව මුළා කර මේ රටේ බලය තහවුරු කර ගන්නට මාන බැලීමයි.

බණ්ඩාරනායක මැතිතුමා අනුගමනය කළේ, දක්ෂිණාංශික මෙන්ම වාමාංශික අන්තවාදයත් අත්හැර, බුදු රජාණන් වහන්සේගේ මධ්‍යම ප්‍රතිපදාව අනුව ගොඩ නගන ලද ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ප්‍රතිපත්තියක්. එහෙම නම්, එතුමාගේ අඩිපාරේ ගමන් කරනවායැයි කියන තමුන්නාන්සේලා අද වාමාංශික දේශපාලඥයන්ට හේත්තු වී ගෙන යන්නේ බණ්ඩාරනායක ප්‍රතිපත්තිද? තමුන්නාන්සේලාගේ නායකයාට ගරු කරන්නේ ඔහොමද? කුරුණෑගල සම්මේලනයේදීත් කැලණි සම්මේලනයේදීත් දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා ප්‍රකාශ කළේ මොනවාද? මාත්, බණ්ඩාරනායක මැතිතුමා සමග ඒ පක්ෂය පිහිටුවීමට අත්තිවාරම් දැමූ කෙනෙක්. එතුමාගේ ප්‍රතිපත්ති අනුගමනය කරනවායැයි කියන තමුන්නාන්සේලා කොහොමද, සමසමාජ හා කොමියුනිස්ට්කාරයන් සමග පැහී එකට කටයුතු කරන්නේ? බණ්ඩාරනායක මැතිතුමාගේ මූලික දේශපාලන ධර්මය මධ්‍යම ප්‍රතිපදාව නම්, වාමාංශිකයන් සමග එකතු වී එතුමාගේ නම විකුණමින් තමුන්නාන්සේලා කටයුතු කරන්නේ ඇයි?

බලය අල්ලා ගන්ට ඕනෑ වුණාම, දේශද්‍රෝහීන්ට ඕනෑම දෙයක් කියන්නට පුළුවන්. තමුන්නාන්සේලා බැටළු හම් පොරවා ගත් වෘකයන් බව කියන්නට මා කැමතියි. බොරුවට බැටළු හම් පොරවා ගෙන රට ගිල ගන්නට එනවා. රටේ නිදහස නැති කරන්නට එනවා. මහජන මතය පාගා දමන්නට උත්සාහ කරනවා. අපේ රටේ මිනිසුන්ට වුවමනා කරන්නේ, ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක්. මිනිසා විසින් මිනිසාට සේවය කරණ ආණ්ඩුවකටයි, ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක්ය කියන්නේ. තමුන්නාන්සේලා උත්සාහ කරන්නේ, ඇදහීමේ නිදහස, කථා කිරීමේ නිදහස, ලිවීමේ නිදහස යන සියලුම නිදහස් නැති කර ඒකාධිපති ආණ්ඩුවක් මේ රටේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න]

පිහිටුවීමටයි. තමුන්නාන්සේලාගේ ක්‍රියා කලාපයෙන් ඒ බව දෘශ්‍යමාන වන බව කියන්නට කැමතියි.

මේ ආණ්ඩුව සාමාන්‍ය මිනිහාට, දුප්පත් මිනිහාට උදව් කර තිබෙනවාය කීම බොරුවක් ද? තමුන්නාන්සේලා ඒ අයට අපට වඩා උදව් කර තිබෙනවා නම් තව කමක් නැහැ. එහෙම උදව්වක් කරලත් නැහැ. මහජනයාට ආදරයක් දක්වන, නියම කැක්කුමක් ඇති—හැබැයි, බොරුවට—මේ ඊනියා දේශ ප්‍රේමීන් 1948 සිට මේ දක්වා වැඩ වර්ජන කීයක් ඇති කර මේ රටේ ඉදිරි ගමන කඩාකප්පල් කර තිබෙනවාද? වැඩ වර්ජන 3,503 ක් කර තිබෙනවා. මේවා කළේ වාමාංශික දේශපාලනඥයිනුයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහෝදර මන්ත්‍රීවරුන්ගෙන් මා ප්‍රශ්නයක් අහනවා. ඔය වාමාංශික නායකයින් බණ්ඩාරනායක මැතිතුමාට ආණ්ඩුව ගෙන යන්නට දුන්නාද? විරුද්ධ පක්ෂයේ නායකතුමියට, බණ්ඩාරනායක මැතිණියට ආණ්ඩුව ගෙන යන්නට දුන්නාද? නැව්වල බඩු කුණු කර මුහුදට දමන්නට පුළුවන් තරම් කටයුතු කළා. වැඩ වර්ජන දහස් ගණනක් ඇති කළා. කාටද ඒවා බලපෑවෙ? මේ රටේ දරුවන්ට නොවේද? බඩගින්නේ සිටින දුප්පත් දරුවන්ට නොවේද? ඒ ගැහුවෙ මේ රටේ ජනතාවට නොවේද? ඩඩ්ලි සේනානායක මැතිතුමාටවත් මේ සිටින මන්ත්‍රීවරුන්ටවත් නොවෙයි ඒ ගැහුවේ. මේ බල ලෝභීන්ගේ තවත් උපක්‍රමයක් තමයි දුප්පත් මහජනතාව ඉදිරියට දමා කෝලාහලයක් ඇති වන විට දනිස් වෙව්ල වෙව්ලා මේ පාර්ලිමේන්තුවට ඇවිත් බංකු අස්සෙ සැඟවීම. එවැනි චපලයින් දුප්පත් කම්කරු ජනතාව් ඉදිරියට දමන එකයි සංවේගය. වැඩ වර්ජන 3,503 ක් කළා. ඒ වැඩ වර්ජන නිසා අපේ රටට නැතිවූ වැඩ කරන දින ගණන කීයද? නැතිවූ වැඩ කරන දින ගණන 1 කෝටි 1 ලක්ෂයටත් වැඩියි. මේ අයගේ මහජන හිතෛෂිභාවය, රටට තිබෙන ආදරය පෙනෙනවා නේද? ලුනු නැවක් ආවාම එය හැකි තරම් ඉක්මණින් බාන්නට කටයුතු නොකර කුණු කර මුහුදට දමන්නට සිදුවන සේ කටයුතු කළේ අපේ ජනතාවට තිබෙන ආදරය නිසාද? දරුවන් කිරි පිටි නැතිව අඩන විට පිටි නැවක් ආවාම ඒක බාන්නට කියන්නෙ නැතිව බාන්නට එපා එපා කිව්වෙ දරුවන්ට තිබෙන ආදරය නිසාද? ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගැන පිරිසිදු ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගැන, මා කණගාටු වෙනවා.

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிரிசேன)*
(Mr. Hemachandra Sirisena)
ඒක කොහේද තියෙන්නෙ?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
ඒක දැන් නැහැ. ඒක නැති බව පෙනෙනව මගේ කථාවෙන්. එවැනි දේවල් කළ වාමාංශික දේශපාලනඥයින් අද කෑගහනව් අපි තමයි දේශ ප්‍රේමීන්, අපි තමයි තමුන්නාන්සේලා නැගිටුවන මිනිසුන්ය කියා. මේ රටට යහපතක් කරන්නෙ අපි තමයි කියනව. පෙළපාළි ගිහින් කඩ ටික කඩන එක තමයි මේ අයගෙ ජාති මමත්වය. ගල් ගහන එක, ගිනි තියන එක. හූ කියන එක, කෝච්චි පෙරළන එක තමයි ජාතිමමත්වය. කාටද කෝච්චිය අයිති? කෝච්චිය අයිති මහජනතාවටයි. කෝච්චිය මේ අගමැතිතුමාගේ පෞද්ගලික වස්තුවක් නොවෙයි. බස් අයිති කාටද? ඒත් මහජනතාවටයි. මේවා මුළු ලංකාවේම ජනතාවගේ ජාතික වස්තුවයි. මේ පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ තිබෙන ඇනයක් ගැලෙව්වොත් කාටද? පාඩු? මුළු ලංකාවේම ජනතාවටයි. තමුන්නාන්සේලාගේවත් මගේවත් පෞද්ගලික වස්තුවක් නොවෙයි, මේක. එසේ නම් මහජනතාවට පහර විදින දේවල් කරන්නත් මහජන හිතෛෂීන්ද නැත්නම් මහජන ද්‍රෝහීන්ද කියා මා ප්‍රශ්න කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට වඩා මා කථා කරන්නට අදහස් කරන්නේ නැහැ. තවත් පාරවල් දෙන්නට නම් පුළුවනි. එහෙත් මා මගේ කථාව අවසාන කරන්නටයි සූදානම් වෙන්නෙ. මා ඉදිරිපත් කළ කරුණුවලට පුළුවන් නම් කෙළින්ම උත්තර දෙන්න. නිකම් පඳුරවටේ කැරකෙන්න එපා. පුළුවන් නම් මා ප්‍රකාශ කළ අන්දමට කොලොන්නාවේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු මන්ත්‍රීතුමා, දොම්පේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ අයවැය ලේඛනවල එහෙම කියා නැත කියා පෙන්වන්න.

යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මුදල් ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේදී ඕවා කිව්වේ නැහැ; ඒ වාගේම ඒ කාලයේ මේ වාගේ වැඩ වර්ජන තිබුණේත් නැහැයි කියන්න.

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிரிசேன)*
(Mr. Hemachandra Sirisena)

ගරු අමැතිතුමා ඒ කාලයේ එක්සත් ජාතික පක්ෂයට දෙහි කපාපු හැටි මතක නැද්ද?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

මොකද මට ඒවා මතක නැත්තේ? මට ඒවා ඔක්කොම බොහොම හොඳට මතක තියෙනවා. මාත් පිළිගන්නවා ඒ කාලයේ මා මොන මොන දේ කථා කර තිබෙනවාදැයි මට මතක තිබෙන බව. ඊයේ—පෙරේදා පස්සෙන් ආ උදවිය කොහොමද දන්නේ ඒ කාලේ මා කී දේවල් මොනවාද, මා එසේ කීවේ මොන මොන වටපිටාවක් යටතේද යනාදි කරුණු? පස්සෙන් ඇවිත් ලෙව කාපු මිනිසුන් කොහොමද ඒ කාලේ කරපු නොකරපු දේවල් ගැන කියන්නට දන්නේ? අපි හොඳට නැගිටලා ඇවිදින කාලේ තමුන්නාන්සේලා මුණින් පෙර ළෙනවා. ඊයේ පෙරේදා ඉපදිලා ඇවිත් කොහේදෝ ඉඳලා දැන් මහ කෙරුම්කාර සිත් වාගේ ඉස්සර කාලේ කළ නොකළ දේවල් අවුස්සන්නට හදනවා. හොඳයි, කියනවා පුළුවන් නම් බලන්නට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයය කියන්නේ කවදා, කවුරු, කොහේදී, කොහොම ඇති කළ එකකටද කියලා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

අපි දන්නෙ නැහැ කියලද ඔය කියන්නේ?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා ගැන නොවෙයි මා කිව්වේ. එතුමා ඔය හැම දෙයක් ගැනම දැනගෙන සිටිය යුතුයි. අප සමග මුල ඉඳලාම එකට වැඩ කළ කෙනෙක් එතුමා. තමුන්නාන්සෙත් මාත් මුල ඉඳලාම ඔය වැඩ කටයුතු කරගෙන ආවා. හුඟක් පනුවෙලා ඇවිත් ලෙවකාපු මිනිසුන් ඕනෑ නැති දේවල් මතු කරනකොට මේවා නොකියා ඉන්නට බැහැ. ඒ නිසා දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා ගැන කියන්නට දෙයක් නැහැ. එතුමා හරියටම ඒවා දන්නව ඇති. එතුමා අප සමග නිතරම එකට එකතු වෙලා වැඩ කළා. ඒ වුණත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇති වුණු ආකාරය ගැනත් එහි මූලික දේවල් ගැනත් කිසිවක් නොදැන කොහේදෝ මුල්ලකට වෙලා ඉඳල වාසි පැත්ත කෝකද කිය කියා බල බලා ඉඳල ඒ පැත්තට පැනලා ඇවිත් ආසනයක් දිනාගෙන මෙතනට ඇවිත් පුපුරු ගහනවා. එහෙම උදවියයි මේවා කථා කරන්නේ. ප්‍රතිපත්ති ගැන කල්පනාවක් නැතිව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් හෝ එක්සත් ජාතික පක්ෂයෙන් හෝ මොන පක්ෂයකින් හෝ ආසනයක් දිනා ගන්නට උත්සාහ කළ උදවිය එහා පැත්තේ දැන් ඉන්නවා. යූ. එන්. පී. එකෙනුත් ඡන්දය ඉල්ලාගෙන ඇවිත් නොලැබුණු මහත්වරුනුත් ඔය පැත්තේ දැන් මන්ත්‍රීවරුන් හැටියට ඉන්නවා. එහෙම ඉල්ලන්නට ගිය පුද්ගලයින් එහා පැත්තේ ඉන්නවා. ඕනෑ නම් මම නම් පවා කියන්නම්. ඔහොම ඉඳගෙන ඉන්නෙ නැතිව නිකම් චෝදනා නැඟීමෙන් වැඩක් නැහැ. මා ඉදිරිපත් කළ තර්කවලට පුළුවන් නම් උත්තර දෙන ලෙසයි මා කියන්නේ. කලින් ඉදිරිපත් කළ අයවැය ලේඛනයෙන් මා යම් තර්කයක් ඔප්පු කරන්නට උත්සාහ කළා. පුළුවන් නම් මා කී දේ බොරු හැටියට ඔප්පු කරන් නැයි මා කියනවා. එහෙම නොකර නිකම් පහර ගහන්නන් වාලේ පහර ගැහැව්වට හරි යන්නේ නැහැ. ඒ නිසා පුළුවන් නම් කරුණු ඔප්පු කරන ලෙස මා ගෞරව යෙන් ඉල්ලනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තේ මිළ ගැන හපුතලේ ගරු මන්ත්‍රීතුමා (ආරියදාස මයා.) කියා සිටියා. එතුමා හොඳ තේ වතුකාරයෙක්. තේ මිළ පහළ බැසගෙන ආ පිළිවෙළ අයවැය කථාව කින්ම පෙන්වා දෙන්නට මට පුළුවන් වුණා. තේ මිළ එදා සිට අද වනතුරුම ක්‍රමයෙන් බැහැගෙන යනවා. ඒ ගැන අපට පමණක් දොස් කියන්නට පුළුවන් කමක් නැහැ. ඒ කාලයේ බලයේ සිටි උදවියට පවා ඊට නිසි පිළියමක් යොදන්නට පුළුවන් වුණාද ? ඒ අය නිසි පිළියමක් කළා නම් ඒ ගැනත් කියන්න. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ අයවැය ලේඛනය මා ඉදිරිපත් කළාම එහි තිබෙන දේවල් වැරදි නම් ඒවා පෙන්වා දිය යුතුයි. මා ඉදිරිපත් කළේ සත්‍ය කරුණු පමණයි. කවදාවත් ලෝකයේ සත්‍යය වහන්නට කාටවත් බැහැ. ඒක කරන්නට කාටවත් පුළුවන්කමක් නැහැ. සත්‍යය, අසත්‍යය හැටියට පෙන්වන්නට කොතෙක් උත්සාහ කළත් කවදා නමුත් සත්‍යය සත්‍යය හැටියට මිනිසුන්ට අවබෝධ වෙනවා වෙනවාමයි. සත්‍යයට හැමදාම ලෝකයේ ඉඩක් තිබෙනවා. සත්‍යය අසත්‍යය හැටියට පෙන්වා වැඩි කාලයක් ලෝකයා මුළා කරන්නට කවදාවත් බැහැ. ඒක යථා කාලයේ රටට අවබෝධ වෙනවා. එදාට මා ජීවතුන් අතර සිටියත් නොසිටියත් රටවාසීන් සිටිනවා ඇති. ඒ නිසා අපේ මූලික අයිතිවාසිකම වූ ප්‍රජාතන්ත්‍රවාදය රැකගෙන මේ රටේ ආර්ථික නිදහසත් ආරක්ෂා කරගෙන ලෝකයේ කිසිම රටක වහලුන් බවට පත් නොවී ජීවත්වීමේ මාර්ගය අප විසින් අපේ ජනතාවට පෙන්වා දිය යුතුයි. මේ ආණ්ඩුව උත්සාහ කරන්නේ ඒ උත්තරීතර කාර්යය සාර්ථක ලෙස කරගෙන යාමටයි. එය සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමින් තමුන්නාන්සේට ස්තුති කරමින් මගේ වචන සවල්පය අවසන් කරනවා.

අ. භා. 6.13

**බී. එච්. බණ්ඩාර මයා.** (බදුල්ල)
*(திரு. பி. எச். பண்டார—பதுளை)*
(Mr. B. H. Bandara—Badulla)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු සමාජසේවා ඇමතිතුමාගේ කථාවෙන් පසු මගේ කථාව කරන්නට මට ඉඩ ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. මගෙ අවාසනාවකට හෝ වාසනාවකට හෝ කවදත් පාහේ මට කථා කරන්නට අවස්ථාව ලැබෙන්නේ සමාජසේවා කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා කථා කිරීමෙන් පසු බව මට පෙනී යනවා. කාලයක් තිස්සේ එකට වැඩ කරගෙන ආ එතුමාත් මාත් මිත්‍රයින් නිසා එතුමා නිර්දය ලෙස විවේචනය කරන්නට මා කොහෙත්ම කැමති නැහැ. එහෙත් එතුමා කළ කථාවේ අඩංගු කරුණු ගැන කල්පනා කර බලනවිට යමක් නොකියා සිටින්නට බැහැ. ඒ ගැන එතුමා මා සමග පෞද්ගලික වශයෙන් අමනාප නොවනු ඇතැයි මා අපේක්ෂා කරනවා.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

බොහොම සන්තෝෂයි, කියන්නට තිබෙන දෙයක් කියන්න.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

ගරු ඇමතිතුමාගේ කථාවට සවන් දෙද්දී මට අපේ වැදගත් පොතක එන කවියකින් පද දෙකක් මතක් වුණා.

"ලිප ගිනි මොළවන තෙක් දිය සැළියේ
සැපයක් යැයි කකුළුව දිය කෙළියේ"

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

හංසයාටත් අවසාන කාලයේ සින්දුවක් කියන්නට මතක් වෙනවලු.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

කකුළුවා දිය රත් වන තුරු ජලයේ ක්‍රීඩා කරනවාලු. ගරු සමාජසේවා ඇමතිතුමාටත් රත්වේගන එනවා. දැන් නම් එතුමා තාවකාලික සැපයක් විඳින බව අප දන්නවා. නුදුරු අනාගතයේදීම අශෝකාගේ ශෝකජනක අවස්ථාව අපට දකින්නට ලැබෙයි. ගරු සභාපතිතුමනි, ගරු සමාජසේවා ඇමතිතුමා නිතරම ප්‍රශ්න කළා, කටින්ද කථා කරන්නේ, වෙන මොකකින්වත්ද කියා. මාත් ඒ ප්‍රශ්නයම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමාජ සේවා ඇමතිතුමාගෙන් අහනවා. කටින්ද කථා කරන්නේ, වෙන මොකකින් වත්ද? එතුමාගේම වචන වලින් මම උත්තර දෙන්නම්. වමාරා කන්නේ කව්ද කියා සමාජ සේවා ඇමතිතුමාට ඒවයින් හොඳට පෙනෙයි. බණ්ඩාරනායක අගමැතිතුමා නම් හොඳයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හොඳ නැත කියා එතුමා කියනවා. ඒකට පිළිතුරක් එතුමාම දී තිබෙනවා. බණ්ඩාරනායක නම නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ට තැනක් ලැබී තිබෙනවාය කියා එදා එක්සත් ජාතික පක්ෂය කළ චෝදනාවකට එතුමාම පිළිතුරු දී තිබෙනවා, රඹුක්කන මන්ත්‍රීතුමා හැටියට. 1962 රාජාසන කථා විවාදයේදී එතුමා කී දේ හැන්සාඩ් වාර්තාවේ 47 වැනි කාණ්ඩයේ 338 වැනි තීරුවෙන් මම කියවන්නම්:

"අපි නිතරම අදින්නේ දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ නාමයය කියා එතුමන්ලා අපට කියනවා. මේ පක්ෂයේ කර්තෘවරයා මේ පක්ෂය පිහිටුවන්ට යම්කිසි ව්‍යවස්ථාවක් පැනෙව්වා නම්, ඒ වගේම මේ පක්ෂය අනුගමනය කරන යම් කිසි ප්‍රතිපත්තියක් තිබෙනවා නම් ඒ පිළිබඳව ගෞරවය හිමි වන්නේ දිවංගත අගමැතිතුමාට බව තමුන්නාන්සේලා පිළිගන්නවා ඇති, ඒ නිසා එතුමාගේ නාමය මුල් කර සෑම පියවරක්ම ගන්නා බව මතක් කරන්ට කැමතියි."

තමුන්නාන්සේම පිළිතුරු දීලා තියෙනවා. තමුන්නාන්සේත් බෞද්ධාගම්කාරයෙක්. තමුන්නාන්සේගේ කථාව හරියට බුදු හාමුදුරුවො නම් හොඳයි, බුද්ධ ධර්මය නම් හොඳ නැහැ කියනවා වගෙයි. ආගම් කර්තෘවරයකු හැටියට බුදු රජාණන් වහන්සේ යම් කිසි ධර්මයක් දේශනා කළා නම් යම් කිසි කොටසක් ඒ ධර්මය අනුගමනය කරනවා නම්, බුදු රජාණන් වහන්සේ නම් හොඳය එහෙත් මේ අය අදහන ධර්මය නම් හොඳ නැත කීම විහිළුවක්. තමුන්නාන්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හොඳ නැත කීමත් ඒ විධියේ දෙයක්.

තමුන්නාන්සේ අද සමාජ සේවා ඇමතිවරයා හැටියට ඔතැන ඉන්නේ බණ්ඩාරනායක අගමැතිතුමා නිසයි. මූල මතක නැති වෙලාය කියා තමුන්නාන්සේ කියනවා. ඒ වචන හොඳටම ගැළපෙන්නේ තමුන්නාන්සේටයි. 1956 මැතිවරණයේදී මහජන ඡන්දයෙන් එන්නට තමුන්නාන්සේට පුළුවන්කමක් තිබුනේ නැහැ. ගරු බණ්ඩාරනායක අගමැතිතුමා අශෝක කරුණාරත්න නමැති පුද්ගලයාව—පළමු වරට සිංහලයකුව—පත් කළ මන්ත්‍රීවරයකු හැටියට පත් කළා. ඒ නිසයි, තමුන්නාන්සේට අද ඔය තැන ලැබී තිබෙන්නේ. තමුන්නාන්සේට මූල මතක නැත කීවේ ඒ නිසයි. එදා තමුන්නාන්සේව පත් කළ මන්ත්‍රීවරයකු හැටියට පත් කළ නිසයි, අශෝකා කරුණාරත්න නමැති පුද්ගලයෙකු මේ රටේ ඉන්නවාය කියා රට දැන ගත්තේ. එදා පත් කළ මන්ත්‍රීවරයකු හැටියට ආ නිසයි, පසුව මහජනයා හඳුනාගෙන මහජන ඡන්දයෙන් එන්නට තමුන්නාන්සේට පුළුවන් වුණේ. ඒ අවස්ථාව තමුන්නාන්සේට ලැබුණේ බණ්ඩාරනායක අගමැතිතුමා නිසයි. සමාජ සේවා ඇමතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අත්හැර ගියේ කුමක් නිසාද කියා අප දන්නවා. එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව අශෝක කරුණාරත්න මහතාට ඇමති ධුරයක් දුන්නා නම් ඔහු තවමත් ඒ පක්ෂයේමයි.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**

*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*

(The Hon. N. H. A. M. Karunaratne)

කරුණාකර ඒ ගැන විරුද්ධ පාර්ශ්වයේ නායකතුමියගෙන් අසන්න. මා එදා ඇමතිකමක් ඉල්ලූ බව එතුමිය කියනවා නම් මා ඉල්ලා අස්වන්නට සූදානම්.

**බී. එච්. බණ්ඩාර මයා.**

*(திரு. பி. எச். பண்டார)*

(Mr. B. H. Bandara)

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලංකා සම සමාජ පක්ෂයත් සමඟ එකතු වී සභාග ආණ්ඩුවක් පිහිටු වූ නිසා අස් වූ බව එතුමා කීවා. තත්ත්වය එසේ නම් එතුමාට අස්වන්නට තිබුණේ එදා සභාග ආණ්ඩුව පිහිටුවන විටයි. ඒ පක්ෂ දෙක එකතු කොට ආණ්ඩුවක් පිහිටුවනවාට විරුද්ධ බව කියා අස් වුණා නම් ඒක වෙනම ප්‍රශ්නයක්. එහෙත් සභාග රජයක් පිහිටුවා ටික කලක් ගියාට පසුව සී. පී. ද සිල්වා කල්ලියත් සමඟ එදා තිබුණු රජයට පිහියෙන් අනින්නට එතුමා ක්‍රියා කළා. එතුමා පැදුරටත් නොකියාම යන්නට ගියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. මා ගියේ සී. පී. ද සිල්වා ඇමතිතුමා යන්නට හය මාසයකට පෙරයි. [බාධා කිරීමක්]

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

දැන් කථා කරන්නේ මායි.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

On a point of order. He is making a false allegation.—[*Interruption*].

**කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy-Chairman of Committees)

Order please! What is your point of Order?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

He is making a false allegation against me. He says that I crossed over with the Hon. C. P. de Silva and others. I wish to remind him that I crossed over six months prior to the Hon. C. P. de Silva and others. I want to correct him.

**කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy-Chairman of Committees)

Yes. The Chair will accept that.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

සමාජ සේවා ඇමතිතුමාට ඕනෑ දෙයක් කියන්නට පුළුවනි. සිංහල භාෂාවට ලොකු ඇල්මක් තිබෙනවා යයි කියන එතුමාගේ ඒ ඇල්ම ඒ කථාවෙන්ම පෙනී යනවා. සමාජ සේවා ඇමතිතුමා කියන ඔය කථා භාර ගන්නට අප සූදානම් නැති වුණත් එතුමා එක් කාලයක් අපේ මිත්‍රයකු වශයෙන්ද සිටි නිසා මා ඒ ප්‍රකාශය ගැන නිහඬ වෙනවා. මේ රටට හුඟක් වැඩ කළා නම් 1965 මහා මැතිවරණයේදී පසුගිය රජය පරාජයට පත් වුණේ මන්දැයි එතුමා අපෙන් ප්‍රශ්න කළා. මම ඊට පිළිතුරු දෙන්නම්. එතුමා වැනි අය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටි නිසයි, එදා අප පැරදුණේ. මේ වගේ පුද්ගලයන්ගෙන් ප්‍රවේශම් වන ලෙස මා එක්සත් ජාතික පක්ෂයටද මතක් කරන්නට කැමතියි [බාධා කිරීමක්].

**කාරකසභා නියෝජ්‍ය සභාපති තුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy-Chairman of Committees)

බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා මා දෙසට හැරී කථා කරනවා නම් ඔය විධියට කරදර ඇති වන්නේ නැහැ.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

ඔව්, අනෙක් පැත්ත බලනවාට වඩා ඔය පැත්ත බැලීමට මා කැමතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය අවුරුදු නවය තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කළේ මොනවාදැයි සමාජ සේවා ඇමතිතුමා අපෙන් ප්‍රශ්න කළා. එතුමාගේ වචන වලින්ම මම ඒ ප්‍රශ්නයට උත්තර දෙන්නම්. එතුමා අපත් සමඟ සිටින කාලයේදී එක්සත් ජාතික පක්ෂයට සැහෙන පිළිතුරු දුන්නා. [බාධා කිරීමක්] 1962 ජූලි මස 18 වන දින **හැන්සාඩ්** වාර්තාවේ මේ විධියට සඳහන් වී තිබෙනවා:

"………1815න් පසු මේ ආණ්ඩුව බලයට පත් වන තුරු—

මෙහි මේ ආණ්ඩුව යයි සඳහන් කර තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවටයි.

—බෞද්ධ ආගමට මේ රටේ තැනක් තිබුණේ නැහැ. අනික් ආගම් ආරක්ෂා කරන අතර බෞද්ධ ආගමට තැනක් දුන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බව මා නිර්භයව කියනවා. මා එය ඔප්පු කරන්නේ මොන සාධකවලින්ද? අනුරාධපුරය ශුද්ධ නගරයක් කෙළේ මේ ආණ්ඩුවයි. අත්තනගල්ල, පොලොන්නරුව, සේරුවාවිල, කැලණිය යන ස්ථාන ශුද්ධ නගර කිරීමට මාර්ග සැලසීම බෞද්ධාගමට තැන දීමක් නොවේද? ඒ සමඟම බෞද්ධ සංස්කෘතිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නඟා සිටෙව්වේ කොහොමද? විද්‍යෝදය හා විද්‍යාලංකාර යන පිරිවෙන් විශ්ව විද්‍යාල කිරීමෙන් බෞද්ධ සංස්කෘතිය මේ රටේ නඟා සිටෙව්වා. ජනතාවට හිතවත්ව ජනතාව නඟා සිටුවීමේ අදහසින් කොයි විධියේ වැඩ පිළිවෙළක් අප ආරම්භ කළාද?

තවත් තැනක මෙසේ කියා තිබෙනවා:

.........තමුන්නාන්සේලා දන්නවා, මේ රටේ මෙතෙක් ජාතික අධ්‍යාපන ක්‍රමයක් නොතිබුණු බව. මේ රටේ ධනේශ්වර පංක්තියට පමණක් හොඳ අධ්‍යාපන ක්‍රමයකුයි, මෙතෙක් තිබුණේ. සාමාන්‍ය ගම්බද දුප්පත් දරුවන්ට උසස් තත්ත්වයකට පත් වන්නට පුළුවන් අන්දමේ අධ්‍යාපන ක්‍රමයක් මේ රටේ තිබුණා ද? මේ රජය විසින් සෑම පාසැලක්ම රජයට ගැනීමෙන් ජාතික අධ්‍යාපන ක්‍රමයක් ඇති කළ නිසා අද ගම්බද ගස් බඩගාන මිනිසකුගේ දරුවකුටත් කුරුඳුවත්තේ මහේශාක්‍ය පුද්ගලයකුගේ දරුවකුටත් ලැබෙන්නේ සම අධ්‍යාපනයක්. ඉතින් මේ ආණ්ඩුව කර තිබෙන්නේ ප්‍රගතිශීලි, සමාජවාදී කටයුතු නොවේද? එපමණක් ද? මෙපමණ කලක් අධිරාජ්‍යවාදීන්ට පෑගිලා ඒ අධිරාජ්‍යවාදීන්ගේම ප්‍රතිපත්ති හා සිරිත් විරිත් අනුගමනය කළා විනා, උන්ගේ භාෂාවම අනුගමනය කළා විනා, ජාතික සවරූපයක් අනුව, ජාතික හැඟීමක් ඇතිව, ජාති මමත්වයක් ඇතිව මේ රටේ යම්කිසි ක්‍රියා මාර්ගයක් ගෙන ගියාද? නමුත් මේ ආණ්ඩුව සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීමෙන්, උසාවිවල සිංහලයෙන් නඩු අසන්නට සැලැස්වීමෙන් ඇති කළේ සමාජවාදී වැඩ පිළිවෙළක්ය කියා තමුන්නාන්සේ පිළිගන්නේ නැද්ද?" [නිල වාර්තාව, 1962 ජූලි 18; කාණ්ඩය 47; තීරුව 340].

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
ඒක කළේ මමයි.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)
තවත් රාශියක් කියවන්නට තිබෙනවා. නිවාස ණය ගැනත් කියා තිබෙන්නේ මොකක්ද කියා කියවන්නම්.

"ප්‍රතිගාමී එක්සත් ජාතික පක්ෂය බලයට පත් වී සිටි කාලයේදී දුප්පත් මනුෂ්‍යයකුට නිවාස ණය වශයෙන් රුපියල් 1,000ක් වත් ලබා ගන්නට පුළුවන් වුණාද කියා මම අහන්නට කැමතියි."

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
අපි ආවාට පසුව දුන් 3,000 යි.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)
තවත් තැනක මෙන්න මෙහෙම කියනවා:

"ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුවට වඩා සමාජවාදී වැඩ පිළිවෙළක් තමන්ගේ පක්ෂය මේ රටේ පාලන බලය ඇතිව සිටි යුගයේදී ගෙන ගියා කියා එක්සත් ජාතික පක්ෂයට උදන් අනන්ට පුළුවන්කමක් නැහැ. අපේ ආණ්ඩුව විසිනුත්, එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩු පැවති කාලයේ ඒ ආණ්ඩු විසිනුත්, කරන ලද දේවල් සත්සත් දනය කර බැලුවොත් අධිරාජ්‍යවාදීන්ගෙන් මේ රට නිදහස් කර, ඒ බැම්මවලින් මේ රට මුදාගෙන, රටට වඩා හිතකර දේ කළේ කොයි පක්ෂයේ ආණ්ඩුව විසින්ද යන්න හොඳාකාරව පෙනී යනවා ඇති. ලංකාවට නිදහස අරන් දුන්නේ එක්සත් ජාතික පක්ෂය විසින්ය කියා තමුන්නාන්සේලා කියනවා ඇති. කොයි හැටි වුවත් අප රටට සම්පූර්ණ නිදහස ලබා දුන්නේ ශ්‍රීමත් බණ්ඩාරනායක අගමැතිතුමා බව මම නිර්භයව ප්‍රකාශ කරනවා." [නිල වාර්තාව, 1962 ජූලි 18; කාණ්ඩය 47; තීරුව, 344].

මේවා කියවනවා නම් එළිවන තුරුත් කියවන්නට තිබෙනවා. මා ඒ කළේ ගරු සමාජසේවා ඇමතිතුමාගේ වචනවලින්ම එතුමාට පිළිතුරු දීමයි. මේවායින් තත්ත්වය පැහැදිලි වන නිසා මීට වඩා ඒ ගැන කියන්නට මා අදහස් කරන්නේ නැහැ. වමාරා කන්නේ කවුද කියා මේවායින් හොඳහැටි පැහැදිලි වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් අය වැය ලේඛනය සම්බන්ධ විවාදයට සහභාගි වන්නටයි අදහස් කරන්නේ. මේ අයවැය ලේඛනය දෙස බලන විට මට කවි පද දෙකක් මතක් වෙනවා.

"උපන්නාට මේ ලොව වැනෙනවා විනා
ලොව සිරිතට අඹු දරු රකිනවා විනා"

මේ අයවැය ලේඛනයත් ඒ වගෙයි. ආණ්ඩුව තිබෙනවා; අවුරුදු ගෙවී යනවා; අයවැය ලේඛන ඉදිරිපත් කරනවා. අය වැය ලේඛනයක් ඉදිරිපත් කරන්නට ඕනෑ නිසා මෙය ඉදිරිපත් කර තිබෙනවා මිස මෙහි කිසිම හරයක් ඇත්තේ නැහැ. මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

අයවැය ලේඛනය දෙස බලන විට අර කවි පද දෙක මෙයට හොඳටම ගැලපෙනවා. ඉදිරිපත් කරන්නට ඕනෑ නිසා ඉදිරිපත් කරනවා මිස එහි කිසිම ගතයුත්තක් ඇත්තේ නැහැ. නොයෙක් නොයෙක් මන්ත්‍රීවරුන් නොයෙක් නොයෙක් වචන මේ අයවැය ලේඛනය සඳහා යෙදුවා. මේ අයවැය ලේඛනය ඇලිමැලි අයවැය ලේඛනයක් යයි කියන්නට මට පුළුවන්කම තිබෙනවා. මෙහි කිසිම ප්‍රාණවත්කමක් නැහැ. මුදල් ඇමතිතුමාගේවත්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේවත්, ඇමතිවරුන්ගේවත් කිසිම උද්යෝගයක් මේ අයවැය ලේඛනය ඉදිරිපත් කළ දවසේවත් දැන්වත් ඇත්තේ නැහැ. ආණ්ඩු පක්ෂය මෙයට දක්වන සැලකිල්ල කුමක්ද කියන එක මේ හිස් පුටු දෙස බලන විට පෙනී යනවා. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අයවැය ලේඛනය ප්‍රාණවත් එකක් නොවෙයි. රටේ ජනතාව අතරවත් කිසිම උද්යෝගයක් නැහැ. අවුරුද්දක් ගත වී අයවැය ලේඛනයක් ඉදිරිපත් කරන විට රටේ ජනතාව බලා සිටින්නේ තමන්ගේ ජීවන වියදම පහල බසියිද, බඩු මිල අඩුවෙයිද, ඇතිවන වෙනස්කම් මොනවාද කියා දැනගැනීමටයි. මෙම අයවැය ලේඛනය ඉදිරිපත් කරන්ට පෙර තමුන්නාන්සේලා කෙරෙහි විශාල බලාපොරොත්තුවක් රටේ ජනතාව තුළ පැවති නමුත් අයවැය යෝජනා ඉදිරිපත් කළායින් පසු ඔවුන්ගේ එම බලාපොරොත්තු සියල්ල සුන් වී ගොස් තිබෙන බව පෙනී ගියා. මෙය අපට හිස් අයවැය ලේඛනයක් වශයෙන් හඳුන්වා දෙන්නට පුළුවනි.

මෙම අයවැය ලේඛනය ඉදිරිපත් කළායින් පසු ගරු මුදල් ඇමතිතුමාගේ කතාවලිනුත්, නොයෙකුත් පත්‍ර මාර්ගයෙනුත් ලොකුවට පෙන්වා දෙන්නට උත්සාහ දරන්නේ රජයේ සේවකයන්ගේ පඩියට සුළු මුදලක් වැඩි කිරීම පිළිබඳවයි. රුපියල් සියයට අඩු මූලික වැටුපක් ලබන උදවියට රුපියල් 20 කිනුත් රුපියල් සියයත් තුන්සියයත් අතර මූලික වැටුපක් ලබන උදවියට රුපියල් 10කිනුත් මෙම දීමනාව සලසා තිබෙන බව පෙනෙනවා. ඒ හැරුණාම ගරු මුදල් ඇමතිතුමා දුම්කොළ බද්දත් වැඩි කර තිබෙන වග පෙනෙනවා. ඒ අනුව අද බාල වර්ගයේ සිගරට්වල මිල ශතය කින් වැඩි වී තිබෙනවා. රජයේ සේවකයන්ට මේ වැඩි කරන ලද මුදල් ප්‍රමාණය දෙස බලන විට එය සිගරට් සඳහා වැඩිපුර ගෙවන්නට සිදුවී තිබෙන මුදල කැපෙන්නටවත් මදි බව කිවයුතුව තිබෙනවා. එම එම නිසා දුම්කොළ බද්ද වැඩි කරන්නේවත් රුපියල් 10 කින් හෝ 20 කින් වේතනය වැඩි කරන්නේවත් නැතුව තිකම් සිටියා නම් අද තිබෙන තත්ත්වයට වඩා වෙනසක් ඇති වන්නේ නැහැ. එහෙයින් මේ මුදල වැඩි කිරීමෙන් රටේ ජනතාවට අළුත් සේවාවක් සිදු වුණායැයි අපට කොහෙත්ම පිළිගන්නට අමාරුයි. අද රටේ ජීවන වියදම නගින ආකාර අප හොඳින් දන්නවා. සාමාන්‍ය වශයෙන් රුපියල් 10ක් හෝ 20ක් වැඩි කිරීම නිසා ජීවන වියදම නැගීම පිළිබඳ ප්‍රශ්නය විසඳන්නට පුළුවන්කමක් ලැබේයැයි මා සිතන්නේ නැහැ. ඒ මුදල සිගරට් බොන්න තරම්වත් මදි. සිගරට් සඳහා වැඩිපුර ගෙවන්නට සිදු වී තිබෙන මුදල පියවා ගන්නවත් ඒ වැඩිකිරීමේ ප්‍රමාණය මදි. රජයේ සේවයෙහි යෙදී සිටින උදවියට මුහුණ පාන්නට සිදුවී තිබෙන නොයෙකුත් ප්‍රශ්න වෙනුවෙන් සටන් කරන්නට වෘත්තීය සමිති වැනි සංවිධාන තිබෙනවා.

කිසිම රක්ෂාවක් නැතුව කල්යවන කොටසක්ද මේ රටේ සිටින බව අප දන්නවා. මේ රටේ වැඩිදෙනා ඒ කොටසට ඇතුළත් වෙනවා. විශේෂයෙන් අපේ ගම්බද උදවිය ඒ තත්ත්වයට මුහුණ දී සිටිනවා. ඒ උදවියගේ ප්‍රශ්න පිළිබඳව තමුන්නාන්සේලා කිසිම සැලකිල්ලක් දක්වා නැහැ. රක්ෂාව කරන කෙනෙකුට රුපියල් 10ක් හෝ 20ක් වැඩි කර දෙන්න ගරු මුදල් ඇමතිතුමා ක්‍රියා කළාට මොකද කිසිම රැකියාවක් නැතුව සිටින උදවිය වෙනුවෙන් යමක් කරන්නට කල්පනා කර නැහැ. ඒ උදවිය වෙනුවෙන් කතා කරන්න වෘත්තීය සමිති වැනි දේත් නැහැ. එම නිසා ඒ උදවියගේ ප්‍රශ්න විසඳන්නට කිසිම වැඩ පිළිවෙළක් යෙදී නැති බව ප්‍රකාශ කරන්නට පුළුවනි. මෙලෙස ක්‍රියා කිරීමෙන් රැකීරක්ෂා නැති උදවියගේ ප්‍රශ්න විසඳන්නට පුළුවන් වෙනවාදැයි මා අහනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දුම්කොළ වවන ගොවීන් සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කතා කළයුතුව තිබෙනවා. සිගරට් දුම්කොළ රාත්තලකින් කොම්පැනිකාරයන් රුපියල් 35ක ලාබයක් ලබන අතර රජයට බදු වශයෙන් රුපියල් 33ක ලාබයක් ලැබෙන බව පෙනෙනවා. නමුත් දුම්කොළ වවන්නාට ලැබෙන්නේ රාත්තලකට රුපියල් 2.50 යි. ඒ තැනැත්තා දුම්කොළ වවන්නේ නැතිනම් කොම්පැනිකාරයාට දුම්කොළ රාත්තලකින් රුපියල් 35ක් වත් රජයට රුපියල් 33ක් වත් ලැබෙන්නේ නැහැ. එම නිසා මහන්සි වන පුද්ගලයාට කිසිම යහපතක් නොසැලසෙන බව මතක් කරන්නට ඕනෑ. සිගරට් මිල වැඩි කිරීමෙන්ද රජයට යම්කිසි ආදායමක් ලැබෙන නමුත් දුම්කොළ වවන ගොවීන්ට එවැනි යහපතක් සිදු වන්නේ නැහැ. එහි කිසිම සාධාරණත්වයක් නැහැ. ගොවියා දුම්කොළ වැව්වේ නැතිනම් අනික් උදවියට කවදාවත් ඒ මුදල් ලබා ගන්නට ලැබෙන්නේ නැහැ. සිගරට් මිල වැඩි වුණත් ගොවියා හිටපු තැනමයි. එම නිසා දුම්කොළ වවන්නාට නියම තත්ත්වයක් ලබා දීමට ක්‍රියා කරන ලෙස මා ඉල්ලා සිටිනවා. මෙම ප්‍රශ්නය පිළිබඳව විශේෂයෙන් සලකා බලන ලෙස මා නැවතත් මතක් කරනවා.

අපේ රජය පැවති කාලයේ තෙල් කොම්පැනි ජනසතු කිරීම නිසා අද කෝටි ගණනක ලාබයක් ලැබෙන බව අයවැය ලේඛනයෙහි පවා සඳහන් කර තිබෙනවා. එහෙයින් මා අළුත් යෝජනාවක් ඉදිරිපත් කරන්නට කැමතියි. ප්‍රජාතන්ත්‍රවාදය ඔස්සේ සමාජවාදය කරා ගමන් කරන බව කියන මෙම ආණ්ඩුවට මේ වැඩේ කරන්න පුළුවනි. මේ ආණ්ඩුවට පුළුවනි සිගරට් කොම්පැනි ජනසතු කරන්නට. තෙල් කොම්පැනි ජනසතු කිරීමෙන් කෝටි ගණනක් ලබා ගන්නට පසුගිය ආණ්ඩුවට පුළුවන් වුණාක් මෙන්ම සිගරට් කොම්පැනිත් ජනසතු කළොත් මේ ආණ්ඩුවටත් කෝටි ගණනක මුදලක් ලබා ගන්නට පුළුවන් වෙනවා. මේ රජය සෑම විටම ධනපති කොම්පැනිකාරයින්ගේ පැත්ත ගෙන ක්‍රියා කරන නිසා මගේ මේ යෝජනාව අනුව ක්‍රියා කරතැයි මා නම් අදහස් කරන්නේ නැහැ. එසේ වුවත් මේ කාරණය ගරු මුදල් ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන කරන ලෙස මා මතක් කරනවා.

මේ අයවැය ලේඛනයෙන් මහජනතාවට පෙන්නුම් කරන්නට බලාපොරොත්තු වන මූලික කරුණු දෙක, රජයේ සේවක යින්ට රුපියල් 10 කින් හා 20 කින් පඩි වැඩි කිරීමත් ආහාර වගාවන් දියුණු කිරීමට රජය ගෙන යන වැඩ පිළිවෙළත් බව මා මුලින් සඳහන් කළා. අපට වුවමනා කරන ආහාර ද්‍රව්‍ය මෙහිම වගා කර ගැනීමට රජය කිසියම් වැඩ පිළිවෙළක් ගෙන යනවා නම් ඊට සහයෝගය දෙන්නට මා—විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයකු වුවත්—සූදානම්. මොන ආණ්ඩුවක් බලයට ආවත් අපේ ආහාර වගා කර ගැනීම කළ යුතු දෙයක්. ඒ කටයුත්ත හරි හැටි අවංකව කෙරෙනවා නම් අපේ සම්පූර්ණ සහයෝගය දෙනවා. එහෙත් එය හරි හැටි කෙරෙන බවක් අපට පෙනෙන්නේ නැහැ. "කළාව දෝලාවෙන් ගමන පයින්" කීවාක් මෙන්, මේ රජයේ වගා වැඩ පිළිවෙළත් ප්‍රචාරයට පමණක් සීමා වී තිබෙන බවයි අපට පේන්නේ. ගුවන් විදුලියෙන් නම් හැමදාම උදේට වගාව කෙරෙනවා. එහෙත්, ආහාර ද්‍රව්‍ය වගා කිරීමේ වැඩ පිළිවෙළ පැහැදිලි ඉලක්කය කරා ගෙන යාමට නියම වැඩ පිළිවෙළක් තිබෙන බවක් අපට නම් පෙනෙන්නේ නැහැ.

කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජීප් රථ 98 ක් ගෙන්වීම සම්බන්ධවත් නිලධාරීන් දෙදෙනකු පත් කිරීම සම්බන්ධවත් අයවැය ලේඛනයෙහි කරුණු දක්වා තිබෙනවා. එපමණකින්ම ඒ වැඩ පිළිවෙළ සාර්ථක වේයයි බලාපොරොත්තු වෙනවා නම් එය හිස් බලාපොරොත්තුවක්. ජීප් රථ ගෙන්වීම ගැන නම් මෙහිදී නොයෙක් විධියේ අදහස් ඉදිරිපත් වුණා. ජීප් රථ මෙපමණ ගණනක් ගෙන්නෙව්වායයි කියමින් රජයත් බොහොම ලොකුවට පුරාජේරු දොඩනවා. ජීප් රථ ගෙන්වීම ගැන මා කියන්නේ මෙයයි: තමුන්නාන් සේලා මැතිවරණ කාලයේදී ධනපතියන්ට වූ පොරොන්දුවක්, ගොවිතැනේ නාමයෙන් ඉටු කර දීමට ගෙන යන ප්‍රෝඩාවක් මේ කර තිබෙන්නේ. ජීප් රථයක් ගෙන්වා ගන්නට පුළුවන් වන්නේ ඉඩම් අක්කර මෙපමණ ගණනක් තිබෙන කෙනකුට පමණක්ය කියා මේ රජය [illegible] සීමාවක් කර තිබෙනවා. අක්කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

3 ක් 4 ක් තිබෙන කෙනකුට ජීප් රථයක් ලබා ගන්නට බැහැ. අඩු ගණනේ අක්කර 30 ක් වත් තියෙන්නට ඕනෑ. ඒ නිසා මේ වැඩ පිළිවෙළෙන් ලොකු ඉඩම් හිමි අයට මිස ගම්බද ගොවීන්ට කිසිම සහන යක් ලැබෙන්නේ නැහැ. විශාල පොල් වතු රබර් වතු තේ වතු කුඹුරු තිබෙන අයට පමණයි ජීප් රථ ලැබෙන්නේ.

ඊළඟට ගොවි හමුදාව ගැනත් මා වචන යක් කියන්නට කැමතියි. මා හිතන හැටි යට නම් ඒකත් මැතිවරණ කාලයේදී වුණු පොරොන්දුවක් ඉෂ්ට කිරීමට ගෙන යන ප්‍රයෝගයක්. පසුගිය මැතිවරණ කාලයේදී මේ රජයේ උදවිය රට හැම තැනම යමින් තරුණයින්ට රක්ෂා දෙන්නට පොරොන්දු වුණා. දැන් ඒ පොරොන්දුව ඉෂ්ට කිරීමට ගොවි හමුදාවක් ඇති කොට කොළපාට තරුණයින් පමණක් ඒ හමු දාවට බඳවා ගන්නවා. මේ රජය එක් දෙයක් හිතේ තබාගෙන ඊට වෙනස් දෙයක් කියා ඊටත් වෙනස් දෙයක් කරන බව දැන් මේ වැඩවලින් පැහැදිලිවී තිබෙ නවා. තමන්ගේ පන්තියේ උදවියට අවශ්‍ය දේවල් ලබා දීම ගොවිතැනේ මුවාවෙන් කරගෙන යන බව පෙනෙනවා. ආහාර සංවර්ධනය සඳහා වැදගත් පියවරක් ගෙන තිබෙනව යයි අපට පිළිගන්න පුළුවන්කමක් නැහැ. ගොවිතැන් කරන පුද්ගලයන්ට මුහුණපාන්නට සිදුවී තිබෙන අවහිර මොනවාද, බාධක මොන වාද කියා සොයා බලා ඒවාට පිළියම් යෙදී මෙනුයි, මේ රටේ වගා සංවර්ධනයක් ඇති කර ගන්ට පුළුවන් වෙන්නෙ. අක්කර බද්ද, රක්ෂණ බද්ද ආදියෙන් ගොවියාට සිදුවී තිබෙන හිරිහැර ගැන මා අපේ පක්ෂයේ ආණ්ඩුව පැවති කාලයේදීත් නොයෙක් වර ප්‍රකාශ කර තිබෙනවා. කුඹුරු අක්කරයක් හිමි ගොවියා අවුරුද් දකට දෙවරක් යල-මහ වැඩ කරනවට අක්කර බද්ද වශයෙන් රුපියල් 12 කුත්, රක්ෂණ බද්ද වශයෙන් රුපියල් 12 කුත් යනුවෙන් රුපියල් 24 ක් ගෙවන්ට ඕනෑ. මේක ගොවීන්ට මහා හිරිහැරයක්. සාමාන්‍ය ගම්බද ගොවීන් අප ළඟට ඇවිත් කරන ප්‍රකාශවලින් පැහැදිලි වෙනව, ඔවුන් ට මේ නිසා විඳින්න සිදුවී තිබෙන හිරිහැර වල තරම. තමන්ගේම කම්බර වැඩ කළොත් අනුන්ගේ කුඹුරක් අඳයට වැඩ කළත්

ගොවීන් විසින් මේ අක්කර බද්ද හා රක්ෂණ බද්ද ගෙවන්න ඕනෑ. මේ බදු නොගෙව්වොත් ගොවි කාරක සභාව විසින් උසාවිවල නඩු පවරනවා. තමන් අඳයට වැඩ කළ කුඹුරු වල බදු ගෙව්වෙ නැත කියා අද ගොවීන් විශාල ගණනකට උසාවිවල රස් තියාදුවන්ට සිදු වී තිබෙන බව මා පෞද් ගලික වශයෙන් දන්නවා. සමහරවිට මිනි සුන්ගේ මේ අමාරුකම් තමුන්නාන්සේලා නොදන්නවා වෙන්ට ඇති.

ධනපති උදවියට ජීප් රථ ගෙන්වා දෙනවාට වැඩිය හොඳයි, සාමාන්‍ය ගොවීන් ට මුහුණපාන්නට සිදුවී තිබෙන මේ බාධක මගහැරවීම. සාමාන්‍ය මිනිහෙකුට ජීප් රථයක් ගන්ට බැහැ. රක්ෂණ බද්ද ගෙවා තිබෙන කෙනෙකුගේ කුඹුරක් පාළු වුණත් ඒ සඳහා වන්දි ලබාගන්න අවුරුදු ගණන් ගත වෙනව. අවුරුදු තුන-හතර රක්ෂණ වන්දි ලබා ගන්න බැරුව රස්ති යාදු වන මිනිසුන් ගැන මම දන්නවා. ඒ නිසා මේ මුදල ගොවියාගෙන් අපරාදෙ අය කර ගන්න මුදලක්. ඇමති මණ්ඩලයටත් මතක් කර රක්ෂණ බද්දත්, අක්කර බද්දත් නැති කර දැමීමට ක්‍රියා කරන ලෙස ගරු මුදල් ඇමතිතුමාගෙන් මා විශේෂ යෙන් ඉල්ලා සිටිනවා.

අද අපට වුවමනා කරන අර්තාපල් ටික, මිරිස් ටික, රතු ලූනු ටික ලබාගන්න පුළුවන්කමක් නැහැ. මේවා සීමා කළාට කමක් නැහැ; නමුත් අපේ රටේ වවන්න ඕනෑ. මිරිස් කෑව මිනිහට මිරිස් ටිකක් නොකා බැහැ. මාසයකට මිරිස් අවුන්ස දෙක-තුනක් කොහෙත්ම ප්‍රමාණවත් නැහැ. රටට අවශ්‍ය ප්‍රමාණය නිපදවන්නෙ නැත්නම් සීමා කිරීමේ තේරුමක් නැහැ. මේවා නිෂ්පාදනය කිරීමට සුදුසු ඉඩම් අපේ පළාත්වල තිබෙනවා. කොම්පැණිවල ටත් නොයෙක් පුද්ගලයන්ටත් අයිති විශාල වතුවල ජල පහසුකම් ඇති, එහෙත් නොවවන ලද අක්කර හාර-පන්සියය තිබෙනවා. මේ ඉඩම් අක්කරය සත 75 ට වගේ සුළු ගණන්වලට මිළදී ගත් ඉඩම්. ඒ නොවැවුණු ඉඩම් මහජනයා අතර බෙදා දී ඒ අය උනන්දු කරවනවනම් මිරිස්, රතු ලූනු, අර්තාපල් ආදිය ඒවායේ වගා කර ගන්න පුළුවනි. ඉඩම් නැතිව මේක කරන්න බැහැ. එම නිසා ඒ ඉඩම් මහජනයා අතර බෙදා දී මෙම ද්‍රව්‍ය වගා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්න ක්‍රියා කරන ලෙස මා ඉල්ලා සිටිනව. එහෙම නැතිව ධනපතියන්ට පුළුවන් තරම් ජීප් ගෙනත් දීමෙන් මේ රටේ වගා සංවර්ධනයක් ඇති කරන්ට පුළුවන්කමක් නැහැ. ඒ අන්දමට සංවර්ධනයක් නමුන්නාන්සේලා බලා පොරොත්තු වෙනව නම් ඒක ලොකු මුලාවක්; අහසේ මාළිගා තැනීමක්. ඒ මුලාවෙන් තොර වෙලා ක්‍රියා කරන ලෙස මා මතක් කරනව.

අකුරණ ගරු දෙවෙනි මන්ත්‍රීතුමා (ඒ. සී. එස්. හමීඩ් මයා.) ඊයේ ප්‍රකාශ කළා, දැන් පෝලිම් නැහැ කියා. කරවල පෝලිම්, රෙදි පෝලිම් ආදිය දැන් නැති බව එතුමා කියා සිටිය. ඒක සම්පූර්ණ ඇත්ත. පෝලිම් නැති කරනවා යයි මැතිවරණ කාලයේදී එතුමන්ලා පොරොන්දු වුණා. අපරාදෙ කියන්න බැහැ; ඒ පොරොන්දුව ඉෂ්ට කර තිබෙනව. බඩු තියෙන්න එපාය පෝලිම් තිබෙන්න. මිරිස් නැත්නම් පෝලිම් මොකටද? ඒ නිසා අකුරණ දෙවන මන්ත්‍රීතුමාගේ කථාව සම්පූර්ණයෙන්ම ඇත්ත.

ඒ වාගේම අපේ මුදල් උප ඇමතිතුමා කියා තිබෙනවා, හාල් සේරුවක් කැපීමෙන් එක්කෙනකුවත් මැරුණේ නැත කියා. ඒකත් ඇත්ත. නියෝජ්‍ය සභාපතිතුමනි, නමුන්නාන්සේ වුණත් මා වුණත් එක වර මැරී යනවා නම් ඒක සැනසීමක්. එහෙත් ටිකෙන් ටික මැරි මැරී යන්නට සිදු වීම විශාල අමාරුවක්. හාල් සේරුවක් දෙන නිසා ඒකෙන් කැද බිබීම අවුරුදු ගණනක් ඉන්න පුළුවන්. එහෙත් රටේ ජනතාව ඒ ජීවිතය ගෙන යන්නේ මොන තරම් අමාරුවෙන්ද? අපේ ප්‍රදේශවල සතියකට 21 වේලක්ම කැවේ බත්. උදේට ත් හීල් බත්. දැන් මොකද කරන්නේ? හාල් සේරුව 21 වේලට බෙදවම ලැබෙන්නෙ හාල් ඇට කීයද? මේක නමුන්නාන්සේලාට තේරෙන්නෙ නැහැ. හාල් සේරුව කැපුවාය කියා එක්කෙනකුවත් මැරුණෙ නැතැයි කීම හපන්කමක් නොවෙයි. එහෙත් මන්ද පෝෂණය නිසා ටිකින් ටික මැරෙන බව නමුන්නාන්සේලාට තේරෙන්නේ නැහැ. මගේ ප්‍රදේශයේ පාඨශාලා ළමයින් උදේට කන්න නැතුව ක්ලාන්ත වී වැටෙනවා. එහෙත් ඒ පැත්තෙන් කියන්නේ කිසිම කෙනෙක මළේ නැත, කිසිම හානියක් සිදු වුණේ නැත කියායි. රට මැදට ගිහින් මේවා ගැන සොයා බලන්න ඕනැ. එවිට පැහැදිලිවම පෙනී යනවා ඇති ජනතාව ටිකින් ටික මැරී යන බව; පණ ඇද ඇද අන්ත දුක් විඳින බව. එක සැරේම මරා දමනවා නම් ඒක සැනසීමක්.

ඊ ළඟට රැකීරක්ෂා ප්‍රශ්නය සම්බන්ධයෙන්, දැන් ටික වෙලාවකට කලින් කථා කළ ආණ්ඩු පක්ෂයේම මන්ත්‍රීවරයකු වූ නාවලපිටියේ ගරු මන්ත්‍රීතුමා හොඳට පිළිතුරු දුන්නා. නාවලපිටියේ ගරු මන්ත්‍රීතුමා මේ සභා ශාලාවේදීම, දැන් මොහොතකට කලින් ප්‍රකාශ කළා, ඇමතිවරුන්ගේ කොට්ඨාශවල අයට නම් රැකීරක්ෂා ලැබෙනවාය, ඒ වාගේම පැරදුණු අපේක්ෂකයන් සංස්ථාවලට පත් වීමෙන් ඒ අයටත් රැකීරක්ෂා ලැබෙනවාය, නමුත්, නාවලපිටිය පැත්තේ කිසි කෙනෙකුට රක්ෂා නැත කියා. නාවලපිටිය පැත්තට එහෙම නම් අපේ පැත්ත ගැන කියනුම කවරේද?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නමුන්නාන්සේත් ඒ කාලයේ අපේ ආණ්ඩුවේ සිටි නිසා නමුන්නාන්සේත් දන්නවා ඇති අප ශිෂ්‍ය ගුරු පත් වීම් දුන්නෙ කොහොමද කියා. අප කිසිම පක්ෂපාත ක්‍රමයකින් ඒ පත් වීම් දුන්නේ නැහැ. වැඩි ලකුණු ලැබුණු ක්‍රමයට අපක්ෂපාතව අප ඒ පත්වීම් දුන්නා. අපට ලැදි අයටය කියා කිසිම කෙනෙකුට අප දුන්නේ නැහැ.

එපමනක්ද නියෝජ්‍ය සභාපතිතුමනි, ලංගම ගැන කල්පනා කර බලන්න. අද දිනකට කොපමන අනතුරු සිදුවෙනවාද? දක්ෂකම්, පලපුරුදු කම් පසෙකට දමා නමන්ට පන්දම් ඇල්ලූ අයට රියැදුරු තනතුරු දීම නිසා සැමදම වාගේ දැන් ලංගම රිය අනතුරු සිදුවන බව රහසක් නොවෙයි. පොලීසිය දෙස බැලුවත් එහෙමයි. ඉස්සර පොලිසියට බඳවා ගත්තේ කොහොමද? එහෙත් දැන් තත්ත්වය මොකක්ද? පොලිසියට බැඳීමට යන විට, ඒ අය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේද, සම සමාජ පක්ෂයේද, ආදී වශයෙන් බලමින් දේශපාලන වශයෙන් නොයෙකුත් බලපෑම් ඇතිව සුදුසුකම් පසෙක දමා කටයුතු කරනවා. යම් ලෙසකින් එවැනි පක්ෂවලට වැඩ කළා නම් කොපමන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

සුදුසුකම් තිබුනත් පොලිසියට බැදෙන්න පුළුවන් කමක් නැහැ. මේ විධියට පක්ෂ පාත ලෙස කටයුතු කරමින් සුදුසුකම් ඇති අය පසෙකට තල්ලුකරමින් මේ විධියේ තක්කඩිකම් කරන්න එපාය කියා මා ආණ්ඩුවට මතක් කරනවා.

රැකී රක්ෂා ප්‍රශ්නය පිළිබඳව කල්පනා කරන විට, අප එදා විශේෂයෙන් සිරිමා ශාස්ත්‍රී-ගිවිසුම ඇති කර ගත්තේ මේ රටේ සිංහල ජනතාවට රැකී රක්ෂා ලබා දීමටයි. මේ රටෙන් ඉන්දියානුවන් 5,25,000 ක් ඉන්දියාවට යවා ඒ තිබෙන රක්ෂා මේ රටේ ජනතාවට ලබා දීමට ඒ විධියේ ගිවිසුමක් පිළියෙල කළ නමුත්, තමුන්නාන්සේලා ඒ එකම ඉන්දියානුව කුවත් ඉන්දියාවට යවන්නේ නැතිව, ගිවිසුමේ ඇති පරිදි 3,00,000 කට මෙහි පුර වැසිකම් දීමෙන් පමණක් ඊ ළඟ වතාවෙ ඒ ඉන්දියානුවන්ගේ ඡන්දය සියයට සියයක්ම තමුන්නාන්සේලාට ලබා ගැනීමට තමුන්නාන්සේලා කටයුතු කරගෙන යනවා. ඒ ඡන්ද එසේ ලබා ගැනීමෙන් නැවතත් බලයට පත් වීමේ අරමුණ උඩ තමුන්නාන්සේලා ක්‍රියා කරමින් මේ රටේ මහා ජාතිය පාවාදීමටයි දැන් සූදානම් වන්නේ. අප ඇති කරගත් ගිවිසුම පරිදි ඉන්දියානුවන් 5,25,000ක් මේ රටින් ඉන්දියාවට යවා ඒ අනුව පුරප්පාඩු වන රක්ෂා ටික රටේ ජනතාවට ලබා දෙමින් රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීමට තමුන්නාන්සේලා ක්‍රියා නොකිරීම ගැන ඒ උඩරට ජනතාව තමුන්නාන්සේලාට ශාප කරනවා.

අපේ ආණ්ඩුව බලයේ පවතින කාලයේ තමුන්නාන්සේලා චෝදනා කළා, ඇමතිවරුන් ආණ්ඩුවේ කාර් පාවිච්චි කරනවාය කියා. නොයෙක් විධියේ චෝදනා කරමින් බොරු බේගල් ඇදැම්මා. පසුගිය රජයේ ඇමතිවරුන් පාවිච්චි කළ නිල—රථ බෙන්ස් කාර්—ලොතරැයි කළා. කියන කොට එහෙම වුණත් දැන් කරන කොට කොහොමද? එදා එහෙම කළත් අද ආණ්ඩුවේ ඇමතිවරු පමණක් නොවෙයි, උප ඇමතිවරුන් පවා යන්නෙ ආණ්ඩුවේ මෝටර් රථවලින්. සමහරුන් වන්දනා ගමන් යන්නෙත් ආණ්ඩුවේ රථවලින්. මා දන්නව, සමහරුන් ඩෝබිට රෙදි දෙන්න යන්නෙත් ආණ්ඩුවෙ කාර් වලින්.

ආණ්ඩුවේ නිවාස පාවිච්චි කරනවාය කියා පසුගිය ආණ්ඩුවෙ මැති ඇමතිවරුන්ට චෝදනා කළත් අද අගමැතිතුමාගෙ පෞද්ගලික ලේකම් සිටින්නෙත් ආණ්ඩුවෙ නිවාසයකයි. කියන කොට එහෙමයි. අපේ සමාජ සේවා ගරු ඇමතිතුමා ඒ අය සුදනන් හැටියට කථා කළා. නමුත් ක්‍රියාව කොහොමද?

භාෂාව ගැනත් සඳහන් කළා. එම නිසා ඒ ගැනත් වචනයක් කියන්න ඕනෑ. අපේ ආණ්ඩුව තිබුණු කාලයේදී සිංහල භාෂාව මේ රටේ රාජ්‍ය භාෂාව වශයෙන් පිළිගෙන සිංහල භාෂාවෙන් කටයුතු කරන්න ඕනෑය කියන පරමාර්ථය ඇතුව සිංහල නොදන්නා රජයේ සේවකයින් බලයෙන් විශ්‍රාම ගැන්වීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. ඒ තනතුරුවලට සිංහල භාෂාව දන්නා පුද්ගලයන් පත් කළා. නමුත් මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව අපේ ආණ්ඩුවෙන් බලයෙන් විශ්‍රාම ගැන්වූ පුද්ගලයන් ආපසු ගත්තා. එහෙම කළේ නැද්ද කියා මා ඒ අයගෙන් මේ අවස්ථාවේදී ප්‍රශ්න කරනවා. සිංහල භාෂාවට තැන දුන්නෙ, සිංහල භාෂා පනත ක්‍රියාත්මක කළේ කොයි ආකාරයෙන්ද කියා විස්තර කර දෙන්න කාලය නොමැති වීම ගැන මා කනගාටු වෙනවා.

මගේ කථාව අවසාන කිරීමට පෙර අධ්‍යාපනය ගැනත් වචනයක් කියන්න ඕනෑ. අධ්‍යාපනය ගැන ලොකුවට කෑ ගැසුවත් අද ඇත්ත වශයෙන්ම සිදු වී තිබෙන්නෙ මොකක්ද? ආණ්ඩුවෙ ක්‍රියා කලාපයට දෙමව්පියන් දක්වා ඇති විරෝධය ගැන ආණ්ඩුව දන්නෙ නැහැ. රටේ ආහාර වගාව දියුණු කරන්නටය කියා අපේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් කුඹුරුවලට දමා ඔවුන්ගේ අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම අඩපණ කර තිබෙනවා. උසස් පංක්තිවල ඉගෙන ගන්නා ළමයින් කියනවා, ඉස්කෝලෙ ගියාම වල් නෙලන්න කුඹුරු වැඩ කරන්න යනවා හැරෙන්නට නියම අන්දමට ඉගෙනීමක් කරන්න කාලයක් නැත කියා. ඔය අන්දමට වැඩ කරගෙන ගියොත් අනාගත බාල පරම්පරාව මෝඩයන් වෙනවාට කිසිම අනුමානයක් නැහැ.

එමණක් නොවෙයි, හැම කටයුත්තක්ම කෙරෙන්නෙ පක්ෂපාතකම් අනුවයි. විශ්ව විද්‍යාල ගැන සඳහන් කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නමුත් කනිෂ්ඨ විශ්ව විද්‍යාල ඇත්තෙ කුලියාපිටිය ප්‍රදේශයේ මිස ඌව ප්‍රදේශයේ නොවෙයි. ඌව ප්‍රදේශයේ ආසන දහයක් තිබෙනවා. නමුත් එකම කනිෂ්ඨ විශ්ව විද්‍යාලයක්වත් එහි නැහැ. ඇමතිතුමාගෙ කොට්ඨාශයෙ නම් තිබෙනවා. මේ විධියේ පක්ෂපාතකම් අනුව ක්‍රියා කරමින්, මේ රටේ අධ්‍යාපනය මකබෑ වෙන අන්දමට කටයුතු කිරීම ගැන අපේ බලවත් කනගාටුව ප්‍රකාශ කරන අතර, මෙම අයවැය ලේඛනයෙන් අපේ ජනතාවගෙ වැදගත් ප්‍රශ්න විසඳන්න ක්‍රියා නොකර ජනතාවගේ බලාපොරොත්තු සම්පූර්ණයෙන්ම සුන් කර ඇති නිසා, කිසිම දෙයක් කර නැති නිසා, අපේ බලවත් අප්‍රසාදය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

අ. භා. 6.53

**එම්. ඒ. ඩැනියෙල් මයා.** (හේවාහැට)

*(திரு. எம். ஏ. டனியல்—ஹேவாஹெற்ற)*

(Mr. M. A. Daniel—Hewaheta)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අයවැය ලේඛන වාර්තාව සම්බන්ධයෙන් මටත් වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. අයවැය විවාදය ආරම්භ කරමින් විරුඩ පක්ෂයෙන් කථා කළ ගරු මන්ත්‍රීවරයා, එය හිස් බම්බුවක් හැටියට සඳහන් කළා. හේවාහැට ආසනයේදී ගහපු බම්බුව, එතැනින් අවසන් වී අවුරුදු දෙකක් පාර්ලිමේන්තුවට එන්න බැරිව සිට, දැන් කොලොන්නාවෙන් ඇවිත් තිබෙන්නෙ, කවදාහරි ඒ බම්බුවටත් තට්ටු වන බව තුම්පනේ බණ්ඩා මහත්මයාට අමතක වී බව මේ අවස්ථාවේ දී කියන්න කැමතියි. විරුඩ පක්ෂයේ තවත් මන්ත්‍රීවරයෙක්, පිත්තල රත්තරන් හැටියට පෙන්වනවාය කියන හැඟීමක් අරගෙන මේ අයවැය විවාදයේදී කරුණු ඉදිරිපත් කර තිබෙනවා. මම ඉතාමත්ම සන්තෝෂ වෙනවා, විරුඩ පක්ෂයෙන් අයවැය ගැන කිසිම කථාවක් නොකිරීම ගැන; නමුත් ආණ්ඩු පක්ෂය වෙනුවෙන් විවේචන ගණනාවක්ම ඇති කළා. ඒක හොඳ ගතියක්. එයින්, ගරු වන්නිනායක මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ අයවැය ලේඛනය මොන ආකාරයද කියා මහජනතාවට පෙන්නුම් කළා. මෙයට පෙර අයවැය ලේඛන මේ ගරු සභාවට ඉදිරිපත් කරන අවස්ථාවලදී රටේ මහජනතාව එහෙමපිටින්ම කුල්මත්වී, මොනවා වෙයිදෝ, බඩු මිල ඉහළ නගීවිදෝ, මොන මොන දේවල් සිදු වෙයිදෝ කියන හැඟීමෙන් සිටි බව තමුන්නාන්සේට මතක ඇති. වන්නියේ නායක වන්නිනායක මුදල් ඇමතිතුමා සිය පළමු වැනි අයවැය ලේඛනය මේ ගරු සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේදී මේ රටේ ජනතාව කොයිතරම් ප්‍රසාදයට පත්වුණාද කියතොත්, එතුමා මේ රටේ නියම පාලකයෙක්ය යන හැඟීම මුළු රටේම ඇති වුණා. ඒ හැඟීම තහවුරු වන කරුණු රාශියක් එතුමාගේ මේ තුන් වැනි අයවැය ලේඛනයේත් ගැබ්වී තිබෙනවා. එහෙත් සමහර පත්‍ර කල් තබා ප්‍රචාරය කළා, විස්කි ගණන් යනවාය කියා. අන්තිමේදී එය පුහු මතයක් වුණා. විස්කි පාවිච්චි කරන සමහර ගරු මන්ත්‍රීවරුන් නම් ඒ ගැන බොහොම සන්තෝෂ වුණා. එහෙත් දුම් කොළ රාත්තල රු. 4.50 කින් වැඩි කළායැයි සිගරට් නොබොන මන්ත්‍රීවරුන් පවා මෙතැන ඇවිත් බොරුවට කෑ ගැහුවා.

මේ රට ස්වයම්පෝෂිත කිරීම සඳහා මේ අයවැය ලේඛනයෙන් රුපියල් 78 කෝටියක් වෙන් කර තිබෙනවා. මේ මුදල වැය කරන ආකාරය මුදල් ඇමතිතුමා හෝ අගමැතිතුමා හෝ තම පිළිතුරු කථාවේදී විස්තර කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. මේ අයවැය ලේඛනයේ සාරාංශ වශයෙන් දක්වා තිබෙන කරුණු විස්තර වශයෙන් සාකච්ඡා කරන්නට තව සතියකින් දෙකකින් පමණ කාරක සභා අවස්ථාවේදී අපට අවකාශ ලැබෙනවා.

මේ අයවැය ලේඛනය පිළිබඳ විවාදයේදී සමහර ගරු මන්ත්‍රීවරුන් කීවා, තවමත් අධිරාජ්‍යවාදී ක්‍රමයට මේ රට ආණ්ඩු කරනවාය කියා. අධිරාජ්‍යවාදී ක්‍රමය කියන්නේ මොකක්ද? 1948 දී මේ රට අධිරාජ්‍යවාදීන්ගෙන් මිදුණාට පසු, අපේ රටට නිදහස ලැබුණාට පසු, එක්සත් ජාතික පක්ෂය අවුරුදු 9 ක් පමණ මේ රට පාලනය කළා. එක්සත් ජාතික පක්ෂයේ පාලනය හොඳ නැතැයි සිතූ ජනතාව මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩැනියෙල් මයා.]
රටේ පාලන බලය ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂයට පැවරුවා. ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂයත් ඒ අධිරාජ්‍යවාදී නීති වෙනස් නොකර, යම් නම් සුළු සුළු වෙනස් කිරීම් පමණක් කර, අවුරුදු 9 ක් මේ රට පාලනය කළා. ඒ අය මහජනයාට අවබෝධ කරවන්නට උත්සාහ කළා, "අධිරාජ්‍යවාදී නීති අප විසින් වෙනස් කරනු ලැබුවාය" කියා. එහෙත් අදත් ඒ අධිරාජ්‍යවාදී ක්‍රමයම ගෙන යන්නට සිදු වී තිබෙනවා. ඒ අධිරාජ්‍යවාදී නීති රීති වෙනස් කර, මේ රටට ගැළපෙන ආණ්ඩු ක්‍රමයක් සකස් කරන්නට මේ ආණ්ඩුව උත්සාහ කරන අවස්ථාවල විරුද්ධ පාර්ශ්වය එය කඩා කප්පල් කර දමනවා. ඒ අධිරාජ්‍යවාදී ක්‍රමය වෙනස් කිරීම සඳහා ආණ්ඩුව ගෙනෙන යෝජනා විරුද්ධ පාර්ශ්වයත් අනුමත කරනවා නම්, ඒ සඳහා විරුද්ධ පාර්ශ්වයත් සහයෝගය දෙනවා නම්, මේ ප්‍රශ්නය ලෙහෙසියෙන්ම නිරාකරණය කර ගන්නට පුළුවන්කම ලැබෙනවා.

පසුගිය මහා යුද්ධයේදී ජපන් රටත් ජර්මනියත් ඒහෙමපිටින්ම වාගේ නැති වුණා. එහෙත් ඒ රටවල් දියුණු කිරීමට, පිටරටවලට දෙන්නට තිබුණු ණය ගෙවා දැමීමට, ක්‍රමානුකූලව සංවර්ධනය කරා රට ඉදිරියට ගෙන යාමට, ඒ රටවල ආණ්ඩු පක්ෂයත් සමග විරුද්ධ පාර්ශ්වයත් අත්වැල් බැඳගෙන එකට වැඩ කළා. ඒ රටවල පාලකයන් රටේ වෘත්තීය සමිති නායකයන් කැඳවා කීවේ මොකක්ද? "මේ රට දැන් දුකින් දුකට පත් වී තිබෙනවා, ඒ නිසා මේ රට නැවතත් ගොඩනගා ගැනීමට අප සියලු දෙනාම එක් විය යුතුයි", කියායි ඔවුන් කීවේ. ඒ හැඟීමෙන් යුතුව සියලු දෙනාම එක් වී වැඩ කිරීම නිසා අද ජපන් රට මේ තරම් දියුණු තත්ත්වයකට පත් වී තිබෙන බව අපේ විරුද්ධ පාර්වශ්වයට පෙනෙන්නේ නැද්ද? සියලු දෙනාම එක් වී රට දියුණු කිරීමේ වැඩ පිළිවෙළක් ගෙන ගිය නිසා අද ජර්මනිය විශාල දියුණුවක් ලබා තිබෙන බව අපේ විරුද්ධ පාර්ශවයට පෙනෙන්නේ නැද්ද? විරුද්ධ පාර්ශ්වයේ දැනට සිටින උදවිය රට පාලනය කළ කාලයේ විදේශවල කළ සංචාරවලදී මේවා දැක්කේ නැද්ද ? මේ රට ප්‍රපාතයෙන් ප්‍රපාතයට වැටී තිබෙන මෙවැනි අවස්ථාවක, ආණ්ඩු පක්ෂයත් සමග එක් වී රට දියුණු කිරීම සඳහා වැඩ කිරීම විරුද්ධ පාර්ශ්වයේ යුතුකමක් නේද?

එහෙත් අද විරුද්ධ පාර්ශ්වය කරන්නේ කුමක්ද? ඔවුන් අද අහිංසක මහජනයා මුළා කරනවා. රජයේ සේවකයන් මුළා කර, ඔවුන් නොමඟ යවා වැඩ වර්ජන ඇති කරන්නට යන්නේ මේ රටට මොනවා කරන්නටද? ඔවුන් එසේ කට යුතු කරන්නේ මේ රට දියුණුව කරා ගෙන යාමට නොවෙයි. මේ රටේ මාක්ස්වාදී පාලනයක් ගෙන යාමට ඔවුන් පුලපුලා බලා සිටිනවා. මේ ගැන අප මොහොතක් කල්පනා කර බලන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක් ගරු මන්ත්‍රීවරයකු සමුපකාරය ගැන කථා කර නවා මට ඇසුණා. සමුපකාරය අද නැත්තටම නැතිවී තිබෙනවාය කියා ප්‍රචාරයක් ගෙන යනවා. එහෙත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමුපකාරය සතොසට පරිවර්තනය කළ හැටිත් එමගින් මේ රටේ දියුණුවූ යම් යම් ආයතන එහෙම පිටින්ම නැති කළ හැටිත් සතොස හා ලංගමය වැනි ආයතන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රචාරක අංශ කර ගත් හැටිත් තමුන්නාන්සේලා කවුරුත් දන්නවා. පසුගිය අවුරුදු නවයක කාල සීමාව ගැන බලන විට රටේ දියුණුවට නොවෙයි රටේ තම නායකත්වය තහවුරු කර ගැනීමටම ඒ අය කටයුතු කර තිබෙන බව පෙනෙනවා. මේ තත්ත්වය වෙනස් කරන්නට අප මහන්සි ගන්නවා. එය තරමක් දුෂ්කර වී තිබෙනවා. අපට ඒ පරිවර්තනය කරන්නට සෑහෙන කාලයක් අවශ්‍ය වී තිබෙනවා. ඊට හේතුව පසුගිය ආණ්ඩුව විසින් නොයෙක් නොයෙක් ස්ථානවලට පත් කර සිටින ඇතැම් උදවියගේ අදහස් වෙනස් කරවීම බොහොම අමාරුවීමයි. රජයේ නිලධාරීන්ටත් ඒවාගේම නොයෙක් නොයෙක් සංස්ථා හා ආයතනවල සේවකයන්ටත් කරුණාවෙන් කරුණු අවබෝධ කර දෙන්නට සිද්ධවී තිබෙනවා. තමුන්නාන්සේලා සේවය කරන්නේ පැය අට නම් කරුණා කර ඒ පැය අට තුළ හරියට සේවය කරන්න, එහෙම කළොත් තමයි අපට මේ ප්‍රශ්න විසඳන්නට අවස්ථාව ලැබෙන්නෙ ආදී වශයෙන් කරුණාවෙන් කරුණු අවබෝධ කරවන්නට අපට සිද්ධ වී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපේ මුදල් ඇමතිතුමාගේ අයවැය ලේඛනය පිළියෙළ කර තිබෙන්නේ රට එහෙම පිටින්ම කාබාසිනියා වන පිළිවෙළටය කියා බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා (බී. එච්. බණ්ඩාර මයා.) කියන්නට යෙදුණා. මේ අයවැය ලේඛනයෙන් ප්‍රධාන වශයෙන්ම පෙන්වන්නෙ කරුණු දෙකක් පමණය කියා එතුමා කිව්වා. එක කරුණක් ගොවි හමුදාවක් ඇති කර රට ස්වයංපෝෂිත කිරීමලු. මුදල් ඇමතිතුමා පෙන්වා දී තිබෙන කරුණු ගැන අපට කාරක සභා අවස්ථාවේදී කරුණු අවබෝධ කර දෙන්නට පුළුවන් වෙනවා. මා මේ අවස්ථාවේදී දීර්ඝ වශයෙන් කථා කරන්නට අදහස් කරන්නේ නැහැ. මා බලාපොරොත්තු වන්නේ ඉතාම කෙටියෙන් කථා කරන්නටයි. 1967-68 අයවැය ලේඛනයෙන් අපේ ආණ්ඩුව රුපියල් 300 ට අඩු පඩි ලබන සේවකයන්ටත් විශ්‍රාම වැටුප් ලබන්නන්ටත් අතුරු දීමනාවක් ගෙවීම සඳහා රුපියල් 6 කෝටියක් වියදම් කරනවා. රුපියල් 20, 10 හා 5 බැගින් ඒ අතුරු දීමනාව ගෙවනවා. මේ අතුරු දීමනාව ලබන රජයේ හා පළාත් පාලන සේවාවේ නිලධාරීන්ගෙන් නියම සේවයක් ලබා ගන්නවා නම්, එම නිලධාරීන් නියම සේවයක් කරනවා නම් අද මේ රටේ තිබෙන මේ අමාරුකම් සම්පූර්ණයෙන්ම මගහරවා ගන්නට අවස්ථාව ලැබෙනවාය කියා මා ප්‍රකාශ කරන්නට සතුටුයි. රජයේ හා පළාත් පාලන සේවාවේ නිලධාරීන් දිනකට පැය අටක් සේවය කළ යුතුයි. මේ පැය අට තුළදී ඔවුන්ගෙන් අවංක සේවයක් ලබා ගැනීමට නම් ඔවුන්ට කරුණු අවබෝධ කරවිය යුතුයි. ඒ සඳහා විශේෂ නියෝග මාලාවක් පිළියෙළ කරන මෙන් මා ඉල්ලා සිටිනවා. අඩු වශයෙන් මේ සේවකයින් නියමිත පැය අට තුළ දී අවංක සේවයක් කළහොත් බොහෝ දුරට මේ අමාරුකම් මගහරවාගෙන අපේ වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්නට පුළුවන් වෙනවා. ගොවි හට හමුදවක් පිහිටුවා තිබෙන බව තමුන්නාන්සේලා දන්නවා. ඒක සමහර ගරු මන්ත්‍රීන් හඳුවන්නේ බට ගොයි හමුදාව යන නමිනුයි. එහෙත් ඒ ගොවි හමුදාව මගින් ක්‍රමානුකූලව අද මේ රටේ කරගෙන යන වැඩ ගැන මොහොතක් කල්පනා කර බලන මෙන් මා ඉල්ලා සිටිනවා. මේ රටේ බෝක්කු පාළුවන් හැටියට, අම්බලන් පාළුවන් හැටියට, ගම්බද හා නගරබද ප්‍රදේශවල කඩාකප්පල්කාරීන් හැටියට හිටපු අපේ රැකිරක්ෂා නැති තරුණයින්ගෙන් රටට යම් සේවයක් ලැබෙන අන්දමට වැඩක් කරගෙන යන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මොකක්ද කියන්නෙ? ඒ ගොවි හමුදාවට තෝරා ගෙන තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයට වැඩ කළ, එක්සත් ජාතික පක්ෂයට ලැදි තරුණයින්ය කියා මේ තුන් හවුල්කාරයින් කියනවා. එහෙත් අපක්ෂපාතව, සුදුසුකම් උඩ මේ ගොවි හමුදාවට අප තරුණයින් බඳවා ගෙන තිබෙන බව මා ප්‍රකාශ කරනවා. තමුන්නාන්සේලාට ඕනෑම අවස්ථාවක නිලධාරි මහත්වරුන්ගෙන් මේ තරුණයින්ගේ ඉල්ලුම් පත්‍ර ගෙන්වා ඒවා පරීක්ෂා කර බලා මා මේ කරන ප්‍රකාශයෙහි සත්‍යභාවය අවබෝධ කර ගන්නට පුළුවනි.

විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමන්ලා හාල් සේරුව කපා දැමීම ගැන කථා කරමින්, ළමයින් බඩගින්නේ සිටිනවාය ආදි වශයෙන් කියා සිටියත්, ගරු මුදල් ඇමතිතුමා අයවැය ලේඛනය පාර්ලිමේන්තුවට ගෙනෙන විට උම්බලකඩ, අල, ලූනු, මිරිස්, බතල ආදී දේවල් ගෙනාවේ නැහැ. එතුමා අයවැය ලේඛනය මගින් ඉදිරිපත් කළේ 1967-68 මුදල් වර්ෂය තුළ ලංකාණ්ඩුවේ අය වශයෙන් බලාපොරොත්තු වන ප්‍රමාණය මෙසේය, වැය වශයෙන් බලාපොරොත්තු වන ප්‍රමාණය මෙසේය, ආදී කරුණුයි. ඒ අනුව මේ රටේ පාලන යන්ත්‍රය ගෙන යන්නට බලාපොරොත්තු වන්නේ මේ ආකාරයටය යන්නයි එතුමා සඳහන් කළේ. සමහරවිට විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමන්ලා බලාපොරොත්තු වෙන්න ඇති, තවත් හාල් සේරුවක් කපාවිය කියා. එසේත් නොවෙයි නම් උම්බලකඩ, මිරිස්, අල, ලූනු, ආදිය ගැනවත් යමක් කරාවිය කියාත් සිතන්නට ඇති. අද මේ රට ස්වයංපෝෂිත කිරීමේ වැඩ කටයුතු කරගෙන යන තරමට එයින් ප්‍රතිඵල ලැබී නැත්නම් තව ටිකක් කල් ගත වන විට යථා කාලයේ ඒවා ලැබෙනවා ඇති. ඒ සියලුම දේවල් සපයා දීමටයි ආණ්ඩුව බලාපොරොත්තු වන්නේ. ඒ සඳහා නොයෙක් කටයුතු කරන්නට තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩැනියෙල් මයා.]

අයවැය ලේඛනය ඉදිරිපත් කළ ගරු මුදල් ඇමතිතුමා එතුමාගේ කථාවේදී සඳහන් කළා, වගා කිරීම සඳහා අක්කර 57,000 ක් දී තිබෙන බව. යම් කෙනකුට මුදල් තිබෙනවා නම්, ඒ මුදල් යොදා මහ පොළොවෙන් ප්‍රයෝජනයක් ගන්නටත් පුළුවන් නම්, වුවමනා තරම් ඉඩම් ඒ සඳහා යොදා ගැනීමට දීමේ වැඩ පිළිවෙළක් රජය මගින් ඇති කර තිබෙනවා. මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය අනුවයි එසේ කර තිබෙන්නේ. ඒ අනුව ඉඩම් දීගෙන යනවා. 1948 සම්ප්‍රදාය අනුව ඉඩම් දීමේ පනත අනුව ඉඩම් දීමේදී එක්කෙනාට අක්කර භාගය, අක්කරය, ආදී වශයෙන් බෙදා දීමේ සිරිතක් රටේ තිබුණු බව සැබෑවක්. ඒ වගේම මධ්‍යම පන්තියේ උදවියට අක්කර දහය, දොළහ, ආදී වශයෙන් බෙදා දෙන ලද බවත් සැබෑවක්. එහෙත් වගා කිරීමට කැමති උදවියට එසේ කරන්නට පුළුවන් කමත් තිබෙනවා නම්, ඕනෑ තරම් දෙන්නට ඉඩම් මේ රටේ තිබෙනවා. ඒවා දීමටයි රජය සූදානම් වන්නේ. විශාල කැලෑ බිම් ඒ අන්දමට තබාගෙන, මේවා රජ කාලේ ඉඩම්ය, ඒ නිසා ඒවා ආරක්ෂා කරගෙන ඒ විධියටම තබාගත යුතුය, ආදී වශයෙන් කිය කියා, දැව දඬු ආදිය ලබා ගැනීමට ඒවා එසේම තබාගත යුතුය යනුවෙන් තර්ක කරනු මිස, ඒවායින් රටට ප්‍රයෝජනවත් වෙනත් වැඩ ගත යුතු බව ඇතැම් අය පිළිගන්නේ නැහැ. එහෙම කළොත් අපේ වුවමනාවන් පිරිමසා ගැනීම සඳහා ඉදිරි කාලයේදී දැනටමත් වඩා—සියේට එකසිය පණහ දක්වා වුවත්—යම් යම් අවශ්‍ය දේවල් නොගෙන්වා ඉන්නට බැරි විය හැකියි.

ගිය අවුරුද්දේදී බෙදා දෙන ලද ඉඩම් ප්‍රමාණයෙන් වගා කරන ලද බිම් ප්‍රමාණය ගැන මොහොතක් කල්පනා කර බලන විට අපට සන්තෝෂ වෙන්නට පුළුවන් වෙනවා. 1970 වන විට මේ රටට අවශ්‍ය තරම් හාල් මේ රටේම නිපදවා වැඩි හරිය පිටරටවලට පවා පටවා යවන්නට තරම් තත්ත්වයක් අපට ඇති වේය යනු අපේ ඒකාන්ත විශ්වාසයයි.

සමහර ගරු මන්ත්‍රීතුමන්ලා සුද්දන්ට ඉඩම් බෙදා දුන්නාය කියමින් අපේ ආණ්ඩුව විවේචනයට ලක් කිරීම සාධාරණ නැහැ. ඕනෑම යකෙකුට වුණත් අපේ ඉඩම් දී ඒවායින්—මහ පොළොවෙන්—නියම ප්‍රයෝජනයක් ගන්නට පුළුවන් නම් එම ප්‍රයෝජනය ගැනීමට වැඩ කරන එකයි අපේ යුතුකම. කැලෑ ඉඩම්වලින් අක්කර 57,000 ක් දුන්නාම ඒවාට යන්නට පහසු කම් නැතැයි කියාවි. වාහන යාමේ පහසුකම් නැතැයි කියාවි. ජීප් එකකින්වත් යන්නට බැරිය කියාවි. කැලෑවලින් ගමන් කරන්නට බැරි බව කියා සිටීවි. ට්‍රැක්ටර් යෙදීමෙන් ගස් එහා මෙහා කර අස් කර පස සකස් කර ගන්නට හැකියාව තිබෙනවා. ජීප් ආදී වාහන එපාය කියන්නට බැහැ. ඒවා ගෙන්වාගෙන තිබෙන්නේ ඒ සඳහායි. සමහර උදවිය ඒවායින් අයුතු ප්‍රයෝජන ගන්න බව මාත් පිළිගන්නවා. පාර්ලිමේන්තු මන්දිරය ඉස්සරහ දැනුත් ජීප් රථ නතර කර තිබෙනවා දකින්නට පුළුවනි. ඒවා කාගේද? කව්ද ඒවා මේ ස්ථානයට ගෙනා අය? ඒවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උදවියගේයි. අපේ ඒවා නොවෙයි. නවත්වා තිබෙනවා නම් තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ජීප්. ඒ අය අපට මේ තරම් ඉඩම් තිබෙනවාය, අප මේ තරම් වගා කර තිබෙනවාය කියා දෙපාර්තමේන්තුවට වංචා කර, බොරු වාර්තා සපයා ඒ ජීප් ලබාගෙන තිබෙනවා. ඒ අය පසුගිය අතුරු මැතිවරණ කීපයකටම වැඩ කෙළේ ඒ ජීප්වලින් බව මා මතක් කරන්නට සතුටුයි. එහෙම කරලත්, ට්‍රැක්ටර් ගෙන්වනවාය; ජීප් රථ ගෙන්වනවාය, ඒ අයගෙ ඕනෑ එපාකම් වලට ඒවා පාවිච්චි කරනවාය, ස්කෝල වලට ළමයින් ගෙන යාම පිණිස ඒවා පාවිච්චි කරනවාය කියා ආණ්ඩු පක්ෂයට චෝදනා කරනවා.

ගරු සභාපතිතුමනි, ඔය විධියට අදහස් ප්‍රකාශ කිරීමෙන් ඒ අය බලාපොරොත්තු වන්නේ මොනවාද? මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන අය වැය ලේඛනය මගින් විදේශ විනිමය විශාල ප්‍රමාණයක් නාස්ති වෙනවාය යන හැඟීමක් මහජනයාට දෙන්නට ඒ අය මහන්සි ගන්නවා. විදේශ විනිමය එකතු කර ගැනීමට මුදල් ඇමතිතුමා දරණ ප්‍රයත්නය ගැන මා වචනයක් දෙකක් කියන්නට ඕනෑ. අපේ ගරු අග්‍රාමාත්‍යතුමාගේ කැබිනට් මණ්ඩලයේ සිටින එතුමා ඒ කැබිනට් මණ්ඩලයේ තීරණය අනුව මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රටට අවශ්‍යයෙන්ම ගෙන්විය යුතු දේ ගෙන්වීමටත්, වෙනත් දේ ගෙන්වීම සම්පූර්ණයෙන්ම නැවැත්වීමටත් සැලැස්මක් සකස් කර තිබෙනවා.

පසුගිය ආණ්ඩුව කාලයේදී පිටරටින් මෙරටට බඩු ගෙන්වීමටත්, මෙරටින් බඩු පිටරට යැවීමටත් ගිවිසුම් අත්සන් කරවා ගත් අයට පන්දම් ඇල්ලූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් අද බොහොම අමාරුවෙන් සිටිනවා, ඒ අයට එදා ලැබුණු කොමිස් මුදල අද ඒ අයගේ සාක්කුවලට එන්නෙ නැති නිසා. ඒ නිසා අද මෙතැනට ඇවිත් අපට අර බඩුව ගෙනෙන්නෙ නැහැ, මේ බඩුව ගෙනෙන්නෙ නැහැ කියමින් කෑගහනවා. පිටරටින් බඩු ගෙන ඒමට සහ මෙරටින් බඩු පිටරට පැටවීමට බලපත්‍ර ලබා ගෙන සිටින අයට අද ටිකක් අමාරුයි. බඩු ගෙනාවොත් පමණයි, ඒ අයගේ සාක්කුව ටිකක් පිරෙන්නේ. අද ඒ අයගේ සාක්කු පිරෙන්නෙ නැති නිසා හිතේ අමාරුවෙන් කියනවා, මුදල් ඇමතිතුමාගේ අයවැය ලේඛනය පුස්සක්ය කියා; මුදල් ඇමතිතුමාගේ අයවැය ලේඛනය හිස් බම්බුවක්ය කියා. ඒ අන්දමට මුදල් ඇමතිතුමා මහජන අප්‍රසාදයට භාජන කිරීමට අද ඔවුන් නොයෙක් විධියේ විවේචන කරනවා. 1967-68 වර්ෂයේදී මේ මුදල් ඇමතිතුමාගේ අයවැය ලේඛනයෙන් ලැබෙන ප්‍රතිඵල අනුව 1968-69 වර්ෂයේදී එතුමන්ලාට කියන්නට දෙයක් නැති වන බව මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට සතුටුයි.

ගරු සභාපතිතුමනි, මේ තුන් හවුලේ මන්ත්‍රීවරුන් හැර ලංකාවේ අස්සක් මුල්ලක් නැර සිටින අනික් හැම දෙනෙක්ම මේ අයවැය ලේඛනය ගැන සතුට ප්‍රකාශ කර තිබෙන බව මා මේ අවස්ථාවේදී ප්‍රීතියෙන් මතක් කරනවා. මේ අයවැය ලේඛනයේ තිබෙන එකම හොඳක්වත් විරුද්ධ පාර්ශ්වයේ එකම මන්ත්‍රීවරයකුටවත් පෙනී නැහැ. හැම පැත්තෙන්ම ඒ අයට පෙනී තිබෙන්නේ මේ අයවැය ලේඛනයේ තිබෙන නරක පමණයි. මේ අයවැය ලේඛනයේ තිබෙන හොඳ මොනවාද කියා එක වචනයක් කියන ලෙස මා ඒ අයගෙන් ඉල්ලා සිටීමට කැමතියි. අපට පෙනෙන්නේ මේ අයවැය ලේඛනය රටට ඉතාමත්ම හොඳින් ගැළපෙන, රටේ දියුණුවට හේතු වන හොඳ එකක් බවයි. එහෙත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ට පෙනෙන්නේ මේක කිසිම හරයක් නැති කිසිම හොඳ දෙයක් නැති අයවැය ලේඛනයක් බවයි.

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

ඒ අයට රහදිව නැහැ.

**ඩැනියෙල් මයා.**
*(திரு. டனியல்)*
(Mr. Daniel)

රහදිව හංගලා නෙ, මුදල් ඇමතිතුමා වැඩ කරලා තියෙන්නේ. මේ අයට රහදිව තේරෙන්නේ ලබන අවුරුද්ද වන විටයි. දැන්ම තේරෙන්නෙ නැහැ. ගරු සභාපතිතුමනි, පසුගිය ආණ්ඩුවේ මුදල් ඇමති පට්ටම් දැරූ අය අද පරාජය වී විරුද්ධ පක්ෂයට පැමිණ ඒ අයම කලින් ඉදිරිපත් කළ අයවැය ලේඛන හා සමාන අයවැය ලේඛන අද විවේචනය කිරීම ගැන මා කණගාටු වෙනවා. කලින් ආණ්ඩුව පැත්තේ සිට, මහා මැතිවරණයකින් ලැබුණු ප්‍රතිඵල අනුව විරුද්ධ පැත්තට එන්නට සිදු වුණු ගරු මන්ත්‍රීවරුන්ට, අලුතෙන් පත් වුණු ආණ්ඩුව විසින් ඉදිරිපත් කරනු ලබන අයවැය ලේඛනවල නොයෙකුත් වැරදි පේනවා. එක පැත්තක සිට අනෙක් පැත්තට ගිය පමණින් වැරදි පේනවා. මොනවා හෝ කියමින් මහජනයා මුළා කරන සමහරුන් නිසා වේදිකාවලට පවා නැඟ කරුණු පැහැදිලි කර දෙන්නට අපට සිදු වෙනවා. මේ වර ඉදිරිපත් කර තිබෙන්නේ මේ මේ විධියේ ප්‍රතිඵල ගෙන දෙන අයවැය ලේඛනයක් යයි වේදිකාවලට නැඟ මහජනයාට කියා දීමට පවා අපට සිදු වී තිබෙන්නේ විරුඬ පාර්ශ්වයේ අය මහජනයා මුළා කිරීමට වැඩ කරන නිසයි.

මේ වර ඉදිරිපත් කර තිබෙන්නේ වට්ටෝරු අයවැය ලේඛනයක් යයි කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) ප්‍රකාශ කළා. ඉස්සර නම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩැනියෙල් මයා.]
වට්ටෝරු වෙදකම තිබුණා. එහෙත් ආයුර් වේද වෛද්‍ය ක්‍රමය දියුණු වෙමින් යන මේ කාලයේ වට්ටෝරු ක්‍රමය අහෝසි වෙමින් පවතිනවා. අද රසායනික ක්‍රමයට සකස් කරන ලද බෙහෙත් දෙනවා මිස බෙහෙත් වට්ටෝරු දෙන්නේ නැහැ. කෙසේ වෙතත්, ඒ ගරු මන්ත්‍රීතුමාට අපේ ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය ලේඛනය වට්ටෝරුවක් හැටියට පෙනී තිබෙනවා. ගරු මුදල් ඇමතිතුමා තම දක්ෂතා මනා ලෙස පෙන්වමින් මේ වර අයවැය ලේඛනය සකස් කර තිබෙන බව කියන අතරම, අප වැනි පසුපස ආසන වල සිටින මන්ත්‍රීවරුන්ට මෙම විවාදයට සහභාගී වීමට අවස්ථාව සලසා දීම ගැන ගරු නියෝජ්‍ය සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින්ද, 1967-68 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනය හේතුකොට ගෙන මේ රට දියුණුවෙන් දියුණුවට පත් වේවායි ප්‍රාර්ථනා කරමින්ද, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 7.17

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**

*(திரு. ஹேமச்சந்திர சிரிசேன)*

(Mr. Hemachandra Sirisena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සෑහෙන කාලයකට පසුව මෙම ගරු සභාවට පැමිණි මට මේ වර ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනය ගැන අදහස් සවල්පයක් ඉදිරි පත් කරන්නට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. මගේ කථාව ආරම්භ කරන්නට මත්තෙන් එක්තරා කාරණයක් ගැන කියන්නට ඕනෑ. මේ රටේ සමහරුන් දිනපතාම බැරි වුණත් සතියකට හමාරකට වරක්, මාසයකට හමාරකට වරක්, මෙම ගරු සභාවේ ගැලරියට පැමිණ විවාදවලට කන් දෙන්නට උනන්දුවක් දක්වනවා. මේ වර මෙම අයවැය ලේඛනය පිළිබඳ විවාදයට සවන් දීම පිණිස පැමිණි උදවියට ලොකු කනගාටුවක් ඇති වුණාට සැකයක් නැහැ. "අහෝ! මෙවැනි වැදගත් විවාදය කදී තමන් විසින් පත්කර එවන ලද ගරු මන්ත්‍රීවරුන්ට මෙම ගරු සභාවට පැමි ණෙන්නට බැරි ඇයි? ඒ අයට මෙම විවාද යට සහභාගි වන්නට බැරි ඇයි? නගනු ලබන ප්‍රශ්නවලට නිසි පිළිතුරු දීම සඳහා ඒ අය නොපැමිණෙන්නේ ඇයි, යනු වෙන් සිතෙන ඒ පිරිසට, තම නියෝජිත යන් කෙරෙහි සාධාරණ කෝපයක් ඇති වෙතැයිද මා කල්පනා කරනවා. සමහර ගරු මන්ත්‍රීවරුන් නගන ප්‍රශ්නවලට පිළි තුරු නොලැබෙන විට ගැලරියේ සිටින සම හර උදවියට, "ගැලරියේ සිට සභාවට පැන උත්තර දෙන්නට පුළුවන් නම්" යනු වෙන්ද සිතෙනවා ඇති. මා එසේ කියන්නේ නිසි විවාදයට නිසි තර්ක, නිසි ප්‍රශ්නයට නිසි පිළිතුරු සපයන්නේ නැති ව ගමේ ගොඩේ ගම්මැදිහැලිවලට පිළිතුරු දෙන්නාක් මෙන් මෙතන නගනු ලබන ප්‍රශ්නත් දෙනු ලබන පිළිතුරුත් දෙස බලන විට මට කණගාටුවක් ඇති වෙන නිසයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ සිටින ඡන්දදායකයා ඉතාමත්ම දියුණු දේශපාලනඥයෙක් බව මගේ අත්දැකීම් වලින් මට පෙනීගොස් තිබෙනවා. මේ රටේ පාලනය බාරගෙන සිටින ගරු මැති ඇමතිවරුන්ටත් වඩා දේශපාලනය පිළිබඳ හොඳ අවබෝධයක් ඇති අය ගමේ ගොඩේ සිටින බව ඔවුන් ඉදිරිපත් කරන තර්ක හා ඔවුන්ගේ විවේචන අනුව බලන විට මට පෙනී යනවා. ඡන්දදායකයා දැන් මෙන්න මේ විධියට හිතෙනවා ඇති. "හොඳයි අපට වැරදුණා. අවසථාව පැමිණියාම බලමු. උඹල මෙතැනට එව්වේ ඔය විධියේ ප්‍රකාශ කරන්න නොවෙයි, මේ රට දියුණු කිරීමටත් ඒ සඳහා සුදුසු මාර්ග සකස් කිරීමටත් මෙතනට එව්වේ. එහෙත් අපේ මන්ත්‍රීවරුන් ආසනවලවත් නැහැ. බයේ පැනගිහින්" යනාදී වශයෙන් හිත නවා ඇති. ඒ සම්බන්ධව ඡන්දදායකයා තුළ සාධාරණ කෝපයක් ඇති වී තිබෙන බව කියන්නට පුළුවින්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අයවැය ලේඛනය ගැන යමක් කියන්නට කලින් හේවාහැට මන්ත්‍රීතුමාට (ඩැනියෙල් මයා.) පිළිතුරක් දෙන්නට මා අදහස් කරනවා. පිළිතුරුවලට කාලය ගත කළොත් අයවැය ලේඛනය ගැන යමක් කියන්නට කාලය මදි වේ යයි මා හිතනවා. ඒ නිසා තමුන් නාන්සේගේ සැලකිල්ල මා කෙරෙහි යොමු කර මට වැඩි වේලාවක් දෙනවා ඇත කියා මා බලාපොරොත්තු වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හේවාහැට මන්ත්‍රීතුමා කථාව ආරම්භ කරන විටම තුම්පනේ බණ්ඩාගේ නම ඉදිරිපත් කර කිසියම් ප්‍රකාශයක් කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජාතිකයයි කියා ගන්නා මේ රජයේ ජීවනාළිය රඳා පවතින්නේ තුම්පනේ බණ්ඩාගේ වැදගත් ආර්ථික ප්‍රතිපත්තිමාලාව උඩ බව මා නිර්භයව ප්‍රකාශ කරන්න ඕනෑ. එය වැරදි නම් තුම්පනේ බණ්ඩාගේ සමාජවාදී ප්‍රතිපත්තිය උඩ සකස් කළ මේ රටේ ආර්ථික වැඩ පිළිවෙළ වෙනස් නොකරන්නේ ඇයි කියා මා අහනවා. ඒ ප්‍රතිපත්තිය වැරදි නම් මේ රජයට තිබෙන අනූ ගණනක් වූ ඡන්ද බලය උඩ ඒ ප්‍රතිපත්ති වෙනස් කර ධනේශ්වර ක්‍රමයේ ආර්ථික සැලැස්මක් ඇති නොකරන්නේ ඇයි කියා මා අහනවා. කථා කරන්නට දෙයක් නැතිව තම ප්‍රති විරුද්ධවාදියාගේ වැරදි පෙන්වා ඒ අස්සෙන් ඉහළට යන්නට බලාපොරොත්තු වුවත් ඡන්දදායකයා ඒ අන්දමට අදහස් කරන්නේ නැහැ. අවස්ථාවක් ලැබුණු විට ඡන්දදායකයා නිසි පියවර ගන්නවා ඇති.

මගේ මිත්‍ර, ඉතා හිතවත් එමෙන්ම කුළුපග අපේ සමාජසේවා ඇමතිතුමා ප්‍රශ්නයක් නගමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පරාජයට හේතු අපෙන් අසා එයට පිළිතුරු අපෙන් ලැබෙන්නට කලින් එතුමාම පිළිතුරත් දුන්නා. එතුමාගේ පිළිතුර වූයේ තුන් හවුල පිහිටුවීමේ විපාක වශයෙන් කලින් තිබුණු ඒ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව පරාජය වුණාය කියන එකයි. එහෙත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජය පරාජය වීමට හේතුව ඒක නොවෙයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැර තුන් හවුලට සම්බන්ධ අනික් පක්ෂ දෙකින් ඉදිරිපත් කළ අපේක්ෂකයින් කී දෙනෙක් පරාජය වුණාද කියා බලන්න. ඒ පක්ෂ දෙකින් ඉදිරිපත් කළ සියළු දෙනාම වාගේ ජයග්‍රහණය කළා. තුන් හවුලට මහජනතාව විරුද්ධ නම් ඒ පක්ෂ දෙකිනුත් සැහෙන පිරිසක් පරාජයට පත් වන්නට ඕනෑ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජය පරාජය වන්නට හේතුව මේ ගරු සභාවේ දී විග්‍රහ වුණේ නැත කියා මා හිතනවා. ඒ ආණ්ඩුව පරාජයවීමට හේතුව මේකයි: මේ රටේ දේශපාලන පක්ෂ අනුගමනය කරන කොටස් දෙකක් සිටිනවා. ප්‍රගතිශීලි හෝ වාමාංශික හෝ කොමියුනිස්ට් සමසමාජ හෝ ශ්‍රී ලංකා හෝ ආදී වශයෙන් ප්‍රගතිශීලී ප්‍රතිපත්ති අනුගමනය කරන කොටසකුත්, අධිරාජ්‍යවාදී රදළ ධනේශ්වර ක්‍රමය අනුගමනය කරන තවත් කොටසකුත් වශයෙන් කොටස් දෙකක් සිටිනවා. මේ පක්ෂ දෙක අතර දේශපාලන අවබෝධයක් නැති මධ්‍යස්ථ පිරිසකුත් සිටිනවා. ඒ කොටසට දේශපාලන අවබෝධයකුත් නැහැ; ආර්ථික සංවර්ධන සැලැස්මක් පිළිබඳ අවබෝධයකුත් නැහැ; උසස් අධ්‍යාපනයකුත් නැහැ. ඒ කොටස එදිනෙදා රක්ෂාව කරමින් දුකසේ ජීවත් වන කොටසක්. ඒ උදවියගෙන් වැඩි දෙනා 1956 සිට 1960 දක්වා කාලය තුළ වාමාංශික ප්‍රගතිශීලී පක්ෂවලට සිය ඡන්දය පරිත්‍යාග කරන්නට යෙදුණා. ඔවුන් එසේ කළේ තමන්ගේ දියුණුවත් සැප පහසුවත් ආර්ථික ලාභයත් තහවුරු කර ගැනීමේ මූලික පරමාර්ථය ඇතුවයි. ඇතැම් විට ධනේශ්වර එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද අපේක්ෂකයන්ගෙන් ලැබෙන ගණුදෙනු පවා සිය සාක්කුවට දමා ගනිමින් වාමාංශික පක්ෂවලට සිය ඡන්දය දුන්නා. එහෙත් ඒ උදවියට නියම දේශපාලන අවබෝධයක් ඇත්තේ නැහැ. ඔවුන් එසේ ඡන්දය පාවිච්චි කිරීමෙන් ඇති කරගෙන තිබුණු බලාපොරොත්තු එපරිද්දෙන්ම ඉටු වන පිළිවෙලක් දකින්නට ඔවුන්ට පුළුවන්කමක් ලැබුණේ නැහැ. එම නිසා ඔවුන් සැහෙන පමණකින් කලකිරීමකට පත්ව සිටියා. ඒ අතරම පස්සා පැත්තෙන් වැදුණු පිහියා පහරවල් නිසා හෝ වේවා වෙන දේවල් නිසා හෝ වේවා කෙසේ නමුත් ඊළඟ මැතිවරණය පැමිණුනා. එම ඡන්දය එන විට පස්සා පැත්තෙන් පැමිණි පිහියා පහරත් සමග පැත්තකට කඩාගෙන ගිය කොටසක්ද සිටියා. ඒ කොටස එසේ පැත්තකට කඩාගෙන යාමට හේතුව කුමක්දැයි පැහැදිලි කර දෙන්නට මා කැමතියි. ඊළඟ මැතිවරණයේ ප්‍රතිඵලවලට අනුව තුන් හවුල බලයට පත් වුණොත්, "ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇතැම් ඇමතිවරුන්ට තිබුණු බලතලවලින් වැඩි කොටසක් ලංකා සමසමාජ පක්ෂයටත් කොමියුනිස්ට් පක්ෂයටත් යන්නට පුළුවනි. එවිට අපේ බලය අඩු වෙනවා ඇති" කියන හැඟීම ඒ උදවියට තිබුණා. බල කෑදරකමින් පෙළුණු ඒ උදවිය එවැනි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[හේමචන්ද්‍ර සිරිසේන මයා.]

පෙරළියක් ඇති වුවහොත් තම තමන්ගේ බලය තව දුරටත් තහවුරු කරගෙන සිටින්නට හැකි නොවේය යන සැකය පිට බියට පත්ව සිටියා. යම් හෙයකින් මෙම බලය ඒ උදවිය අතට ගියොත් අප විසින් කරන ලද දූෂණ සියල්ල එළිවීම හේතු කොටගෙන අපව මේ රටින් තුරන් කරන තත්ත්වයකට පවා පත් වේවිය කියන බිය ඔවුන් තුළ පැවතුනා. එම නිසා ආණ්ඩු බලය නැවත තමන්ටම තහවුරු කර ගැනීමට කරන ලද උත්සාහයක් වශයෙන් තමයි, ඒ උදවිය එවකට තිබුණු විරුද්ධ පාර්ශ්වයට ගොස් මැතිවරණයකට මුහුණ දුන්නේ. එම මැතිවරණයේදී තෙල් කොම්පැනිකාරයනුත් ඉන්ෂුවරන්ස් කොම්පැනිකාරයනුත් 1958 වන තුරු බස්සමාගම් හිමිව සිටි බස් මුදලාලිලාත් වරාය කොන්ත්‍රාත්කරුවනුත් පාඨශාලා ඒකාධිකාරය පවත්වාගෙන ගිය පුද්ගලයනුත් ගම්මුලාදැනිනුත් යනාදි වශයෙන් නම් කළ හැකි, ආර්ථික තත්ත්වයෙන් තම බලය තහවුරු කර ගෙන සිටි හුඟ දෙනෙක්, එක් පැත්තක් ගෙන කටයුතු කරන්නට යෙදුණා. මේ රටේ බලය තහවුරු කර ගෙන සිටි විදේශීය ධනපතියන් හුඟ දෙනකුට ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවේ ඉලංගරත්න මැතිතුමාගේ ප්‍රතිපත්තිවලට අනුව පහර වැදීගෙන ගියා. එසේ පහර වැදීගෙන යන විට යට කියන ලද උදවිය ඇතුළත්ව ඔවුන් සියලු දෙනාම එකා මෙන් නැගී සිට කටයුතු කරන්නට පටන් ගත්තා. එවැනි නොයෙකුත් කොටස් එකතු වී දේශපාලන අවබෝධයෙන් තොරව කටයුතු කරන උදවිය ඉදිරියෙහි පෙනී සිට කියා සිටියා, "උඹලා මෙපමණ කාලයක් තිස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඡන්දය දුන්නා; ඒ ආණ්ඩුව තිබුණු කාලයේදී ක්‍රමක්‍රමයෙන් බඩු මිල වැඩි වුණා; රැකීරක්ෂා ප්‍රශ්නය උග්‍ර වුණා; රටේ ආර්ථික තත්ත්වය පිරිහුණා; උඹලාට යහපතක් වුණේ නැහැ; අපි ආණ්ඩු කළ කාලයේ මේ රටේ ඕනෑ තරම් දේ තිබුණා; ඕනෑ තරම් අල තිබුණා; ඕනෑ තරම් රෙදිපිළි තිබුණා; ඕනෑ තරම් මෝටර් රථ යනාදිය මිලයට ගතහැකිව තිබුණා; මේ විධියට නොයෙකුත් සැප පහසුකම් තිබුණා; බඩු මිල පවා අඩු වුණා; අප බලය ඉල්ලන්නේ එම තත්ත්වය නැවත ඇති කර දෙන්නටයි" යනුවෙන්.

ජාත්‍යන්තර වශයෙන් දේශපාලන අවබෝධයක් තියෙනවා තබා තමන්ගේ පවුල්වල ආදායම් තත්ත්වයවත් මැන ගන්නට බැරි අර අන්දමේ ඇතැම් දෙනා ඒ අනුව සිතන්නට පටන් ගත්තා. "ඇත්ත තමයි මේ කථාව; හැමදාම මේ වැඩේ කරන්න බැහැ; මේ අයට ඡන්දය දී බලමු" කියා ඔවුන් එකතු වෙලා ඒ විදියට කටයුතු කළා. නමුත් ඒ අය දැන් "අනේ අපට වෙච්ච දේ" කියමින් පසුතැවිලි වෙනවා. බස් කොම්පැනිකාරයන්, තෙල් කොම්පැනිකාරයන්, පාඨශාලා අධිකාරය පවත්වාගෙන ගිය තැනැත්තන්, ගම්මුලාදැනීන් යනාදී වශයෙන් මා මුලින් සඳහන් කළ අය මෙමු රජයට පක්ෂපාතීකම් දැක්වූ නමුත්, දැන් පසුතැවිලි වෙන බව පෙනෙනවා. බස් ව්‍යාපාරය ආපසු ලබා ගන්න බලාපොරොත්තුවෙන් සමහර අය උදව් කළා. පාඨශාලා ආපසු ලබා ගන්න බලාපොරොත්තුවෙන් සමහර අය උදව් කළා. ඉන්ෂුවරන්ස් සමාගම් ආපසු ලබා ගන්න බලාපොරොත්තුවෙන් සමහර අය උදව් කළා. තෙල් කොම්පැනි ආපසු ලබා ගන්න බලාපොරොත්තුවෙන් සමහර අය උදව් කළා. දැන් බලන විට ඒවා කෙරෙන්නෙ නැහැ. ඒ උදවිය දැන් බලා සිටිනවා, අපි බැටේ දෙමුය කියමින්. ඒ විධියේ මතයක් මේ රටේ ඡන්දදායකයන් තුළ පවතින බවට රහසක් නැති බව තමුන්නාන්සේ ඉදිරියෙහි ප්‍රකාශ කරන්නට මා කැමතියි. එදා පරාජයට හේතුව ඔවැනි තත්ත්වයක් ඇති වීමයි. හාමුදුරුවරුත් ආවා, කුඹුරු ටික ආරක්ෂා කර ගන්න; කුඹුරු පනත වෙනස් කර ගන්න. වෙන කිසි කරුණක් නිසා නොවෙයි, එවැනි නොයෙකුත් කාරණා උඩයි ආවේ.

අයවැය ලේඛනය පිළිබඳව මා ඉතා කෙටියෙන් කරුණු සඳහන් කරන්න මීළඟට කල්පනා කරනවා. මේ රට ආර්ථික අතින් පහත වැටෙනවාය කියන කියමන අද ඊයේ පටන්ගත් කියමනක් නොවෙයි. රාජ්‍ය මන්ත්‍රණ සභා කාලයේදීත් ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභා කාලයේදීත් ඩොනෝමෝර් ආණ්ඩු කාලයේදීත් සෝල්බරි ආණ්ඩු කාලයේදීත් ඔය කථාව කිව්වා. මහජන එකසත් පෙරමුණ ආණ්ඩු කළ කාලයේදීත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව තියෙද්දීත් කිව්වේ ඔය කථාවමයි. අදත් ඒකම කියනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එහෙම නම්, තව තවත් ඔය තත්ත්වය අමාරු වෙනවා මිස නගා සිටුවන්නට මේ විධියට නම් පුළුවන් වන්නේ නැහැ. අය වැය ලේඛන සකස් කරන්නේ මුදල් ඇමතිවරුන් නොවෙයි. දෙපාර්තමේන්තුවල නිළධාරීනුයි එය කරන්නේ. එහෙත් අය වැයක් සකස් කිරීම පිළිබඳව දක්ෂතාවක් මුදල් ඇමති වරයාටත් තිබිය යුතුයි. සිරිතක් වශයෙන් කෙරෙන්නේ දෙපාතීමේන්තුවල නිළධාරීන් සකස් කර දෙන සැලැස්ම කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා කොට මේ සභාවට ඉදිරිපත් කිරීමයි.

අය වැය හිඟයක් හැමදාමත් ඇති වෙනවා. වැඩි වන ජන ගහනයේ ප්‍රශ්න විසඳීම සඳහාත් රජයේ නොයෙක් කාර්යාංශවලට වුවමනා කරන ලිපිකරුවන් ආදී නිළධාරීන් බඳවා ගැනීම වැනි කටයුතු සඳහාත් විශාල වියදමක් යන නිසා අය වැය හිඟකම් හැමදාමත් ඇති වෙනවා. මේ රටේ නිපදවෙන ද්‍රව්‍ය විකුණා ගන්නට බැරි වීම නිසා රටේ ආදායම පහළ යාමත් වියදම් වැඩි වීමත් නිසා මෙවැනි තත්ත්වයක් ඇති වෙනවා. එසේ වූ විට අය වැය හිඟය පියවා ගැනීමට හිඟමනේ යාම අද ඊයේ සිට පමණක් කෙරෙන වැඩක් නොවෙයි. මේ රටේ දේශපාලන ඉතිහාසයේ හැමදාමත් එය කෙරුණා. ඒ ගැන මේ පැත්තට හෝ ඒ පැත්තට හෝ චෝදනා කිරීමෙන් ප්‍රයෝජනයක් අත්වන්නේ නැහැ. අප පමණක් නොව ආර්ථික තත්ත්වය හීන රටවල් කවදාත් දියුණු රටවලින් ආධාර ලබා ගන්නවා. එහෙත් හැම් දාමත් ඒ විධියට උදවු ලබා ගන්නට ගිය විට අපට සිදු වන්නේ හැම ප්‍රශ්නයකදීම ඒ රටවලට බැගෑපත්වී යටත් වී අපේ කට වසාගෙන සිටීමටයි. කිසියම් ජාත්‍යන්තර ප්‍රශ්නයකදී අපට අපගේ අදහස් කෙළින් ප්‍රකාශ කරන්නට බැරි වෙනවා. විදේශ ආධාර නැතිව රටක් ගෙනයන්නට නම් අප වෙහෙස මහන්සි වී වැඩ කරන්නට ඕනෑ. අප තුළ අවංක ජාත්‍යාලයක් ඇති වන්නට ඕනෑ.

අය වැය හිඟය පිරිමසා ගන්නට ජනතාව පිට බදු බර පැටවීම මුදල් ඇමතිවරයකුගේ දක්ෂකමක් නොවෙයි. ජනතාව පිට බදු බර පටවන්නට පටවන්නට රටේ ආර්ථික තත්ත්වය බහිනවා. ඉදිරි වර්ෂයේ ආදායම් හා වියදම් ලැයිස්තුව සකස් කරන විට හිඟ පිරිමසා ගන්නට ණය මුදල් ගැනීම ගමේ ගොඩේ පොඩි කඩයක සිල්ලර වෙළෙන්දකුගේවත් සිරිතක් නොවෙයි. ආදායම් උපදවිය හැකි ලාභ උපදවිය හැකි කර්මාන්තයක් හෝ වෙළෙඳාමක් හෝ ආරම්භ කිරීමට වුවමනා කරන අරමුදල වැඩි කර ගැනීමට නම් සමහරුන් ණය මුදල් ගන්නවා. ඒ ණය මුදල්, අදහස් කරන ලද ව්‍යාපාරවල යොදවා එයින් ලාභ උපදවා, ගත් ණය මුදල ගෙවන්නට කට යුතු කරනවා මිස හිඟ පිරිමසා ගන්නට නම් ගම්බද සිල්ලර වෙළෙන්දෙක්වත් ණය ගන්නේ නැහැ. අය වැය සකස් කිරීම සම්බන්ධයෙන් ගමේ කඩේක සිල්ලර වෙළෙන්දකුට තිබෙන තරම්වත් දක්ෂකමක් මේ රටේ සිටි එකම මුදල් ඇමති වරයකුටවත් නොතිබුණු බව මා ප්‍රකාශ කරනවා. රටේ නොයෙක් නොයෙක් අංශ පිළිබඳව කාරණාකාරණා දන්න අයට ආණ්ඩුවල ඇමතිකම් නොලැබීමයි මීට හේතුව.

රටක වෙළෙඳ ඇමති විය යුත්තේ වෙළෙදාම ගැන අවබෝධයක් ඇති කෙනකු මිස නිකම්ම මහේශාක්‍ය පුද්ගලයෙක් නොවෙයි. ජේවිමන්ට් එකේ කඩල විකුණා බලත් විට සුරුට්ටු සිගරට් විකුණා ක්‍රම ක්‍රමයෙන් දියුණු වේගෙන ගොස් උසස් තත්ත්වයකට පැමිණ වෙළෙඳාම ගැන ලැබූ අත්දැකීම් ඇති කෙනකුටයි වෙළෙඳ ඇමතිකම දෙන්නට ඕනෑ. ඒවාගේම රටක සෞඛ්‍ය ඇමති වන්නට ඕනෑ, මුලදී බොහොම දුකසේ වෙදකමෙහි යෙදී රෝගීන් ගැනත් බෙත්හේත් ගැනත් හොඳ දැනීමක් අවබෝධයක් ලබා ක්‍රම යෙන් ජනප්‍රිය වී ගිය කෙනකුයි. සෞඛ්‍ය අංශය සම්බන්ධයෙන් සෑහෙන සැලැස්මක් වත් ඉදිරිපත් කරන්නට පුළුවන් වන්නේ එවැනි කෙනකුට පමණයි. රටක කෘෂිකර්ම ඇමති විය යුත්තේ ගොවිතැන හොඳට දන්න කෙනෙක්. මේ රටේ මෙතෙක් කෘෂි කර්ම ඇමතිකම් කළ එක්කෙනකුටවත් උදැල්ලක් අල්ලා නියරක් හගින්නවත් ලියද්දක් කොටන්නවත් නියරක් බඳින්නවත් බැහැ. දැකත්ත හරියට අල්ලා ගොයම් මිටක් කපන්නට බැහැ. කොළ පාගන තැනකට ගිහින් දැති ගොයියාව අල්ලා පිදුරු අහුරක් ඉවත් කරන්නට බැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[හේමචන්ද්‍ර සිරිසේන මයා.]

බෑත ටිකක් එකතු කරන්නට බැහැ. කෘෂි කර්ම නිළධාරීන්ගේ තත්ත්වය මොකක්ද ? ඒත් ඒ වාගේමයි. ගොවිතැන් කටයුතු සඳහා ගොවීන්ට උපදෙස් දෙන්නට යන මේ නිල ධාරීන් කුඹුරට බහින්නේ දනහිස දක්වා සපත්තුවක් දාගෙන. ඔවුන් කවදාවත් උදැල්ලක් අල්ලා නැහැ. පොතෙන් ලබා ගත් අධ්‍යාපනයෙන් කෘෂිකර්මය දියුණු කරන්ට පුළුවන්කමක් නැහැ. කුඩා කාලයේ සිට ගොවිතැන වෙනුවෙන් වෙහෙසී වැඩ කළ පුද්ගලයන්ටයි කෘෂිකර් මය දියුණු කරන්ට පුළුවන්කම තිබෙන් නෙ. ඒ විධියේ පුද්ගලයෙක් කෘෂිකර්ම ඇමති හැටියට පත් වුණු දාටයි, මේ රටේ කෘෂිකර්මය දියුණු වෙන්නෙ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රුපියල් දහය සහ රුපියල් විස්ස බැගින් සමහරුන් ගේ පඩි වැඩි කර තිබෙනව. මේ පඩි වැඩි කිරීමක් නොවෙයි; මිනිසුන් රුවටීමක්. මම ඒක ඔප්පු කරනව. "ඔප්පු කරන්න; ඔප්පු කරන්න" කියා සමාජ සේවා ඇමතිතුමා කියනවනෙ. මම ඔප්පු කරනව. සිගරට් එකෙන්, වෙනත් බඩු මුට්ටු වලින් මිළ මේ අයවැය ලේඛනය මගින් වැඩි කිරීමෙන් මේ මුදලින් කීයක් ආපසු ගත්තද ? මේ විධියට රට රවටන්න පුළු වන්කමක් නැහැ.

හාල් නිකම් දෙනව කිව්ව. ඔව්, ඇත්ත. තමුන්නාන්සේලා හාල් සේරුවකට සත 60 ක් අය කරනව. නිකම් දෙන්නෙ නැහැ. මේක ඔප්පු කරන්ට මට පුළුවන්. කූපන් වලට පිටස්තරව හාල් සේරුවක් 1.20 යි. එක සේරුවක් නිකම් ලබෙනව. අනික ගන්ට 1. 20 ක් වියදම් වෙනව. එතකොට සේරුවක් සත 60 ක් වුණේ නැද්ද කියා මම අහනව, සමාජ සේවා ඇමතිතුමා ගෙන්. උත්තර දෙන්න. හාල් සේරුවක් සත 60 ක් වුනේ නැද්ද ? උත්තර නැහැ.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**

*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*

(The Hon. N. H. A. M. Karunaratne)

අපි දෙන්නෙ නිකම්.

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**

*(திரு. ஹேமச்சந்திர சிறிசேன)*

(Mr. Hemachandra Sirisena)

නිකම් ප්‍රශ්නයක් නැහැ. තමුන්නාන් සේලා හාල් සේරුව සත 60 ක් කෙරුව. හාල් සේරුව අඩු කරල කලින් විතාවෙ වගේ බඩේ අමාරුව හැදෙයි, දොට්ට යන්ට වෙයි කියල හදිසි නීතිය දැම්ම. මේ ගණන් මිනුම්, සංඛ්‍යා ලේඛන වශයෙන් හදා ඉදිරි පත් කරන්නෙ මන්ත්‍රීවරුන් නොවෙයි; ගම්බද ගොවි කම්කරු ජනතාවයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආකාරයට දේශපාලනය කරන්ට පුළුවන් කමක් නැහැ. මට දැන් වයස අවුරුදු 54ක් විතර වෙන්ට ආව, මේ ප්‍රජාතන්ත්‍රවාදය මොන විධියට ක්‍රියාත්මක කරන ප්‍රජා තන්ත්‍රවාදයක්ද කියන එක තවම මට තේරුම් ගන්ට බැරි වුණා. මම ප්‍රජාතන්ත්‍ර වාදය සොයා ගත්ත. ඒ මේ රටේ ප්‍රජා තන්ත්‍රවාදය නොවෙයි. ලෝකයේ රටවල් 17 ක සංචාරය කිරීමෙන් නියම ප්‍රජාතන්ත්‍ර වාදය මම සොයා ගත්ත. ඒ ප්‍රජාතන්ත්‍ර වාදය නොවෙයි මෙහෙ ක්‍රියාත්මක කරන්නෙ. මෙහෙ ප්‍රජාතන්ත්‍රවාදය ගැන මම කියල දෙන්නම්. ටිකක් හොඳින් අහ ගෙන ඉන්න. තමන්ගේ පක්ෂය බලයට පත් කරන්ට විශාල ධනස්කන්ධයක් වැය කළ පුද්ගලයන්ට උදව් කරන ප්‍රජා තන්ත්‍රවාදයක් තමයි, මෙහෙ තිබෙන්නෙ. තමන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශ යෙන් පත් කරන්ට ඡන්දය දුන් ආධාර කාරයින්ට උදව් කරන ප්‍රජාතන්ත්‍රවාදයක් තමයි, මේ රටේ තිබෙන්නෙ. මේ එක පක්ෂයකට පමණක් සීමා කරලා කරන කථාවක් නොවෙයි.

ඒ වගේම තවත් බොහොම භයානක ප්‍රජාතන්ත්‍රවාදයකුත් මේ රටේ තිබෙනව. ඒක ලෝකයේ වෙනත් කිසිම රටක නැති අන්දමේ එකක්. සමාජ සේවා ඇමතිතුමා හොඳින් ඇහුම්කන් දෙන්න මම ඒක කියල ඔප්පු කරන්නම්. ලෝකයේ ඕනෑම රටකින් ඕනෑම ජාතිකයෙක් මේ රටට ආවාම ඔහුට මේ රටේ පැලපදියම් වීමට, ඇබ්බැහිවීමට ඉඩ දීමත් මේ රටේ තිබෙන එක්තරා ප්‍රජාතන්ත්‍රවාදයක්. ඔහු මොන ආගමිකයකු වුණත් මේ රටේ ප්‍රජාතන්ත්‍ර වාදය අනුව ඔහුට බෞද්ධ කාන්තාවක්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

සමග විවාහ වන්ට ඉඩ තිබෙනව. ඔහුගේ ආගම, ඔහුගේ භාෂාව මේ රටේ ප්‍රචාරය කරන්ට ඉඩ තිබෙනව. ඒකද ප්‍රජාතන්ත්‍රවාදය? ඒ ප්‍රජාතන්ත්‍රවාදයෙන් අනාගතයේදී අපේ බාල පරම්පරාවට කොතරම් හානි ඇති වෙනවද? එබඳු පුද්ගලයින් මේ රටට ඇවිත් මේ රටේ වෙළඳ ව්‍යාපාරත්, මේ රටේ කර්මාන්ත ව්‍යාපාරත් අල්ලාගෙන ඒවා තහවුරු කරගෙන මේ රටේ පරම්පරාව ඔවුන්ගේ දාසයන් වශයෙන් පාවිච්චි කරනව. මේක ප්‍රජාතන්ත්‍රවාදයද? මේ විධියේ ප්‍රජාතන්ත්‍රවාදයකට ඉඩ දෙන රටවල් ලෝකයේ තවත් තිබෙනවද? මෙබඳු පුද්ගලයින් මා කලින් සඳහන් කළ අන්දමට තහවුරු කර ගත් වෙළඳ ව්‍යාපාරවලින් උපයා ගන්න විශාල ධනස්කන්ධය අනියම් මාර්ගවලින් ඔවුන්ගේ රටවලට යවනව. ඒක ප්‍රජාතන්ත්‍රවාදයද කියා මා අහනව. ඒ අන්දමට මේ රට අන්ත පරිහාණියකට පත් කරනව මදිවට තවත් පරම්පරාවකුත් මේ රටේ බෝ කරනව. ඒ පරම්පරාව ක්‍රම ක්‍රමයෙන් වැඩි වුණාම දේශපාලන අයිතිවාසිකම් පවා ඉල්ලනව. අපේ වර්ගයා වෙනුවෙන්, අපේ කණ්ඩායම වෙනුවෙන් අඩු ගණනේ පත් කරන ලද මන්ත්‍රීවරයකුවත් ඕනෑ යයි ඉල්ලනව. මේ රටේ තිබෙන්නෙ ඒ විධියේ ප්‍රජාතන්ත්‍රවාදයක්.

එපමණක් නොවෙයි, මේ රට ආර්ථික අතින් පරිහාණියට පත් වී බංකොළොත් ලැබූ විට ඔවුන් අහස්යානයෙන් ඔවුන්ගේ රටට ගොස් පැලපදියම් වෙනවා; අප අමාරුවේ වැටෙනවා. ඒ විධියට ඉඩ දීම ප්‍රජාතන්ත්‍රවාදයද? එපමණක්ද? යම් යම් විදේශීන් මේ රටට පැමිණ මේ රටේ වෙළෙඳ ව්‍යාපාර හා කර්මාන්ත සියල්ලක්ම අල්ලාගෙන මේ රටේ ධනය සූරා ගන්නවා පමණක් නොව, ඔවුන් මේ රටේ මැරුණ අවස්ථාවලදීවත් ඔවුන්ගේ මළකඳන් මෙහි වළලන්නේ නැහැ; ඒ මළකඳන් අහස් යානාවෙන් ඒ ඒ රට රටවලට ගෙනගොස් වැළලීමයි කරන්නේ. අන්න ඒ විධියේ ප්‍රජාතන්ත්‍රවාදයක් මේ රටේ තිබෙන්නේ.

ඔය විධියේ තත්ත්වයක් තිබෙනතුරු ඇමතිවරයකුට හොඳ සැලැස්මක් ඇති කිරීමටවත් මුදල් ඇමතිවරයකුට හොඳ අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීමටවත් පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. අද තිබෙන ඒ තත්ත්වය මග හැරෙන්නට අවස්ථාවක් පැමිණෙන තුරු මේ රටේ කිසිම දේශපාලනඥයකුට මේ රට ආහාරයෙන් ස්වයංපෝෂිත කරන්නට පුළුවන්කමක් නැහැ. ඇත්ත වශයෙන්ම බොරු කරන ආණ්ඩු ක්‍රමයක් මේ රටේ තිබෙන්නේ. මොනම පක්ෂයක්වත් නවම හරි හැටි ආණ්ඩු කිරීමක් කෙළේ නැහැ. සියලු දෙනාම මහජනයා රවටා මේ ස්ථානයට පැමිණ කථාවක් පවත්වා නම ප්‍රසිද්ධ කරවා ගැනීමට උත්සාහ කරනවා. ඒ කථාවෙන් තමන්ගේ පහත් හැඟීම් කොයි තරම් දුරට පැහැදිලි වුණත්, අද මහජනතාව පුරුදු වී සිටින්නේත් ඒ තත්ත්වයටමයි. එවැනි රටකයි අද අප ජීවත් වන්නේ. අනාගතය ගැන කල්පනා කර බලන විට ඉතාම භයානක තත්ත්වයක් පෙනෙන්නට තිබෙන මේ අවස්ථාවේදී මේ රටේ දැනට තිබෙන මේ ඊනියා ප්‍රජාතන්ත්‍රවාදය මේ රටට ගැළපෙන පරිදි සකස් කර මේ රටේ පුරවැසියන් වූ දෙමළ හෝ මුස්ලිම් හෝ සෑම දෙනකුටම එවැනි ප්‍රජාතන්ත්‍රවාදයක් තහවුරු කරන තුරු මේ රට දියුණු දියුණු කරන්න බැරි බව ප්‍රකාශ කරමින් එබඳු පියවරක් ගන්නා හැටියට සියලුම දේශපාලන නායකයින්ට අවවාද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 7.42

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

Mr. Deputy Chairman, after listening to a learned discourse on the principles of democracy by the hon. First Member for Akurana (Mr. Hemachandra Sirisena) I am beginning to wonder whether we are really having a democratic system of government in our own country.

The opinion has been expressed from time to time by leading politicians and also by no less a person than the late Mr. S. W. R. D. Bandaranaike, that the democratic system of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාසමානික්කම් මයා.]

government we are following, namely, the party system of government, is unsuited for our country. In fact, he even advocated that we should go back to the committee system of government which, in his opinion, was more suitable.

Following the same tradition and belief the hon. First Member for Akurana thought it fit to make his comments on the existing system of democratic government and democratic institutions that is functioning in this country. He spoke on how unsuited the party system is to the genius of the people of this country.

As a matter of fact, Sir, to a certain extent I do agree with him that the party system of government has not proved very satisfactory in the conditions obtaining in our own country. Now, the British system of government and their democratic process were evolved over centuries. They grew spontaneously, and were built upon tradition so that the true spirit of democracy prevails in that country. But where we have adapted that system *ad hoc* to the conditions obtaining in our country, we find that there is a great disparity between the true democracy as practised in the western world and the adopted democracy as practised in the eastern world.

This is the situation in Ceylon as well as in certain other countries in the east. Perhaps, quite a large number of countries in the east which have adopted the democratic system of government have found that it does not lend itself to solving the numerous problems that arise in those countries to the satisfaction of the people.

When the spirit of democracy is not followed in the administration under the so-called democratic processes, when democracy merely starts functioning not only by a count of heads but also by the power that can be exerted by dominant and powerful groups, then democracy really fails.

The hon. Member for Akurana was not far wrong when he said that the democratic process in this country has not been operating well. Since we gained independence we have had almost 20 years of government in this country. For the first ten years from 1947 the U. N. P. was ruling this country. During the second ten years from 1955 the Mahajana Eksath Peramuna and the S. L. F. P. ruled this country. We find in both administrations similar characteristics, similar patterns of management, and similar faults and follies. But in retrospect we find that the first period was a period of experiment of a new independence that was won, and the second period was a period of aggressive democracy that was practised in this country for the benefit of one group of people only.

You will thus see that in the matter of economic development of this country the first ten years was a period of experiment where government was conducted through a process of trial and error. In the second period when the late Mr. Bandaranaike was the Prime Minister and followed by Mrs. Bandaranaike, they sought to divert the energies of the people really from developing this country for the benefit of the people of this country to developing this country for the benefit of a section of the people of this country. That is why we find that during the ten-year regime of the M. E. P. and S. L. F. P. Governments this country suffered the most.

In the morning the hon. Member for Mirigama (Mrs. Obeyesekere) made a very brilliant speech. In her analysis she raised certain points which she was unable to explain. She was not able to give a cogent explanation as to why those conditions should still remain. You know, Sir, that in any country unless the energies of the people are directed towards a purpose and an objective or a set goal, the government of the country must necessarily fail. It necessarily has to falter in fulfilling the needs, aims and aspirations of the people of the country. So, unless the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

attention of the whole country is focussed towards the development of this country there can be no development.

During the M. E. P. and S. L. F. P. regimes one can say that the attention of the people, their energies and enthusiasm, were directed towards various spheres. They were dissipated into channels into which they should not have been directed. So that, with the country torn by communalism, racialism and discrimination of the highest order we failed to achieve the one objective that we should achieve, that is, the development of this country.

I am happy to be in the National Government today for one reason. I do not say that it is not making some of the mistakes that the M. E. P. and the S. L. F. P. Governments committed in the past ; that it is not committing the same blunders that other governments made in the past. I do not even go to the extent of saying that all the Ministers work with the purity of mind and purpose which they profess.

**වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාතන් (නල්ලූර්)**

*(டொக்டர் ஈ. எம். வி. நாகநாதன்—நல்லூர்)*

(Dr. E. M. V. Naganathan—Nallur)

What about the Hon. Minister of Education ?

**රාසමානික්කම් මයා.**

*(திரு. இராசமாணிக்கம்)*

(Mr. Rasamanickam)

So, the National Government has achieved one thing ; it has succeeded in directing the attention and the energies of the people, to the largest possible extent, to the development of this country, in taking away their minds from the communal, racial and other activities to which they were directed in the past. That is why we say that there is a semblance of improvement.

We have been told by the Hon. Prime Minister that paddy production in this country has increased, that all activities of internal production have shown an improvement, because we are seeking to direct our attention to the one common goal that we all hope to achieve, that is, not only self-sufficiency in our requirements of food but also development of our industries.

When there is strife, communalism and racialism in the country it is not only the minorities who get affected but also the majority. In fact, it is the majority that gets affected more than the minority. A Sinhalese friend of mine, who was the agent of a big company in Colombo, used to come on his periodical trips to the Eastern Province to sell his articles ; he complained to me that after the communal troubles in 1958 his business had gone down by about fifty per cent. That was so not only in his case but in every other case. Therefore I say that, if we really profess democracy and want to reap its benefits, then we must seek to practise it not only in proper spirit but also in the proper sense of it. While professing to practise democracy if we seek to keep down certain groups merely because they are a minority or give certain benefits to other groups because they are a majority, then we will fail in our objectives. That is the reason why the National Government has now shown a new path, a new ambition, to the people of this country. Without communal harmony, without communal unity and without the co-operation of everybody living in this country, it is impossible to achieve self-sufficiency in food or economic progress.

I shall now give you an example. The recent happenings in the Middle East have taught us one big lesson. Israel, which is about one-third the size of Ceylon, and with a population of almost one-fourth that of Ceylon, has been able to stand up against the power and strength of fourteen nations around it. This shows one thing : when a nation is united and determined it can generate sufficient power to achieve the objectives it sets before

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාසමාණික්කම් මයා.]

itself. If that country could have attained that position in a time of war, I see no reason why a country like ours, with all the resources that it has, with all the manpower and other assets available for development, cannot do so in a time of peace.

This Budget is one of the least controversial budgets of recent times. I have listened to over a dozen budget speeches ; I have listened to budget speeches which have created great controversies and pyrotechnics in this House. But I must say that this Budget is one which has created the least amount of controversy. I think the hon. First Member for Akurana (Mr. Hemachandra Sirisena) said on the Floor of this House that normally when there is a controversy over a budget, when the people disapprove of the proposals contained therein, there is bound to be agitation not only in this House but in the country as well and that various institutions in the country will not only condemn such a budget but even hold public meetings against it. This is one of those rare occasions where no such thing has happened and it is an indication that the budget proposals have not affected the people of the country adversely.

The hon. Fair Member for Mirigama (Mrs. J. P. Obeyesekere) complained bitterly this morning about the shortage of many things including milk foods. I believe she referred to the shortage of imported milk foods. I would suggest to the Fair Member to take the very same keen interest that she takes in the weaving industry and in the prevention and cure of cancer in this country to persuade the people to rear more cows and also imbibe in them the habit of drinking more and more fresh milk. In rural areas like ours the need for imported powdered milk is not so great because the rural mother believes in breast-feeding her children rather than in giving artificial milk, but the sophisticated town mother looks for artificial milk to feed her children. I would once again ask the Fair Member to conduct a propaganda campaign to induce the people to drink more and more fresh milk and to rear more cattle in this country rather than depend on imported milk because to import these milk foods we have to expend foreign exchange.

There was another matter that she raised which provoked a remark from me. She said that there was a large-scale smuggling of milk foods and other articles out of Ceylon. She appealed to the Federal Party to try and prevent it. I think it is a myth that is going round not only in Parliament but in the whole country that the smuggling operations in this country are being carried on along the coasts in the North and certain portions of the East, and that the people of the Northern and Eastern Provinces are carrying on these smuggling operations. I come from the Eastern Province and I must here and now explode the myth that smuggling as a business is being carried on by the people of these two areas under any patronage of the Federal Party.

We are as much concerned as other hon. Members in this House about the smuggling of goods from this country to any country outside and the illicit imigration in this country. We are most concerned about it and we have up to now lent our support to all officers and the Government in eliminating this menace. But to say or even suggest that it does happen with the knowledge of our party is a monstrous untruth.

I must say that smugglers—gem smugglers and others—who are in the rest of the country, in Colombo and other places, make use of the outskirt of the Eastern and Northern Province to carry on their nefarious activities and operations. It is not confined to people from any section of the country. The groups or types of people who are carrying on these operations are found all over this country. The groups or types of the Eastern Province man but men all over the country—with no racial distinction—all groups of people, who are carrying on this business. It should be our effort, irrespective of caste or community, to see that these

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

activities are checked instead of carrying on a myth that the Jaffna man or the Trincomalee man or the Mannar man is doing smuggling. It is not so. Some of them may be used as instruments in the trade, but it is being practised and propagated by people all over the country, including many Sinhalese *mudalalis.*

The agricultural development of this country is much in the forefront and I should say a few words about it. The Ten-Year Plan, the Five-Year Plan, the Three-Year Implementation Plan, all these plans have failed because the sucesss of any agricultural plan depends on the uncertainties of cultivation. Where the processes of cultivation depend on the uncertainties of the weather the success of any plan cannot be expected with any degree of certainty. In fact, some of the plans in India failed because the weather failed and consequently their agricultural programmes failed. It should be our duty to make the agricultural operations in this country more certain by not leaving them entirely in the hands of nature. The natural resources of this country, including land and water, are so plentiful that we need have no difficulty in planning our agricultural operations. We have rivers in most parts of the country, and the waters that flow into these rivers should be conserved for our agricultural purposes. No government in this country, whether it was the S. L. F. P. Government, the U. N. P. Government or the National Government, has so far given this aspect any serious consideration. Unless the water that flows into our rivers is conserved, the cultivation processes in this country will depend on the uncertainties of nature.

In the Eastern Province more than 50 per cent of the land that is under cultivation depends on the monsoonal rains. When the monsoonal rains fail the crops fail. If the water is conserved and that water is diverted to places which lack water by means of irrigation schemes, our progress in the field of agriculture could be greatly improved. This is an aspect which the Government should address its mind to.

I wish to mention one final matter on which the entire success of our food production campaign as well as the development of this country depends. In fact, I made a passing reference to it in the Debate on the Address of Thanks. I would like to mention it again because it is of such vital importance. The Budget provides certain benefits to the public servants. The Minister of Finance has given them a temporary salary increase and has also promised them certain other benefits, such as two-year salary loans with a fixed lower limit, to purchase land for the purpose of putting up houses, or residential property. I should think that this is a very welcome feature and a long-felt need because we know that the public servants in this country, who form the bulk of the middle class, are hard-pressed. I think the benefits given to the public servants by this Government will stand them in good stead in solving many of the problems that face them now.

The public servants occupy a predominant and very influential position in this country. They have in the past made or marred governments by their activity or by their inactivity. The entire burden of running the machinery of government, whether it be in the field of food production or administration, is upon them. It is their responsibility. But does the government servant today realize his responsibility and contribute his best to the development of the country? That is the question that I pose. I am very grieved to say that the government servant is more alive to his needs than to his obligations.

If the Government can get every public servant to be at his desk by 9 a.m. and leave his desk only at 4.30 p.m. and to do his work in the intervening hours putting his heart and soul into his job, the country would be all the better for it. The snag today is that he is not giving of his best.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාසමානික්කම් මයා.]

I appeal to the public servants to do the jobs entrusted to them properly and to help the Government by their efforts, particularly in the food production drive. They must work, and the Government must see to it that they work. Then we shall achieve the objectives that we have set before us.

අ. භා. 8.21

ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා. (හපුතලේ)

(திரு. டபிள்யூ. பீ. ஜீ. ஆரியதாச—ஹப்புத்தளை)

(Mr. W. P. G. Ariyadasa—Haputale)

ජාතික රජය විසින් තුන්වන වරට ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනය සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මගේ කෘතඥතාවය තමුන්නාන්සේට පළ කරන අතර පද්දිරිප්පුවේ එස්. එම්. රාසමානික්කම් මයා.) ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුව මගේ කථාව කරන්න ලැබීම මගේ වාසනාවක් හැටියට මා සලකනවා. මෙවර පමණක් නොවෙයි, මේ ගරු සභාවෙ මෙයට පෙරත් පද්දිරිප්පුවේ ගරු මන්ත්‍රීතුමාගෙ කථාවට පසුව කථා කිරීමට අවස්ථා කීපයක්ම එළඹුණා. එතුමාට මගේ ලොකු සැලකිල්ලක් තිබෙනවා පමණක් නොවෙයි, එතුමා මගේ හොඳ මිත්‍රයෙක්. එසේ වුණත් මගේ කථාව පටන් ගන්න මත්තෙන් එතුමා විසින් සඳහන් කළ කරුණු කීපයක් ගැන කථා කිරීම යෝග්‍ය යයි මා කල්පනා කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පද්දිරිප්පුවේ ගරු මන්ත්‍රීතුමාගෙ කථාවෙන් පෙන්වන්න අදහස් කළේ රටේ සංවර්ධනයට ජනතාවගේ ශ්‍රමය මිඩංගු කළ යුතු අතර රජයේ සංවර්ධන වැඩ කටයුතුවලට විරුඬ පක්ෂයේ සහයෝගයද තිබිය යුතු බවයි. එය ඉතාමත් හොඳ යෝජනාවක්. රටේ සංවර්ධනයට ජනතාවගේ ශ්‍රමය මිඩංගු කළ යුතු අතර හැම පක්ෂයකම සහයෝගය ලැබිය යුතු බව විරුඬ පක්ෂය වුණත් පිළිගන්නවා. මා කොයි ලෙසකින්වත් සිතන්නෙ නැහැ, අපේ රටේ සංවර්ධනයක් ඇති කිරීම සඳහා ජනතාවගේ ශ්‍රමය මිඩංගු කිරීම ගැන සහයෝගය ලබාගැනීම ගැන කවර පක්ෂයකින්වත් විරුඬත්වයක් ඇතැයි කියා. එතුමා මගේ කොතරම් හොඳ මිත්‍රයකු වුණත් එතුමා ප්‍රකාශ කළ එක් කාරණයක් ගැන සඳහන් නොකරම බැහැ. මේ රටේ සංවර්ධනයක් ඇති කිරීමට නම්, මේ රටේ දියුණුවක් ඇති කිරීමට නම් සම්පූර්ණයෙන්ම ජාති භේදයෙන් තොරව කටයුතු කළ යුතු බව එතුමා පෙන්වන්න යෙදුණා. අප කවුරුත් පිළිගන්නවා, ජාති භේදවාදය හොඳ දෙයක් නොවන බව. ජාති වාදය රටකින් නැත්තටම නැති කළ යුතු දෙයක් බව මා පිළිගන්නවා. නමුත් මේ රටේ ජාතිවාදය පළමුවෙන්ම කොතැනින්ද ආරම්භ වුණේ කියා ගරු පද්දිරිප්පුවේ ගරු මන්ත්‍රීතුමාගෙන්ම කනගාටු වෙන් නමුත් අසන්න සිදු වී තිබෙනවා. සමහර විට එතුමාම මොහොතකට කල්පනා කර බැලුවොත් එතුමාට මතක් වේවි මේ රටේ බෝඩ් ලැලිවල තාර ගෑමේ ව්‍යාපාරය පළමුවෙන්ම පටන් ගත්තෙ එතුමාගෙ පක්ෂයෙන් බව. ඒ වාගේම මොන කාරණයක් නිසාද මා දන්නෙ නැහැ, එතුමාගෙ පක්ෂයෙ උදවිය එක්තරා අවස්ථාවකදී උතුරේ තැපැල් කන්තෝරු පිහිටුවා ගත්තා; මුද්දර ගැහීමක් ආරම්භ කළා. එමනිසා ජාති භේදවාදය ඒ ගරු මන්ත්‍රීවරුන්ගේම පක්ෂයෙන් පටන් ගත් බව මෙහිදී මතක් කර දෙන්න කැමතියි. ඒ අතරම තවත් කාරණයක් කියන්න ඕනෑ. අපේ පැත්තෙත් හිටිය, බෝඩ් ලැලිවල තාර ගාන මිනිහෙක්; ව්‍යාජ ජාති වාදියෙක්. උන්නැහෙල ඒ පැත්තෙ ඉඳගෙන බෝඩ් ලැලිවල තාර ගාන විට, මේ පැත්තෙ ඉඳගෙන මේ මිනිහ බෝඩ් ලැලිවල තාර ගානවා. ඔන්න ඔහොමයි මේ රටේ ජාති වාදය පටන් ගත්තෙ. උන්නැහෙල පටන් ගත් ඒ ව්‍යාපාරය—

රාසමානික්කම් මයා.

(திரு. இராசமாணிக்கம்)

(Mr. Rasamanickam)

It is after the Sinhala Only Act.

ආරියදාස මයා.

(திரு. ஆரியதாச)

(Mr. Ariyadasa)

මම ඒ ප්‍රශ්නයට එන්නම්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රටේ සංවර්ධනය ඇති කිරීම සඳහා ජාතිය භේද භින්න කිරීම අවශ්‍ය නැහැ. පද්දිරිප්පුවෙ ගරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මන්ත්‍රීතුමා පිළිගන්නවා ඇති මේ රට ඉතා කුඩා රටක් බව. ඒ වාගේම සිංහල ජාතිය මේ රටේ මහජාතිය වශයෙනුත් පිළිගන්නවා ඇති. ඒ කෙසේ වුණත් කවර අවස්ථාවකදීවත් ජාති වාදියෙක් හැටියට කථා කරන්න මගේ බලාපොරොත්තුවක් නැහැ. මගේ සම්පූර්ණ සහයෝගය මේ රටේ රැටියන් වන ද්‍රවිඩ ජනතාවට තිබෙනවා. එපමණක් නොව, අපේ පක්ෂයේ සහයෝගයද තිබෙනවා. අප ඒ අය අපේ සහෝදරයන් ලෙස සලකනවා.

තාර ගෑමේ ව්‍යාපාරය පටන් ගත්තෙ සිංහල පනත ඉදිරිපත් වුණු අවස්ථාවේදී බව ඒ මන්ත්‍රීතුමා කියනවා. ගරු මන්ත්‍රීතුමා කියන කාරණය එසේ නම්, අර ඉංග්‍රීසියෙන් කියමනක් තිබෙනව, දිව කම් මුලේ හංගා ගෙන කථා කරනවාය කියන. ඒ කියමනට මේ කථාවක් සමාන නොවේද කියා මා අහනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නාවලපිටියේ ගරු මන්ත්‍රීතුමාගෙ (චන්ද්‍රා කරුණාරත්න මයා.) කථාව ගෙන බලමු. විරුද්ධ පක්ෂයෙන් කථා කළේ නැතත්, නාවලපිටියේ ගරු මන්ත්‍රීවරයාගෙ කථාවෙන් සෑහෙන පිළිතුරක් ඒ අයගේ තර්කවලට ලැබෙන බව මේ අවස්ථාවේදී කියන්න පුළුවනි. කරුණු මෙසේ තිබියදීත්, "ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉන්නේ ජාතිවාදය අවුස්සන පිරිසක්යැයි" හංවඩු ගැසීමට යම්කිසිවකු කල්පනා කරනවා නම්, එය සම්පූර්ණ අසාධාරණ චෝදනාවක් බව මේ ගරු සභාවට පමණක් නොව ළදරුවකුට පවා ඒත්තු ගැන්වීමට පුළුවන්කම තිබෙනවා.

ඊළඟට එතුමා පෙන්වා දෙන්නට උත්සාහ කළා, ජාතික ආණ්ඩුව අද ජාතිවාදයෙන් තොරව වැඩ කරගෙන යනවාය, එය රටේ සංවර්ධනය සඳහා අවශ්‍ය වැදගත් දෙයක්ය, කියා. හොඳයි, අපි ඒ කීම ගැනත් කල්පනා කර බලමු. වැඩි කාලයක් නොවෙයි, මීට අවුරුදු හය හතකට කලින්—සිරිමා බණ්ඩාරනායක මැතිණිය මේ රටේ පාලන බලය ඇරු කාලයේම—"මේ රටෙන් භාගයක් උතුරට හා නැගෙනහිරට කඩා වෙන් කර දෙන්නට යනවායැයි" කියමින් සි[illegible]

මින්, වර්තමාන අගමැතිතුමා එදා මේ රටේ ජාතිවාදය ඇවිස්සූ බව තමුන්නාන්සේට මතකයි නේද? එදා එතුමා ජාතිවාදී යකු වශයෙන් කටයුතු කළා නේද? අද ජාතිවාදයෙන් තොරව මේ රටේ සංවර්ධනය සඳහා කටයුතු කරගෙන යනවායැයි කියන ගරු අගමැතිතුමා එදා කළේ මොකක්දැයි මා අහනවා.

මේ ආදි කරුණු ගැන කල්පනා කර බලන විට නම්, ඇත්ත වශයෙන්ම දේශපාලනය එතරම් හොඳ දෙයක් නොවන බව අපට පෙනී යනවා. බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා (බී. එච්. බණ්ඩාර මයා.) කොළ වගයක් පෙරළ පෙරළා කීවා, "අදට වඩා හාත්පසින්ම වෙනස් විධියට, එදා මෙන්න මෙහෙම කීවානේද ගොයියෝ?" කියා. මා නම් ඒ වේලාවේම මේ ගරු සභාවෙන්—මන්ත්‍රීකමෙන්—ඉල්ලා අස් වී එළියට යනවා. සමහර දේශපාලනඥයන්ට එසේ ලජ්ජා නැති විධියට කථා කරන්නට පුළුවන් වීමත් ඇත්ත වශයෙන්ම අපේ ජාතියට විශාල අගෞරවයක් බව කියන්නට කැමතියි. ඔවුන් අද කියන්නේ එකක්. එහෙත් එදා කීවේ මොනවාදැයි සොයා බැලුවොත්, අද කථාවට හාත්පසින්ම වෙනස් දෙයක් එදා කියා ඇති බව පැහැදිලි වෙනවා. අද අපේ රටේ එවැනි දේශපාලනඥයනුත් ඉන්නවා.

ජාති ආගම් වශයෙන් භේද භින්න නොවී සමගි සම්පන්නව අද ජාතික රජය කටයුතු කරනවායැයි සිතන්නට අපට බොහොම අමාරුයි. පදිරිප්පුවේ ගරු මන්ත්‍රීතුමා (රාසමානික්කම් මයා.) ජාතික රජය ජාතිවාදයෙන් තොරව කටයුතු කරනවායැයි කීමේ හේතුව මොකක්දැයි පැහැදිලි කළ යුතුව තිබෙනවා. අද උන්නැහෙලාට භේද භින්න වන්න කිසිම හේතුවක් නැහැ. ෆෙඩරල් පක්ෂයට යම් දෙයක් වුවමනා වී තිබුණා නම්, ඔවුන් බලාපොරොත්තු වුණාටත් වඩා සාර්ථක අන්දමට මේ ජාතික රජයෙන් ඒ වුවමනාවන් ඉෂ්ට වනවා බව මේ අවස්ථාවේදී සඳහන් කරන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආරියදාස මයා.]
නට කැමතියි. අද එවැනි තත්ත්වයක් පවතිද්දී භේද භින්න වන්නට වුවමනායෑ? රජයට විරුද්ධව චෝදනාවක් නඟන්නට ෆෙඩරල් පක්ෂයට කිසිම අවකාශයක් ලැබී නැහැ. තමන් බලාපොරොත්තු වුණාටත් වඩා හොඳින් සෑම දෙයක්ම කෙරෙනවා නොවැ ?

**එකල්හි වේලාව අ. භා. 8.30 වූයෙන්, කටයුතු අත් සිටුවා විවාදය කල් තබන ලදී.**

**එතැන් සිට විවාදය 1967 අගෝස්තු 10 වන බ්‍රහස්පතින්දා පවත්වනු ලැබේ.**

*அப்போது பி. ப. 8.30 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடை நிறுத்தப்பட்டு, விவாதம் ஒத்தி வைக்கப்பெற்றது.*

*1967 ஓகஸ்ட் 10, வியாழக்கிழமை விவாதம்மீள ஆரம்பமாகும்.*

*It being 8.30 P.M., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Thursday, 10th August 1967.*

## කල් තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

**එකල්හි වේලාව අ. භා. 8.31 වූයෙන්, කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.**

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව 1967 අගෝස්තු 7 වන දින සභා සම්මතිය අනුව, 1967 අගෝස්තු 10 වන බ්‍රහස්පතින්දා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.**

*அப்போது பி.ப. 8.31 மணியாகிவிடவே குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் வினா விடுக்காமலேயே சபையை ஒத்திவைத்தார்கள்.*

*அதன்படி சபை அதனது 1967 ஓகஸ்ட் 7 ஆம் தேதியத் தீர்மானத்திற்கிணங்க, 1967 ஓகஸ்ட் 10 ஆம் தேதி வியாழக் கிழமை மு. ப. 10 மணிவரை சபை ஒத்திவைக்கப் பெற்றது.*

*And it being 8.31 P.M., MR. DEPUTY CHAIRMAN OF COMMITTEES adjourned the House without Question put.*

*Adjourned accordingly until 10 A.M. on Thursday, 10th August 1967, pursuant to the Resolution of the House of 7th August 1967.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம்; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00) uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org